පරිවාස හා ළමාරක්ෂක
සේවා දෙපාර්තමේන්තුව

කොළඹ විශ්වවිද්‍යාලය, නීති පීඨය
මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය

# ශිෂ්‍ය අත්පොත

## මානව හිමිකම් ප්‍රවේශය පදනම් කරගත් ළමා වෙළඳාමේ වින්දිතයින් පිළිබඳ සිද්ධි කළමනාකරණය සහ රැකවරණය සඳහා වූ ප්‍රවේශය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව

2024

Save the Children

IOM
UN MIGRATION

පරිවාස හා ළමාරක්ෂක සේවා
දෙපාර්තමේන්තුව

කොළඹ විශ්වවිද්‍යාලය, නීති පීඨය
මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය

# ශිෂ්‍ය අත්පොත

# මානව හිමිකම් ප්‍රවේශය පදනම් කරගත් ළමා වෙළෙඳාමේ වින්දිතයින් පිළිබඳ සිද්ධි කළමනාකරණය සහ රැකවරණය සඳහා වූ ප්‍රවේශය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව

2024

Save the Children

IOM
UN MIGRATION

**කොළඹ විශ්වවිද්‍යාලය, නීති පීඨය**
**මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය**

## අපගේ දැක්ම

*සියලු මිනිසුන්ගේ ගෞරවයට හා අයිතිවාසිකම්වලට ගරු කරන අයිතිවාසිකම් පිළිබඳ සවිඥානකත්වයක් ඇති ජාතියක් බිහි කිරීම.*

## අපගේ මෙහෙවර

*බහුවිධ ප්‍රවේශයක් භාවිත කරමින් මානව හිමිකම් අධ්‍යාපනය සහ පර්යේෂණ සඳහා විශිෂ්ට මධ්‍යස්ථානයක් බවට පත් වීම.*

## පිදුම

**ව්‍යාපෘති කණ්ඩායම සහ තාක්ෂණික විශේෂඥතාව - මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය**

මහාචාර්ය (විශ්‍රාමික) වසන්තා සෙනවිරත්න අධ්‍යක්ෂක

එම්.ඒ.එම්. හකීම් - නියෝජ්‍ය අධ්‍යක්ෂක

චතුරි ජයවර්ධන - ව්‍යාපෘති කළමනාකාර

නීතිඥ ලේඛා හේරත් - සහකාර වැඩසටහන් කළමනාකාර

එස්. ශ්‍රී දයාලිනි - ව්‍යාපෘති සම්බන්ධීකාරක

**ව්‍යාපෘති කණ්ඩායම සහ තාක්ෂණික විශේෂඥතාව - සේව් ද චිල්ඩ්‍රන්**

බුද්ධිනී විතාන - ජ්‍යෙෂ්ඨ තාක්ෂණික උපදේශක ළමා ආරක්ෂණය සහ ළමා අයිතිවාසිකම් පිළිබඳ ව්‍යාපාරය

ජනනී චන්ද්‍රමෝහන් - ජ්‍යෙෂ්ඨ තාක්ෂණික උපදේශක - මානසික සෞඛ්‍ය මනෝ සමාජීය සහය හා ළමා සහභාගීත්වය

සුජේතා ගොපල්ලව, ජ්‍යෙෂ්ඨ කළමනාකාර - තැනැත්තන් වෙළෙඳාමට එරෙහිව කටයුතු කිරීම

**ව්‍යාපෘති කණ්ඩායම - සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය (IOM)**

මිනෝලි පී. දොන්, ප්‍රධානී - ආරක්ෂණ ඒකකය

මිෂෙල් බර්මන් - ජ්‍යෙෂ්ඨ ව්‍යාපෘති සම්බන්ධීකාරක - තැනැත්තන් වෙළෙඳාමට එරෙහිව කටයුතු කිරීම, ආරක්ෂණ ඒකකය

**පරිවර්තකයින්:**

සිංහල:
කේ.කේ. හිරුණි පවිත්‍රා - සහය කථිකාචාර්ය, සමාජ විද්‍යා අධ්‍යයනාංශය, ශාස්ත්‍ර පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය

දෙමළ:
නිශාන්දනි රත්නම් - නීතිඥ (ශ්‍රී ලංකාව)

ශායිස්වරී පත්මසීලන් - සහකාර කථිකාචාර්ය (පරිවාස), KAATSU ජාත්‍යන්තර විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

**මුල් පිටු සැකසුම :**

නීතිඥ නයනිකා සෙනෙවිරත්න - සන්නිවේදන නිලධාරී, CSHR

ඒකාබද්ධව ප්‍රකාශයට පත් කළේ:

මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය
නීති පීඨය, කොළඹ විශ්විද්‍යාලය
94, කුමාරතුංග මුණිදාස මාවත
කොළඹ 03
https://cshr.cmb.ac.lk/

සේව් ද චිල්ඩ්‍රන් ශ්‍රී ලංකා
18 සින්සප පාර, කොළඹ 06, ශ්‍රී ලංකාව
www.srilanka.savethechildren.net/

සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය
9 වන මහල, IBSL ගොඩනැගිල්ල, අංක 80 A,
ඇල්විටිගල මාවත,
කොළඹ 08, ශ්‍රී ලංකාව
https://srilanka.iom.int/

වියාචනය: මෙම අත්පොත සම්පාදනය කර තිබෙන්නේ 2024 අප්‍රේල් මස දක්වා ලැබුණු තොරතුරු සමඟිනි. මෙම අත්පොත සාමාන්‍ය තොරතුරු සඳහා පමණක් වන අතර නිල අරමුණු සඳහා නොවන බව කරුණාවෙන් සලකන්න. මෙහි අඩංගු ඕනෑම තොරතුරක් අදාළ අධිකාරිය වෙත යොමු කිරීමෙන් තහවුරු කළ යුතුය.

මෙම වාර්තාවේ සියලුම තොරතුරු මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය (CSHR) සතු වේ. CSHR හි අවසරයකින් තොරව මෙම ප්‍රකාශනය හෝ මෙම ප්‍රකාශනයේ කිසිදු කොටසක් ප්‍රතිනිෂ්පාදනය කිරීමට හෝ පිටපත් කිරීමට නොහැකිය..

තැනැත්තන් වෙළෙඳාම් කිරීම නිරීක්ෂණය කිරීම සහ ඒවාට එරෙහිව සටන් කිරීම සඳහා එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ කාර්යාලය විසින් සපයනු ලබන සහයෝගය හරහා අධ්‍යයන සම්භාර අංක SSJTIP22GR0008 හි නියමයන් යටතේ මෙම අත්පොත ප්‍රකාශනය කිරීමට හැකි විය. මෙහි ප්‍රකාශිත ඕනෑම මතයක් කර්තෘගේ අදහස් වන අතර එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ අදහස් මේ ඔස්සේ පිළිබිඹු නොවන බව සලකන්න.

© මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය; © සේව් ද චිල්ඩ්‍රන් ඉන්ටර්නැෂනල්; © සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය 2024

ප්‍රකාශිත අදහස් කතෘවරුන්ගේ අදහස් පමණක් වන අතර ඒවා ප්‍රකාශනයෙන් සහ එය නැවත භාවිතා කිරීමෙන් ඇතිවන කිසිදු ප්‍රතිවිපාකයකට කොළඹ විශ්වවිද්‍යාලය, සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය (IOM) සහ සේව් ද චිල්ඩ්‍රන්ස් ආයතනය වගකිව යුතු නියෝජිතයන් ලෙස නොසැලකිය යුතුය.

මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය යනු කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයට අනුබද්ධ ලාභ

නොලබන සංවිධානයකි. බහුවිධ ප්‍රවේශයක් භාවිතා කරමින් මානව හිමිකම් අධ්‍යාපනය සහ පර්යේෂණ සඳහා විශිෂ්ටත්වයේ කේන්ද්‍රස්ථානයවීමේ මෙහෙවර සමඟින් මානව හිමිකම් අධ්‍යාපනය සහ පර්යේෂණ වැඩසටහන් පැවැත්වීම සහ පහසුකම් සැලසීම එහි අරමුණයි.

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව ළමුන් සඳහා නිශ්චිත සේවාවක් ඉටු කරන අතර ශ්‍රී ලංකාවේ දරුවන්ගේ අයිතිවාසිකම් සුරැකීම සඳහා නව ප්‍රවේශයන් පිළිබඳ වැඩසටහන් විශාල ප්‍රමාණයක් ක්‍රියාත්මක කරයි.

හදිසි අවස්ථාවන්හිදී මෙන්ම සංවර්ධන සන්දර්භයන්හිදී, දරුවන් වෙනුවෙන් ක්ෂණික සහ කල් පවත්නා වැඩිදියුණු කිරීම් සඳහා දායක වීමට සේව් ද චිල්ඩ්‍රන් ආයතනය රටවල් 120 කට වඩා වැඩි ගණනක ක්‍රියාත්මක වේ. අපට අවශ්‍ය වන්නේ සියලුම දරුවන් කරදරයකින් තොරව ජීවත් වන, ඉගෙන ගන්නා සහ ආරක්ෂා වන ලෝකයකි.

IOM මානුෂීය හා විධිමත් සංක්‍රමණය, සංක්‍රමණිකයන්ට සහ සමාජයට ප්‍රතිලාභ ලබා දෙන ප්‍රතිපත්තිය වෙනුවෙන් කැපවී සිටී. IOM හට ලොව පුරා රටවල් කාර්යාල සහ උප කාර්යාල 480කට වඩා ඇත.

සියලුම හිමිකම් ඇවිරිණි: ප්‍රකාශකයාගේ පූර්ව ලිඛිත අවසරයකින් තොරව මෙම ප්‍රකාශනයේ කිසිදු කොටසක් කිසිදු ආකාරයකින් නිෂ්පාදනය වෙනස් කිරීම, බෙදා හැරීම හෝ සම්ප්‍රේෂණය කිරීම හෝ ඡායා පිටපත් කිරීම, පටිගත කිරීම හෝ වෙනත් විද්‍යුත් හෝ යාන්ත්‍රික ක්‍රම ඇතුළු වෙනත් ආකාරයකින් සිදු කළ නොහැක.

**සැකසුම:** කොළඹ විශ්වවිද්‍යාලය, නීති පීඨය, මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය

**සහයෝගිත්වය:** පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

Save the Children

**පත්කරන ලද්දේ:** IOM UN MIGRATION

**මූල්‍ය දායකත්වය:**

CSHR පහත සඳහන් තාක්ෂණික සමාලෝචන කමිටු සාමාජිකයින්ට ද දැඩි ලෙස කෘතඥ වේ.

මහාචාර්ය (විනේතෘ) වසන්තා සෙනවිරත්න
අධ්‍යක්ෂ, මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය
රාජ්‍ය සහ ජාත්‍යන්තර නීති දෙපාර්තමේන්තුව
නීති පීඨය
කොළඹ විශ්වවිද්‍යාලය

මහාචාර්ය නිෂාර ප්‍රනාන්දු
සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
ශාස්ත්‍ර පීඨය
කොළඹ විශ්වවිද්‍යාලය

මහාචාර්ය පියංජලී ද සොයිසා
මනෝ චිකිත්සක දෙපාර්තමේන්තුව
වෛද්‍ය පීඨය
කොළඹ විශ්වවිද්‍යාලය

නිර්මලී පෙරේරා
ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරී
පරිවාස හා ළමාරක්ෂක සේවා
දෙපාර්තමේන්තුව

ප්‍රියංගිකා රත්නායක
සහකාර අධ්‍යක්ෂක
මනෝ සමාජීය දෙපාර්තමේන්තුව
ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

ජනනී චන්ද්‍රමෝහන්
ජ්‍යෙෂ්ඨ තාක්ෂණික උපදේශක
මානසික සෞඛ්‍ය මනෝ-සමාජය සහය සහ
ළමා සහභාගීත්වය
සේව් ද චිල්ඩ්රන්, ශ්‍රී ලංකාව

රොෂාන් ධම්මපාල
ස්වාධීන සායනික මනෝවිද්‍යාඥ

සුෂේතා ගොපල්ලව
ජ්‍යෙෂ්ඨ කළමනාකරු
ජාවාරමට එරෙහිව කටයුතු කිරීම
සේව් ද චිල්ඩ්රන්, ශ්‍රී ලංකාව

නිවේදිතා ජීවබාලන්
මානසික සෞඛ්‍ය විශේෂඥ/කළමනාකරු
ළමා ආරක්ෂණ ඒකකය – LEADS

ඊ.ඩබ්. චලනිකා සඳමාලි
ළමා වෙළඳාමේ වින්දිතයින් සම්බන්ධීකාරක

බුද්ධිනී විතාන
ජ්‍යෙෂ්ඨ තාක්ෂණික උපදේශක
ළමා ආරක්ෂණය සහ ළමා අයිතිවාසිකම් පිළිබඳ
ව්‍යාපාරය
සේව් ද චිල්ඩ්රන්, ශ්‍රී ලංකාව

**පහත සඳහන් මොඩියුල සංවර්ධකයින් වෙත CSHR හි අවංක කෘතඥතාව පුද කෙරේ:**

සඳරේඛා ලියනගේ
සහකාර කොමසාරිස්
පරිවාස හා ළමාරක්ෂක සේවා
දෙපාර්තමේන්තුව

රොෂාන් ධම්මපාල
ස්වාධීන සායනික මනෝවිද්‍යාඥ

නිලූෂා ගුණතිලක
උපදේශක / සායනික මනෝවිද්‍යාඥ

නිවේදිතා ජීවබාලන්
මානසික සෞඛ්‍ය විශේෂඥ/කළමනාකරු
ළමා ආරක්ෂණ ඒකකය – LEADS

සුබෝධ එම්. මලවර ආරච්චි
කළමනාකාර අධ්‍යක්ෂ, ලයිෆ් කන්සල්ටන්සි
ආයතනය
කුසලතා පුහුණුකරු

බුද්ධිනී විතාන
ජ්‍යෙෂ්ඨ තාක්ෂණික උපදේශක
ළමා ආරක්ෂණය සහ ළමා අයිතිවාසිකම්
පිළිබඳ ව්‍යාපාරය
සේව් ද චිල්ඩ්‍රන්, ශ්‍රී ලංකාව

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ පහත සඳහන් පළාත් පරිවාස කොමසාරිස්වරුන් වෙත CSHR අපගේ අවංක කෘතඥතාව පුදකරයි.

ගයනි කෞෂල්‍යා විජේසිංහ
කොමසාරිස්
පරිවාස හා ළමාරක්ෂක සේවා
දෙපාර්තමේන්තුව - ජාතික කාර්යාලය

නිර්මලී පෙරේරා
ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරී
පරිවාස හා ළමාරක්ෂක සේවා
දෙපාර්තමේන්තුව - ජාතික කාර්යාලය

ඩී.එම්.සී.සී.කේ. ගුණරත්න
පළාත් කොමසාරිස්,
පරිවාස හා ළමාරක්ෂක සේවා
දෙපාර්තමේන්තුව - මධ්‍යම පළාත

රිස්වානි රිෆාන්
පළාත් කොමසාරිස්
පරිවාස සහ ළමාරක්ෂක සේවා
දෙපාර්තමේන්තුව - නැගෙනහිර පළාත

රාජේන්ද්‍රම් ගුරුපරන්
පළාත් කොමසාරිස්
පරිවාස සහ ළමාරක්ෂක සේවා
දෙපාර්තමේන්තුව - උතුරු පළාත

සුරිතා පෙරේරා
පළාත් කොමසාරිස්
පරිවාස සහ ළමාරක්ෂක සේවා
දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත

එම් ජ් මල්කාන්ති පියසේන
පළාත් කොමසාරිස්
පරිවාස සහ ළමාරක්ෂක සේවා
දෙපාර්තමේන්තුව - වයඹ පළාත

ජී.ඩී.ලක්මාලි යූ කුමාරි
පළාත් කොමසාරිස්
පරිවාස සහ ළමාරක්ෂක සේවා
දෙපාර්තමේන්තුව - සබරගමුව පළාත

රෂිකා යූ අයි දිසානායක
පළාත් කොමසාරිස්
පරිවාස සහ ළමාරක්ෂක සේවා
දෙපාර්තමේන්තුව - දකුණු පළාත

ටී.එම්.එන්.චතුරංගි
පළාත් කොමසාරිස්
පරිවාස සහ ළමාරක්ෂක සේවා
දෙපාර්තමේන්තුව - ඌව පළාත

පේෂලා ආර් අබේසූරිය
පළාත් කොමසාරිස්
පරිවාස සහ ළමාරක්ෂක සේවා
දෙපාර්තමේන්තුව - බස්නාහිර පළාත

## පටුන

ස්තුතිය iii

පෙරවදන vi

පීඨාධිපතිතුමන්ගේ පණිවිඩය vii

නියෝජ්‍ය අධ්‍යක්ෂකතුමන්ගේ පණිවිඩය viii

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ පණිවිඩය ix

සේව් ද චිල්ඩ්‍රන් ඉන්ටර්නැෂනල් පණිවිඩය x

සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධාන යේ පණිවිඩය - IOM පණිවිඩය xii

කෙටියෙදුම් xiii

01. කොළඹ විශ්වවිද්‍යාලය 1

02. මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය 2

03. පාඨමාලාව හැඳින්වීම 3

04. පාඨමාලාවේ අන්තර්ගතය 4

4.1. ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රධාන මූලධර්ම ....5

4.2. නීතිමය රාමුව ....13

4.3. ළමා වෙළෙඳාමේ වින්දිතයින් සහ වෙනත් අපචාරවලට ගොදුරු වූ ළමා වින්දිතයන් හඳුනා ගැනීම ....19

4.4. ළමා වෙළෙඳාම සහ වෙනත් ආකාරයේ අපචාරයන්ට ලක්වූ වින්දිතයින්ගේ රැකවරණ අවශ්‍යතා....24

4.5. CVoT හි අභියෝගාත්මක හැසිරීම් සහ අවදානම් කළමනාකරණය කිරීම....32

4.6. ළමා ආරක්ෂණ සිද්ධි කළමනාකරණය සහ වාර්තා තබා ගැනීම සඳහා සහාය වීම ....36

4.7. පුද්ගල සුරැකුම් සැලැස්ම සහ නැවත සමාජගත කිරීම ....57

4.8. ස්වයං රැකවරණය සහ රැකවරණ සපයන්නන්ගේ ආතති කළමනාකරණය ....65

05. දේශන කාලසටහන....71

06. පාඨමාලා මාර්ගෝපදේශ ....76

07. ඇගයීම් කාලසටහන ....79

08. ස්වාධීන පැවරුම ....80

09. ස්වාධීන ඉදිරිපත් කිරීම ....81

10. ප්‍රවර්ධන මාර්ගෝපදේශ ....82

11. පරිපාලන මාර්ගෝපදේශ....84

12. විශේෂ දිනයන්....86

13. විශේෂ තොරතුරු....87

# පෙරවදන



මානව හිමිකම් ප්‍රවේශය පදනම් කරගත් ළමා වෙළදාමේ වින්දිතයින් පිළිබඳ සිද්ධි කළමනාකරණය සහ රැකවරණය සඳහා වූ ප්‍රවේශය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව, ළමා වෙළෙඳාමේ වින්දිතයින් සඳහා වන සේවාවන් වැඩිදියුණු කිරීම සඳහා ළමා සුරැකුම් මධ්‍යස්ථානවල සුරැකුම් කාර්ය මණ්ඩලයට හැකියාව ලබා දීම සඳහා සංවර්ධනය කරන ලදී. විශේෂයෙන්ම, හඳුනාගෙන ඇති සියලුම ළමා වින්දිතයන් සඳහා ගුණාත්මකභාවය සහ ප්‍රවේශ්‍යතාව සහිත උසස් සේවාවක් ලබාදීම අරමුණු කෙරේ. එහිදී, ළමා වෙළෙඳාමේ වින්දිතයින්හට ඵලදායී ආරක්ෂාවක් සැපයීමට සුරැකුම් කාර්ය මණ්ඩලයට හැකියාව ලබා දීම සහ සුරැකුම් කාර්යමණ්ඩලයේ සාමාජිකයින් තුළ ළමා වෙළෙඳාම පිළිබඳ අවබෝධය සහ ළමා වෙළෙඳාම සම්බන්ධ සිදුවීම් වාර්තා කිරීමේ හැකියාව වැඩිදියුණු කිරීම මෙමගින් අරමුණු කෙරේ.

මානව හිමිකම් ප්‍රවේශය පදනම් කරගත් ළමා වෙළෙඳාමේ වින්දිතයින් පිළිබඳ සිද්ධි කළමනාකරණය සහ රැකවරණය සඳහා වූ ප්‍රවේශය පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව සම්බන්ධ මෙම අත්පොත රාජ්‍ය ආයතනවල සුරැකුම් කාර්ය මණ්ඩලය සඳහා පුළුල් මාර්ගෝපදේශයක් ලෙස කටයුතු කෙරේ. පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව, මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය සහ සේව් ද චිල්ඩ්‍රන් යන ආයතන සමඟ සහයෝගයෙන් සකස් කරන ලද මෙම අත්පොත මෙම වැඩසටහනට විශේෂිත වූ ප්‍රතිපත්ති සහ අධ්‍යයන රෙගුලාසි ගෙනහැර දක්වයි.

මෙම අධ්‍යාපනික ගමන්මග ආරම්භ කරන සිසුන්, මෙම අත්පොතෙහි දක්වා ඇති මාර්ගෝපදේශ තේරුම් ගෙන ඒවා පිළිපැදීම අත්‍යවශ්‍ය වේ. මෙහි දක්වා ඇති රෙගුලාසි පිළිබඳව දැනුවත් වීම මෙම පාඨමාලාව සමඟ සම්බන්ධ වන සියලුම දෙනාගේ වගකීම වේ.

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ අවශ්‍යතා සපුරාලීම සඳහා නම්‍යශීලී වන පරිදි පාඨමාලා ව්‍යුහය සැලසුම් කර තිබෙන අතර, පාඨමාලා ව්‍යුහය සැලසුම් කිරීමේදී සුරැකුම් කාර්ය මණ්ඩලයේ සහ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විත කාර්යමණ්ඩලයක උපදෙස් ලබාගෙන තිබේ. මෙම මොඩියුලය මගින් පාඨමාලා අන්තර්ගතය පිළිබඳ සවිස්තරාත්මක දළ විශ්ලේෂණයක් ඉදිරිපත් කරන අතර, කොළඹ විශ්වවිද්‍යාලය විසින් සකසා ඇති අධ්‍යයන ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කෙරේ.

CSHR කණ්ඩායම සමස්ත වැඩසටහන පුරාවටම, සිසුන්ට වඩාත් ප්‍රතිලාභදායක සහ බුද්ධිමය උත්තේජනයන් සහිත අත්දැකීමක් ලබා දීමට කැපවී සිටී. මෙම මානව හිමිකම් පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව තුළින්, ළමා වෙළෙඳාමට හසුවූ වින්දිතයින් පිළිබඳ සිද්ධි කළමනාකරණය සහ රැකවරණය සඳහා වූ ප්‍රවේශය පිළිබඳව සිසුන්ගේ දැනුම සහ කුසලතා වර්ධනය කර ගැනීම සඳහා සිසුන්ට සහාය වීමට අපි කැපවී සිටින්නෙමු.

මෙම අධ්‍යාපනික කටයුතු ආරම්භ කරන සියලුම දෙනාට අපි අපගේ සුභාශිංසන පිරිනමන්නෙමු.

**මහාචාර්ය (විනේතෘ) වසන්තා සෙනවිරත්න**
අධ්‍යක්ෂක
මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය
කොළඹ විශ්වවිද්‍යාලය

## පීඨාධිපතිතුමන්ගේ පණිවිඩය
## නීති පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය



සියලු සිසුන් වෙත,

මානව හිමිකම් ප්‍රවේශය පදනම් කරගත් ළමා වෙළෙඳාමේ වින්දිතයින් පිළිබඳ සිද්ධි කළමනාකරණය සහ රැකවරණය සඳහා වූ ප්‍රවේශය පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව වෙත ඔබව සාදරයෙන් පිළිගනිමු. රාජ්‍ය ආයතනවල සුරැකුම් කාර්ය මණ්ඩල සාමාජිකයින් 200 ක් සඳහා ආරම්භ කරන ලද මෙම වැඩසටහන ළමා අයිතිවාසිකම් සහ ආරක්ෂාව පිළිබඳ වෘත්තීය වර්ධනය සඳහා සැලකිය යුතු අවස්ථාවක් සලසා දෙයි.

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව, මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය සහ සේව් ද චිල්ඩ්රන් යන ආයතන සමඟ සහයෝගයෙන් සිදු කරන මෙම මුලපිරීම මගින් සමාජ සාධාරණත්වය ප්‍රවර්ධනය කිරීමට සහ සෑම දරුවෙකුගේම, විශේෂයෙන්ම වඩාත් ආන්තීකරණයට ලක්වූවන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටීම අපගේ බලාපොරොත්තුවයි.

මෙම තීරණාත්මක ක්ෂේත්‍රය තුළ ඔබගේ දැනුම සහ කුසලතා වැඩි දියුණු කර ගැනීමට ඔබ දක්වන කැපවීම මම අගය කරමි. මෙම පාඨමාලාව සඳහා ඔබගේ සහභාගීත්වය ඔබේ වෘත්තීය ගමන්මග ශක්තිමත් කිරීමට පමණක් නොව, ළමා වෙළෙඳාමේ වින්දිතයින්ගේ අයිතිවාසිකම් සහ යහපැවැත්ම ආරක්ෂා කිරීම සඳහා ද දායක වනු ඇත.

පාඨමාලාව පුරාවටම, පාඨමාලා අන්තර්ගතය සමඟ ඔබගේ සක්‍රිය සම්බන්ධ වීම අපේක්ෂා කරමි. මෙම පාඨමාලාව තුළින්, සම වයස් කණ්ඩායම් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම, මානව හිමිකම් මූලධර්ම පිළිබඳ ගැඹුරු අවබෝධය සහ සිද්ධි කළමනාකරණය සහ ළමා රැකවරණය සඳහා නව්‍ය ප්‍රවේශයන් ගවේෂණය කිරීම සඳහා අධ්‍යයන ක්ෂේත්‍රයේ පවතින විශේෂඥතාව ඔබ විසින් උපයෝගී කර ගැනීම අපේක්ෂා කෙරේ.

ඔබගේ ඉදිරි කාර්යයන් වල, ධනාත්මක බලපෑමක් දැකගැනීමට අපේක්ෂා කරමින්, ඔබගේ ඉදිරි අධ්‍යයන කටයුතු වෙනුවෙන් මාගේ සුභාශිංසන පිරිනමමි.

**මහාචාර්ය (ආචාර්ය) එන්.එස්. පුංචිහේවා**
පීඨාධිපති
නීති පීඨය
කොළඹ විශ්වවිද්‍යාලය

## නියෝජ්‍ය අධ්‍යක්ෂකතුමන්ගේ පණිවිඩය



මානව හිමිකම් ප්‍රවේශය පදනම් කරගත් ළමා වෙළෙඳාමේ වින්දිතයින් පිළිබඳ සිද්ධි කළමනාකරණය සහ රැකවරණය සඳහා වූ ප්‍රවේශය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව සමඟ සම්බන්ධ වන ඔබ සියලුම දෙනා උණුසුම් ලෙස පිළිගැනීමට ලැබීම සම්බන්ධයෙන් මම සතුටු වෙමි.

රාජ්‍ය ආයතනවල සහ සුරැකුම් මධ්‍යස්ථානයන්හි සේවය කරන සුරැකුම් කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙනුවෙන්,

මානව හිමිකම් රාමුවක් තුළ ළමා වෙළෙඳාමේ වින්දිතයින්ගේ අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය දැනුම හා කුසලතාවලින් සන්නද්ධ කරවන විශේෂිත පුහුණුවක් ලබා දීම අපගේ වැඩසටහනේ සුවිශේෂීත්වය වශයෙන් දැක්විය හැකිය. කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයේ සහ ක්ෂේත්‍රයේ ගෞරවණීය ප්‍රවීණයන්ගේ මගපෙන්වීම යටතේ, අපගේ පාඨමාලාවේ විෂය නිර්දේශය සකස් කර තිබේ. මෙහිදී අදාළ විෂය කරුණු සහ අවශ්‍ය ප්‍රායෝගික අවබෝධය නිවැරදිව ලබා දීම සඳහා පාඨමාලාවේ විෂය නිර්දේශය ප්‍රවේශමෙන් සකස් කර ඇත.

අපගේ පාඨමාලාව දේශන, සාකච්ඡා සහ ප්‍රායෝගික අභ්‍යාසවල එකතුවක් ලෙස ක්‍රියාත්මක වේ. මානව හිමිකම් මූලධර්ම, නීතිමය රාමු සහ ළමා වෙළෙඳාමේ වින්දිතයින් සඳහා විශේෂිත වූ සිද්ධි කළමනාකරණයේ හොඳම භාවිතයන් පිළිබඳ පුළුල් අවබෝධයක් ලබාදෙයි. පාඨමාලාව සමඟ සම්බන්ධවන්නන් හට එකිනෙකා සමඟ සම්බන්ධවීමට සහ අත්දැකීම් හුවමාරුව තුළින් ඉගෙන ගත හැකි උපකාරක ඉගෙනුම් පරිසරයක් පෝෂණය කිරීමට අපි කැපවී සිටින්නෙමු.

අවදානමට ලක්විය හැකි දරුවන්ගේ අයිතිවාසිකම් සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් ඉගැන්වීමේ සහ පර්යේෂණවල විශිෂ්ටත්වය සහතික කිරීම උදෙසා, මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රයේ (CSHR) අපි කැපවී සිටින්නෙමු. මෙම පාඨමාලාවට සම්බන්ධ වන ඔබට, පළපුරුදු වෘත්තිකයන්ගෙන් ඉගෙන ගැනීමටත්, මෙම තීරණාත්මක ක්ෂේත්‍රයේ දැනුමේ දියුණුවට දායක වීමටත් ඔබට අවස්ථාව හිමි වනු ඇත.

පාඨමාලාව සාර්ථකව නිම කිරීම සඳහා මම ඔබට උණුසුම් සුභ පැතුම් පිරිනමමි. ළමා වෙළෙඳාමේ වින්දිතයින් වෙනුවෙන් රැකවරණය සහ ආරක්ෂාව සැලසීම සඳහා ඔබ දක්වන කැපවීම ප්‍රශංසනීය වන අතර, ඔවුන්ගේ ජීවිතවල ධනාත්මක වෙනසක් ඇති කිරීමට මෙම වැඩසටහන ඔබට ශක්තියක් වනු ඇතැයි මම විශ්වාස කරමි.

**එම්. ඒ. එම්. හකීම්**
නියෝජ්‍ය අධ්‍යක්ෂ, CSHR
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
රාජ්‍ය සහ ජාත්‍යන්තර නීති දෙපාර්තමේන්තුව
නීති පීඨය
කොළඹ විශ්වවිද්‍යාලය

## පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ පණිවිඩය



පරිවාස දෙපාර්තමේන්තුවේ සහ ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ සුරැකුම් කාර්ය මණ්ඩල සඳහා නිර්මාණය කර තිබෙන, මානව හිමිකම් ප්‍රවේශය පදනම් කරගත් ළමා වෙළෙඳාමේ වින්දිතයින් පිළිබඳ සිද්ධි කළමනාකරණය සහ රැකවරණය සඳහා වූ ප්‍රවේශය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව වෙත සාදරයෙන් පිළිගනිමු. වෙළෙඳාමට ගොදුරු වූවන් ඇතුළුව ළමා වින්දිතයින්, ඔවුන්ගේ වෙළෙඳාමට ලක්වන කාලය පුරාවටම සහ නැවත ආරක්ෂාව වෙත ළඟා වන විට දැඩි ශාරීරික, ලිංගික, මානසික සහ චිත්තවේගීය දුෂ්කරතා විඳදරා ගනී. කඩිනම් හඳුනා ගැනීමක් සහ පුළුල් මනෝ සමාජීය සහායක් නොමැතිව, මෙම අවදානමට ලක්විය හැකි තැනැත්තන් යථා තත්ත්වයට පත් කිරීම සහ ඔවුන්ගේ ජීවිත නැවත ගොඩනගා ගැනීම සඳහා යන ගමනේදී බලවත් බාධකවලට මුහුණ දෙයි. එම නිසා කල්තබා හඳුනා ගැනීම, ආරක්ෂා කිරීම සහ අවශ්‍ය චිකිත්සක ප්‍රතිකාර ලබා දීම ඉතා වැදගත් වේ. සමාජයට සාර්ථක ලෙස නැවත සමාජගත වීම ද ඒ හා සමානව වැදගත් ය.

එබැවින්, ළමා ආරක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් සහ වෘත්තිකයන් සමඟ පුළුල් උපදේශනයන්ගෙන් පසුව, පුළුල් පුහුණු මොඩියුල ඉතා සූක්ෂම ලෙස සකස් කරන ලදී. මෙම මොඩියුලවල අරමුණ වන්නේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රධාන මූලධර්ම කෙරෙහි අවධානය යොමු කරමින් අත්‍යවශ්‍ය දැනුම සහ කුසලතා සහිත ළමා ආරක්ෂණ ආයතනවල කාර්ය මණ්ඩලය සවිබල ගැන්වීමයි. වෙළෙඳාමට ගොදුරු වූවන් ඇතුළු වින්දිතයන් හඳුනා ගැනීම, ඔවුන්ගේ විශේෂිත රැකවරණ අවශ්‍යතා අවබෝධ කර ගැනීම, අභියෝගාත්මක හැසිරීම් සහ අවදානම් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම, ළමා ආරක්ෂණ සිද්ධි කළමනාකරණයට සහාය වීම, පුද්ගලාරෝපිත සුරැකුම් සැලසුම් පවත්වාගෙන යාම සහ සාර්ථක ලෙස නැවත සමාජගත වීම සඳහා අවශ්‍යය පහසුකම් සැලසීම වැනි තීරණාත්මක ක්ෂේත්‍ර ඔවුන් ආවරණය කරයි. එවැනි වින්දිතයන් සමඟ කටයුතු කිරීම සඳහා පවතින ඉල්ලුමේ ස්වභාවය සැලකිල්ලට ගෙන, පුහුණු මොඩියුලයට ස්වයං රැකවරණය සහ රැකවරණ ආතතිය කළමනාකරණය පිළිබඳ තේමාවන් ඇතුළත් වේ.

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව, සේව් ද චිල්ඩ්රන් ආයතනය සහ මානව හිමිකම් පිළිබඳ අධ්‍යයන කේන්ද්‍රය සමඟ එක්ව සංවර්ධනය කරන ලද මෙම උසස් සහතිකපත්‍ර පාඨමාලාව, ඔබේ අධීක්ෂණය යටතේ අවදානමට ලක්විය හැකි වින්දිතයින්ට ආදර්ශමත් රැකවරණයක් සැපයීම සඳහා ඔබව සූදානම් කරයි.

වෙනසක් ඇති කිරීම සඳහා ඔබගේ කැපවීම ඉතා අගනේය. ළමා සුරැකුම් ආයතන තුළ අවදානමට ලක්විය හැකි වින්දිතයින් සඳහා ලබාදිය හැකි හොඳම සේවාවන් සහතික කිරීම සඳහා මෙම පුහුණුව වෙනුවෙන් ඔබගේ ක්‍රියාකාරී සහභාගීත්වය දිරිමත් කරන අතරම, ඔබේ ඉදිරි ගමන්මඟ සඳහා මම ඔබට සුබ පතමි.

**ගයනි කෞශල්‍යා විජේසිංහ**
කොමසාරිස්
පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

## සේව් ද චිල්ඩ්‍රන් ඉන්ටර්නැෂනල් ජාතික අධ්‍යක්ෂතුමන්ගේ පණිවිඩය



කොළඹ විශ්වවිද්‍යාලයේ මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය (CSHR) විසින් පිරිනමනු ලබන, මානව හිමිකම් ප්‍රවේශය පදනම් කරගත් ළමා වෙළෙඳාමේ වින්දිතයින් පිළිබඳ සිද්ධි කළමනාකරණය සහ රැකවරණය සඳහා වූ ප්‍රවේශය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව සම්බන්ධයෙන් මගේ අදහස් ලබා දීමට හැකිවීම පිළිබඳ මම සතුටු වෙමි.

සේව් ද චිල්ඩ්‍රන් ශ්‍රී ලංකා හි ප්‍රමුඛතාවක් වන්නේ ළමයින් වෙළෙඳාම වැළැක්වීමේ රජයේ සහ සිවිල් සමාජ ප්‍රයත්නයන්ට සහාය වීමයි. මෙම විෂය පථය තුළ, පසුගිය වසර කිහිපය තුළ, ළමා ජාවාරමට ගොදුරුවූවන් නේවාසික රැකවරණයේ සිටින විට මුහුණ දෙන අභියෝග සහ අවස්ථාවන් පිළිබඳ අපගේ අවබෝධය වර්ධනය කර ගෙන ඇත. ඔවුන් කොපමණ වාරයක් වරදවා වටහාගෙන, ජාවාරමට ගොදුරුවූවන් ලෙස හඳුනා නොගෙන, බොහෝ විට වින්දිතයන්ගේ සහාය ලෙස නුසුදුසු සහ වඩාත් හානිකර මැදිහත්වීම්වලට තුඩු දෙන ආකාරය අපි දැක ඇත්තෙමු.

ළමා වෙළෙඳාමේ වින්දිතයින් සඳහා අදාළ සහ ගුණාත්මක සහාය පුළුල් රාමුවක් තුළ ලබා දීම සඳහා, සේව් ද චිල්ඩ්‍රන් ආයතනය, වින්දිතයන් සමඟ සෘජුව සම්බන්ධවන අයගේ කුසලතා සහ විශේෂඥතාව ගොඩනැගීමට කැපවී සිටින අතර, දරුවන්ට නැවත යථාතත්ත්වයට පත් කිරීමට අවශ්‍ය හොඳම ගුණාත්මක රැකවරණය සහ සහාය සහතික කිරීම සහ ධනාත්මක සටන් උපාය මාර්ග ගොඩනැගීම වෙනුවෙන් ක්‍රියාත්මක වේ.

ළමා සාකල්‍ය සංවර්ධනය සඳහා හොඳම පරිසරය ගෘහ පරිසරය වන බවත්, ඕනෑම දරුවෙකුට ලබා දෙන අවසාන විසඳුම ආයතනික රැකවරණය විය යුතු බවත්, සේව් ද චිල්ඩ්‍රන්, අපි තරයේ විශ්වාස කරමු. ආයතනික සැකසුම් ඔවුන්ගේ වර්ධනයට සහ යහපැවැත්ම සඳහා එකම හිතකර පරිසරයක් ලබා නොදෙන බැවින්, ආයතනික රැකවරණයට ඇතුළත් වන දරුවන්ට අවාසියක් ඇත. මෙම සන්දර්භය තුළ, වින්දිතයන් සඳහා රැකවරණය සපයන්නන් දරුවන්ගේ වර්ධනයට සහ යහපැවැත්මට සෑම විටම ප්‍රමුඛත්වය දෙන බව සහතික කිරීම සඳහා සුදුසු නිපුණතාවලින් සන්නද්ධ වීම අතිශයින් වැදගත් වේ. ළමා සුරැකුම් ආයතනවල සුරැකුම්කාර්ය මණ්ඩලය සඳහා මෙම උසස් සහතිකය පිරිනැමීමට කොළඹ විශ්වවිද්‍යාලය සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට ලැබීම සම්බන්ධයෙන් අපි සතුටු වන්නෙමු, එය ආයතනික සැකසුම් තුළ දරුවන්ට සලකන, රැකබලා ගන්නා සහ සංවර්ධනය සහ දියුණුව සඳහා සහාය වන ආකාරය කෙරෙහි ගැඹුරු බලපෑමක් ඇති කරනු ඇතැයි අපි අපේක්ෂා කරමු.

විශේෂයෙන්ම නීතිය ක්‍රියාත්මක කිරීමට සහ සමාජ සේවා ශ්‍රම බලකායට ළමා අයිතිවාසිකම් පිළිබඳ ව්‍යුහාත්මක පුහුණුවක් ලබා දීමේදී, සේව් ද චිල්ඩ්‍රන් හට CSHR සමඟ සහයෝගීතාවයේ දිගු ඉතිහාසයක් ඇත. අපගේ මෑතකාලීන සහයෝගීතාවයන් ළමා ආරක්ෂණ නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය ඇතුළුව ළමා වෙළෙඳාමේ වින්දිතයින් හඳුනා ගැනීම සහ ඒවාට ප්‍රතිචාර දැක්වීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කර ඇති අතර, මෙම පාඨමාලාව සංවර්ධනය කර මෙම වසරේ පිරිනැමීමට හේතු විය.

කොළඹ විශ්වවිද්‍යාලය සමඟ ඇති හවුල්කාරිත්වය මම අවංකව පිළිගන්නා අතර අගය කරමි, උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය (විශේෂඥ වෛද්‍ය) එච්.ඩී. කරුණාරත්න, නීති පීඨයේ පීඨාධිපති මහාචාර්ය (ආචාර්ය) එන්. පුංචිහේවා සහ CSHR අධ්‍යක්ෂ, මහාචාර්ය (විශේෂඥ වෛද්‍ය) වසන්තා සෙනෙවිරත්න සහ කාර්ය මණ්ඩලය අපගේ සහයෝගීතා කටයුතු සඳහා ඔවුන්ගේ කැපවීම අගය කරමි. පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්, ගයනි විජේසිංහ මහත්මිය සහ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය මෙම පාඨමාලාවට තාක්ෂණිකව සහ පරිපාලනමය වශයෙන් සහයෝගය දැක්වීමට කැපවීම පිළිබඳව මම ස්තුතිවන්ත වෙමි. උසස් තත්ත්වයේ පුහුණු අවස්ථාවක් සංවර්ධනය කිරීමට සහ ලබා දීමට ඔවුන්ගේ වටිනා කාලය සහ විශේෂඥභාවය වෙනුවෙන් මම තාක්ෂණික සමාලෝචන කමිටුවට සහ ඇඳුරු මඩුල්ලට ස්තුතිවන්ත වෙමි. IOM සහ එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ, තැනැත්තන් වෙළෙඳාමට එරෙහිව සටන් කිරීමේ කාර්යාලයට මෙන්ම IOM, සේව් ද චිල්ඩ්රන්, සහ අනෙකුත් පාර්ශවකරුවන් විසින් ක්‍රියාත්මක කරන ලද 'IMPACT' ව්‍යාපෘතිය හරහා මෙම මුලපිරීම වෙනුවෙන් මූල්‍යමය වශයෙන් දැක්වීම සම්බන්ධයෙන් මම ස්තුතිවන්ත වෙමි.

සියලුම සහභාගිවන්නන්ට වඩාත් හොඳ ඉගෙනීමේ අත්දැකීමක් ලබාගත හැකිවේවා යැයි ප්‍රාර්ථනා කරන අතර, ළමා වෙළෙඳාමේ සියලුම වින්දිතයින් වෙනුවෙන් ධනාත්මක රැකවරණ පරිසරයක් සහතික කිරීම සඳහා මෙම පාඨමාලාව තුළ වර්ධනය කර ඇති කුසලතා ප්‍රායෝගිකව යොදාගනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි.

**ජූලියන් චෙල්ලප්පා**
ජාතික අධ්‍යක්ෂ
සේව් ද චිල්ඩ්රන් - ශ්‍රී ලංකා ජාතික කාර්යාලය

## සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධාන යේ පණිවිඩය (IOM)



හිතවත් සහභාගිවන්නනි,

මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය (CSHR) නීති පීඨය සමඟ එක්ව සකස් කරන ලද මානව හිමිකම් ප්‍රවේශය පදනම් කරගත් ළමා වෙළෙඳාමේ වින්දිතයින් පිළිබඳ සිද්ධි කළමනාකරණය සහ රැකවරණය සඳහා වූ ප්‍රවේශය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව වෙත සියලුම සහභාගිවන්නන් මම සාදරයෙන් පිළිගනිමි. කොළඹ විශ්වවිද්‍යාලය සහ සේව් ද චිල්ඩ්‍රන් එක්ව පිරිනමන මෙම පාඨමාලාව මගින් වඩාත් අවදානමට ලක්විය හැකි, ළමා වෙළෙඳාමේ වින්දිතයින් සඳහා ඵලදායි සිද්ධි කළමනාකරණයෙහි නියැලීමට සහ උපකාර කිරීමට, රාජ්‍ය සහ රාජ්‍ය නොවන සුරැකුම් ආයතනවල සුරැකුම් කාර්ය මණ්ඩලය 200ක් සඳහා අදාළ දැනුම හා කුසලතා ලබා දෙනු ඇතැයි මගේ විශ්වාසයයි.

තැනැත්තන් වෙළෙඳාම් කිරීම අපරාධයක් වන අතර, ජාවාරමට ගොදුරු වූවන්ට ඵලදායී ලෙස උපකාර කිරීම සඳහා එයට සම්බන්ධ සියලුම පාර්ශවකරුවන්ගේ පරිපූර්ණ, සම්බන්ධීකරණ සහ ක්‍රියාශීලී ප්‍රතිචාරයක් අවශ්‍ය වන අතර, වින්දිතයින් හඳුනා ගැනීම සහ ආරක්ෂා කිරීම පිළිබඳ ඒකාබද්ධ ක්‍රියාමාර්ග අත්‍යවශ්‍ය වේ. එක්සත් ජාතීන්ගේ සංක්‍රමණ ආයතනය වන සංක්‍රමණ සඳහා වන ජාත්‍යන්තර සංවිධානය (IOM), 2007 වර්ෂයේ සිට සිට ශ්‍රී ලංකාවේ ප්‍රති ජාවාරම සම්බන්ධයෙන් ක්‍රියා කරන අතර ශ්‍රී ලංකා රජය සමඟ සහයෝගයෙන් කටයුතු කරමින් 2010 වර්ෂයේ සිට ජාතික තැනැත්තන් වෙළෙඳාම් විරෝධී කාර්ය සාධක බලකාය පිහිටුවීම සඳහා තාක්ෂණික සහාය ලබා දීමට මූලික වී ඇත. තැනැත්තන් වෙළෙඳාම නිරීක්ෂණය කිරීම සහ මැඩපැවැත්වීම සඳහා අඛණ්ඩව පස් අවුරුදු ජාතික උපාය මාර්ගික ක්‍රියාකාරී සැලසුම් ද්විත්වයක් සංවර්ධනය කිරීම සහ තැනැත්තන් වෙළෙඳාමේ වින්දිතයින් හඳුනා ගැනීම, ආරක්ෂා කිරීම සහ යොමු කිරීම පිළිබඳ සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි (SOP) කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලදී. IOM විසින් සේව් ද චිල්ඩ්‍රන් සමග සහයෝගයෙන් කටයුතු කරන අතර, ළමා ජාවාරමට ගොදුරු වූ වින්දිතයන් හඳුනා ගැනීම ,යොමු කිරීම සහ ආරක්ෂා පිළිබඳ sop මාර්ගොපදේශ සටහන 2021 සංවර්ධනය කිරීමේදී කාන්තා හා ළමා කටයුතු අමාත්‍යයට තාක්ෂණික සහය ලබා දී ඇත.

එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ තැනැත්තන් වෙළෙඳාම අධීක්ෂණය කිරීම සහ ඒවාට එරෙහිව සටන් කිරීම සඳහා වන කාර්යාලයේ අරමුදල් සහාය ඇතිව, සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය විසින් සේව් ද චිල්ඩ්‍රන් සමඟ එක්ව රාජ්‍ය සහ රාජ්‍ය නොවන සුරැකුම් ආයතනවල සුරැකුම් කාර්යමණ්ඩල සාමාජිකයින් 200 දෙනෙකුට මෙම පාඨමාලාව නොමිලේ පිරිනැමීම සිදු කරයි (J/TIP).

මෙම උසස් සහතිකපත්‍ර පාඨමාලාව සඳහා සහභාගී වන සියලුම දෙනාට ඔවුන්ගේ රැකවරණය යටතේ සිටින ළමා වෙළෙඳාමේ වින්දිතයින් සඳහා ඵලදායී ලෙස සහාය වීමට සහ ආරක්ෂා කිරීමට අවශ්‍ය විශේෂඥ දැනුම වර්ධනය කර ගැනීම සඳහා සාර්ථක සහ ඵලදායී ප්‍රවේශයකට මම සුබ ප්‍රාර්ථනා කරමි.

**සරත් ඩෑෂ්**
සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානයේ ශ්‍රී ලංකාව සහ මාලදිවයිනේ දූත මණ්ඩල ප්‍රධානී

# කෙටියෙදුම්

| | |
|---|---|
| CRC | එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් සම්මුතිය |
| CSHR | මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය |
| CVoT | ළමා වෙළෙඳාමේ වින්දිතයින් |
| DPCCS | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව |
| ICD | ජාත්‍යන්තර රෝග වර්ගීකරණය |
| ILO | ජාත්‍යන්තර කම්කරු සංවිධානය |
| IOM | සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය |
| JMO | අධිකරණ වෛද්‍ය නිලධාරී |
| MHPSS | මානසික සෞඛ්‍යය සහ මනෝ සමාජීය සහාය |
| NCPA | ජාතික ළමා ආරක්ෂක අධිකාරිය |
| OHCHR | මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය |
| SAARC | කලාපීය සහයෝගීතාව සඳහා වූ දකුණු ආසියානු සංගමය |
| SCI | සේව් ද චිල්ඩ්‍රන් ඉන්ටර්නැෂනල් |
| TIP | තැනැත්තන් වෙළෙඳාම |
| TRC | තාක්ෂණික සමාලෝචන කමිටුව |
| UN | එක්සත් ජාතීන්ගේ සංවිධානය |
| UOC | කොළඹ විශ්වවිද්‍යාලය |
| UNTOC | අන්තර්ජාතික සංවිධානාත්මක අපරාධවලට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය |
| UNICEF | එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල |
| WHO | ලෝක සෞඛ්‍ය සංවිධානය |

## 1. කොළඹ විශ්වවිද්‍යාලය

1921 දී ආරම්භ කරන ලද කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාවේ පැරණිතම උසස් අධ්‍යාපන ආයතනයකි. සංස්කෘත භාෂාවෙන් ''ප්‍රඥාව ප්‍රබෝධමත්'' ලෙස පරිවර්තනය කර ඇති එහි ආදර්ශ පාඨයට අනුකූලව, කොළඹ විශ්වවිද්‍යාලය සෑම අධ්‍යයන ක්ෂේත්‍රයකම ශාස්ත්‍රීය විශිෂ්ටත්වය පවත්වා ගැනීමට අඛණ්ඩව උත්සාහ කරයි. විශ්වවිද්‍යාලය පීඨ 10 ක් සහ පීඨ තුළ පවතින අධ්‍යයන දෙපාර්තමේන්තු 68 කින් සාන්විත වන අතර, ආයතන 6 ක්, මණ්ඩපයක්, පාසලක් සහ මධ්‍යස්ථාන සහ ඒකක 20 කට අධික ප්‍රමාණයකින් සමන්විත වේ.

විශාල හා විවිධ වූ අධ්‍යයන ක්ෂේත්‍ර රාශියකට අමතරව, කොළඹ විශ්වවිද්‍යාලය පුස්තකාල සේවා, වෘත්තීය මාර්ගෝපදේශන, ක්‍රීඩා, ශිෂ්‍ය සංගම් සහ විශ්වවිද්‍යාලයෙ හි නවාතැන් යනාදී පහසුකම් සැපයීමද සිදු කෙරේ. අනෙකුත් පහසුකම් අතර සිසුන්ට ප්‍රසාංගික කලාවේ කුසලතා ප්‍රදර්ශනය කළ හැකි කලා රඟහලක් ද ඇතුළත් වේ.

සමාජ සංහිදියාව, සංස්කෘතික විවිධත්වය, සියලුම දෙනාට සමාන අවස්ථා සලසා දීම සහ විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය සහ සිසුන් අතර පවතින එකමුතුකම යන වටිනාකම් අවධාරණය කෙරෙණ බහු-සංස්කෘතික, බහු-වාර්ගික ආයතනයක් වීම පිළිබඳව විශ්වවිද්‍යාලය ආඩම්බර වේ. ජාත්‍යන්තර සිසුන් සඳහා ශිෂ්‍යත්ව ලබා ගත හැකි අතර, ස්වීඩනයේ උප්සලා විශ්වවිද්‍යාලය, ජර්මනියේ ස්ටස් ලිබිග් විශ්වවිද්‍යාලය, ඩෙන්මාර්කයේ කෝපන්හේගන් විශ්වවිද්‍යාලය, ජර්මනියේ හයිඩෙල්බර්ග් විශ්වවිද්‍යාලය, ස්විට්සර්ලන්තයේ සූරිච් විශ්වවිද්‍යාලය, එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගිණුම්කරණ ආයතනය (CIMA), ඕස්ට්‍රේලියාවේ බටහිර සිඩ්නි විශ්වවිද්‍යාලය, ඕස්ට්‍රේලියාවේ ක්වීන්ස්ලන්ඩ් විශ්වවිද්‍යාලය සහ ස්පාඤ්ඤයේ ග්‍රනාඩා විශ්වවිද්‍යාලය ඇතුළු විදේශීය විශ්වවිද්‍යාල සමඟ අධ්‍යයන හවුල්කාරිත්වයන් රාශියක් කොළඹ විශ්වවිද්‍යාලය සතුව පවතී.

කොළඹ විශ්වවිද්‍යාලය ශාස්ත්‍රීය අධ්‍යාපනයට අමතරව විවිධ ආකාරවලින් ශිෂ්‍ය ජීවිතය වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාකාරීව දායක වේ. වසර ගණනාවක් පුරා, අප ලබා දෙන අධ්‍යාපනයේ වටිනාකම ඉහළ නැංවීම සඳහා විශ්වවිද්‍යාලය කර්මාන්ත ක්ෂේත්‍රය සමඟ ශක්තිමත් සම්බන්ධතාවන් ගොඩනගාගෙන ඇත. එලෙසම විශ්වවිද්‍යාලය මඟින් ලබා දෙන ක්‍රීඩා පහසුකම් සිසුන්ට අධ්‍යාපනික හා සමාජ ජීවිතය සමබර කර ගැනීමට දිරි ගන්වන අතර, විශ්වවිද්‍යාල සිසුන් විසින් සෑම වසරකම ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ ජාතික හා ජාත්‍යන්තර ජයග්‍රහණ රැසක් වාර්තා කරයි.

**[වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර පිවිසෙන්න: https://cmb.ac.lk/]**

## 2. මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය

1991 දී ශ්‍රී ලංකාව තුළ පැවති පුළුල් මානව හිමිකම් කඩවීම්වලට ප්‍රතිචාර වශයෙන්, මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය (CSHR) පිහිටුවන ලදී. පුද්ගලයින්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් සඳහා වන පිළියම් පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ අරමුණ ඇතිව, කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨය තුළ ලාභ නොලබන සංවිධානයක් වශයෙන් CSHR පිහිටුවන ලදි. CSHR වසර 25කට අධික කාලයක් මානව හිමිකම් අධ්‍යාපනයේ පුරෝගාමියෙකු වශයෙන් කටයුතු කර තිබේ.

වෙනස්වන ගෝලීය තත්ත්වයන්ට ප්‍රතිචාර වශයෙන් එහි භූමිකාව වෙනස් වී ඇත. එක් කාලයකදී, සංගණනය ප්‍රකාශයට පත්කිරීමේ සිට මුදල් අච්චු ගැසීමේ ප්‍රකාශන හිමිකම පාලනය සහ කළමනාකාරණය කිරීම දක්වා දේශීය රාජකාරි ගණනාවක් සඳහා රාජ්‍ය දෙපාර්තමේන්තුව වගකිව යුතු විය. වර්තමානයේ එය ත්‍රස්තවාදයට එරෙහිව සටන් කිරීමට, විදේශයන්හි එක්සත් ජනපද අවශ්‍යතා ආරක්ෂා කිරීමට සහ වඩා නිදහස්, සමෘද්ධිමත් සුරක්ෂිත ලෝකයක් ගොඩනගන අතරම විදේශ ප්‍රතිපත්ති මුලපිරීම් ක්‍රියාත්මක කිරීමට ක්‍රියා කරයි.

CSHR අධ්‍යාපන වැඩසටහන් යටතේ සහතිකපත්‍ර පාඨමාලා, උසස් පුහුණු වැඩසටහන්, ඩිප්ලෝමා පාඨමාලා සහ පශ්චාද් උපාධි වැඩසටහන් ක්‍රියාත්මක වේ. CSHR අයිතිවාසිකම් සම්බන්ධයෙන් ප්‍රායෝගිකව අදාළ වන පර්යේෂණ සිදු කරන අතර අනෙකුත් සංවිධාන සඳහා පර්යේෂණ පැවැත්වීම ද සිදු කරයි. CSHR ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම මෙන්ම ඔවුන්ගේ පාර්ශවකරුවන්ගේ අයිතිවාසිකම් පිළිබඳව පාර්ශවකරුවන් දැනුවත් කිරීමේ අරමුණින් රාජ්‍ය සහ රාජ්‍ය නොවන අංශවල අයගේ ධාරිතාව ශක්තිමත් කිරීමේ වැඩසටහන් ද ක්‍රියාත්මක කරයි.

මානව හිමිකම් දැනුම සහ දැනුම් සේවා බෙදා හැරීමේදී පුළුල් පරාසයක මානව හිමිකම් සම්පත් වලින් පොහොසත් CSHR හි, සම්පත් මධ්‍යස්ථානය හරහා ධාරිතා වර්ධන වැඩසටහන් සඳහා ද පහසුකම් සපයයි. මෙහි ප්‍රතිලාභීන් අතර සිසුන්, විද්වතුන්, පර්යේෂකයන් සහ සාමාන්‍ය ජනතාව ඇතුළත් වේ.

2015 න් පසු ළමා අයිතිවාසිකම් ධාරිතා ගොඩනැගීම සම්බන්ධයෙන්, CSHR විසින් පහත වැඩසටහන් පවත්වන ලදී.

- SCI විසින් අරමුදල් සපයන NCPA සමඟ සහයෝගයෙන්, නිලධාරීන් 100 දෙනෙකු සඳහා මාස තුනක කාලයක් තුළ සකස් කරන ලද පුහුණු වැඩසටහනක්.
- SCI විසින් අරමුදල් සපයන ශ්‍රී ලංකාවේ ළමා සුභසාධනය පිළිබඳ පුහුණු වැඩසටහනක්.
- එක්සත් ජනපද තානාපති කාර්යාලය මගින් අරමුදල් සපයන වටරැක තරුණ පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ තරුණයින් සඳහා වූ වැඩසටහන
- පරිවාස දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 100ක් පුහුණු කිරීමේ වැඩසටහන

එමෙන්ම CSHR ආයතනික සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කරමින් කාර්ය මණ්ඩලයේ දැනුම, කුසලතා සහ හැකියාවන් වැඩිදියුණු කිරීමේ සහ CSHR හි හවුල්කරුවන්ට කාර්යක්ෂමව වැඩසටහන් බෙදා හැරීමේ අපේක්ෂාවෙන්, ඔවුන්ගේ ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරයි.

CSHR හි පරමාර්ථය වන්නේ සියලු මිනිසුන්ගේ ගෞරවයට සහ අයිතිවාසිකම්වලට ගරු කරන අයිතිවාසිකම් පිළිබඳ සවිඥානකත්වයක් ඇති ජාතියක් නිර්මාණය කිරීමයි.

## 3. පාඨමාලාව හැඳින්වීම

සේව් ද චිල්ඩ්‍රන් ශ්‍රී ලංකා (SC) හි මූල්‍ය අනුග්‍රහය සහ DPCCS හි සහය ඇතිව සිදු කරන ලද පරතර විශ්ලේෂණයක් මගින්, රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතනවල සුරැකුම් කාර්ය මණ්ඩලයට ළමා වෙළෙඳාමේ වින්දිතයින් රැකබලා ගැනීම සහ කළමනාකරණය පිළිබඳ මූලික අවබෝධයක් සහ පුහුණුවක් නොමැති බව CSHR විසින් හඳුනාගෙන ඇත. මෙම විශ්ලේෂණය කේන්ද්‍රගත වන්නේ ළමා වෙළෙඳාමේ වින්දිතයින් හඳුනා ගැනීමට සහ ඔවුන්ගේ රැකවරණය යටතේ සිටින දරුවන්ට ඵලදායි ආරක්ෂාවක් සැපයීම සඳහා ළමා ආරක්ෂණ රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතනවල සුරැකුම් කාර්ය මණ්ඩලයේ ධාරිතාව ඉහළ නැංවීමේ අත්‍යවශ්‍ය අවශ්‍යතාවයයි. මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සහ සේව් ද චිල්ඩ්‍රන් ශ්‍රී ලංකා යන ආයතන විසින් දැනුම, සේවා සහ ක්‍රියාවලීන්හි පවතින හිඩැස් හඳුනාගැනීම සහ ඒවා සකස් කරන ලද දියුණුවකින් විසඳා ගැනීම මූලික අරමුණ විය. ඒ අනුව, CSHR විසින් නීතිය, සමාජ විද්‍යාව, මනෝවිද්‍යාව, මනෝ-සමාජ සහය පිළිබඳ විශේෂඥයින් පිරිසකගේ මගපෙන්වීම යටතේ සහ DPCCS සහ NCPA හි, ආයතනික තාක්ෂණික සහය යටතේ, වින්දිත සේවාවන්ගේ ගුණාත්මකභාවය සහ ප්‍රවේශ්‍යතාව ඇතුළුව, වින්දිත සේවාවන් වැඩිදියුණු කිරීම සඳහා සිද්ධි කළමනාකරණය සහ ළමා වෙළෙඳාමේ වින්දිතයින් රැකබලා ගැනීම සඳහා මානව හිමිකම් ප්‍රවේශය මත පදනම් වූ මෙම උසස් සහතික පත්‍ර පාඨමාලාව නිර්මාණය කරන ලදී.

අධ්‍යාපන පොදු සහතිකපත්‍ර සාමාන්‍ය පෙළ (සාමාන්‍ය පෙළ) හෝ ඊට සමාන සුදුසුකමක් සම්පූර්ණ කර ඇති රාජ්‍ය සහ රාජ්‍ය නොවන සුරැකුම් මධ්‍යස්ථානවල සුරැකුම් කාර්ය මණ්ඩල සාමාජිකයින් 200ක් පුහුණු කිරීම සඳහා මෙම වැඩසටහන විශේෂයෙන් සැලසුම් කර ඇති අතර, SC හි නොමසුරු දායකත්වය යටතේ මෙම පාඨමාලාව නොමිලේ පිරිනැමේ.

**පාඨමාලා ව්‍යුහය**

මෙම පාඨමාලාව **ශ්‍රී ලංකා සුදුසුකම් රාමු මට්ටම** 2 (SLQF 2) හි සම්මාන වටිනාකම් පද්ධතිය මත පදනම්ව නිර්මාණය කර ඇති අතර එමගින් අපේක්ෂකයෙකුට, **මාස හයක** (මාස 06) කාලයක් තුළ ආයතනය විසින් ලබාදී තිබෙන විෂය ඒකක අටක් (08) සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් **අධ්‍යයන සම්භාර 15 ක්** හිමිකර ගැනීමට ඉඩ සලසයි.

මෙම පාඨමාලාව ළමා වෙළඳාමේ වින්දිතයින් කළමනාකරණය සහ රැකවරණය (CVoT) පිළිබඳ හැඳින්වීමකි. එය අදාළ ක්ෂේත්‍රවල මූලික කරුණු කෙරෙහි, විශේෂයෙන්ම ළමා අයිතිවාසිකම්, නීතිමය රාමුව, ළමා අපයෝජන, ළමා ආරක්ෂණය, රැකවරණ සැලැස්ම, ආතති කළමනාකරණය, CVoT අවබෝධ කර ගැනීම, CVoT හි සත්කාර අවශ්‍යතා, සිද්ධි කළමනාකරණය සහ වාර්තා තබා ගැනීම සම්බන්ධයෙන් අවධානය යොමු කරයි.

**මූල්‍ය සහයෝගය**

එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ පුද්ගල ජාවාරමට එරෙහි කාර්යාලය සහ සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානයේ (IOM) සහයෝගීතාවයෙන් අරමුදල් සපයනු ලබන, තැනැත්තන් වෙළෙඳාමට එරෙහිව සටන් කිරීමට සහ වැඩි බලපෑමක් ඇති කිරීමට රජයේ සහ සිවිල් සමාජ සංවිධාන වල හැකියාව ශක්තිමත් කිරීමේ (IMPACT) ව්‍යාපෘතිය යටතේ, සේව් ද චිල්ඩ්‍රන් හි සහාය ඇතිව තෝරාගත් සුරැකුම් කාර්ය මණ්ඩල සාමාජිකයින් 200ක් සඳහා මෙම පාඨමාලාව නොමිලේ ප්‍රධානය කෙරෙනු ඇත. විශ්වවිද්‍යාලයේ දේශන පැවැත්වෙන විට ප්‍රවාහන ගාස්තු සහ දිවා ආහාරය සඳහා මෙන්ම, පාඨමාලාව සම්බන්ධ දේශන අන්තර්ජාලය හරහා පවත්වන විට දත්ත පිරිවැය සඳහා ද කොළඹ විශ්වවිද්‍යාලය ඔබට සහාය දක්වයි.

## 4. පාඨමාලාවේ අන්තර්ගතය

**මානව හිමිකම් ප්‍රවේශය පදනම් කරගත් ළමා වෙළෙඳාමේ වින්දිතයින් පිළිබඳ සිද්ධි කළමනාකරණය සහ රැකවරණය සඳහා වූ ප්‍රවේශය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව**

**(SLQF මට්ටම 2/ අධ්‍යයන සම්භාර 15/ පැය 60)**

| අංකය | මොඩියුල / මූලික ඒකක | සම්මාන වටිනාකම |
|---|---|---|
| 1. | පළමු මොඩියුලය<br>ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රධාන මූලධර්ම | 02 |
| 2. | දෙවන මොඩියුලය<br>නීතිමය රාමුව | 01 |
| 3. | තෙවන මොඩියුලය<br>ළමා වෙළෙඳාමේ වින්දිතයින් සහ වෙනත් අපචාරවලට ගොදුරු වූ ළමා වින්දිතයන් හඳුනා ගැනීම | 02 |
| 4. | සිව්වන මොඩියුලය<br>ළමා වෙළෙඳාම සහ වෙනත් ආකාරයේ අපචාරයන්ට ලක්වූ වින්දිතයින්ගේ රැකවරණ අවශ්‍යතා | 02 |
| 5. | පස්වන මොඩියුලය<br>ළමා වෙළෙඳාමේ වින්දිතයින්ගේ අභියෝගාත්මක හැසිරීම් සහ අවදානම් කළමනාකරණය කිරීම | 02 |
| 6. | හයවන මොඩියුලය<br>ළමා ආරක්ෂණ සිද්ධි කළමනාකරණය සහ වාර්තා තබා ගැනීම සඳහා සහාය වීම | 02 |
| 7. | සත්වන මොඩියුලය<br>පුද්ගල රැකවරණ සැලැස්ම සහ නැවත සමාජගත කිරීම | 02 |
| 8. | අටවන මොඩියුලය<br>ස්වයං රැකවරණය සහ රැකවරණ සපයන්නාගේ ආතති කළමනාකරණය | 02 |
| සමස්ත සම්මාන ප්‍රමාණය | | 15 |

# 4.1. ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රධාන මූලධර්ම

## පාඨමාලා අන්තර්ගතය

මෙම පාඨමාලාව ළමා අයිතිවාසිකම් ක්ෂේත්‍රය පිළිබඳ හැඳින්වීමකි. එහි මූලික සංකල්ප, ඓතිහාසික පසුබිම සහ නීතිමය රාමුව එය දරුවන්ට සේවා සැපයීමට අවශ්‍ය කුසලතා වර්ධනය කිරීමට මෙන්ම ළමා අයිතිවාසිකම් පිළිබඳ පුළුල් දැනුමක් ලබා ගැනීමට සැලසුම් කර ඇත.

## ඉගෙනුම් අරමුණු:

- ළමා වෙළෙඳාම පිළිබඳව සහභාගිවන්නන් දැනුවත් කිරීම සහ වින්දිතයින්ට උපකාර කිරීමේ ක්‍රම හඳුන්වා දීම.
- ළමයා යනු කවුරුන් ද යන්න නිර්වචනය සහ ළමා අයිතිවාසිකම් මොනවාද යන්න (සංවර්ධනයේ අයිතිය, පැවැත්මේ අයිතිය, සහභාගී වීමේ අයිතිය සහ ආරක්ෂාව සඳහා ඇති අයිතිය ඇතුළුව) පිළිබඳව සහභාගිවන්නන් දැනුවත් කිරීම.
- ආයතනික රැකවරණයේ සිටින දරුවන්ගේ අයිතිවාසිකම් තහවුරු කිරීම.
- ළමා සංවර්ධන මධ්‍යස්ථානවල සිටින සියලුම දරුවන්ට සුදුසු පරිසරයක් නිර්මාණය කිරීම.

## 4.1.1. ළමයා නිර්වචනය කිරීම හා ළමා අයිතිවාසිකම්

ළමයා යන්න නිර්වචනය කිරීමේදී ජාත්‍යන්තර වශයෙන් පිළිගනු ලබන්නේ 1989 වසරේදී එක්සත් ජාතීන්ගේ සම්මුතිය විසින් අර්ථකතනය කරන ලද නිර්වචනයයි.

ඊට අනුව ළමයෙකු යන්නෙන් එම ළමයාට අදාල නීතිය යටතේ වයස අවුරුදු 18 ට පෙර ඔහු වයස් පූර්ණත්වය ලබන්නේ නම් මිස ,වයස අවු:18 ට අඩු සෑම මනුෂ්‍යකුම ළමයා ලෙස සැලකේ - (ළමා අයිතිවාසිකම් සම්මුතිය 1 වන ව්‍යවස්ථාව)

ලංකාවේ ක්‍රියාත්මක විවිධ නීති , අනපනත් හා අඥාපනත් වල ළමයා යන්නෙහි අර්ථකතනයෙහි වෙනස්වීම් දක්නට ලැබේ.

උදා:-

1. අධ්‍යාපන ආඥාපනත - ළමයා අවු:16 ට අඩු
2. ළමයින් සහ යෞවනයින් පිළිබඳ ආඥාපනත - ළමයා අවු:16 ට අඩු
3. කාන්තාවන් හා ළමයින් සේවයේ යෙදවීම පිළිබඳ ආඥාපනත - ළමයා අවු:16 ට අඩු

ළමා අයිතිවාසිකම් යනු ළමයෙකු වීම නිසාම නෛසර්ගිකව ළමයෙකුට හිමි වන අයිතිවාසිකම්ය. ළමා අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය ලෙස පිළිගනු ලබන්නේ එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියයි. වැඩිම රටවල් සංඛ්‍යාවක් අත්සන් තබා පිළිගෙන ඇති ලියවිල්ලක් වන මෙහි වගන්ති 54 ක් ඇතුලත්ය.

මෙහි 1-40 දක්වා වූ ව්‍යවස්ථා ළමුන්ගේ අයිතිවාසිකම්ද

41-45 දක්වා වූ ව්‍යවස්ථා සම්මුතිය ක්‍රියාත්මක කිරීම, පරීක්ෂා කිරීම හා ඒ අදාල වාර්තාකරණ ක්‍රියාවලිය ද

46-54 දක්වා වූ ව්‍යවස්ථා සම්මුතිය වලංගුවීම සඳහා රජයක් විසින් ඉටුකල යුතු කාර්යයභාරය හා සම්මුතියට අදාලව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ පරිපාලන ක්‍රියාවලිය ද දක්වා ඇත.

ළමා අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය සැලකිල්ලට ගනිමින් ලංකාව ඊට අනුගතවෙමින් ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියක් සකස් කර ඇත .

එයට අනුව, ළමුන්ට හිමි අයිතිවාසිකම් පහත දැක්වේ

1 ව්‍යවස්ථාව - ළමයෙකු යන්නෙහි අර්ථකථනය

2 ව්‍යවස්ථාව - වෙනස්කොට නොදැක්වීම

3 ව්‍යවස්ථාව - ළමයාගේ උපරිම යහපත

4 ව්‍යවස්ථාව - අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම

5 ව්‍යවස්ථාව - දෙමාපියන්ගේ මග පෙන්වීම සහ ළමයාගේ දක්ෂතා විකසනය

6 ව්‍යවස්ථාව - ජීවිතයට, උත්ජීවනයට සහ වර්ධනයට ඇති අයිතිය

7 ව්‍යවස්ථාව - නාමය හා ජාතිය

8 ව්‍යවස්ථාව - අනන්‍යතාවය ආරක්ෂා කිරීම

9 ව්‍යවස්ථාව - දෙමාපියන්ගෙන් වෙන් කිරීමේ ආරක්ෂාව

10 ව්‍යවස්ථාව - පවුල නැවත එක් කිරීම

11 ව්‍යවස්ථාව - අපහරණය කිරීමෙන් ආරක්ෂාව

12 ව්‍යවස්ථාව - අදහස් සඳහා ඇති අයිතිය

13 ව්‍යවස්ථාව - ප්‍රකාශ කිරීමේ නිදහස

14 ව්‍යවස්ථාව - සිතීමේ නිදහස,හෘදය සාක්ෂියේ නිදහස හා ආගමික නිදහස

15 ව්‍යවස්ථාව - ආශ්‍රය කිරීමේ නිදහස

16 ව්‍යවස්ථාව - පෞද්ගලිකත්වය සම්බන්ධයෙන් ආරක්ෂාව

17 ව්‍යවස්ථාව - උචිත තොරතුරු වලට ප්‍රවේශය

18 ව්‍යවස්ථාව - ජාතිකානුරාගය ප්‍රවර්ධනය කිරීම

19 ව්‍යවස්ථාව - ප්‍රචණ්ඩත්වයෙන්, අපයෝජනයෙන් හා නොසලකා හැරීමෙන් ආරක්ෂා වීම

20 ව්‍යවස්ථාව - පවුලෙන් වෙන් වූ ළමයාගේ ආරක්ෂාව

21 ව්‍යවස්ථාව - දරුකමට හදාවඩා ගැනීම

22 ව්‍යවස්ථාව - සරණාගත ළමයින්

23 ව්‍යවස්ථාව - ආබාධ සහිත බවට පත් වූ ළමයින්

24 ව්‍යවස්ථාව - සෞඛ්‍ය සහ සෞඛ්‍ය සේවා

25 ව්‍යවස්ථාව - ඒකවරණය පසුවිපරම් කිරීම

26 ව්‍යවස්ථාව - සමාජ ආරක්ෂණ ක්‍රියාමාර්ග

27 ව්‍යවස්ථාව - ජීවන තත්වය

28 ව්‍යවස්ථාව - අධ්‍යාපනයට ඇති අයිතිය

29 ව්‍යවස්ථාව - අධ්‍යාපනයේ අරමුණු

30 ව්‍යවස්ථාව - සුළු ජන කොටස් වල ළමයින්

31 ව්‍යවස්ථාව - විවේක කාලය,විනෝදාත්මක සහ සංස්කෘතික කටයුතු

32 ව්‍යවස්ථාව - ළමා ශ්‍රමයෙන් ආරක්ෂා කිරීම

33 ව්‍යවස්ථාව - මත් ද්‍රව්‍ය අනිසි ලෙස භාවිතා කිරීම සහ ජාවාරම් කිරීම

34 ව්‍යවස්ථාව - ලිංගික වශයෙන් අයුතු ලෙස යෙදවීමෙන් ආරක්ෂා කිරීම

35 ව්‍යවස්ථාව - විකිණීමෙන් හා පැහැරගෙන යාමෙන් ආරක්ෂා කිරීම

36 ව්‍යවස්ථාව - වෙනත් අයුතු ලෙස යෙදවීමෙන් /සූරාකෑමෙන් ආරක්ෂා කිරීම

37 ව්‍යවස්ථාව - පුනුරුත්ථාපන රැකවරණය

38 ව්‍යවස්ථාව - සන්නද්ධ ගැටීම් වලින් ආරක්ෂාව

39 ව්‍යවස්ථාව - කම්පන තත්ත්වයන්ගෙන් මිදී යථා තත්වයට පත්වීම

40 ව්‍යවස්ථාව - බාලක යුක්තිය

ළමා අයිතිවාසිකම් අධ්‍යයනය කිරීමේ පහසුවට ප්‍රධාන කොටස් 4 කට බෙදිය හැකිය. අධ්‍යනයේ පහසුවට එසේ බෙදා දැක් වුවද මේ සෑම අයිතිවාසිකමක්ම එකිනෙක හා අන්තර් සබඳතාවයක් පවතී.

| | |
|---|---|
| ආරක්ෂාව | පැවැත්ම |
| සංවර්ධනය | සහභාගීත්වය |

## 4.1.2. ළමා අයිතිවාසිකම් අධ්‍යයනය කිරීමේ අරමුණු

- හිමිකම් පාදක ප්‍රවේශය (Right based approach) තුළ දරුවාට හිමි අයිතිවාසිකම් ලබා දීම ආයතනික කාර්යය මණ්ඩලයේ වගකීමක් වීම.
- ළමුන්ගේ උපරිම සේවය සැලසීමට නම් ඔවුන්ට හිමි අයිතිවාසිකම්/හිමිකම් පිළිබඳ දැණුම අවශ්‍ය වීම.
- ආයතනගත දරුවන් අඩු වරප්‍රසාදිත මෙන්ම අවදානම් සහිත දරුවන් වීම.
- යහපත් පුරවැසියෙකු ලෙස දරුවාව සමාජගත කිරීමට නම් ඔවුන්ට හිමි අයිතිවාසිකම් උරුමකල යුතු දෙයක් වීම. ඊට හේතුව දරුවාට අද සලකන ආකාරය ඔවුන් අනාගතයේදී සිදුකරන හැසිරීම්වලට සෘජුවම බලපායි.
- ආහාර,පාන පෝෂණය වැනි කායික අවශ්‍යතා පමණක් නොව ආදරය, රැකවරණය, සහභාගීත්වය වැනි මානසික අවශ්‍යතා ද ලබා දීම වැදගත්වීම.
- දරුවන්ට අයිතිවාසිකම් හිමි නොවීම තුළ ගොඩනැගෙන දුර්වල පෞරුෂත්වය හඳුනා ගැනීම.
- ඒකාබද්ධව කටයුතු කිරීමෙන් දරුවාගේ සමස්ත සංවර්ධනයට හේතු වන දායකත්වය ලබා ගත හැකි බව පෙන්වාදීම.
- ළමා අයිතිවාසිකම් පිළිබඳ මූලධර්මයන්ට අනුගතව ක්‍රියා කිරීම තුළ සෑම දරුවෙකුටම සමානව සැලකීම වැදගත් බව පෙන්වා දීම.
- ආයතනගතව සිටින දරුවන්ගේ සහභාගීත්වය ඔවුන් සම්බන්ධ කටයුතු වලදී ලබා ගැනීමේ වැදගත්කම පෙන්වා දීම.
- තනිව තීරණ ගත නොහැකි වැඩිහිටි මගපෙන්වීම යටතේ සිටිමින් යැපෙන එහෙත් විකසනය වන පෞරුෂත්වයකට හිමිකම් කියන මනුෂ්‍ය ජීවියෙකු වීම.

### 4.1.3. ළමා අයිතිවාසිකම් සම්මුතියේ ප්‍රධාන මූලධර්ම

- දරුවාගේ උපරිම යහපත (3 වන ව්‍යවස්ථාව)
- වෙනස්කොට නොසැලකීම (2 වන ව්‍යවස්ථාව)
- ජීවත්වීමට,පැවැත්මට හා සංවර්ධනයට ඇති අයිතිය (6 වන ව්‍යවස්ථාව)
- සහභාගීත්වයට ඇති අයිතිය (12 වන ව්‍යවස්ථාව)

### 4.1.4. දරුවන් අවදානමට ලක්වීමට බලපාන ප්‍රධාන හේතු

**මේ කෙරෙහි සමාජ, ආර්ථික, සංස්කෘතික මෙන්ම මනෝ විද්‍යාත්මක කරුණු රැසක් බලපායි.**

**සමාජ සාධක**

- දෙමාපියන්ගේ වෙන්වීම් / දික්කසාදවීම් / වියෝවීම් / නොසලකා හැරීම්
- දරුවන්ගේ අවශ්‍යතා, වර්ධනය,පිළිබඳ දෙමාපියන්ගේ නොදැනුවත්භාවය
- දිළිඳුකම/සේවා වියුක්තිය වැනි සමාජ අවාසිදායක තත්වයන්
- බිඳුනු පවුල්/පවුල් විසිර යාම්
- ප්‍රජාව තුළ හිංසනය
- අනතුරුදායක අසල්වාසීන්/පරිසරය
- දරුවන්ට එරෙහි හිංසනවල සංකීර්ණතාවය පිළිබඳ දෙමාපිය නොදැනුවත්කම
- අන්තර්ජාලය, ජංගම දුරකතන, ඩිජිටල් මාධ්‍ය පිළිබඳ දෙමාපිය නොදැණුවත්භාවය
- අයහපත් දෙමාපිය සබඳතා /සෘණාත්මක අන්තර්ක්‍රියා

**ආර්ථික සාධක**

- මව විදෙස් ගතවීම
- ළමා ශ්‍රමිකත්වය/කුට්ටනයට ලක්වීම
- පවුලේ ආදායම හා වියදම සැලසුම් කිරීමට සමත් දැනුමක් නොවීම
- ක්ෂණික මුදල් ඉපයීමේ ආශාවන්
- මූලික භෞතික පහසුකම් නොමැතිවීම
- යැපුම් මානසිකත්වය
- දේපල උරුම කිරීම් පිලිබඳ ගැටළු
- සමාජ විරෝධී හා නීති විරෝධී ජීවනෝපායන්
- දිළිඳුකම ඇතිකරන පීඩනයන් /ශක්තිමත්ආදායමක් නොමැතිවීම

**සංස්කෘතික සාධක**

- අනන්‍යතා අර්බුද
- සමාජ සම්මතයන්, හානිකර පිළිවෙත් හා සංස්කෘතික භාවිතයන්
- කුල ප්‍රශ්න
- නිවැරදි කිරීම් ක්‍රමයක් ලෙස ශාරීරික දඬුවම් කිරීම පිළිබඳ විශ්වාසයන්
- විවිධ ආගම් හා බැඳුනු චාරිත්‍ර හා සම්ප්‍රදායන් අන්ධානුකරණය
- ළමා විවාහ
- සමාජය තුළ ස්ත්‍රී පුරුෂ අසමානතාවය

**මනෝවිද්‍යාත්මක සාධක**

- චිත්තවේග පාලනය දුර්වලවීම
- දෙමාපියන් විසින් දරුවන්ට අසමානව සැලකීම
- විෂාදය හෝ වෙනත් මානසික සෞඛ්‍ය ප්‍රශ්න ඇතුළුව දෙමාපියන්ගේ ආතතිය හා දොම්නස
- ගෘහස්ථ හිංසනය හා ගැටුම් පිළිබඳ ඉතිහාසය
- ළමා කාලයේ හිංසනයන්ගෙන් වින්දිතයන් වූ දෙමාපියන්
- දරුවන්ගෙන් අන්තවාදී සහ නුසුදුසු අපේක්ෂාවන් දෙමාපියන් බලාපොරොත්තු වීම (දරුවන් පිළිබඳව දෙමාපියන්ගේ අධි අපේක්ෂා හා බලාපොරොත්තු)
- අනියම් සහකරුවන්ගේ හිංසනයන්ට දරුවන් නිරාවරණය වීම
- සමාජ විරෝධී චර්යා
- පහත් ස්වඅභිමානය
- ජීවන කුසලතා නොමැතිවීම
- දරුකමට හදාගත් දරුවන් වෙත දක්වන වෙනස්කොට සලකන ආකල්ප

## 4.1.5. අවදානම් දරුවන් සඳහා මැදිහත්වීමේ ක්‍රමවේද

දරුවාගේ අවදානම් තත්වය නිවැරදිව තක්සේරු කර ගැනීම ඉතා වැදගත්. දරුවාගේ අවදානම් තත්වය පහල,මැදි හෝ ඉහල අවදානම් තත්වයක්ද යන්න තක්සේරු කර ගැනීම දරුවාට සිදුකරන මැදිහත්වීම නිවැරදිව සිදුකිරීමට අවශ්‍ය වේ.

**තක්සේරු ක්‍රමවේද**

1.නිරීක්ෂණ 2.සම්මුඛ සාකච්ඡා 3. කණ්ඩායම් සාකච්ඡා 4. විවිධ ආකෘති

**තක්සේරු මෙවලම්**

1.පවුල් ගස 2. ඓතිහාසික පැතිකඩ 3. පාරිසරික සිතියම 4. හැකියා සිතියම 5. ජීවන අත්දැකීම්

මෙමගින් හඳුනාගන්නා සාධක වලට අනුව දරුවාට සිදුකරන බලපෑම තක්සේරු කර

සිද්ධි සම්මන්ත්‍රණ පැවැත්වීම /පවුල් හමු පැවැත්වීම තුළින් ආරක්ෂණ සැලසුම් සකස් කර බහු ආංශික ප්‍රවේශයක් තුළින් මැදිහත්වීම ඉහල අවදානම් සහිත දරුවන්ට සිදු කිරීම, මෙන්ම පහල/මැදි අවදානමින් යුතු දරුවන් සඳහා පුද්ගලික සංවර්ධන සැලසුම් සකස් කර ක්‍රියාවට නැංවීම වැදගත්වේ (මෙම තාක්ෂණික ක්‍රමවේදයන් පිලිබඳව පුහුණුකරුවන් අවබෝධය ලබා දිය යුතුය).

ආරක්ෂණ සැලසුම හෝ පුද්ගල සංවර්ධන සැලැස්ම පසුවිපරම් කිරීම/ නියාමනය කිරීම හා අවශ්‍ය අවස්ථාවල සංශෝධනය කරමින් යාවත්කාලීන වූ සේවාවක් සැපයීම.

## 4.1.6. ආයතනගත දරුවන් වෙනුවෙන් සේවාසම්පාදකයින්ගේ වගකීම්

අවදානමට ලක් වූ දරුවන් පිරිසකට සේවා සම්පාදනය කරන පිරිසක් ලෙස ආයතනික කාර්යය මණ්ඩලයට මෙම දරුවන් විෂයෙහි විශාල වගකීමක් පැවරේ. දරුවන්ගේ කායික,මානසික, සමාජයීය මෙන්ම අධ්‍යාත්මික අවශ්‍යතා සියළු දරුවන්ට සමාන වන සේ ලබා දීමේ මූලික වගකීම මෙම කාර්යය මණ්ඩලයට හිමිවේ.

ඒ අනුව ,

- අවදානමට ලක්වූ දරුවන්ට සේවා සම්පාදනය පිළිබඳ කුසලතාවය ඇති කර ගැනීම.
- ළමා මනෝවිද්‍යාව, චර්යා හැඩගැස්වීම, කණ්ඩායමක් ලෙස කටයුතු කිරීම පිළිබඳ පුහුණුව හා අත්දැකීම් හුවමාරුව.
- කිසියම් හේතුවක් නිසා දරුවන් ආයතනගතවුව ද එම දරුවන් හැකි ඉක්මනින් සමාජගත කිරීමේ කාර්යයට තම උපරිම දායකත්වය ලබා දීමට කටයුතු කිරීම.
- යහපත් පුරවැසියෙකු ලෙස සමාජයේ ජීවත්වීමට අවශ්‍ය කුසලතා,පුහුණුව දරුවන්ට ලබා දීම.
- ආයතනගතව සිටින කාලසීමාව තුළ දරුවන්ට ජීවනකුසලතා හැකි සෑම විටම ලබා දීමට කටයුතු කිරීම.
- හැකි සෑම විටම දරුවන්ට බාහිර සමාජය හා මුසු වීමට අවස්ථාව ලබා දීමට කටයුතු කිරීම.
- දරුවන් සම්බන්ධ කටයුතු වලදී තීරණ ගැනීමේ ක්‍රියාවලියට දරුවන් සම්බන්ධ කර ගැනීම.
- ආයතනික කාර්යය මණ්ඩලය දරුවන්ට ආදර්ශමත් ලෙස සැමවිටම කටයුතු කිරීම.
- ආයතනික කාර්යය මණ්ඩලයේ කාර්යයන් නිශ්චිත ලෙස හඳුනා ගැනීම,ක්‍රියා කිරීම හා නිරතුරු සමාලෝචනය කිරීම.
- දරුවන් විෂයෙහි හැසිරීම /කටයුතු කිරීම පිළිබඳ ගැටළු හඳුනාගත්විට ඒ සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන් දැනුවත් කර අවශ්‍ය දායකත්වය ලබා ගැනීම.
- තම විෂය සංවර්ධනය කිරීමට අවශ්‍ය දායකත්වය ලබා දිය හැකි සෑම විටම තම අත්දැකීම් තුළින් ලබා දී දරුවන්ට සපයන සේවාවේ ප්‍රශස්ථ බව වර්ධනය කිරීමට කටයුතු කිරීම.
- දරුවන්ට අනාගත ජීවිතය සාර්ථක කර ගැනීමට අධ්‍යාපනය /වෘත්තීය පුහුණුව අඛණ්ඩව ලබා දීමට කටයුතු කිරීම හා දරුවන්ගේ නිත්‍යානුකූල (තාවකාලික වුව) භාරකරු ලෙස සෑම විටම පෙනී සිටීම.
- ආයතනික කමිටු රැස්වීම් සඳහා සක්‍රිය සහභාගීත්වය ලබා දීම.

## 4.1.7. ළමුන්ගේ වගකීම්

දරුවන්ගේ අයිතිවාසිකම් පමණක් කියා දීමෙන් ඔවුන් ඉල්ලීම් වෙනුවෙන් පමණක් සටන් කරන යුතුකම්, වගකීම් පැහැර හරින පිරිසක් බවට පත්වේ.එම නිසා ඒ ඒ වයසට ගැලපෙන අයුරින් දරුවන්ගේ මානසික මට්ටම් හොඳින් තේරුම් ගෙන වගකීම් පිළිබඳ අවබෝධයක් දරුවන්ට ලබා දිය යුතුය.

- අධ්‍යාපනය/වෘත්තීය පුහුණුව නිසි පරිදිලබා ගැනීම.
- තම කටයුතු තනිව ඉටු කිරීම - පුද්ගලික පවිත්‍රතාව/තමා අවට පරිශ්‍රය පිරිසිදුව තබා ගැනීම (වයසට සරිලන සේ)
- චිත්තවේග පාලනය - අන් අයට හානියක් නොවන සේ හැසිරීම.
- තම සිරුර ආරක්ෂා කර ගැනීමේ වගකීම (හොඳ හා නරක ස්පර්ශය පිළිබඳව අවබෝධයෙන් කටයුතු කිරීම)
- තමා වෙත ලැබෙන ද්‍රව්‍ය /භාණ්ඩ/ සේවා අරපිරිමැස්මෙන් හා සුරක්ෂිතව භාවිතා කිරීම වගකීමක්/ පුරුද්දක් බවට පත් කර ගැනීම.
- ආයතනය තම නිවස සේ හා ආයතනික කාර්යය මණ්ඩලය හා සෙසු සාමාජිකයන් නිවැසියන් සේ සලකා කටයුතු කිරීම.

### 4.1.8. ආයතනගත දරුවන් වර්ගීකරණය

භාරය හා ආරක්ෂාව අවශ්‍ය ළමුන් ලෙස දරුවන් ආයතනගතවුවද ඔවුන් සියළු දෙනාම එකම කාණ්ඩයකට අයිති නොවේ.

- අනාථ දරුවන්
- අත්හල දරුවන්
- අසරණ දරුවන්
- නීතිය හා ගැටුණු දරුවන්
- වින්දිත දරුවන්
- වැරදිකරුවන් වු දරුවන්

### 4.1.9. ආයතන තුළ බහුවිධ ප්‍රවේශයෙන් දරුවන් සඳහා සේවය සැපයීම

දරුවන්ට සේවා සම්පාදනය පරිපූර්ණ වීමට නම් දරුවාගේ සෑම ගැටළුවකටම විසඳුම් සැපයෙන බහු විධ මැදිහත්වීමකින් සිදුවීම වැදගත්වේ. ඒ සඳහා සියළු ආයතන/නිලධාරීන් /සංවිධාන සමග හොඳ සම්බන්ධතාවයක් පවත්වා ගැනීමට කටයුතු කල යුතු වේ. උදා:-

| ගැටළුව /අවශ්‍යතාවය | මැදිහත්වීම |
|---|---|
| අධ්‍යාපනය ලැබීම | පාසල/අධ්‍යාපන අමා:/ප්‍රා.ලේ.කාර්යාලය |
| උප්පැන්න සහතිකය නොමැතිවීම | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය/රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපා:/රෝහල |
| අකුරු හඳුනා ගැනීමට දුෂ්කර වීම | සාක්ෂරතා පංති/ප්‍රජා මූල සංවිධාන/අනුග්‍රාහකයො |
| සමාජගත කිරීම | ආයතනික කමිටුවට කැඳවන නිලධාරින් /ආයතන |
| සෞඛ්‍යමය ගැටළු | රෝහල/රාජ්‍ය නොවන සංවිධාන |
| ළමා සමාජ සඳහා සහභාගීවීම | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය/පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු |
| නිවසක් නැතිකම/ආදායම් මාර්ගයක් නැතිකම | රාජ්‍ය නොවන සංවිධාන/අනුග්‍රාහකයන් /පරිත්‍යාගශීලින් |

### 4.1.10. ආයතනය තුළ ළමා සහභාගීත්වය තහවුරු කිරීම.

- දරුවන් සම්බන්ධ තීරණ ගැනීමේදී දරුවාව ඊට හවුල් කර ගැනීම.
- ආයතන තුළ සිදුකරන කටයුතු වලදී දරුවන් සම්බන්ධ කර ගැනීම (උදා:- දරුවන්ගේ ආහාර වට්ටෝරු පිලියෙල කිරීම/ශ්‍රමදාන/ විනෝද චාරිකා යාම) .
- දරුවාට ආයතනය තුළ වයසට ගැලපෙන ලෙස වගකීම් පැවරීම (දඬුවමක් ලෙස නොව යහපත් චේතනාවෙන්).
- ළමා සමාජ/ යෞවන සමාජ/ සාහිත්‍ය සමිති වැනි ළමා ක්‍රියාකාරකම් සහිත කටයුතු සංවිධානය කිරීම.
- බාහිරින් පැමිණෙන පුද්ගලයින් සමග යහපත් සබඳතා ඇති කර ගැනිමට අවස්ථාව ලබා දීම.
- දරුවන් අකමැති චර්යා කිරීමට බලහත්කාරයෙන් දිරිමත් නොකිරීම.
- දරුවන්ගෙ අභිමානය රැකෙන අයුරින් කටයුතු කිරීම (දරුවන්ට ආහාර බාහිරින් ලැබෙන අවස්ථාවල පිං පැමිණවීම/දානය වැනි වචන ප්‍රතික්ෂේප කිරීමට දරුවන්/ප්‍රජාව බලගැන්වීම).

- බාහිර සමාජයේ දරුවන් හා සම්මිශ්‍රවීමට අවස්ථා ලබා දීම.
- ආයතනික පරිපාලනය සඳහා දරුවන්ගේ නියෝජනයක් ලබා ගැනීම.
- දරුවන්ට හැකි සෑම විටම කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීමට අධීක්ෂණයක් සහිතව අවස්ථා සකසා දීම.
- නායකත්වයට දරුවන්ට අවස්ථාව සැලසීම.

**නිර්දිෂ්ට කියවීම්:**

Child Rights Convention. https://www.ohchr.org/Documents/ProfessionalInterest/crc.pdf

Optional protocols. https://www.ohchr.org/en/instruments-mechanisms/instruments/optional-protocol-convention-rights-child-sale-children-child

CRC country reports/ concluding observations.
https://www.mfa.gov.lk/wp-content/uploads/2018/03/CRC-4.pdf

Guidance notes on the identification protection and referral of child victims of trafficking.
https://resourcecentre.savethechildren.net/pdf/Guidance-Note-on-the-Identification-Protection-and-Referral-of-Child-Victims-of-Trafficking.pdf/

Guidelines for law enforcement officials on interviewing Child Victims of Trafficking.
https://resourcecentre.savethechildren.net/pdf/Guidelines-for-Law-Enforcement-Officials-on-Interviewing-Child-Victims-of-Trafficking.pdf/

National case management on all forms of violence. chrome-
https://bettercarenetwork.org/sites/default/files/2022-02/English_Report.pdf

**********************

## 4.2. නීතිමය රාමුව

**පාඨමාලා විස්තරය:**

රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ළමා සුරැකුම් ආයතන කළමනාකරණය සහ සේවා සැපයීම, ළමා වෙළෙඳාමේ වින්දිතයින් සහ ඔවුන්ගේ පවුල් සඳහා සපයනු ලබන මිල කළ නොහැකි සේවාවකි. එවැනි සුරැකුම් ආයතනවල කාර්ය මණ්ඩලයට විශේෂයෙන්ම භාරකරුවන්ගේ වගකීම වන්නේ මෙම ආයතනික දරුවන් සඳහා රැකවරණය සහ ආරක්ෂාව සැපයීමයි. ළමා වෙළෙඳාමේ වින්දිතයින්ගේ ආරක්ෂාව සහ සුබසාධනය සඳහා හොඳින් නිර්වචනය කරන ලද ජාත්‍යන්තර, කලාපීය සහ ජාතික නීති තිබේ. රැකබලා ගන්නන් ඇතුළු සෑම පුරවැසියෙකුම මෙම නීතිමය රාමුවට දැඩි ලෙස බැඳී සිටී. මෙමගින් දරුවන්ට ඔවුන්ගේ අයිතීන් බාධාවකින් තොරව භුක්ති විඳීමට මෙන්ම ඔවුන්ගේ ආරක්ෂාව තහවුරු කරමින් මෙම අයිතිවාසිකම් අනිසි භාවිතය සහ උල්ලංඝනය කිරීම් සඳහා පිළියම් සෙවීමටද හැකියාව ලැබේ. අනෙක් අතට රැක බලා ගන්නන්ට, ළමා වෙළෙඳාමේ වින්දිතයින් සම්බන්ධ නීති පිළිබඳ වඩා හොඳ අවබෝධයක් ලබා ගැනීමට මෙන්ම, ළමා ආරක්ෂණ මූලධර්ම සහ ඔවුන්ගේ රාජකාරි ඉටු කිරීමේ ප්‍රවේශයන් පිළිබඳ නිවැරදි දැනුමකින් සහ අවබෝධයකින් සන්නද්ධ වීමටද හැකියාව ලැබේ.

මෙම පාඨමාලාව රැකබලා ගන්නන් සඳහා මූලික දැනුම සහ අවබෝධය ලබා ගැනීමටත්, ළමා අයිතිවාසිකම්, වින්දිත අයිතිවාසිකම්, නීතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියා පටිපාටි, සහන යාන්ත්‍රණයන්, ළමුන් සඳහා ලබා ගත හැකි සේවාවන්, යොමු කිරීමේ ක්‍රියා පටිපාටි සහ නීතිය උල්ලංඝනය කිරීම සඳහා පනවා තිබෙන අදාළ දඬුවම්/ දඩවලට අදාළව පවතින නීති හඳුනා ගැනීමට සහ පිළිගැනීමටත් සැලසුම් කර ඇත. පාඨමාලාව සඳහා සහභාගිවන්නන් ශ්‍රී ලංකාවේ ළමා වෙළෙඳාම සහ නැගී එන නව ප්‍රවණතා හඳුනාගෙන නිර්වචනය කරනු ඇත. තවද, සහභාගිවන්නන්ට ළමා ආරක්ෂණයේ විවිධ මූලධර්ම සහ ප්‍රවේශයන් හඳුනා ගැනීමට සහ ලැයිස්තුගත කිරීමට හැකි වන අතර, නඩු විභාගයට පෙර, නඩු විභාගය සහ පශ්චාත් නඩු කාලසීමාව තුළ ළමා වෙළෙඳාමේ වින්දිතයින් සඳහා හොඳම සේවා සපයන ආකාරය පිළිබඳව හඳුනා ගැනීමට හැකියාව ලැබේ.

**ඉගෙනුම් අරමුණු**

- ළමා අයිතිවාසිකම් සහ ළමා වෙළෙඳාම පිළිබඳ අදාළ නීති සහ ප්‍රතිපත්ති හඳුනා ගැනීම සහ පිළිගැනීම.
- ශ්‍රී ලංකාවේ ළමා වෙළෙඳාම සහ මෙම සංවිධානාත්මක අපරාධයේ නව ප්‍රවණතා නිර්වචනය කිරීම සහ හඳුනා ගැනීම.
- ළමා ආරක්ෂාව සහ ළමා වින්දිතයන්ට සහය ලබා දීම සම්බන්ධ මූලධර්ම හා ප්‍රවේශයන් හඳුනාගෙන ලැයිස්තුගත කිරීම.

**මූලික තේමාවන්**

### 4.2.1. තැනැත්තන් වෙළෙඳාම් (TIP) සහ ළමා වෙළෙඳාම් අපරාධ පිළිබඳ මූලික අවබෝධය

තැනැත්තන් වෙළෙඳාම් කිරීමේ අපරාධය (TIP) රහසිගත හා සංකීර්ණය. එය නූතන වහල් ක්‍රමයකි. එය වින්දිතයින්ට සහ සමාජයට දිගුකාලීන ඍණාත්මක බලපෑමක් ඇතිකරන බරපතල අපරාධයක් වන අතර එය වෙනත් බරපතල අපරාධ ක්‍රියාකාරකම් පෝෂණය කරන මූලාශ්‍රයකි.

විශේෂයෙන්, ළමා වින්දිතයින් ඔවුන්ගේ වයස, නොමේරූ බව සහ අත්දැකීම් නොමැතිකම හේතුවෙන් වෙළෙඳාමට ගොදුරු වන අතර අපයෝජන ක්‍රියාවන්හි හානිකර ප්‍රතිවිපාකවලට මුහුණ දෙයි. දිගුකාලීන කායික, මානසික, ලිංගික අපයෝජනය සහ මන්දපෝෂණය බොහෝ විට දිගු කාලීන මානසික කැළැල් වලට තුඩු දෙන අතර දරුවාගේ වර්ධනය අඩාල කරමින් දරුවාගේ චිත්තවේගීය හා කායික වර්ධනයට බාධා කරයි.

මෙම සාධක හඳුනා ගැනීම සඳහා, ළමා වෙළෙඳාම යනු කුමක්ද? එහි විවිධ වර්ග මොනවාද? යන්න සහ සූරාකෑමේ ආකාරයන් පිළිබඳව මූලිකවම අවබෝධ කර ගැනීම වැදගත් වේ. වෙළෙඳාම්කරුවන් තම වින්දිතයින් පාලනය කිරීම සඳහා භාවිතා කරන විවිධ ක්‍රම පිළිබඳවද අවබෝධ කර ගැනීම වැදගත්ය. වෙළෙඳාමේ බලපෑම වෙනස් වන අතර, යම්තාක් දුරකට ස්ත්‍රී පුරුෂ භාවය, නිරාවරණය වන සූරාකෑමේ ආකාරයන්, අත්දැකීම්වල කාලසීමාව සහ වින්දිතයා මත භාවිතා කරන පාලන ක්‍රම යනාදිය මත වෙළෙඳාමේ බලපෑම රඳා පවතී. අවදානම් සහ ප්‍රතිවිපාක ඒ අනුව වෙනස් විය හැකිය.

ආවරණය කිරීමට නියමිත මූලික කරුණු:

- 'තැනැත්තන් වෙළෙඳාම සහ ළමා වෙළෙඳාම' යනු කුමක්ද?
- වෙළෙඳාම තුළ සූරාකෑමේ ආකාර සහ වර්ග
- වින්දිතයන් පාලනය කිරීමට භාවිතා කරන ක්‍රම
- තැනැත්තන් වෙළෙඳාමේ අවදානම් සහ ප්‍රතිවිපාක
- TIP සම්බන්ධ මිථ්‍යාවන් සහ වැරදි වැටහීම්

### 4.2.2. ළමා වෙළෙඳාමට අදාළ වන ජාතික, ජාත්‍යන්තර සහ කලාපීය නීති

තැනැත්තන් වෙළෙඳාම බොහෝ විට නූතන වහල්භාවය ලෙස හැඳින්වේ. අතීතයේ පැවති වහල් වෙළෙඳාම පසු කාලීනව පුළුල් ලෙස හෙළා දකින ලද අතර, වහල් වෙළෙඳාම තුළින් තවත් මිනිසෙකු සූරාකන බැවින් එය දුරාචාරයක් ලෙස සලකනු ලැබීය. වහල්භාවය සහ වහල් වෙළෙඳාම අහෝසි කිරීමට සහ හෙළා දැකීමට ගත් උත්සාහයන් වහල් වෙළෙඳාමට අදාළ ජාත්‍යන්තර නීතිමය සහ ප්‍රතිපත්තිමය මෙවලම් සංවර්ධනය කිරීමට දායක විය. මෙම ජාත්‍යන්තර වහල් විරෝධී සම්මුතීන් ජාත්‍යන්තර ජාවාරම් විරෝධී රාමුව සංවර්ධනය කිරීමට දායක විය.

ආවරණය කිරීමට නියමිත මූලික කරුණු:

අදාළත්වය;

- ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය
- තැනැත්තන් වෙළෙඳාම, විශේෂයෙන්ම කාන්තාවන් සහ ළමුන් ප්‍රවාහනය වැළැක්වීම, මර්දනය කිරීම සහ දඬුවම් කිරීම සඳහා වන එක්සත් ජාතීන්ගේ ප්‍රොටෝකෝලය
- ගණිකා වෘත්තිය සඳහා කාන්තාවන් සහ ළමුන් ප්‍රවාහනය කිරීම වැළැක්වීම සහ මර්දනය කිරීම පිළිබඳ සාර්ක් සම්මුතිය
- ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) 2006 අංක 16 දරණ පනත

### 4.2.3. ළමා අයිතිවාසිකම් සහ ළමා වෙළෙඳාම පිළිබඳ නීතිමය සහ ප්‍රතිපත්ති රාමුව තුළ අදාළ ළමා ආරක්ෂණ සේවා සපයන්නන්ගේ යුතුකම් සහ වගකීම් අවබෝධ කර ගැනීම

එක්සත් ජාතීන්ගේ ප්‍රොටකෝල, ජාත්‍යන්තර ගිවිසුම් සහ ශ්‍රී ලංකා නීති මගින් ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කර ඇත. අදාළ බලධාරීන් මෙන්ම අමාත්‍යාංශ විසින් ජාත්‍යන්තර සහ ශ්‍රී ලංකා නීතිවලට අනුකූලව, ළමා අයිතිවාසිකම් සහ ළමා වෙළෙඳාම සම්බන්ධයෙන් නීති, ප්‍රතිපත්ති සහ රෙගුලාසි සකස් කර ඇත. මෙම නීති සහ ප්‍රතිපත්ති ළමා ආරක්ෂණ සේවා සපයන්නන්ගේ කැමැත්ත හඳුනාගෙන ඒ අනුව ඔවුන් සඳහා යුතුකම් සහ වගකීම් පවරා ඇත. වඩා හොඳ සේවාවක් සැපයීම සඳහා, ළමා ආරක්ෂණ ක්ෂේත්‍රයේ කටයුතු කරන පුද්ගලයින් තුළ ළමා අයිතිවාසිකම් සහ ළමා වෙළෙඳාම් පිළිබඳ මූලික කරුණු පිළිබඳව සංවේදී වීම සහ දැනුමක් පැවතීම අවශ්‍ය වේ. දරුවාගේ සමස්ත සහ හොඳම අවශ්‍යතා ආරක්ෂා කිරීම සඳහා, දරුවන්ට ආධාර සහ සේවා සැපයීමේ යෙදී සිටින පුද්ගලයින් ළමා අයිතිවාසිකම් සහ ළමා වෙළෙඳාමේ ප්‍රධාන සාධක පිළිබඳව සංවේදී විය යුතුය.

ආවරණය කිරීමට නියමිත මූලික කරුණු:

- ළමා ආරක්ෂණ සේවා සපයන්නන්ගේ විවිධ යුතුකම් සහ වගකීම් පිළිබඳ අවබෝධය.
- යොමු කිරීමේ යාන්ත්‍රණයන්හි ප්‍රධාන අංග සහ වින්දිතයින් යොමු කිරීමේ හොඳම භාවිතයන්.

### 4.2.4. ගෝලීය වශයෙන් සහ ජාතික වශයෙන් ළමා වෙළෙඳාම් ගැටලුව

තැනැත්තන් වෙළෙඳාමේ විෂය පථය සහ පරිමාණය තීරණය කිරීම හෝ තක්සේරු කිරීම බොහෝ විට අපහසු වේ. වින්දිතයින් හඳුනාගැනීමේ අභියෝග හමුවේ, බොහෝ වින්දිතයින් හඳුනා නොගෙන යා හැකි අතරම, හඳුනා ගැනීමට අකමැති වීම හෝ එම තත්වයන් තුළ දිගටම ජීවත් වීමට තීරණය කිරීම සිදුවිය හැකිය.

2021 දී ඇස්තමේන්තු කර ඇත්තේ ගෝලීය වශයෙන් මිලියන 52 ක ජනතාවක් නූතන වහල්භාවයේ තත්වයන් තුළ ජීවත් වන බවයි. මෙයින් මිලියන 28 ක් බලහත්කාර සේවයේ යොදවා සිටි අතර මිලියන 22 ක් බලහත්කාරයෙන් විවාහ කරවා ඇත.[1] කාන්තාවන්, ළමයින් සහ සංක්‍රමණිකයන් වඩාත් අවදානමට ලක්ව තිබේ. නූතන වහල්භාවයේ සිටින සියලුම දෙනාගෙන් මිලියන 12 කට වඩා වැඩි පිරිසක් ළමයින් වන අතර නූතන වහල්භාවයේ මුළු සංඛ්‍යාවෙන් අඩකට වඩා කාන්තාවන් සහ ගැහැණු ළමයින් වේ.

2020 දී, ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් ළමුන් මිලියන 160 ක් ළමා ශ්‍රමයේ යෙදී සිටින බව ඇස්තමේන්තුගත කර ඇති අතර, COVID 19 බලපෑම හේතුවෙන් තවත් මිලියන ගණනක් අවදානමට ලක්ව තිබේ.[2] තැනැත්තන් වෙළෙඳාමේ ගෝලීය ප්‍රවණතා පිළිබඳ එක්සත් ජාතීන්ගේ අපරාධ හා මත්ද්‍රව්‍ය පිළිබඳ කාර්යාලය (UNODC) වාර්තාව පෙන්වා දෙන්නේ ජාවාරමට ගොදුරු වූවන්ගෙන් සියයට 35 ක් හෝ තුන් දෙනෙකුගෙන් එක් අයෙක් ළමයින් බවයි.

UNODC විසින් රැස් කරන ලද සිද්ධි සාරාංශ විශ්ලේෂණයෙන් ඇඟවෙන්නේ වෙළෙඳාම්කරුවන් ළමා වින්දිත කාන්තාවන් සම්බන්ධයෙන්, විශේෂයෙන් ගැහැණු ළමයින් සම්බන්ධයෙන් වැඩි වශයෙන් ප්‍රචණ්ඩත්වය භාවිතා කරන බවයි. මෙම සිද්ධිවල විස්තර කර ඇති ආකාරයට ජාවාරම් කිරීමේදී, ඕනෑම වයස් මට්ටමක කාන්තා වින්දිතයෙකු, ශාරීරික හෝ ආන්තික ප්‍රචණ්ඩත්වයට (ලිංගික ප්‍රචණ්ඩත්වය ඇතුළුව) ගොදුරු වීමේ සම්භාවිතාව පිරිමින්ට වඩා තුන් ගුණයකින් වැඩිය. එම දත්ත කට්ටලය පෙන්නුම් කරන්නේ, වැඩිහිටියන්ට (වැඩිහිටි පිරිමි

---

[1] Global Slavery Index published by the Walk Free Foundation https://www.walkfree.org/resources/

[2] Child Labour: Global estimates 2020, trends and the road forward- UNICEF/ILO joint publication

සහ වැඩිහිටි ගැහැණු) වඩා ළමයින් (ගැහැණු ළමයින් සහ පිරිමි ළමයින්) ශාරීරික හෝ ආන්තික හිංසනයට ගොදුරු වීමේ සම්භාවිතාව 1.7 ගුණයකින් වැඩි බවත් කාන්තාවන්ට වඩා ගැහැණු ළමයින් ප්‍රචණ්ඩත්වයට ගොදුරු වීමේ සම්භාවිතාව 1.5 ගුණයකින් වැඩි බවත් ය. මෙහිදී කුමන ආකාරයේ සාපරාධී ක්‍රියාවක් හෝ සූරාකෑමේ ආකාරයක්ද යන්න වැදගත් නොවන අතර, සියලුම ප්‍රදේශවල මෙය සත්‍ය වේ.[3]

ශාරීරික විකෘතිතා ඇති ළමුන් සහ පුද්ගලයන් වැනි සමාජීය වශයෙන් අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වල පුද්ගලයින් හට, මත්ද්‍රව්‍ය ජාවාරම් ඇතුළු ශ්‍රී ලංකාවේ විශාලතම නගරවල සිඟාකෑමට හෝ සාපරාධී ක්‍රියාකාරකම්වල යෙදීමට බලකෙරෙන ආකාරය වාර්තා සහ පර්යේෂණ මගින් ඉස්මතු කර තිබේ. තේ වතු ආශ්‍රිත ප්‍රදේශයන්ගෙන් පැමිණ කොළඹ නගරයේ ඇතැම් ස්ථානයන් වල සේවය කරන ළමා ගෘහ සේවකයින්, වැඩි වශයෙන් කායික, ලිංගික සහ මානසික හිංසනයට ලක් වේ. වැටුප් නොගෙවීම සහ ශ්‍රම ජාවාරමේ දර්ශක වන සීමා සහිත කොන්දේසි යටතේ ඔවුන් කටයුතු කරයි. කුඩා කඩවල, කුඩා හා අවිධිමත් කර්මාන්තයන්වල සහ වෙළෙඳ පොළවල ශ්‍රමය සඳහා ජාවාරම්කරුවන් විසින් ළමයින් සූරාකන ආකාරය ද වාර්තා සහ වාර්තාගත පැමිණිලිවලින් පෙන්නුම් කෙරේ. සේවා යෝජකයින් විසින් සේවකයා සමඟ සහ ඇතැම් විට සේවකයාගේ මුළු පවුල සමඟම කම්කරුවන්ගේ ණය වෙනත් සේවා යෝජකයෙකුට "විකිණූ" බවට ලේඛනගත අවස්ථා ද හඳුනාගෙන තිබේ.

සේව් ද චිල්ඩ්‍රන් ආයතනය විසින් 2020[4] දී පවත්වන ලද ළමා ලිංගික සංචාරක ව්‍යාපාරය පිළිබඳ පර්යේෂණයකින් හෙළි වූයේ බොහෝ අවස්ථාවලදී ළමා අපචාර සහ අපයෝජනවල ප්‍රතිඵලයක් ලෙස හෝ මත්ද්‍රව්‍ය භාවිතයට පෙළඹවීම හරහා හෝ දරුවෙකු වෙළෙඳාම් ක්‍රියාවලියට පිවිසෙන බවයි. ඉන්පසුව දරුවන්ව ඔවුන්ට හුරුපුරුදු අය විසින්ම රවටනු ලබන අතර, එම දරුවා පදිංචි ප්‍රදේශය තුළම ලිංගික සේවා සඳහා යොමු කෙරේ. ඉන් අනතුරුව ජාත්‍යන්තර සංචාරක ව්‍යාපාරයේ ලිංගික සේවා සඳහා වෙළෙඳාම් කරනු ලැබේ.

**ආවරණය කිරීමට නියමිත මූලික කරුණු:**

- ළමා වෙළෙඳාමේ ගෝලීය තත්ත්වය
- ශ්‍රී ලංකාවේ ළමා වෙළෙඳාමේ වත්මන් තත්ත්වය අවබෝධ කර ගැනීම

### 4.2.5. ළමා වෙළෙඳාමේ නව ප්‍රවණතා සහ ළමා වෙළෙඳාම සඳහා තල්ලු කිරීමේ සහ ඇදගැනීමේ සාධක

TIP හි අපරාධය සහ වින්දිතයින් අඛණ්ඩව 'බඳවා ගැනීම්' සිදු කරමින් සූරාකෑම සඳහා සපයන ආකාරය වඩා හොඳින් අවබෝධ කර ගැනීම සඳහා, TIP හි ඉල්ලුම සහ සැපයුම් ක්‍රියාවලිය අවබෝධ කර ගත යුතුය. තැනැත්තන් වෙළෙඳාමෙන් ලබන විශාල ලාභය සූරාකෑමේ ශ්‍රමය සඳහා ඇති ඉල්ලුම දිගින් දිගටම රඳවා තබා ගැනීමට උපකාරී වේ. එම ඉල්ලුම තුළින් අවදානමට ලක්විය හැකි මිනිසුන්ගේ සැපයුමක් TIP වෙත තල්ලු කරමින් විෂම චක්‍රයක් දිගින් දිගටම පවත්වා ගෙන යාම සඳහා දායකත්වය සපයයි.

ගැටුම්, ස්වභාවික විපත් සහ ගෝලීය ආර්ථික කඩාවැටීම් ඇතුළු අවදානම් සාධක රැසක් හේතුවෙන් වසර ගණනාවක් පුරා තැනැත්තන් වෙළෙඳාම සිදුවී ඇත. සාමාන්‍යයෙන් වෙළෙඳාම්කරුවන් දරිද්‍රතාවය, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය, අධ්‍යාපන අවස්ථා නොමැතිකම, පවුලේ සහයෝගය නොමැතිකම, නිවාස නොමැතිකම, මානසික

[3] Global report on trafficking in persons 2022 - UNODC - https://www.unodc.org/unodc/en/data-and-analysis/glotip.html
[4] Child Sex Trafficking in the Tourism Sector in Sri Lanka- Peiris. P. 2021 Save the Children and IOM: Colombo

හෝ ශාරීරික ආබාධ, සංක්‍රමණ තත්ත්වය සහ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම වැනි වින්දිතයන්ගේ දුර්වලතා ප්‍රයෝජනයට ගනී. එයට අමතරව නොසලකා හැරීම හෝ අපයෝජනය බහුලව සිදු වූ පවුල්වලින් පැමිණි දරුවන් අවදානමට ලක්වේ.

ආවරණය කිරීමට නියමිත මූලික කරුණු:

– ළමා වෙළෙඳාම සඳහා තල්ලු කිරීමේ සහ ඇදගැනීමේ සාධක
– ළමා වෙළෙඳාමේ නැගී එන නව ප්‍රවණතා හඳුනා ගැනීම
– ළමා වෙළෙඳාමේ සමාජ පිරිවැය

## 4.2.6. ළමා වෙළෙඳාම් අපරාධයේ මූලිකාංග

පුද්ගලයෙකු සත්‍ය වශයෙන්ම වෙළෙඳාමට ගොදුරු වී ඇත්ද යන්න තීරණය කිරීම සඳහා, 'ළමා වෙළෙඳාම' යනු කුමක්ද යන්න සම්බන්ධයෙන් වන නීතිමය නිර්වචනය හඳුනා ගැනීම අවශ්‍ය වේ. හඳුනාගැනීමේ ක්‍රියාවලිය අවබෝධ කර ගැනීම සඳහා සහභාගිවන්නන්ට ජාත්‍යන්තර නිර්වචනය මෙන්ම "ළමා වෙළෙඳාම" පිළිබඳ දේශීය නිර්වචනය පිළිබඳ පැහැදිලි අදහසක් තිබිය යුතුය.

විශේෂයෙන්ම කාන්තාවන් සහ ළමුන් වෙළෙඳාම් කිරීම වැළැක්වීම, මර්දනය කිරීම සහ දඬුවම් කිරීම සඳහා වන, 2000 වර්ෂයේ එක්සත් ජාතීන්ගේ ප්‍රොටෝකෝලයේ 3C වගන්තිය, වෙළෙඳාම නිර්වචනය කරන නිශ්චිත වගන්ති සපයයි.

ජාතික මට්ටමින් හඳුනා ගැනීමේදී, දණ්ඩ නීති සංග්‍රහයේ 2006 අංක 16 දරණ සංශෝධන පනතේ 360 C (1) (c) වගන්තිය මගින් තැනැත්තන් වෙළෙඳාම් කිරීමේ වරද සම්බන්ධයෙන්, එක්සත් ජාතීන්ගේ වෙළෙඳාම් කිරීමේ ප්‍රොටෝකෝල නිර්වචනයට බොහෝ දුරට අනුකූල වන සවිස්තරාත්මක නිර්වචනයක් ඉදිරිපත් කරයි.

ඉහත නිර්වචනයට අනුව ළමා වෙළෙඳාමක් නිශ්චය කිරීම සඳහා ස්ථාපිත කළ යුත්තේ 'පනත' සහ සූරාකෑමේ 'අරමුණ' යන අංග පමණක් බව සඳහන් කළ යුතුය. වැඩිහිටියන් මෙන්, කැමැත්ත ලබා ගැනීම සඳහා භාවිතා කරන 'මාර්ගය' ස්ථාපිත කිරීම අවශ්‍ය නොවේ.

ආවරණය කිරීමට නියමිත මූලික කරුණු:

– තැනැත්තන්, විශේෂයෙන්ම කාන්තාවන් සහ ළමුන් වෙළෙඳාම් කිරීම වැළැක්වීම, මර්දනය කිරීම සහ දඬුවම් කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ ප්‍රොටකෝලයේ 3C වගන්තිය, 2000
– දණ්ඩ නීති සංග්‍රහයේ 2006 අංක 16 දරණ සංශෝධන පනතේ 360 C(1)(C) වගන්තිය.
– ළමා වෙළෙඳාමේ මූලිකාංග

## 4.2.7. ළමා ආරක්ෂණය සහ ළමා වෙළෙඳාමේ වින්දිතයින්ගේ සහාය සඳහා පුළුල් මූලධර්ම සහ ප්‍රවේශයන්

වෙළෙඳාම් අපරාධයන් හඳුනාගැනීමේ සහ පරීක්ෂා කිරීමේ ක්‍රියාවලියේදී වින්දිත දරුවා ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. වින්දිතයෙකුට ඔවුන්ගේ ආරක්ෂාව සඳහා සම්බන්ධ වන පළමු ප්‍රතිචාර දක්වන්නාට තීරණාත්මක තොරතුරු සැපයිය හැකිය. වින්දිත දරුවෙකුට සාර්ථකව සහයෝගයෙන් කටයුතු කිරීමට උපකාර කිරීම සඳහා, ඔවුන්ගේ මූලික අයිතිවාසිකම් හඳුනා ගැනීම වැදගත් වේ. වින්දිතයන් සමඟ කටයුතු කිරීමේදී, අදාළ බලධාරීන්,

දෙමාපියන් සහ භාරකරුවන් දරුවාගේ යහපත වෙනුවෙන් ක්‍රියා කළ යුතුය. මෙහිදී තීරණ ගැනීමේ ක්‍රියාවලියට දරුවාගේ සහභාගීත්වය අවශ්‍යය වන අතර තීරණ ගැනීමේදී දරුවාගේ අදහස් සලකා බැලිය යුතුය.

එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් සම්මුතියෙහි දරුවාගේ යහපත පාලනය කරන මූලික මූලධර්ම සහ මාර්ගෝපදේශ සකස් කර ඇත.

### ආවරණය කිරීමට නියමිත මූලික කරුණු:

- පුළුල් මූලධර්ම
- අයිතිවාසිකම් මත පදනම් වූ ප්‍රවේශය
- වින්දිතයා කේන්ද්‍ර කරගත් ප්‍රවේශය
- බහු විනය ප්‍රවේශය
- ප්‍රජාව පදනම් කරගත් ප්‍රවේශය

| නිර්දිෂ්ට කියවීම්: |
| --- |
| Protocol to Prevent, Suppress and punish Trafficking in persons, especially women and children (the Palermo Protocol), Supplementing the United National Convention against Transnational Organized Crime (UNTOC) https://www.unhcr.org/media/protocol-prevent-suppress-and-punish-trafficking-persons-especially-women-and-children-1<br>UN Protocol on the rights of the child – 1989 https://www.ohchr.org/sites/default/files/crc.pdf<br>The optional protocol on the sale of children, child prostitution, and child pornography (OPSC) 2000 https://www.ohchr.org/sites/default/files/Documents/ProfessionalInterest/crc-sale.pdf<br>ILO Convention (C 182) of 1999 on the worst forms of child labor https://www.ilo.org/wcmsp5/groups/public/---ed_norm/---declaration/documents/publication/wcms_decl_fs_46_en.pdf<br>ILO Convention (C 138) of 1973 on minimum age https://www.ilo.org/wcmsp5/groups/public/---ed_norm/---ipec/documents/publication/wcms_ipec_pub_30215.pdf<br>SAARC conventions on preventing and combating the trafficking in women and children for prostitutions ( 2002) https://childprotection.gov.lk/images/pdfs/child-laws/saarc-convention-on-preventing-and-combating-trafficking-in-women-and-children-for-prostitution-1.pdf<br>Penal code ( Amendment) Act number 16 of 2006. https://www.vertic.org/media/National%20Legislation/Sri%20Lanka/LK_Penal_Code_Amend_Act_No_16_2006.pdf<br>Other offences stipulated the penal code in relation with child trafficking<br>CYPO – 48 of 1939. https://www.socialproba.cp.gov.lk/download/ord_1939_48_en.pdf<br>Standard Operating procedures (SOP) for identification, protection and referral of victims of human trafficking, Sri Lanka https://resourcecentre.savethechildren.net/pdf/Guidance-Note-on-the-Identification-Protection-and-Referral-of-Child-Victims-of-Trafficking.pdf/<br>Guidance notes on identification, protection and referral of child victims of trafficking, Sri Lanka.<br>Recommended principles and guidelines on human rights and human trafficking, office of the High Commissioner for Human Rights ( OHCHR) https://www.ohchr.org/sites/default/files/Documents/Publications/Traffickingen.pdf |

## 4.3. ළමා වෙළඳාමේ වින්දිතයින් සහ වෙනත් අපචාරවලට ගොදුරු වූ ළමා වින්දිතයන් හඳුනා ගැනීම

**පාඨමාලා විස්තරය**

ළමා වෙළෙඳාමේ වින්දිතයින් හඳුනා ගැනීම සඳහා මෙන්ම වින්දිත ළමුන්ට ආරක්ෂාව සහ රැකවරණය සැපයීම සම්බන්ධයෙන් ළමා ආරක්ෂණ ආයතනවල කාර්ය මණ්ඩලය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. විවිධ හේතූන් මත ආයතනික රැකවරණය යටතේ සිටින ළමුන් අතරින් ළමා වෙළෙඳාමේ වින්දිතයන් කවුරුන්ද යන්න හඳුනා ගැනීමේ හැකියාව රැකවරණ සපයන්නන් හට පැවතිය යුතුය. වින්දිතයින්ට අවශ්‍ය වන කාලෝචිත සහය ලබා දීම සහතික කිරීම වෙනුවෙන් මෙය වැදගත් වේ. බොහෝ විට ළමා වෙළෙඳාමේ වින්දිතයින් වෙනත් අපරාධවලට ගොදුරු වූවන් වශයෙන් හෝ දණ්ඩ නීති සංග්‍රහයේ විවිධ අපරාධ යටතේ වැරදිකරුවන් වූවන් වශයෙන් හඳුනා ගැනේ.

එබැවින් මෙම ළමා සුරැකුම් ආයතනවල අදාළ කාර්ය මණ්ඩලය වින්දිතයින් නිවැරදිව හඳුනා ගැනීම සඳහා පමණක් නොව, මෙම වින්දිතයන් සමඟ කටයුතු කරන ආකාරය සහ වින්දිතයින්ට රැකවරණය සපයන ආකාරය පිළිබඳව නිවැරදි දැනුම හා කුසලතා වලින් සමන්විත විය යුතුය. මෙම මොඩියුලය ළමා වෙළෙඳාම, ළමා වෙළෙඳාමේ වින්දිතයින්ගේ දර්ශක, මූලික පරීක්ෂණ මෙවලම් සහ වින්දිතයින් සමඟ සම්මුඛ සාකච්ඡා කිරීමේ මූලිකාංග පිළිබඳ නිවැරදි දැනුම, අවබෝධය සහ කුසලතා සංවර්ධනය කරමින් සහභාගිවන්නන්ගේ ධාරිතාව ගොඩනැගීමට සහාය වනු ඇත. වින්දිතයන් හඳුනාගැනීම මගින් ඔවුන්ව අවශ්‍ය සහ කාලෝචිත ලෙස වෛද්‍ය, මනෝ සමාජීය සහ වෙනත් ආධාර සඳහා අදාළ බලධාරීන් වෙත යොමු කිරීමට කාර්ය මණ්ඩලයට හැකි වන අතර එමගින්, තවදුරටත් සිදුවිය හැකි හානිය සහ අපයෝජන අවම කර ගත හැකිය.

තවද, දරුවන්ගේ අවශ්‍යතා සම්බන්ධයෙන් ලබාදිය යුතු හොඳම සහයෝගය සහ සහාය ලබා දිය යුතු ආකාරය පිළිබඳව කාර්ය මණ්ඩලය සංවේදී කරනු ලැබේ. මෙම කාර්යය සඳහා, ළමා වෙළෙඳාමේ වින්දිතයින් කවුරුන්ද? ඔහු/ඇය ආයතනගත වීමට හේතු මොනවාද? වින්දිතයෙක් වශයෙන් ඔහුගේ/ඇයගේ අවශ්‍යතා මොනවාද? කම්පනයෙන් ගොඩ ඒමට ඔහුට/ඇයට උපකාර කරන්නේ කෙසේද යන කරුණු පිළිබඳව දැනුමෙන් සහ අවබෝධයෙන් කාර්ය මණ්ඩලය සන්නද්ධ විය යුතුය. මෙම මොඩියුලයේ පරමාර්ථ වනුයේ ළමා වෙළෙඳාමේ දර්ශක සහ පරීක්ෂණ මෙවලම් භාවිතයෙන් විභව ළමා වින්දිතයන් හඳුනා ගැනීමට අවශ්‍ය කුසලතා ලබා ගැනීම, හඳුනාගැනීමේ ක්‍රියාවලියේදී පුද්ගලයන්ගේ සහ ආයතනවල භූමිකාවන් සහ වගකීම් පිළිබඳව දැනුවත් වීම, ඒවා පිළිබඳව නිර්වචනය කිරීම සහ නිරූපණය කිරීමයි. ළමා සංවේදී සන්නිවේදනය සහ සම්මුඛ පරීක්ෂණ ක්‍රම පිළිබඳ කුසලතා සංවර්ධනය කරමින් සහභාගීවන්නන් තුළ හොඳම භාවිතයන් වර්ධනය කිරීම පිළිබඳව සංවේදී වන අතර, ළමා වෙළෙඳාමේ වින්දිතයින් රැකබලා ගැනීමේදී ධනාත්මක ආකල්පයක් වර්ධනය කරනු ඇත. මොඩියුලයේ සමස්ත ඉලක්කය වන්නේ සහභාගිවන්නන්ගේ චින්තන රටා වෙනස් කිරීම සහ එමගින් දරුවාගේ ආරක්ෂාව සහ වින්දිතයින්ගේ යහපැවැත්ම වැඩිදියුණු කිරීම සහතික කිරීමයි.

**ඉගෙනුම් අරමුණු**

- මූලික පරීක්ෂණ සහ වෙළෙඳාම් දර්ශක හරහා ළමා වෙළෙඳාමේ විභව අවස්ථා හඳුනා ගැනීමට කුසලතා ලබා ගැනීම.
- වින්දිතයන් හඳුනාගැනීමේ ක්‍රියාවලිය තුළ භූමිකාවන් සහ වගකීම් විස්තර කිරීම.

- ළමා හිතකාමී සන්නිවේදනයේ සහ සම්මුඛ පරීක්ෂණ ක්‍රමවල කුසලතා ප්‍රදර්ශනය කිරීම සහ ළමා වින්දිතයන් සමඟ සංවේදීව කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ අවබෝධය.

**මූලික තේමාවන්**

## 4.3.1. ශ්‍රී ලංකාවේ ළමා වෙළෙඳාම සහ අනෙකුත් ළමා අපචාර අතර සම්බන්ධය

භාරකරුවන්ගේ ක්‍රියාවන් හෝ අතපසුවීම් හේතුවෙන් බොහෝ අවස්ථාවන් වලදී දරුවන් නොසලකා හැරෙන අතර ශාරීරික හා මානසික හිංසනයන්ට මුහුණ දෙයි. ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහය තුළ අපරාධ ලෙස හඳුනාගෙන ඇති විවිධ ආකාරයේ ළමා අපචාර තිබේ. මේවා කායික සහ මානසික අපයෝජන සහ/හෝ ලිංගික සූරාකෑම ලෙස වර්ගීකරණය කළ හැක.

ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් විස්තර කර ඇති පරිදි අපයෝජනය යනු වගකීම, විශ්වාසය හෝ බලය පිළිබඳ සම්බන්ධතාවන්ගේ සන්දර්භය තුළ දරුවාගේ සෞඛ්‍යයට, පැවැත්මට, සංවර්ධනයට හෝ ගෞරවයට සැබෑ හෝ විභව හානියක් ඇති කරන ඕනෑම ආකාරයක ශාරීරික සහ/හෝ චිත්තවේගීය අයහපත් සැලකීම, ලිංගික අපයෝජනය, නොසලකා හැරීම හෝ නොසැලකිලිමත් සැලකීම හෝ වාණිජමය හෝ වෙනත් සූරාකෑමකි" (WHO, 2002).

ළමා වෙළෙඳාම යනු බොහෝ විට වහල්භාවයේ දී, කටුක තත්වයන් යටතේ, ඔවුන්ගේ මිතුරන්ගේ සහ පවුලේ අයගේ ආදරය හා සෙනෙහස අහිමි කර, ළමයින්ට කුරිරු ලෙස සැලකීමයි. ඔවුන්ට ලබාදෙන ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය තුළ ඔවුන්ට සිදුවූ මානසික හා ශාරීරික හානිය යථා තත්ත්වයට පත් කළ නොහැකි නම්, එම මානසික හා ශාරීරික හානිය ජීවිත කාලය පුරාවටම පැවතිය හැකිය.

ළමා වෙළෙඳාම් තත්වයක් තුළ ළමා අපයෝජනය ද දක්නට ලැබෙන බැවින් ළමා අපචාර සහ ළමා වෙළෙඳාම අතර වෙනස හඳුනා ගැනීම බොහෝ විට අපහසු වේ. කෙසේ වෙතත්, සහභාගිවන්නන්ට මෙම මොඩියුලය හරහා ළමා වෙළෙඳාම වෙනත් ආකාරයේ අපයෝජනවලට වඩා වෙනස් බව තේරුම් ගැනීමට සහ හඳුනා ගැනීමට හැකි වනු ඇත. දරුවෙකු දිගු කලක් අපයෝජනයට ලක් වූ විට, අවසානයේ ඔහු/ඇය ළමා වෙළෙඳාමේ වින්දිතයෙක් බවට පත්විය හැකිය. වෙළෙඳාමේ අවසාන අරමුණ සූරාකෑම බව සහභාගිවන්නන් ද වටහා ගනු ඇත. ළමා සූරාකෑම යනු ලිංගික සේවා හෝ ශ්‍රමය සඳහා දරුවා හිතාමතාම යොදා ගැනීමයි.

**ආවරණය කිරීමට නියමිත මූලික කරුණු:**

- ළමා අපචාර වර්ග
- ළමා අපචාර සහ ළමා වෙළෙඳාම අතර සම්බන්ධය
- ළමා අපචාර සහ ළමා වෙළෙඳාම පිළිබඳ දර්ශක
- ළමා වෙළෙඳාමේ වින්දිතයින්ගේ විශේෂ අවශ්‍යතා

## 4.3.2. ළමා වෙළෙඳාමේ වින්දිතයින් හඳුනාගැනීමේ වැදගත්කම

දැනටමත් සංකීර්ණ වී ඇති මෙම අපරාධයේ වඩාත් දුෂ්කර කාර්යයක් වන්නේ ළමා වෙළෙඳාමේ වින්දිතයින් හඳුනා ගැනීමයි. වෙනත් ආකාරයේ ළමා අපචාර අතරින්, ළමා වෙළෙඳාම හඳුනාගැනීමේදී වෙළෙඳාම් ක්‍රියාවලිය සිදුවන ස්වභාවයම අභියෝග මතු කරයි.

බරපතල අපරාධයකට ගොදුරු වූවන් ලෙස, ළමා වෙළෙඳාමේ වින්දිතයින්ට තමන් පමණක් නොව තම පවුලේ සාමාජිකයන්ගේ ආරක්ෂාව පිළිබඳ ගැටළු ඇති විය හැකි බැවින්, ළමා වෙළෙඳාමේ වින්දිතයින් හඳුනා ගැනීම වැදගත් වේ. තවද, ඔවුන්ගේ අයිතීන් උල්ලංඝණය වීමට මුහුණ දී තිබෙන බැවින් ජාත්‍යන්තර නීතිය යටතේ ඔවුන්ට හිමිවන විශේෂ ආරක්ෂණ ක්‍රමවේදවලට ප්‍රවේශය ලබාදී ඇති බව සහතික කිරීම සඳහා වින්දිතයන් හඳුනාගෙන ඔවුන් සුදුසු සේවාවන් වෙත යොමු කිරීම ඉතා වැදගත් වේ. ඔවුන්ගේ කායික හා මානසික සෞඛ්‍ය අවශ්‍යතා සහ අවශ්‍ය අනෙකුත් ආධාර සපුරාලීම සහතික කිරීම සඳහා වින්දිතයින් නිවැරදිව හා කාලෝචිතව හඳුනාගැනීම ද අවශ්‍ය වේ.

ආවරණය කිරීමට නියමිත මූලික කරුණු:

- ළමා වෙළෙඳාමේ වින්දිතයින් කවුද?
- වින්දිතයන් පිළිබඳ පොදු මිත්‍යාවන්
- වින්දිතයින් හඳුනා ගැනීම සිදු කරන්නේ කෙසේද?
- වින්දිතයින් හඳුනාගැනීමේ අභියෝග

### 4.3.3. වින්දිතයින් හඳුනා ගැනීමේ ක්‍රියාවලිය

ළමා වින්දිතයින්ට ලැබිය යුතු සහයෝගය සහ උපකාරය සහතික කිරීම සඳහා, ළමා වෙළෙඳාමේ වින්දිතයන් කාලෝචිතව හා නිවැරදිව හඳුනා ගැනීම ඉතා වැදගත් වේ. අපරාධය පිළිබඳ චෝදනා එල්ල කිරීමට සහ ඒ සම්බන්ධයෙන් ඵලදායි විමර්ශනය සඳහා ද එය ඉතා වැදගත් වේ. වින්දිතයන් නිවැරදිව හඳුනාගැනීම මගින් වෙළෙඳාම් ක්‍රියාවලිය ආරම්භ වීමටත් පෙර එය කඩාකප්පල් කළ හැකි අතර එමගින් අවදානමට ලක්විය හැකි ළමුන් සූරාකෑමට ලක්වීම වැළැක්විය හැකිය.

වෙළෙඳාම් කරන ලද ළමුන් සම්බන්ධයෙන් ගනු ලබන සියලුම ක්‍රියාමාර්ග ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය (CRC) සහ තැනැත්තන් වෙළෙඳාම් කිරීම වැළැක්වීම, මර්දනය කිරීම සහ දඬුවම් කිරීම සඳහා වන එක්සත් ජාතීන්ගේ ප්‍රොටකෝලය (2000) මත පදනම් විය යුතුය. සෑම විටම මූලික වශයෙන් දරුවාගේ යහපත සලකා බැලිය යුතු අතර, ඔහුට හෝ ඇයට බලපාන සියලු කාරණාවලදී දරුවාගේ අදහස් සැලකිල්ලට ගත යුතුය.

ආවරණය කිරීමට නියමිත මූලික කරුණු:

- පළමු සම්බන්ධතාවය
- මූලික සම්මුඛ පරීක්ෂණය
- අතිරේක සාධක තක්සේරු කිරීම
- අවසාන තීරණය

### 4.3.4. ළමා වෙළෙඳාමේ විභව වින්දිතයන් හඳුනා ගැනීමට උපකාර වන පරීක්ෂණ දර්ශක සහ මූලික පරීක්ෂණ මෙවලම්

වෙළෙඳාම්කරුවන් බොහෝ විට විශ්වාසය දිනා ගැනීම සඳහා දරුවා, දරුවාගේ පවුලේ සාමාජිකයින් හෝ දරුවා අයත් ප්‍රජාවේ සාමාජිකයන් තුළ විශ්වාසය ඇති වන පරිදි කටයුතු කරති. එමෙන්ම, ඔවුන් දරුවාට හෝ දරුවාගේ පවුලේ සාමාජිකයින්හට ප්‍රචණ්ඩත්වය නැතිනම් හානි කිරීම් මගින් තර්ජනය කළ හැකිය. බොහෝ විට ළමුන් හට ඔවුන්ට සිදු වූ අපරාධයේ/හානියේ පවතින බරපතලකම හඳුනාගත නොහැකි අතර තොරතුරු හෙළි කිරීමට

ඔවුන් බිය විය හැකිය. ළමා වෙළෙඳාම පිළිබඳ මූලික හඳුනා ගැනීම් සිදු කිරීම සඳහා අවශ්‍ය වන තොරතුරු ලබා ගැනීම සඳහා උපකාර කිරීමට පරීක්ෂණ දර්ශක සංවර්ධනය කෙරේ.

ළමා වෙළෙඳාමේ වින්දිතයින් විවිධ තත්වයන් යටතේ හඳුනාගත හැකිය. සහභාගිවන්නන්, සිද්ධි අධ්‍යයනය සහ භූමිකා රඟ දැක්වීම තුළින් වින්දිතයන් හඳුනාගැනීම සඳහා අවශ්‍ය දැනුම සහ කුසලතා ලබා ගනී.

ආවරණය කිරීමට නියමිත මූලික කරුණු:

- ළමා වෙළෙඳාම පිළිබඳ සාමාන්‍ය දර්ශක
- පිරික්සුම් මෙවලම් භාවිතය

### 4.3.5. ළමා වෙළෙඳාමේ වින්දිතයන් සමඟ සම්මුඛ සාකච්ඡා කිරීමේ මූලික මූලධර්ම

විවිධ අවදානම් වලට ලක්වූ වින්දිතයින් සමඟ සම්මුඛ සාකච්ඡා කිරීමේ මූලික මූලධර්ම බොහොමයක් ළමා වෙළෙඳාමේ වින්දිතයින් සඳහාද අදාළ වේ. ළමා වෙළෙඳාමේ වින්දිතයින් සමඟ සම්මුඛ සාකච්ඡා කිරීම වඩාත් අභියෝගාත්මක විය හැකිය. වෙළෙඳාමේ වින්දිතයින් වූ වැඩිහිටි පුද්ගලයින් සමඟ සම්මුඛ සාකච්ඡා පවත්වනවාට වඩා වැඩි දැනුවත්භාවයක් සහ සංවේදීතාවයක්, ළමා වින්දිතයින් සමඟ කටයුතු කිරීමේදී අවශ්‍ය වන බව දැන ගැනීම වැදගත්ය.

ආවරණය කිරීමට නියමිත මූලික කරුණු:

- වැඩිහිටි වින්දිතයින්ට වඩා, ළමා වෙළෙඳාමේ වින්දිතයින් අවදානමට ලක්විය හැකි වීමට හේතු මොනවාද?
- දරුවෙකු සමඟ සම්මුඛ සාකච්ඡා කළ යුත්තේ කවුද?
- වින්දිත දරුවෙකු සම්මුඛ සාකච්ඡාවට ලක් කිරීමේ අරමුණ සහ ළමුන් සමඟ සිදු කරන සම්මුඛ සාකච්ඡා සඳහා නිර්දේශිත මාර්ගෝපදේශ
- PEACE ආකෘතිය හඳුන්වාදීම
- දරුවෙකු සමඟ සම්මුඛ සාකච්ඡා නොපැවැත්විය යුතු අවස්ථා

### 4.3.6. ළමා - සංවේදී සන්නිවේදනය

ළමයින් වැඩිහිටියන්ට වඩා වෙනස් ආකාරයකට ඔවුන්ගේ වයස, පරිණතභාවය, ලිංගභේදය, ආබාධිතභාවය සහ අනෙකුත් ලක්ෂණ පිළිබිඹු වන ආකාරයෙන් සිතීම, කතා කිරීම, අත්දැකීම් දැක්වීම සහ හැසිරීම සිදු කරයි. පොදුවේ ළමුන්, විශේෂයෙන් වින්දිතයින් සමඟ සන්නිවේදනය කිරීමේදී ඔවුන්ව තවදුරටත් හානිවලින් ආරක්ෂා කර ගැනීම සඳහා මෙන්ම, සහය ක්‍රියාවලීන්ට අර්ථවත් ලෙස සහභාගී වීම සඳහා, ළමුන්ගේ භාෂාව, හැසිරීම සහ ආකල්ප කෙරෙහි වැඩිහිටියන් සහ වෘත්තිකයන් අනුගත විය යුතුය.

වින්දිතයන් සමඟ සම්බන්ධ වන සියලුම පාර්ශවකරුවන්ට ළමා සංවේදී ආකාරයෙන් සන්නිවේදනය කිරීමට හැකි විය යුතුය. හඳුනාගැනීමේ සහ උපකාර කිරීමේ ක්‍රියාවලියේ විවිධ අවධීන් සඳහා දරුවන්ට සම්පූර්ණයෙන්ම සහභාගී විය හැක්කේ ඔවුන් සන්නිවේදනය කරන්නේ කුමක්ද යන්න තේරුම් ගන්නේ නම් පමණි.

සෑම දරුවෙකුම අද්විතීය වන අතර සමාජ පරිසරය, අධ්‍යාපනය, සංස්කෘතිය යනාදී සාධක ඔහුගේ හෝ ඇයගේ හැකියාවට සහ සංවර්ධනයට බලපායි. සාමාන්‍යයෙන්, සාමාන්‍ය ළමයෙකු නිශ්චිත වයසකදී අත්කර ගන්නා

ධාරිතාවය පිළිබඳ ඇගවීමක් ළමා සංවර්ධනයේ අවධීන් වලදී ලබා දෙයි. කෙසේ වෙතත් නව පරිසරයක සිටින සහ/හෝ කරදරයට පත් වූ දරුවෙකු, නිදසුනක් වශයෙන්, අපරාධ අත්දැකීම් සහිත දරුවෙකු, පෙර සංවර්ධන අවධියකට ආපසු යා හැකි බව ප්‍රතිචාර දක්වන්නන් දැන සිටිය යුතුය. මෙයින් අදහස් කරන්නේ අඩු තර්ජනාත්මක තත්ත්වයන් යටතේ දරුවාට තේරුම් ගැනීමට සහ පිළිතුරු දීමට හැකියාවක් පැවති ප්‍රශ්නයක් හෝ තොරතුරු තේරුම් ගැනීමට හෝ ප්‍රශ්නවලට නිවැරදිව පිළිතුරු ලබා දීමට කරදරයකට මුහුණ දුන් දරුවෙකුට නොහැකි විය හැකි බවයි.

### ආවරණය කිරීමට නියමිත මූලික කරුණු:

- සන්නිවේදන ක්‍රියාවලියක ප්‍රධාන කොටස්
- වාචික සහ වාචික නොවන සන්නිවේදන කුසලතා
- වින්දිත දරුවා සමඟ මූලික සංවාද වලදී ප්‍රධාන ක්‍රියාවන්
- රහස්‍යභාවය සහ ආරක්‍ෂාව

**නිර්දිෂ්ට කියවීම්:**

Recommended principles and guidelines on human rights and human trafficking, office of the High Commissioner for Human Rights ( OHCHR)
https://www.ohchr.org/sites/default/files/Documents/Publications/Traffickingen.pdf
UN Protocol on the rights of the child – 1989 https://www.ohchr.org/sites/default/files/crc.pdf
Standard Operating procedures (SOP) for identification, protection and referral of victims of human trafficking, Sri Lanka.
https://srilanka.iom.int/sites/g/files/tmzbdl1601/files/documents/Standard%2520Operation%2520Procedures%2520%2528SOP%2529%2520for%2520the%2520Identification%252C%2520Protection%252C%2520and%2520Referral%2520of%2520Trafficking%2520Victims.pdf
Guidance note on identification, protection and referral of child victims of trafficking, Sri Lanka.
https://resourcecentre.savethechildren.net/pdf/Guidance-Note-on-the-Identification-Protection-and-Referral-of-Child-Victims-of-Trafficking.pdf/
Guidelines on the protection of child victims of trafficking, (UNICEF)
https://www.unhcr.org/sites/default/files/legacy-pdf/4d9484e39.pdf
Guidelines on child friendly legal aid, UNICEF, 2018.
https://www.unicef.org/turkiye/media/7066/file/Guidelines%20on%20Child-Friendly%20Legal%20Aid%20-%202018.pdf
General Child Care Course For Careers in Child Care Giving, NCPA Sri Lanka, 2019.
https://childprotection.gov.lk/images/pdfs/acts-guidelines/2019%20-%20Trainers%20Guide%20(%20General%20Child%20Care%20Course%20_%20NVQ%20Level%204)%20-%20English.pdf
Child Protection Handbook, NCPA Sri Lanka, 2019.
https://childprotection.gov.lk/images/pdfs/handbooks/Child%20Protection%20Handbook%20-%20Sinhala%202019.5.10.pdf

## 4.4. ළමා වෙළෙඳාම සහ වෙනත් ආකාරයේ අපචාරයන්ට ලක්වූ වින්දිතයින්ගේ රැකවරණ අවශ්‍යතා

**පාඨමාලා විස්තරය:**

ළමා වෙළෙඳාම සහ වෙනත් අපචාරයන්ට ලක් වූ දරුවන්ට රැකවරණය ලබා දීමේදී සෞඛ්‍යය, ආරක්ෂාව සහ යහපැවැත්ම වැනි ඔවුන්ගේ මූලික අවශ්‍යතා කෙරෙහි දැඩි අවධානයක් යොමු කරයි. බොහෝ විට එය "කිසිදු හානියක් නොකරන්න" යන මූලික රීතියට වඩා ඉහළින් හා ඉන් ඔබ්බට යයි. ආයතනගත දරුවන්ගේ රැකවරණ අවශ්‍යතා සපුරාලීමේ වගකීම පැවරෙන්නේ ඔවුන්ට පහසුකම් සපයන සුරැකුම් කාර්ය මණ්ඩලයටයි. දරුවන්ට ලැබෙන රැකවරණයේ ගුණාත්මක බව, දරුවන්ගේ වර්ධනයට, පැවැත්මට සහ කම්පනයෙන් සුවය ලැබීමට අත්‍යවශ්‍ය වේ. වෙළෙඳාම බොහෝ මානයන් සහිත සංකීර්ණ සංසිද්ධියක් බැවින්, වෙළෙඳාම සහ වෙනත් අපචාරයන්ට මුහුණ දුන් ළමුන් සඳහා මනෝ සමාජීය ප්‍රවේශයක් භාවිතා කරමින් පරිපූර්ණ රැකවරණයක් සැපයීම ඉතා වැදගත් වේ (IOM, 2010). මනෝ සමාජීය ප්‍රවේශයට අනුව, ඕනෑම ආකාරයක ආධාරයක් ලබා දීමේදී සමාජ, මනෝවිද්‍යාත්මක සහ සංස්කෘතික අංශයන්ගේ අන්තර් සම්බන්ධතාවය සලකා බැලිය යුතුය. ළමා වෙළෙඳාමේ හෝ වෙනත් ආකාරයේ අපචාරයන්ගේ වින්දිතයින් හට තවදුරටත් චිත්තවේගීය හානි සිදුවීම වැළැක්වීම සඳහා, මෙම වින්දිතයින්ගේ මානසික තත්ත්වය සහ අතීතය සම්බන්ධයෙන් මෙන්ම ඔවුන්ගේ අත්දැකීම් සහ සංස්කෘතික පසුබිම සම්බන්ධයෙන් ද, ඔවුන් සමඟ කටයුතු කරන සුරැකුම් කාර්ය මණ්ඩලය සංවේදී විය යුතුය. එබැවින්, ආයතනික රැකවරණය යටතේ සිටින අනෙකුත් ළමුන්ගේ අවශ්‍යතාවලට වඩා වෙනස් වන, ළමා වෙළෙඳාමේ වින්දිතයින්ගේ රැකවරණ අවශ්‍යතා පිළිබඳ දැනුම සහ අවබෝධය ඔවුන්ට ලබා දීම අත්‍යවශ්‍ය වේ. මෙහිදී අවශ්‍ය වන අත්‍යවශ්‍ය අවශ්‍යතා අතරට ශාරීරික අවශ්‍යතා, මානසික සෞඛ්‍යය, චිත්තවේගීය සහ මානසික අවශ්‍යතා, අධ්‍යාපනික සහ වෘත්තීය පුහුණු අවශ්‍යතා, සමාජ අවශ්‍යතා, නීති ආධාර සහ නියෝජනය සඳහා වන අවශ්‍යතා සහ නැවත සමාජගත කිරීමේ සහ ප්‍රතිසංවිධාන අවශ්‍යතා ඇතුළත් වේ. එම අවශ්‍යතා සපුරාලීමට සහ ප්‍රකෘතිමත් වීම කරා පියනගන ඔවුන්ගේ ගමනට පහසුකම් සැලසීමට, ළමා වෙළෙඳාමේ වින්දිතයින් නැවත සමාජගත කිරීමට අවශ්‍ය දැනුම සහ කුසලතා සුරැකුම් කාර්ය මණ්ඩලය සතුව පැවතිය යුතුය.

**ඉගෙනුම් අරමුණු**

**මොඩියුලයේ ප්‍රධාන අරමුණ:**

මෙම මොඩියුලයේ ප්‍රධාන පරමාර්ථය වන්නේ, ළමා වෙළෙඳාම සහ වෙනත් ආකාරයේ අපචාරයන්ට ලක් වූ වින්දිතයින්ගේ විවිධ කාණ්ඩයන් වල රැකවරණ අවශ්‍යතා පිළිබඳව ශ්‍රී ලංකාවේ ළමාරක්ෂක කාර්ය මණ්ඩලය අතර දැනුම සහ අවබෝධය වර්ධනය කිරීමයි. මෙහිදී සංවර්ධන අවශ්‍යතා, සෞඛ්‍ය අවශ්‍යතා (ශාරීරික හා මානසික) චිත්තවේගීය සහ මනෝවිද්‍යාත්මක අවශ්‍යතා, අධ්‍යාපනික සහ වෘත්තීය පුහුණු අවශ්‍යතා, සමාජ අවශ්‍යතා, නීති ආධාර සහ නියෝජනය සඳහා අවශ්‍යතා, එක්සත් කිරීමේ සහ නැවත සමාජගත කිරීමේ අවශ්‍යතා මෙන්ම ළමා වෙළෙඳාමේ වින්දිතයින්ට අවශ්‍ය සුරැකුම් අවශ්‍යතා සැපයීමට අවශ්‍ය කුසලතා සම්බන්ධයෙන් දැනුම සහ අවබෝධය වර්ධනය කිරීම අපේක්ෂා කෙරේ. තවද, ශ්‍රී ලාංකීය සන්දර්භය තුළ ළමා වෙළෙඳාම සහ වෙනත් ආකාරයේ අපචාරයන්ට ලක් වූ වින්දිතයින්ට රැකවරණය සැපයීම සඳහා පවතින අතිරේක උපකාරක සේවාවන් පිළිබඳ දැනුවත්භාවය වැඩි කිරීමද අරමුණු කෙරේ.

**මෙම මොඩියුලය සම්පූර්ණ කිරීමෙන් පසු, සහභාගිවන්නන්ට හැකි විය යුතුය**

1. ළමා වෙළෙඳාම සහ වෙනත් ආකාරයේ අපචාරයන්ට ලක් වූ වින්දිතයින්ගේ රැකවරණ අවශ්‍යතා සපුරාලීමේ වැදගත්කම අවබෝධ කර ගැනීම.
2. ළමා වෙළෙඳාම සහ වෙනත් ආකාරයේ අපචාරයන්ට ලක් වූ වින්දිතයින්ගේ විවිධ ආකාරයේ රැකවරණ අවශ්‍යතා හඳුනා ගැනීම.
3. ළමා වෙළෙඳාමේ වින්දිතයින්ගේ රැකවරණ අවශ්‍යතාවලට ප්‍රතිචාර දැක්වීම සඳහා මනෝ සමාජීය ප්‍රවේශයක් භාවිතා කිරීම.
4. රැකවරණ අවශ්‍යතා සහිත ළමුන් සඳහා රැකවරණය සැපයීමේදී අත්‍යවශ්‍ය කුසලතා ප්‍රදර්ශනය කිරීම.
5. රැකවරණය ලබන ළමුන් අතර පොදු මානසික සෞඛ්‍ය ගැටළු වල සලකුණු සහ දර්ශක හඳුනා ගැනීම.
6. මානසික සෞඛ්‍ය තත්ත්වයන් අපකීර්තියට පත් කිරීම වැළැක්වීම සඳහා දැනුවත්භාවය ප්‍රදර්ශනය කිරීම.
7. ශ්‍රී ලංකාව තුළ පවතින අතිරේක උපකාරක සේවා සහ යොමු කිරීමේ ප්‍රොටකෝල පිළිබඳ දැනුම සංස්ලේෂණය කිරීම.

**මූලික තේමාවන්**

## 4.4.1. ළමා වෙළෙඳාම සහ වෙනත් ආකාරයේ අපචාරයන්ට ලක් වූ වින්දිතයින්ගේ රැකවරණ අවශ්‍යතා සපුරාලීමේ වැදගත්කම පිළිබඳ හැඳින්වීම

### 4.4.1.1. ළමා වෙළෙඳාම සහ වෙනත් ආකාරයේ අපචාරයන් නිර්වචනය කිරීම

I. ළමා වෙළෙඳාම, ළමුන් කායික, චිත්තවේගීය වශයෙන් නොසළකා හැරීම සහ ලිංගික අපයෝජනයන් යනු, ක්ෂණික හා පුළුල් අවධානයක් අවශ්‍ය වන මානුෂීය ගැටළු වශයෙන් සැලකේ. ඔවුන්ගේ යහපැවැත්ම, වර්ධනය කිරීම සඳහා විශේෂිත රැකවරණයක් ලබා දීම බෙහෙවින් වැදගත් වේ.

II. වෙළෙඳාම්කරුවන් මෙම දරුවන්ගේ දුර්වලතා, අහිංසකත්වය සහ අසරණ භාවයෙන් ප්‍රයෝජන ගනී. එබැවින්, වෙළෙඳාමේ වින්දිතයින් ළමා කාලය අහිමි වීම, බලහත්කාරයෙන් වැඩ කිරීම, සිරගත කිරීම් සහ අපයෝජනයන්ට මුහුණ දෙයි. මෙය නැවත කම්පනයට පත්වීම ඇතුළුව ආරක්ෂාව, නීතිමය සහ සෞඛ්‍ය ආරක්ෂණ ගැටළු සඳහා මග පාදයි.

III. තැනැත්තන් වෙළෙඳාම සහ අපයෝජනය හේතුවෙන් බලපෑමට ලක්වන දරුවන්ගේ රැකවරණ අවශ්‍යතා සපුරාලීම, ඔවුන්ගේ යහපැවැත්ම අගය කරන සමාජයක් ඇති කිරීම සඳහා දායක වන අතරම, අවදානමට ලක්වීමේ චක්‍රය අවසන් කිරීම, පුනරාවර්තනය වැළැක්වීම සහ ඔරොත්තු දෙන පුද්ගලයන් නිර්මාණය කිරීම සඳහා ඉතා වැදගත් වේ.

### 4.4.1.2. ළමා වෙළෙඳාමේ වින්දිතයින්ගේ රැකවරණ අවශ්‍යතා, ආයතනික රැකවරණය යටතේ සිටින වෙනත් ළමුන්ගෙන් වෙනස්වන ආකාරය හඳුනා ගැනීම.

I. ළමා වෙළෙඳාම සාපරාධී ක්‍රියාවක්, මානව හිමිකම් කඩකිරීමක්, සූරාකෑමේ ආකාරයක් සහ ප්‍රචණ්ඩ ක්‍රියාවක් ලෙස හඳුනාගෙන ඇත. බොහෝ විට ආයතනික රැකවරණය යටතේ සිටින අනෙකුත්

ළමයින්ට සාපේක්ෂව, ළමා වෙළෙඳාමේ වින්දිතයින් ඉහළ සත්කාර අවශ්‍යතා පෙන්නුම් කරන්නේ ඔවුන් විඳදරාගත් විශේෂිත කම්පන සහ අත්දැකීම් හේතුවෙනි. ප්‍රධාන වෙනස්කම් කිහිපයක් පහත දැක්වේ.

a. දැඩි කම්පන සහ සූරාකෑම
b. නීතිමය ගැටළු
c. ආරක්ෂාව පිළිබඳ ගැටළු
d. සූරාකෑමෙන් ඉවත් වීම
e. නැවත සමාජගත කිරීමේ අභියෝග
f. අධ්‍යාපන හිඩැස් සහ නිපුණතා සංවර්ධනය
g. සංස්කෘතික සහ භාෂා සංවේදීතාව
h. මනෝවිද්‍යාත්මක සහ සෞඛ්‍ය ආරක්ෂණ අවශ්‍යතාවය

II. වෙළෙඳාම් ඉතිහාසයක් නොමැතිව ආයතනික රැකවරණය යටතේ සිටින දරුවන්ට මූලික අවශ්‍යතා (උදා: ප්‍රමාණවත් පෝෂණය, නවාතැන් සහ ඇඳුම් පැළඳුම්) පෝෂණය, අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා, ස්ථාවර සබඳතා සහ චිත්තවේගීය සහයෝගය වැනි වඩාත් සාමාන්‍ය අවශ්‍යතා පැවතිය හැකිය. මෙම දරුවන්ට අධ්‍යාපනික අවශ්‍යතා සපුරාලීම, සමාජානුයෝජනය ප්‍රවර්ධනය කිරීම, සාමාන්‍ය සෞඛ්‍ය සේවා ලබා ගැනීම මෙන්ම චර්යාත්මක සහ චිත්තවේගීය අභියෝග ආමන්ත්‍රණය කිරීම අවශ්‍ය වේ, නමුත් මෙම දරුවන්ගේ අවශ්‍යතාවන් වල ස්වභාවය සහ තීව්‍රතාවය වෙනස් විය හැක.

III. ළමා රැකවරණයේ ඇතැම් අංග සමාන වුවත්, ළමා වෙළෙඳාමේ වින්දිතයින්ගේ අත්දැකීම්වලට අනන්‍ය අවශ්‍යතා ඇත.

**4.4.1.3. ළමා වෙළෙඳාම සහ වෙනත් ආකාරයේ අපචාරයන්ට ලක් වූ වින්දිතයින් සඳහා විවිධ ආකාරයේ රැකවරණ අවශ්‍යතා හඳුනා ගැනීම:**

a) සංවර්ධන අවශ්‍යතා (ආබාධිත අවශ්‍යතා පවතින්නේ නම් එම අවශ්‍යතා සහ ලිංගික දිශානතියට අදාළ අවශ්‍යතා ඇතුළුව)
b) මානසික සෞඛ්‍යය, චිත්තවේගීය සහ මානසික අවශ්‍යතා
c) අධ්‍යාපනික/වෘත්තීය පුහුණු අවශ්‍යතා
d) සමාජ අවශ්‍යතා
e) නීතිමය සහාය/නියෝජනය සඳහා අවශ්‍යතා.
f) නැවත එක්සත් කිරීම සහ නැවත සමාජගත කිරීමේ අවශ්‍යතා

**4.4.1.4. ළමා වෙළෙඳාම සහ වෙනත් ආකාරයේ අපචාරයන්ට ලක් වූ වින්දිතයින්ගේ රැකවරණය සම්බන්ධයෙන් උපකාර කිරීම සඳහා වන මනෝ සමාජීය ප්‍රවේශය**

I. මත්ද්‍රව්‍ය ජාවාරමට හෝ අපයෝජනයට ලක් වූ දරුවන්ට ඕනෑම ආකාරයක උපකාරයක් ලබා දීමේදී සමාජ, මනෝවිද්‍යාත්මක සහ සංස්කෘතික යන අංශයන් ත්‍රිත්වයෙහි අන්තර් සම්බන්ධතාවය පිළිබඳව මනෝ සමාජීය ප්‍රවේශය ඔස්සේ සලකා බලයි. සමාජ සත්කාර ලබා දෙන අතරම, දරුවාට තවදුරටත් හානියක් නොවන ආකාරයට, දරුවා නැවත චිත්තවේගීයව කම්පනයට පත් නොකිරීමට, දරුවාගේ

මනෝවිද්‍යාත්මක තත්ත්වය සහ ඔහුගේ හෝ ඇයගේ අතීත අත්දැකීම් පිළිබඳව රැකබලා ගන්නෙකු දැනුවත් විය යුතුය. සහාය ලබා දීමේදී, ළමා භාරකරු සමාජ ආධාරක පද්ධති සමඟ සම්බන්ධ විය යුතු අතර දරුවා සඳහා සංස්කෘතික වශයෙන් සුදුසු සහ සංවේදී උපකාරක යාන්ත්‍රණයක් සලකා බැලිය යුතුය.

II. එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) IASC මාර්ගෝපදේශ (2007) අගය කර ඇති අතර ළමුන් සඳහා මනෝ සමාජීය සහය සහ මැදිහත්වීම් වැඩසටහන් (IOM, 2020) සංවර්ධනය කිරීමේදී මැදිහත්වීම් මට්ටම් හතරක් සම්බන්ධ වන බව යෝජනා කරයි.

IASC මානසික සෞඛ්‍ය සහ මනෝ සමාජීය සහාය (MHPSS) පිරමීඩය (ලෝක සෞඛ්‍ය සංවිධානය, යුධ කම්පන පදනම, ලෝක දැක්ම ජාත්‍යන්තරය, 2011) භාවිතා කරන්න.

## 4.4.2. රැකවරණ අවශ්‍යතා සඳහා අත්‍යවශ්‍ය කුසලතා හඳුනා ගැනීම සහ පුහුණු කිරීම

### 4.4.2.1. සන්නිවේදන කුසලතා: වාචික සහ වාචික නොවන සන්නිවේදන කුසලතා, ක්‍රියාකාරී සවන්දීම, සහකම්පනය සහ අනුකම්පාව

I. වාචික සන්නිවේදනය සඳහා භූමිකා රඟ දැක්වීමේ පුහුණුව:

සංවේදී සවන්දීම, විවෘත ප්‍රශ්න, කම්පන-දැනුවත් භාෂාව (ප්‍රේරක වාක්‍ය ඛණ්ඩ වළක්වා ගැනීම සහ ආධාරක පරිසරයක් සහතික කිරීම), සංස්කෘතික සංවේදීතාව (දරුවාගේ සංස්කෘතික පසුබිම හඳුනාගෙන ගරු කිරීම, සන්නිවේදනය ඔවුන්ගේ අද්විතීය අත්දැකීම් සහ විශ්වාසයන්ට සංවේදී බව සහතික කිරීම).

II. වාචික නොවන සන්නිවේදනය සඳහා භූමිකා රඟ දැක්වීමේ පුහුණුව:

a. ශරීර භාෂාව: විවෘත, උණුසුම් සහ තර්ජනාත්මක නොවන හැසිරීම් ප්‍රකාශ කිරීමට ඔබේම ශරීර භාෂාව කෙරෙහි අවධානය යොමු කරන්න. දරුවාගේ සුවපහසු මට්ටම පිළිබඳ ඉඟි සඳහා දරුවාගේ ශරීර භාෂාව නිරීක්ෂණය කරන්න.

b. මුහුණේ ඉරියව්: අවබෝධය, සහයෝගය සහ සංවේදනය ප්‍රකාශ කිරීමට සුදුසු මුහුණේ ඉරියව් භාවිතා කරන්න.

c. අක්ෂි සම්බන්ධතා: අක්ෂි සම්බන්ධතා සම්මතයන්ට බලපෑම් කළ හැකි සංස්කෘතික වෙනස්කම් පිළිබඳව දැනුවත්ව සිටින අතරම විශ්වාසයේ හැඟීමක් ගොඩනැගීමට සුදුසු අක්ෂි සම්බන්ධතා පවත්වා ගන්න.

### 4.4.2.2. සහකම්පනය අනුකම්පාවෙන් වෙනස් වන ආකාරය

I. සහකම්පනය සහ අනුකම්පාව නිර්වචනය කර, අපචාරයන්ට සහ වෙළෙඳාමට ලක් වූ ළමුන්ට අනුකම්පා කරනවාට වඩා ඔවුන් කෙරෙහි සහකම්පනය දැක්වීමේ වෙනස්කම් සහ වැදගත්කම හඳුනා ගැනීම.

II. පුහුණුවීම් අතරතුර සහභාගිවන්නන්ට ඔවුන්ගේ සේවා පළපුරුද්ද භාවිතා කළ හැක.

**4.4.2.3. ළමා වෙළෙඳාමේ වින්දිතයින්ට ඔවුන්ගේ හැඟීම් නියාමනය සම්බන්ධයෙන් උපකාර කිරීම සඳහා ළමා සුරැකුම් කාර්ය මණ්ඩලය තුළ චිත්තවේගීය නියාමන කුසලතා ගොඩනැගීම**

I. ළමා වෙළෙඳාමේ වින්දිතයින් වෙනුවෙන් ආධාරක පරිසරයක් නිර්මාණය කිරීම සඳහා ළමා සුරැකුම් කාර්ය මණ්ඩලය සීමා මායිම් පවත්වාගෙන යාම තීරණාත්මක වීමට හේතු පැහැදිලි කිරීම.

II. සීමාවන් පවත්වා ගැනීමට අදාළ උපාය මාර්ග.

a. අවධානය සම්බන්ධ පුහුණු වීම්
b. පුහුණුව සහ අධ්‍යාපනය
c. ස්වයං දැනුවත්කම සංවර්ධනය කරන ක්‍රියාකාරකම්
d. රැකවරණ සපයන්නන් ආදර්ශමත් ලෙස සේවය කිරීම
e. චිත්තවේගීය පුහුණු කිරීම

**4.4.2.4. සෞඛ්‍ය සම්පන්න සීමාවන් සහ චර්යාවන් සංවේදීව පවත්වා ගැනීමේ හැකියාව ඉහළ නැංවීම**

1. භාරකරුවන් විසින් සංවේදී උපක්‍රම භාවිතා කරමින් ළමා වෙළෙඳාමේ වින්දිතයින්ගේ සහ වෙනත් අපචාරයන්ට ලක් වූ දරුවන්ගේ යහපැවැත්ම සඳහා සෞඛ්‍ය සම්පන්න සීමාවන් සහ චර්යාවන් ස්ථාපිත කර පවත්වාගෙන යා යුතුය.

a) ස්ථාවර සහ පුරෝකතනය කළ හැකි දෛනික චර්යාවන් ස්ථාපිත කරන්න: කම්පනය අත්විඳින ලද දරුවන්ට ස්ථාවරත්වය සහ පුරෝකතනය කිරීමේ හැඟීමක් ලබා දෙන බැවින්, කම්පනයට පත් වූ දරුවන්ට මෙම දින චර්යාව හේතුවෙන් බොහෝ විට සැනසීම ලැබේ.

b) කම්පන-තොරතුරු සත්කාර මූලධර්ම යෙදීම: මායිම් ස්ථාපිත කිරීමේදී කම්පන-දැනුවත් සත්කාර මූලධර්ම යොදන්න. විශ්වාසය තැබීමට, සබඳතා ගොඩනඟා ගැනීමට සහ සංවේදීතාවයෙන් මායිම් සැකසීමට ප්‍රවේශ වීමට දරුවා තුළ පවතින හැකියාව කෙරෙහි කම්පනයෙන් ඇති විය හැකි බලපෑම වටහා ගැනීම. විය හැකි ප්‍රේරක පිළිබඳව දැනුවත් වීම සහ දරුවා නැවත කම්පනයට පත් විය හැකි තේමාවන් හෝ භාෂාවෙන් වළකින්න. සන්නිවේදනය සඳහා ආරක්ෂිත අවකාශයක් නිර්මාණය කිරීම සහ දරුවාගේ හැඟීම් සහ අත්දැකීම් වලංගු කිරීම, ඔවුන්ගේ හැඟීම් පිළිගෙන ගරු කරන බව අවධාරණය කරන්න.

c) ආරක්ෂාව සඳහා ප්‍රමුඛත්වය ලබාදීම

d) පෞද්ගලික අවකාශයට ගරු කිරීම

e) සුදුසු අවස්ථාවන් වලදී තීරණ ගැනීම සඳහා දරුවන් සම්බන්ධ කර ගැනීම

f) විවෘත සන්නිවේදන මාර්ග පවත්වාගෙන යාම

g) සීමාවන් තුළ තේරීම් සපයන්න: සාධාරණ සීමාවන් තුළ දරුවන්ට තේරීම් ඉදිරිපත් කරන්න. මෙය ඔවුන්ට තම පරිසරය කෙරෙහි යම් පාලනයක් ඇති කිරීමට ඉඩ සලසයි, ස්වාධීනත්වය පිළිබඳ හැඟීමක් ප්‍රවර්ධනය කරයි.

### 4.4.3. ළමා වෙළෙඳාමේ වින්දිතයින් තුළ පවතින මානසික සෞඛ්‍ය ගැටලු පිළිබඳ සංඥා සහ දර්ශක හඳුනා ගැනීම සහ ඔවුන් අපකීර්තියට පත් කිරීම හෝ ලේබල් කිරීම තුරන් කිරීමේ වැදගත්කම

#### 4.4.3.1. මානසික සෞඛ්‍ය තත්ත්වයන් අපකීර්තියට ලක් කිරීම සහ ලේබල් කිරීම තුරන් කිරීම

a. අපකීර්තියට පත් කිරීම මගින්, දරුවන් දැනට අත්විඳින දුෂ්කරතා වඩාත් නරක අතට හැරේ, එය සුව කිරීමට සහ අත්‍යවශ්‍ය මානසික සෞඛ්‍ය රැකවරණය ලබා ගැනීමට ඔවුන්ට ඇති හැකියාවට බාධා කරයි.

b. දරුවන් ලැජ්ජාව සහ තනිකම වැනි හැඟීම් අභ්‍යන්තරීකරණය කරගත හැකි අතර, එය ඔවුන්ගේ ආත්ම ශක්තියට සහ සාමාන්‍ය යහපැවැත්මට අහිතකර බලපෑමක් ඇති කළ හැකිය.

c. මානසික සෞඛ්‍ය දුෂ්කරතා පැවතීම ඔවුන්ගේ වරදක් නොවන බව අවධාරණය කිරීම.

#### 4.4.3.2. ළමා වෙළෙඳාම සහ වෙනත් ආකාරයේ අපචාරයන්ට ලක් වූ වින්දිතයින් තුළ පවතින මානසික සෞඛ්‍ය ගැටලු පිළිබඳ සංඥා සහ දර්ශක හඳුනා ගැනීම

පහත දක්වා ඇති මෙම කොන්දේසි සහභාගිවන්නන් සමඟ කෙටියෙන් සාකච්ඡා කරන්න. කොන්දේසි සඳහා ජාත්‍යන්තර රෝග වර්ගීකරණය (ICD) හෝ මානසික ආබාධ පිළිබඳ රෝග විනිශ්චය සහ සංඛ්‍යාන අත්පොත (DSM) රෝග විනිශ්චය නිර්ණායක භාවිතා නොකර, සාමාන්‍ය රෝග ලක්ෂණ භාවිතා කරන්න. භාරකරුවන්ට ළමුන් හඳුනා ගැනීමට නොහැකි බවත් රෝග විනිශ්චය සඳහා ඔවුන් සෞඛ්‍ය සේවා වෘත්තිකයෙකු වෙත යොමු කළ යුතු බවත් උපදේශකවරයා සඳහන් කළ යුතු බව කරුණාවෙන් සලකන්න; මෙය තත්වය හඳුනා ගැනීම සඳහා පමණි.

a) කම්පනය
b) මානසික අවපීඩනය (විෂාදය) සහ අඩු මනෝභාවය
c) අවධානය සම්බන්ධ ගැටළු.
d) අධි ක්‍රියාකාරීත්වය
e) ආක්‍රමණශීලී සහ විරෝධය දක්වන හැසිරීම්
f) කෝපය (හැඟීම් අක්‍රමිකතා)
g) ඉගෙනීමේ දුෂ්කරතා
h) ඔටිසම්
i) ස්වයං හානි සිදුකර ගැනීම

### 4.4.4. ළමා වින්දිතයින් යොමු කිරීමේ මාර්ගෝපදේශ සහ ක්‍රියා පටිපාටි - ආරක්ෂිත යොමු කිරීම්

#### 4.4.4.1. යොමු කිරීම් වල වැදගත්කම හඳුනා ගැනීම

ළමා වෙළෙඳාමේ වින්දිතයින්ට සහ අවශ්‍ය අනෙකුත් අයට අදාළ අවශ්‍යතා සහ ආධාර සැපයීම සඳහා සියලුම ප්‍රධාන පාර්ශවකරුවන් සම්බන්ධ කර ගැනීමේ වැදගත්කම සාකච්ඡා කරන්න.

#### 4.4.4.2. "ළමා වෙළෙඳාමේ වින්දිතයින් හඳුනා ගැනීම, ආරක්ෂා කිරීම සහ යොමු කිරීම පිළිබඳ මාර්ගෝපදේශ සටහන" මත පදනම්ව යොමු කිරීමේ යාන්ත්‍රණය අනුගමනය කරන්න

**පළමු අදියර**

පළමු පියවර: පළමු තොරතුරු වාර්තා කිරීම, පැමිණිලි සටහන් කිරීම සහ හදිසි අවශ්‍යතා හඳුනා ගැනීම.

පහත සඳහන් ආයතන ඇතුළුව බොහෝ ආයතන වෙත, ළමා වෙළෙඳාම් සහ අපචාරයන්ට අදාළ වියහැකි තොරතුරු හෝ පැමිණිලි සිදු කිරීමට, ලැබීමට හෝ වාර්තා කිරීමට හැකිය.

1. ශ්‍රී ලංකා පොලිසිය (පොලිස් මූලස්ථානය 119 හෝ ප්‍රාදේශීය පොලිස් ස්ථාන හරහා, සංචාරක පොලිසිය, 'ළමා හා කාන්තා කාර්යාංශය').
2. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය (1929 හරහා ප්‍රධාන කාර්යාලය, NCPA පොලිසියට හෝ NCPA හි දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය නිලධාරීන්ට).
3. ජාතික පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව (ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් හරහා) සහ පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව (පරිවාස නිලධාරීන් හරහා)
4. 1938 හරහා කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ කාන්තාවන් පිළිබඳ ජාතික කමිටුව
5. ජාතික/ප්‍රාදේශීය මට්ටමින් කම්කරු දෙපාර්තමේන්තුව (කම්කරු නිලධාරීන් හරහා)
6. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
7. සිවිල් සමාජ සංවිධාන / දේශීය හා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන
8. ශ්‍රී ලංකා තානාපති කාර්යාල/කොන්සල් කාර්යාල
9. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

**දෙවන අදියර**

සංක්‍රාන්ති සහ දිගු කාලීන අවශ්‍යතා සඳහා ප්‍රතිචාරය - වෛද්‍ය ප්‍රතිකාර

රෝහල්ගත කිරීම - අවශ්‍ය ඕනෑම වෛද්‍ය ප්‍රතිකාරයක් සඳහා ළඟම ඇති රජයේ රෝහල හෝ අධිකරණ වෛද්‍ය නිලධාරී (JMO).

1. සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් මෙහෙයවන සායනික සිද්ධි සම්මන්ත්‍රණ සහ ආයතනික සිද්ධි සම්මන්ත්‍රණ - නීතිය ක්‍රියාත්මක කිරීමේ බලධාරීන්, වෛද්‍ය වෘත්තිකයන්, NCPA සහ පරිවාස නිලධාරියෙකු වැනි ප්‍රධාන පාර්ශවකරුවන්.

2. ආයතනික සිද්ධි සම්මන්ත්‍රණය පරිවාස නිලධාරියා විසින් අදාළ මහේස්ත්‍රාත්වරයාගේ සලකා බැලීම සඳහා ඔහුගේ/ඇයගේ සමාජ විමර්ශන වාර්තාව සමඟ අදාළ අධිකරණයට ඉදිරිපත් කළ යුතුය.

**තෙවන අදියර**

පොලිසිය විසින් විමර්ශනය කිරීම (පූර්ව නඩු විභාගය) සහ අධිකරණයට කරුණු වාර්තා කිරීම.

**සිව්වන අදියර**

නඩු විභාගය සහ පශ්චාත් නඩු විභාගය.

**පස්වන අදියර**

ළමා වෙළෙඳාමේ වින්දිතයින් බවට පත් වූ විදේශිකයන් ආපසු පැමිණීම/නැවත ගෙන්වා ගැනීම. පවතින අතිරේක උපකාරක සේවාවන්හි දැනුවත් කිරීම.

**4.4.4.3. රාජ්‍ය අංශයේ සේවා**

**4.4.4.4. රාජ්‍ය නොවන සංවිධාන විසින් සපයනු ලබන සේවාවන්**

"ශ්‍රී ලංකාවේ ළමා සංවර්ධන අමාත්‍යාංශයේ, ළමා වෙළෙඳාමේ වින්දිතයින් හඳුනා ගැනීම, ආරක්ෂා කිරීම සහ යොමු කිරීම පිළිබඳ මාර්ගෝපදේශ සටහන් අනුගමනය කරන්න."

**නිර්දිෂ්ට කියවීම:**


Greenbaum, J., & Albright, K. (2018). Improving health care services for trafficked persons. International Centre for Missing & Exploited Children. https://publications.iom.int/books/caring-trafficked-persons-guidance-health-providers

International Organization for Migration. (2020). Caring for trafficked persons: Guidance for health providers. Training, Facilitator's guide. https://publications.iom.int/books/caring-trafficked-persons-guidance-health-providers-facilitators-guide

IASC. (2007). IASC Guidelines on Mental Health and Psychosocial Support in Emergency Settings. Geneva: Inter-Agency Standing Committee. https://interagencystandingcommittee.org/sites/default/files/migrated/2020-11/IASC%20Guidelines%20on%20Mental%20Health%20and%20Psychosocial%20Support%20in%20Emergency%20Settings%20%28English%29.pdf

State Ministry of Women and Child Development, Pre-Schools & Primary Education, School infrastructure & education Services. (n.d). Guidance note on the identification, protection and referral of child victims of trafficking. https://srilanka.savethechildren.net/sites/srilanka.savethechildren.net/files/library/SOP%20Book%20Final%20Artwork-compressed.pdf

## 4.5. ළමා වෙළඳාමේ වින්දිතයින්ගේ අභියෝගාත්මක හැසිරීම් සහ අවදානම් කළමනාකරණය කිරීම

**පාඨමාලා විස්තරය:**

මෙම මොඩියුලය, විශේෂයෙන්ම වෙළෙඳාම්, අපචාරයන් සහ වෙනත් ආකාරයේ අභිමිවීම්වලට ලක්වූ ළමා වින්දිතයින් හා සම්බන්ධ වූ අභියෝගාත්මක හැසිරීම් පිළිබඳ හැඳින්වීමක් ඉදිරිපත් කරයි. එය, ඔවුන් නිසැකවම උගත් පැවැත්මේ ප්‍රතිචාර දැක්වීමට හේතු විය හැකි දරුවාගේ ජීවන අත්දැකීම් සහ අනෙකුත් නැඹුරු සාධක සන්දර්භය තුළ අභියෝගාත්මක හැසිරීම් ස්ථානගත කිරීමට සිසුන් පුහුණු කරයි.

ආධාරක හෝ ස්ථාවර පවුල් පරිසරයක හැදී වැඩෙන දරුවන් මෙන් නොව, ළමා වෙළෙඳාමේ වින්දිතයින් බොහෝ විට මූල්‍ය හෝ සමාජ අනාරක්ෂිත භාවය එනම්, අසමත්, දුර්වල ලෙස සන්නද්ධ, රෝගී හෝ අස්ථාවර දෙමාපියන් හෝ රැකබලා ගන්නන්, ප්‍රමාණවත් රැකවරණයක්, ආරක්ෂාවක් සහ සුරක්ෂිතතාවක් සැපයීමට නොහැකි; ඔවුන් සහ ඔවුන්ගේ පවුල් සූරාකෑමට ලක්වන වැඩිහිටියන් සහ උපකාරශීලී නමුත් කුරිරු වැඩිහිටියන් ආදී සාධක හේතුවෙන් සැලකිය යුතු ජීවන ආතතියකට මුහුණ දෙනු ඇත. විශේෂයෙන්ම ළමා වෙළෙඳාමේ වින්දිතයින් වැඩිහිටියන් කෙරෙහි සුපරීක්ෂාකාරීව හා අවිශ්වාසයෙන් සිටීමට ඉගෙන ගත හැකි අතර, ඔවුන් මුහුණ දෙන යථාර්ථයන් පිළිබඳ අවබෝධයක් නොමැති හෝ අධිකාරියක් ඇති වැඩිහිටියන් සම්බන්ධ අත්දැකීම් ලබා ඇත. නිදසුනක් වශයෙන්, අස්ථාවර නිවාසවල සිටින සහ අනාරක්ෂිත මූල්‍ය පසුබිමක් සහිත දරුවන් මේ වන විටත් සමාජ සහ පාසල් පරිසරයන්ගෙන් විනිශ්චයට සහ ප්‍රතික්ෂේප කිරීම්වලට මුහුණ දී තිබේ. දෙමාපියෙකු හෝ භාරකරුවෙකු විසින් අතහැර දමා ඇති හෝ අපයෝජනයට ලක් වූ දරුවන් ආදරය, රැකවරණය සහ අභිලාෂයන් වැනි දේ ලැබීම සඳහා තමන් නුසුදුසු යැයි විශ්වාස කළ හැකිය. ඇතැම් දරුවන් රැකවරණ සපයන්නන් කෙරෙහි අවිශ්වාසයෙන් සිටීමට, ක්‍රියාකාරකම් කඩාකප්පල් කිරීමට, සමච්චල් කිරීමට හෝ අධිකාරියෙන් ඉවත් වීමට මෙම සාධක හේතු විය හැකිය. මෙම හැසිරීම් මොනවාද යන්න තේරුම් ගැනීමට රැකවරණ සපයන්නන් කාලය ගත නොකරන්නේ නම්, ඔවුන් දරුවාගේ නොහොබිනා, අගෞරවනීය හෝ ආරක්ෂාකාරී හැසිරීම් වලට දණ්ඩනීය ලෙස ප්‍රතිචාර දැක්වීමේ අවදානමක් පවතී. එය දරුවා ඔවුන්ගෙන් පළමුවෙන් අපේක්ෂා කරන ආකාරයටම, එනම් නෛසර්ගිකව නරක, සහ දඬුවම් ලැබිය යුතු තැනැත්තන් ලෙස දරුවන්ව විනිශ්චය කිරීමක් වේ. මෙය දරුවා විසින්, රැකබලා ගන්නෙකු විශ්වාස කිරීමට සහ ඔවුන්ගෙන් නව හැසිරීම් ඉගෙන ගැනීමට විවෘත වීමට ඇති ඕනෑම හැකියාවක් විනාශ කරයි. දරුවාගේ චර්යා වෙනස් කිරීමට හෝ කඩාකප්පල් කර දැමීමට උත්සාහයක් ගැනීමට පෙර, දරුවාගේ දෘෂ්ටිකෝණයෙන් අභියෝගාත්මක හැසිරීම් ඇතිවීම කෙරෙහි බලපෑම් කළ හැකි සාධක සහ අභියෝගාත්මක හැසිරීම් වල පවතින ක්‍රියාකාරී අරමුණ පිළිබඳ අවබෝධයක් සිසුන් හට වර්ධනය කර ගැනීමේ වැදගත්කම මෙයින් ඉස්මතු කරයි.

මෙම මොඩියුලය වින්දිත දරුවන්ට රැකවරණය සපයන්නන් ලෙස ක්‍රියා කරන පුද්ගලයින් සඳහා දැනුම සහ කුසලතා හඳුන්වා දෙන අතර, ඔවුන්ට අභියෝගාත්මක හැසිරීම් සඳහා නිර්මාණාත්මක සහ ප්‍රයෝජනවත් ප්‍රතිචාර හඳුන්වා දීම, අවදානම අඩු කිරීම, ආරක්ෂාව වැඩි කිරීම සහ පීඩාවට පත් ළමුන් සඳහා නව ඉගෙනුම් සහ අනුවර්තනයට මුහුණ දීම සක්‍රීය කිරීම, අමතර සහාය අවශ්‍ය දරුවන් හඳුනාගෙන සුදුසු අවස්ථාවලදී එම දරුවන් යොමු කිරීම, චර්යා කළමනාකරණයේ හානිකර භාවිතයන් හඳුනාගෙන ඒවා ඉවත් කිරීම සහ එවැනි භාවිතයන් සඳහා දායක විය හැකි ඔවුන්ගේම ආකල්ප, වටිනාකම් සහ නොඉවසීම පිළිබඳව දැනුවත් වීම සම්බන්ධ දැනුම සහ කුසලතා හඳුන්වා දෙනු ලැබේ.

**ඉගෙනුම් අරමුණු**

සිසුන් :

1. අභියෝගාත්මක හැසිරීම් වල ක්‍රියාකාරිත්වය සහ අරමුණ අවබෝධ කර ගැනීම සඳහා, අදාළ සන්දර්භීය සාධක පරීක්ෂා කිරීමේ දැනුම සහ ක්‍රියාවලිය ලබා ගනී.
2. අභියෝගාත්මක සහ හානිකර හැසිරීම් සම්බන්ධ සන්දර්භීය සාධක හඳුනාගැනීම සඳහා මූලික තක්සේරු කුසලතා වලින් සමන්විත වේ.
3. ළමා වෙළෙඳාම සහ වෙනත් ආකාරයේ අපචාරයන්ට ලක් වූ වින්දිතයින් අතර, නව ඉගෙනීමට සහ අනුවර්තනය වීමට ඉඩ සලසන ආකාරයෙන් අභියෝගාත්මක හැසිරීම් වලට ප්‍රතිචාර දැක්වීමට අවශ්‍ය උපාය මාර්ග ඉගෙන ගනී.
4. අමතර හෝ විශේෂඥ සහාය සඳහා යොමු කිරීම අවශ්‍ය වන පීඩාවට පත් දරුවන් හඳුනා ගැනීමට හැකියාව ලබා ගනී.
5. හැසිරීම් කළමනාකරණ මැදිහත්වීම්වලදී අවදානම් අවම කිරීමට සහ හානි අවම කිරීම ප්‍රවර්ධනය කිරීමට උපාය මාර්ග ඉගෙන ගනී.

## 4.5.1. අභියෝගාත්මක හැසිරීම් පිළිබඳ අවබෝධයක් ඇති කර ගැනීම

අනපේක්ෂිත සහ අනාරක්ෂිත පරිසරයක හැදෙන දරුවන්, ඔවුන්ට ආදරය, රැකවරණය සහ ආරක්ෂාව පිළිබඳ හැඟීමක් ලබා දුන් අවම වශයෙන් තම ජීවිතයේ, එක් ආරක්ෂිත සහ ස්ථාවර වැඩිහිටි සම්බන්ධතාවයක් ඇති දරුවෙකුගේ හැසිරීම් වලට වඩා වෙනස් වන පැවැත්මේ හැසිරීම් අනිවාර්යයෙන්ම වර්ධනය කරගනු ඇත.

ළමා වෙළෙඳාම සහ වෙනත් ආකාරයේ අපචාරයන්ට ලක් වූ වින්දිතයින් තුළ අභියෝගාත්මක හැසිරීම් වලට ආධාර වන, එම හැසිරීම් ප්‍රේරණය කරන සහ එම අභියෝගාත්මක හැසිරීම් පවත්වාගෙන යෑමට දායක වන සාධක හඳුනා ගැනීමට සිසුන් ඉගෙන ගනී. ළමා සංවර්ධනය කෙරෙහි අපයෝජනය, නොසලකා හැරීම සහ වෙළෙඳාමේ බලපෑම, ඔවුන්ගේ රැකවරණ සපයන්නන්ගේ සබඳතා (විශ්වාසය/ බැඳීම් මත බලපෑම) සහ අනාගත රැකවරණ සපයන්නන් හෝ අධිකාරියේ පුද්ගලයින් කෙරෙහි ඔවුන්ගේ ප්‍රතිචාරයට මෙම සාධක බලපෑම් කරන්නේ කෙසේද යන්න පිළිබඳව සිසුන් ඉගෙන ගනී. උදා: ආක්‍රමණශීලී, තමාටම හෝ අන් අයට හානියක් සිදු කිරීම, නොහොබිනා හැසිරීම්, නොගැලපෙන හැසිරීම්, ලිංගික හැසිරීම් ආදිය.

## 4.5.2. අභියෝගාත්මක හැසිරීම් වල ක්‍රියාකාරී අරමුණ

සියළුම හැසිරීම් සඳහා විවිධ අවශ්‍යතා සපුරාලීම (ජීවත්වීම, ආරක්ෂාව, ආදරය සහ අයිතිවාසිකම, ගෞරවය සහ පුද්ගලික අරමුණු) අරමුණු කරගත් අර්ථයක් සහ අරමුණක් ඇත. එම හැසිරීම් මෙම අවශ්‍යතා සාක්ෂාත් කර ගැනීමේ මාධ්‍යයක් ලෙස වටහාගෙන ඇත.

සිසුන් සන්දර්භීය සාධක තේරුම් ගැනීම තුළින්, මෙම හැසිරීම් ප්‍රකාශ කිරීමට උත්සාහ කරන්නේ කුමන හැඟීම්ද යන්නත්, මෙම හැසිරීම් සපුරාලීමට උත්සාහ කරන අවශ්‍යතා මොනවාදැයි යන්නත් හඳුනා ගැනීමට ඉගෙන ගනී. අභියෝගාත්මක හැසිරීම් වලට අභියෝග කිරීමට, වෙනස් කිරීමට හෝ විසුරුවා හැරීමට උත්සාහ කිරීමට පෙර, දරුවාගේ දෘෂ්ටිකෝණයෙන් අභියෝගාත්මක හැසිරීම් වල අරමුණ හඳුනා ගැනීමට සිසුන් ඉගෙන ගනී.

දරුවාගේ ජීවන අත්දැකීම් සහ ඇතැම් උගත් පැවැත්මේ ප්‍රතිචාර දැක්වීමට හේතු විය හැකි වෙනත් නැඹුරු සාධක සන්දර්භය තුළ අභියෝගාත්මක හැසිරීම ස්ථානගත කිරීමට සිසුන් ආදර්ශයක් හෝ රාමුවක් භාවිතා කරයි (වීරසේකර, 5P ආකෘතිය: 1996). තල්ලු කිරීමේ සාධක සහ ඇදගැනීමේ සාධක, අභියෝගාත්මක හැසිරීමක

ඉතිහාසය සිතියම්ගත කිරීමට උපකාරී විය හැකි අතරම, පුළුල් සමාජ ආර්ථික සන්දර්භය තුළ, දරුවාට සහ ඔවුන්ගේ පවුලේ සමීපතම සමාජ ලෝකයට බලපෑම් කළ කරුණු මොනවාදැයි විමසා බලයි.

ශිෂ්‍යයා මෙම හැසිරීම් වල ඉතිහාසය සහ වර්තමානයේ ඒවා සක්‍රීය වන ආකාරය සිතියම්ගත කිරීමට පටන් ගන්නා විට, රැකවරණයේ සිටින දරුවන් අවශ්‍යතාවයෙන් සහ බියෙන් ක්‍රියා කරන බව ඔවුන් තේරුම් ගැනීම ආරම්භ කරයි. මන්දයත් ඔවුන් මීට පෙර සැරිසැරීමට සහ අනතුරෙන් බේරීමට ඉගෙන ගෙන ඇති ආකාරය මෙයයි. එසේත් නොමැති නම්, භාරකරු කෙරෙහි පුද්ගලීකරණය කරන ලද අභිප්‍රායෙන් ක්‍රියා කරනවා වෙනුවට විශ්වාස කළ නොහැකි වැඩිහිටියන් විසින් ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලීම සිදු කර තිබේ.

### 4.5.3. අභියෝගාත්මක හැසිරීම් වල ක්‍රියාකාරී අරමුණ පරීක්ෂා කිරීම සඳහා මූලික තක්සේරු කුසලතා

රැකවරණය සපයන්නන්ට දරුවාගේ හැසිරීම පිටුපස පවතින අරමුණ අවබෝධ කර ගැනීම සඳහා හැසිරීම තක්සේරු කිරීමට පහත ප්‍රශ්න මාලාව භාවිතා කළ හැකිය. චර්යාවේ ස්වභාවය සහ තීව්‍රතාවය පිළිබඳ විස්තරයක් මෙයට ඇතුළත් විය යුතුය, දරුවා මෙන්ම ඔවුන් අවට සිටින අය සඳහා හැසිරීම් සිදුවීමට පෙර, හැසිරීම අතරතුර සහ හැසිරීමෙන් පසුව (ප්‍රතිවිපාක) සිදු වන දේ සිදු වන්නේ කවදාද සහ කොතැනද යන්න නිරීක්ෂණය කිරීම; මෙහිදී හැසිරීම් වල නිරත වීමෙන් අනතුරුව, සපුරා ගැනීමට (අවශ්‍යතා) හෝ පලා යාමට (බිය) උත්සාහ කරයි. එකතු කරන ලද මෙම තොරතුරු මත පදනම්ව, දරුවා සන්නිවේදනය කිරීමට උත්සාහ කරන දේ හඳුනා ගැනීමට සිසුන් උත්සාහ කරයි

මූලාශ්‍ර:

https://iris.peabody.vanderbilt.edu/module/fba/cresource/q2/p04/#content

### 4.5.4. අභියෝගාත්මක හැසිරීම් අවම කිරීමේ උපාය මාර්ග සහ අභියෝගාත්මක හැසිරීම් සහ අර්බුදකාරී තත්වයන්ට ප්‍රතිචාර දැක්වීම සඳහා පරාවර්තක කාර්යය

අභියෝගාත්මක හැසිරීම් අවම කිරීම පිළිබඳ අවධාරණය පදනම් වී ඇත්තේ කෝනෙල් විශ්ව විද්‍යාලයේ නේවාසික ළමා සුරැකුම් ව්‍යාපෘතිය මගින් සංවර්ධනය කරන ලද චිකිත්සක අර්බුද මැදිහත්වීමේ ශිල්පීය ක්‍රම මත ය. ළමුන්ට සහ ඔවුන්ව රැකබලා ගන්නන් සඳහා ආරක්ෂිත පරිසරයක් නිර්මාණය කිරීම අවධාරණය කරන අතර, රැකබලා ගන්නන් තුළ දරුවාගේ කම්පන ඉතිහාසය පිළිබඳ දැනුවත්භාවයක් පවතින අතර, ඔවුන් දරුවාගේ දෛනික අන්තර්ක්‍රියාකාරිත්වයේ දුෂ්කර හෝ ප්‍රේරක අත්දැකීම් හඳුනාගෙන හැකි සෑම විටම අවදානම අවම කරන ආකාරවලින් ක්‍රියා කරයි. චිකිත්සක අර්බුද මැදිහත්වීමේ වැදගත්ම අංගයක් නම්, තර්ජනය සහ ආතතිය යටතේ හැසිරීම උත්සන්න වන ආකාරය පිළිබඳව, විශේෂයෙන්ම වැඩිහිටියන් කෝපයට මැදිහත් වන විට, හැසිරීම වෙනස් කිරීම සහ නව ඉගෙනීම පිළිබඳ සාකච්ඡා ඵලදායී විය හැක්කේ දරුවාගේ ආරක්ෂාව පිළිබඳ හැඟීම යථා තත්ත්වයට පත් කිරීමෙන් පසුව බව දැනුවත් භාවයක් පැවතීමයි.

### 4.5.5. අමතර හෝ විශේෂඥ සහාය සඳහා යොමු කිරීම අවශ්‍ය වන පීඩාවට පත් දරුවන් හඳුනා ගැනීම

සිව්වන මොඩියුලය ඔස්සේ, “ළමා වෙළෙඳාම සහ වෙනත් ආකාරයේ අපචාරයන්ට ලක් වූ වින්දිතයින්ගේ රැකවරණ අවශ්‍යතා” වෙත දරුවන් යොමු කිරීමේ ක්‍රියාවලියට සහ මාර්ග සිසුන්ට හඳුන්වා දෙයි. මෙම දේශනයේදී, චර්යාත්මක සහ චිත්තවේගීය ප්‍රතික්‍රියා මගින් කම්පනයක හෝ කනස්සල්ලෙන් (බිය) ප්‍රතිචාර

දැක්වීමේ ලක්ෂණ පෙන්නුම් කළ හැකි විට ඒවා හඳුනා ගැනීමට අවශ්‍ය දැනුම සිසුන්ට ලබාදෙන අතර, එබැවින් එම ලක්ෂණ වැඩිදියුණු වීමේ සලකුණු නොපෙන්වයි. එවැනි අවස්ථාවන්හිදී දරුවා උපදේශකයෙකු හෝ මානසික සෞඛ්‍ය සේවාව වෙත යොමු කළ යුත්තේ කවුරුන්ද යන්න හඳුනා ගැනීම සහ දරුවාගේ ආරක්ෂාව සහ යහපැවැත්ම පිළිබඳ හැඟීම වැඩිදියුණු කිරීම සඳහා ඔවුන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම වැදගත් වේ.

### 4.5.6. හැසිරීම් කළමනාකරණ මැදිහත්වීම් වලදී අවදානම් අවම කිරීම සහ හානිය අවම කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා උපාය මාර්ග හඳුන්වා දීම

හානිකර හැසිරීම් කළමනාකරණ පිළිවෙත් සහ ඒවායේ විභව අහිතකර ප්‍රතිඵල හඳුනා ගැනීමට සිසුන් ඉගෙන ගනී.

අභියෝගාත්මක හැසිරීම් වලට ඔවුන්ගේ ප්‍රතිචාර පිළිබිඹු කිරීමට ආදර්ශයක් භාවිතා කිරීමට සිසුන් ඉගෙන ගනී, ඔවුන්ගේම ආකල්ප, සාරධර්ම සහ නොඉවසීම පිළිබඳ දැනුවත් වීම, එය ඔවුන්ගේම හැඟීම් තීව්‍ර කළ හැකි අතර හැසිරීම් කළමනාකරණයේ හානිකර භාවිතයන්ට දායක විය හැකි දරුවාගේ හැසිරීම පෞද්ගලිකරණය කරයි.

**නිර්දිෂ්ට කියවීම්:**

Incorporate components of Therapeutic Crisis Intervention
https://rccp.cornell.edu/TCI_LevelOne.html
Content of TCI is available in abbreviated form on this link: https://www.greenchimneys.org/wp-content/uploads/2020/05/TCI-Pocket-Guide.pdf
Curriculum outline https://synergy-fostering.co.uk/therapeutic-crisis-intervention-families/

## 4.6. ළමා ආරක්ෂණ සිද්ධි කළමනාකරණය සහ වාර්තා තබා ගැනීම සඳහා සහාය වීම

**පාඨමාලා විස්තරය:**

සුරැකුම් ආයතනවල ළමුන් රැකබලා ගන්නන්ට, ළමා ආරක්ෂණ සිද්ධි කළමනාකරණය සඳහා අනුගමනය කරනු ලබන ක්‍රියාවලිය සහ ක්‍රියා පටිපාටි අවබෝධ කර ගැනීමට උපකාර කිරීමට මෙම පාඨමාලාව අපේක්ෂා කෙරේ. භාරකරුවන්ට සිද්ධි කළමනාකරණයේ ඍජු වගකීමක් නොමැති වුවද, දරුවාගේ ආරක්ෂාව සහ යහපැවැත්ම සඳහා ගනු ලබන තීරණ සාර්ථකව ක්‍රියාත්මක කළ හැකි බව සහතික කිරීමට නිලධාරීන්ට සහාය වීම සම්බන්ධයෙන් ඔවුන්ට වැදගත් කාර්යභාරයක් ඇත.

සිද්ධි කළමනාකරණ ක්‍රියාවලිය හරහා සංවර්ධනය කරන ලද පුද්ගල සුරැකුම් සැලැස්ම ක්‍රියාවට නැංවීමට සහාය වීම සඳහා භාරකරුවන්ට ඍජු කාර්යභාරයක් ඇත. සිද්ධි කළමනාකරණය සාර්ථක වීමට නම්, දරුවන්ගේ මනෝ සමාජීය යහපැවැත්ම ගොඩනැගීමේ සුරැකුම් සැලසුම්වල අපේක්ෂාවන් සහ අරමුණු කෙරෙහි භාරකරුගේ සංවේදීතාවය අත්‍යවශ්‍ය වේ. ළමා සිද්ධීන් සැලසුම් කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රියාවලිය පිළිබඳ භාරකරුගේ අවබෝධය සහ සංවේදනාත්මක ප්‍රවේශයක් හරහා ළමුන්ගේ මුහුණ දීමේ කුසලතා වර්ධනය කිරීම, සිද්ධි කළමනාකරණයට සහ අවසානයේ ළමුන් නැවත සමාජගත කිරීමට සහාය වීම සඳහා අත්‍යවශ්‍ය වගකීමක් ගැනීමට ඔවුන්ට උපකාරී වනු ඇත.

ළමා ආරක්ෂණ සිද්ධි කළමනාකරණ ක්‍රියාවලිය දරුවා මුහුණ දී ඇති ප්‍රචණ්ඩත්වය අනුව වෙනස් නොවේ. සෑම වින්දිත දරුවෙකු සඳහාම ක්‍රියාවලිය සමාන වේ. කෙසේ වෙතත්, ක්‍රියාවලියේ විවිධ සංරචක ක්‍රියාත්මක කිරීම ළමයින්ට විශේෂිත අපරාධවල බලපෑම මත රඳා පවතී; එබැවින් CVoTs සමඟ CPCM ක්‍රියාවලියට එහිම ඇඟවුම් සහ අභියෝග පැවතිය හැක.

**ඉගෙනුම් අරමුණු**

සිසුන්:

1. ආයතනික රැකවරණයේ සිටින ළමුන් සඳහා ළමා ආරක්ෂණ සිද්ධි කළමනාකරණය පිළිබඳ හඳුන්වාදීමේ මට්ටමේ අවබෝධයක් ලබා ගනී
2. දරුවන්ගේ රැකවරණය සහ ආරක්ෂාව සම්බන්ධයෙන් ඔවුන්ගේ අද්විතීය කාර්යභාරය සහ වගකීම් හඳුනා ගැනීම
3. ළමා ආරක්ෂණ සිද්ධි කළමනාකරණයට සම්බන්ධ පුද්ගලයින් - විශේෂයෙන්ම පරිවාස නිලධාරීන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට දිරිමත් කරනු ලැබේ
4. උපකාරක රැකවරණ සපයන්නන්ට දරුවන් වෙත ලබාදිය හැකි විශේෂිත නොවන ක්‍රම පිළිබඳ අවබෝධයක් වර්ධනය කිරීම.
5. විපත්තිවලින් පීඩාවට පත් දරුවන් සමඟ කටයුතු කිරීමේදී සිදුවන අවදානම් සහ අභියෝග අවබෝධ කර ගැනීම

### 4.6.1. ළමා ආරක්ෂණ සිද්ධි කළමනාකරණය යනු කුමක්ද?

සිද්ධි කළමනාකරණය යනු හානියක් වීමේ අවදානමක් ඇති හෝ හානියට පත් වූ තනි දරුවෙකුගේ අවශ්‍යතා සපුරාලීම සඳහා වන ප්‍රවේශයකි. සෘජු සහාය සහ යොමු කිරීම් හරහා ක්‍රමානුකූලව සහ කාලෝචිත ආකාරයකින් සිද්ධි සම්බන්ධයෙන් කටයුතු කරන්නෙකු විසින් දරුවාට සහ ඔවුන්ගේ පවුලට සහාය වේ. සිද්ධි කළමනාකරණය ඔස්සේ, සංකීර්ණ සහ බොහෝ විට සම්බන්ධිත ළමා ආරක්ෂණ ගැටළු සඳහා පුද්ගලාරෝපිත, සම්බන්ධීකරණ, පරිපූර්ණ, බහුආංශික සහය සපයයි[5].

ළමා ආරක්ෂණ සිද්ධි කළමනාකරණය:

- **තනි දරුවෙකුගේ** සහ ඔවුන්ගේ පවුලේ අයගේ අවශ්‍යතා කෙරෙහි අවධානය යොමු කරයි, දරුවාගේ හොඳම අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් සහ ලබා දී ඇති සන්දර්භය තුළ දරුවාගේ සහ පවුලේ අයගේ ඔරොත්තු දීමේ හැකියාව මත පදනම්ව ක්‍රමානුකූලව සැලකිලිමත් වන බව සහතික කරයි. බොහෝ සන්දර්භයන් තුළ, සිද්ධි සම්බන්ධයෙන් කටයුතු කරන්නෙකු ළමා මූලික ගෘහයන් ඇතුළුව දරුවන් කිහිප දෙනෙකු සිටින පවුල් සමඟ කටයුතු කරන බව සැලකිල්ලට ගැනීම වැදගත්ය. එක් එක් දරුවාට අමතරව, සිද්ධි කළමනාකරණය කිරීමේදී සිද්ධි සම්බන්ධයෙන් කටයුතු කරන්නෙකු, මුළු පවුලම හෝ ගෘහය ගැන සලකා බැලිය යුතුය.
- එක් **ප්‍රධාන සේවකයෙකු** විසින් සපයනු ලබන අතර, සිද්ධි සම්බන්ධයෙන් කටයුතු කරන්නෙකු ලෙසින් හඳුන්වනු ලබන අතර, ඔහු දරුවාගේ යහපත සඳහා තීරණ ගනු ලබන බවත්, ස්ථාපිත ක්‍රියාවලියට අනුකූලව සිද්ධිය කළමනාකරණය කරන බවත්, සියලුම ක්‍රියාකාරීන්ගේ ක්‍රියාවන් සම්බන්ධීකරණය සහතික කිරීම සඳහාත් වගකිව යුතු වේ. ආයතනික රැකවරණයේ සිටින ළමුන් සඳහා සිද්ධි සම්බන්ධයෙන් කටයුතු කරන්නා පරිවාස නිලධාරියා වේ.
- **ස්ථාපිත සිද්ධි කළමනාකරණ ක්‍රියාවලියට** අනුකූලව සපයනු ලැබේ, සෑම සිද්ධියකදීම දරුවන්ගේ අර්ථවත් සහභාගීත්වය සහ පවුල සවිබල ගැන්වීම ඇතුළත් පියවර මාලාවක් හරහා ගමන් කරයි.
- ආරක්ෂිත සහ සදාචාරාත්මක යොමු පද්ධතියක් හරහා **පවුල්, ප්‍රජාව සහ රජයේ ආධාර සහ සේවාවන්** ඇතුළු සංකීර්ණ පද්ධතියක් **සම්බන්ධීකරණය** කිරීම මෙන්ම රැකවරණය අඛණ්ඩව පවත්වා ගැනීම සහතික කිරීම සඳහා උපදේශකයෙකු ලෙස ක්‍රියා කිරීම සඳහා සිද්ධි සම්බන්ධයෙන් කටයුතු කරන්නෙකු අවශ්‍ය කරයි.

මේ ආකාරයට ක්‍රමානුකූලව සිද්ධි කළමනාකරණය කිරීමෙන් දරුවන්ට වඩා හොඳ ප්‍රතිඵල ලැබෙනු ඇත. එය ඔවුන්ට අවශ්‍ය සේවාවන් නියමිත වේලාවට ලැබීම සහතික කිරීමට සහ දරුවන් වඩාත් හොඳින් රැකබලා ගැනීමට දරුවන්ගේ පවුල්වලට සහාය වීම සහතික කිරීමට උපකාරී වේ. ළමුන් සඳහා සුදුසු ප්‍රවේශ විය හැකි සේවාවන් සැපයීමේ ප්‍රධාන අරමුණ වන්නේ ප්‍රවේශ විය හැකි, වෙනස් කොට සැලකීමකින් තොරව, අදාළ වයසට-හිතකාමී, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදීත්වය ආදි සාධක ඇතුළත් සිද්ධි කළමනාකරණය සහතික කිරීමයි.

[5] Alliance for Child Protection in Humanitarian Action (2019) Minimum Standards for Child Protection in Humanitarian Action

### 4.6.2. ආයතනික රැකවරණය යටතේ සිද්ධි කළමනාකරණයට සම්බන්ධ ක්‍රියාකාරීන්ගේ භූමිකාවන් සහ වගකීම්

- ආයතනික රැකවරණ සැකසුම් තුළ සිද්ධි කළමනාකරණ ක්‍රියාවලියේදී විවිධ ක්‍රියාකාරීන් නිශ්චිත භූමිකාවන් ඉටු කරයි:
- දරුවා සහ ඔවුන්ගේ (විස්තෘත) පවුල
- සිද්ධි සම්බන්ධයෙන් කටයුතු කරන්නන්, රජයේ ළමා ආරක්ෂණ සේවා, ආයතනවල රැකබලා ගන්නන් (මෙතැන් සිට 'රැකබලා ගන්නන්' ලෙස හැඳින්වේ).
- ප්‍රජා සාමාජිකයින් සහ ප්‍රජා පාදක ව්‍යුහයන් ඇතුළු ප්‍රජාවන්
- රෝහල්, පාසල්, විධිමත් නොවන අධ්‍යාපනඥයින්, උපදේශකයින් යනාදිය ඇතුළුව සේවා සපයන්නන් (රජයේ සහ රාජ්‍ය නොවන).

#### දරුවා

සිද්ධි කළමනාකරණ ක්‍රියාවලියේ කේන්ද්‍රස්ථානය වන්නේ දරුවා ය. සිද්ධි සම්බන්ධයෙන් කටයුතු කරන්නන් සහ රැකබලා ගන්නන් හට දරුවාගේ වයස, ස්ත්‍රී පුරුෂ භාවය, හැකියාව සහ සංවර්ධන අවබෝධය මත පදනම්ව එක් එක් දරුවා සමඟ පහසුවෙන් කතා කිරීමට සහ වැඩ කිරීමට හැකි විය යුතුය. දරුවාට සහාය විය යුත්තේ:

- ඔවුන්ගේ සිද්ධි සම්බන්ධයෙන් කටයුතු කරන්නන් සහ රැකබලා ගන්නන් සමඟ සුවපහසුවක් දැනේ.
- දැනුවත් කැමැත්ත / අනුමැතිය ලබා දෙන්න
- සිද්ධි කළමනාකරණ ක්‍රියාවලියේ එක් එක් පියවරේදී යෝජිත ක්‍රියා සම්බන්ධයෙන් ඔවුන්ගේ අදහස් සහ ආශාවන් ප්‍රකාශ කරන්න, ප්‍රශ්න අසන්න සහ එකඟ නොවීම් ප්‍රකාශ කරන්න.
- ගනු ලබන ප්‍රධාන තීරණ තේරුම් ගෙන එම තීරණ ගැනීමේ ක්‍රියාවලියට දායක වන්න.
- සිද්ධි කළමනාකරණ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා පෝෂණය. ඔවුන්ගේ වයස සහ පරිණතභාවය මත පදනම්ව, ක්‍රියාවලිය සහ ප්‍රතිඵලය පිළිබඳව සෑහීමකට පත් වූවාද නැද්ද යන්න පිළිබඳව ප්‍රතිපෝෂණ ලබා දීමට දරුවන්ට හැකි විය යුතුය.

**ප්‍රධාන සලකා බැලීම්:**

→ සිද්ධි සම්බන්ධයෙන් කටයුතු කරන්නාගේ සහ රැකබලා ගන්නන්ගේ කාර්යභාරය වන්නේ, දරුවාට සැහැල්ලුවක් සහ ආරක්ෂිත බවක් දන්වමින්, දරුවාගේ ගැටළු වලට ඇහුම්කන් දීම සහ දරුවාගේ වයසට ගැළපෙන, ප්‍රවේශ විය හැකි, වෙනස් කොට සැලකීමකින් තොරව, ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී ආකාරයෙන් සිදුවන්නේ කුමක්ද යන්න පැහැදිලි කිරීමයි. දරුවා සංඥා භාෂාව හෝ වාචික නොවන සන්නිවේදන මාධ්‍යයන් ඇතුළුව ඔවුන්ගේම භාෂාව කතා කරන සිද්ධි සම්බන්ධයෙන් කටයුතු කරන්නන් සහ රැකබලා ගන්නන් සමඟද කතා කළ යුතුය.

→ තම භාරකරුවන් හෝ පවුලේ සාමාජිකයන් ක්‍රියාවලියේ කොටසක් වීමට දරුවෙකුට අවශ්‍ය නොවන අවස්ථා තිබිය හැක. හැකි සෑම අවස්ථාවකදීම, සිද්ධි සම්බන්ධයෙන් කටයුතු කරන්නා දරුවා සැලකිලිමත් වන දේ තේරුම් ගැනීමට උත්සාහ කළ යුතු අතර එම ගැටළු ප්‍රමාණවත් ලෙස විසඳීමට උත්සාහ කළ යුතුය. භාරකරුවන් තීරණ ගැනීමේ ක්‍රියාවලියේ කොටසක් විය යුත්තේ කවදාද යන්න

සම්බන්ධයෙන් රටේ පවතින නීතිමය අවශ්‍යතා පිළිබඳව ද සිද්ධි සම්බන්ධයෙන් කටයුතු කරන්නාට අවබෝධයක් තිබිය යුතුය.

## පවුල්

**පවුල්** යනු ඥාතිත්වය**,** විවාහය**,** දරුකමට හදා ගැනීම හෝ තේරීම මගින් සම්බන්ධ වූ සමාජ කණ්ඩායම් වේ. පවුලේ සාමාජිකයන් තුළ පැහැදිලිව නිර්වචනය කර තිබෙන දිගුකාලීන බැඳීම්**,** අන්‍යෝන්‍ය බැඳීම් සහ වගකීම් මෙන්ම**,** සාමූහිකත්වය පිළිබඳ හවුල් හැඟීමක් ඇත.[6] මේවා බොහෝ විට දෙමව්පියන්ගෙන් එක් අයෙකුගෙන් හෝ දෙදෙනාගෙන් සමන්විත වේ**,** නමුත් සුළු-දෙමාපියන්**,** ආච්චිලා සීයලා ඇතුළත් විස්තෘත පවුලේ සාමාජිකයන්**,** විධිමත් හෝ අවිධිමත් කැපකරු සහ හදාගත් දෙමාපියන්**,** නිවසේ සිටින දරුවාට සෘජුව වගකිව යුතු භාරකරුවන් ද ඇතුළත් විය හැකිය. දශක ගනනාවක පර්යේෂණ වලින් පෙන්නුම් කර ඇත්තේ දරුවෙකු සඳහා වඩාත්ම ආරක්ෂිත පරිසරය ආසන්නතම සහ විස්තෘත පවුල බවයි.

වෙනත් ආකාරයකින් තීරණය නොකළහොත්, සිද්ධි කළමනාකරණයේදී **දෙමාපියන්ගේ, විස්තෘත පවුලේ සාමාජිකයින්ගේ හෝ භාරකරුවන්ගේ** කාර්යභාරය විය යුත්තේ:

- දරුවා සඳහා දැනුවත් කැමැත්ත ලබා දීම
- සිද්ධි කළමනාකරණ ක්‍රියාවලියේ සියලුම පියවරයන් වලට සම්බන්ධ වීම
- සිද්ධි සැලැස්මේ එකඟ වූ ක්‍රියා ක්‍රියාත්මක කිරීමට.

**පවුලේ අනෙකුත් සාමාජිකයින්ට** පහත දැක්වෙන ආකාරවලින් සම්බන්ධ විය හැකිය:

- දරුවාගේ ඉල්ලීම මත**,** දෙමාපියෙකු/භාරකරුවෙකුට අමතරව හෝ දෙමාපිය/භාරකරුවෙකු නොමැති අවස්ථාවක**,** සිද්ධි කළමනාකරණ ක්‍රියාවලියේදී විශ්වාසවන්ත වැඩිහිටියෙකු ලෙස ක්‍රියා කිරීම.
- සිද්ධි සැලැස්මේ එකඟ වූ ක්‍රියා ක්‍රියාත්මක කිරීමට. නිදසුනක් වශයෙන්**,** තම මව විදේශයක සේවය කරන අතරතුර දරුවා සමඟ නිතිපතා සන්නිවේදනය කරන නැන්දා**;** හෝ නිවාඩු කාලය තුළ දරුවා බලා ගන්නා ආච්චි.

## සිද්ධි සම්බන්ධයෙන් කටයුතු කරන්නන්

සිද්ධි කළමනාකරණයේ සිද්ධි සම්බන්ධයෙන් කටයුතු කරන්නා යනු සිද්ධියකට සම්බන්ධ ප්‍රධාන සේවකයා වන අතර, ඔහු දරුවාගේ සහ දරුවාගේ පවුලේ සාමාජිකයින්ගේ රැකවරණය පිළිබඳ වගකීම පවත්වාගෙන යයි - මූලික පරීක්ෂාව සහ ලියාපදිංචියේ සිට සිද්ධිය වසා දැමීම දක්වා. රැකවරණ පද්ධතියට ඇතුළු වන සෑම දරුවෙකුගේම රැකවරණය සහ ආරක්ෂාව සඳහා අධිකරණය විසින් පරිවාස නිලධාරියෙකු පත් කරනු ලැබේ. එබැවින් පරිවාස නිලධාරියා ඔහු/ඇය ගේ භාරයේ සිටින ළමුන් සඳහා ළමා ආරක්ෂණ සිද්ධි කළමනාකරණය පිළිබඳ වගකීම දරයි.

[6] Save the Children (2014) Position statement: Families

සිද්ධි සම්බන්ධයෙන් කටයුතු කරන්නෙකුට අදාළ වගකීම් සහිත මූලික කාර්යයන් තුනක් ඇත[7]:

1. ආධාරක කාර්යය:
    - මූලික චිත්තවේගීය සහය සැපයීම සහ අවධානය යොමු කිරීම, විශේෂිත නොවන MHPSS සැපයීම
    - දරුවාට සහ ඔවුන්ගේ පවුලේ අයට තොරතුරු සැපයීම
    - දරුවා වෙනුවෙන් පෙනී සිටීම
    - දරුවාගේ අවශ්‍යතාවලට ප්‍රතිචාර දැක්වීම සම්බන්ධයෙන් සේවා සඳහා ප්‍රවේශය සහතික කිරීම
    - දරුවෙකුගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා සහාය ලබා දීම
    - හදිසි අවස්ථාවකදී වෙන්වී ඇත්නම් ආරක්ෂිත සුරැකුම් විධිවිධාන සොයා ගැනීමට සහ පවුල් සොයා ගැනීමට දරුවන්ට උපකාර කිරීම
2. සම්බන්ධීකරණ කාර්යය:
    - සිද්ධි කළමනාකරණ සහාය අවශ්‍ය දරුවන් සහ පවුල් කල්තියා හඳුනා ගැනීම සඳහා ප්‍රධාන පාර්ශවකරුවන් සමඟ සම්බන්ධීකරණය කිරීම
    - සේවා ස්ථානගත කර දරුවන්ට සහ ඔවුන්ගේ පවුල්වලට එම සේවාවන් වෙත ප්‍රවේශ වීමට උපකාර කිරීම
    - සේවා සඳහා වැඩි දියුණු කළ ප්‍රවේශය වෙනුවෙන් පෙනී සිටීම
    - සිද්ධි සම්මන්ත්‍රණ පැවැත්වීම
3. තොරතුරු කළමනාකරණ කාර්යය:
    - සිද්ධි ලේඛනගත කිරීම
    - සිද්ධි කළමනාකරණ තොරතුරු සහ ගොනු ගබඩා කිරීම
    - සිද්ධි කළමනාකරණ දත්ත ගබඩාව යාවත්කාලීන කිරීම
    - අත්සන් කරන ලද දත්ත ආරක්ෂණ සහ තොරතුරු හුවමාරු කිරීමේ ප්‍රොටෝකෝල ආරක්ෂා කිරීම

### බහු-ආංශික සේවා සපයන්නන්

පවතින සේවාවන් සිතියම්ගත කිරීම සිද්ධි කළමනාකරණයේ අත්‍යවශ්‍ය අංගයකි. ආරක්ෂිත, ළමා හිතකාමී, ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී සහ ඇතුළත් බහු-විනය යොමු මාර්ග - ළමා ආරක්ෂණය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය, ආබාධිතයන් ඇතුළත් කිරීම, අධ්‍යාපනය, සෞඛ්‍යය, පෝෂණය, ජලය, සනීපාරක්ෂාව සහ සනීපාරක්ෂාව (WASH), ජීවනෝපායන්, සමාජ ආරක්ෂණය හෝ ආරක්ෂාව සම්බන්ධයෙන් සේවය කරන සේවා සපයන්නන් සම්බන්ධ වීම - තනි තනි දරුවන්ට සහ ඔවුන්ගේ පවුල්වලට සුදුසු සාකල්‍ය සහය සඳහා ප්‍රවේශය ලබා ගැනීමට හැකි වනු ඇත.

සිද්ධි කළමනාකරණයේදී සේවා සපයන්නන් විවිධ භූමිකාවන් ඉටු කරයි:

- දරුවාගේ සිද්ධි සැලැස්මට අනුව, සිද්ධි සම්බන්ධයෙන් කටයුතු කරන්නන්ගේ සහාය සඳහා ඔවුන් වෙත යොමු කර ඇති තනි දරුවන්ට සහ ඔවුන්ගේ පවුල්වලට සුදුසු සහය ලබා දීම.

[7] Alliance for Child Protection in Humanitarian Action (2021) Revised Interagency Child Protection Case Management Training: See training Level 1 Module 2 Foundations of child protection case management

- යොමු කිරීමේ මාර්ග හරහා අවදානමට ලක්විය හැකි දරුවන් හඳුනාගෙන සුදුසු සේවාවන් වෙත යොමු කිරීමේ වගකීම ඔවුන් සතුය.

### 4.6.3. සිද්ධි කළමනාකරණය සඳහා මාර්ගෝපදේශ මූලධර්ම

ළමා ආරක්ෂණ සිද්ධි කළමනාකරණය, ළමා ආරක්ෂාව සහ සිද්ධි කළමනාකරණය සඳහා වන අන්තර් ආයතන මාර්ගෝපදේශවල ඇතුළත් මාර්ගෝපදේශ මූලධර්ම අනුගමනය කරයි. ප්‍රධාන මූලධර්ම පිළිබඳ වඩාත් සම්පූර්ණ පැහැදිලි කිරීමක් සඳහා, කරුණාකර මෙම මාර්ගෝපදේශ බලන්න.

- **කිසිඳු හානියක් නොකරන්න:** සිද්ධි කළමනාකරණයේ මූලිකම මූලධර්මය නම්, සියලුම ක්‍රියා සහ මැදිහත්වීම් මගින් දරුවන් සහ ඔවුන්ගේ පවුල් තවදුරටත් හානියට පත් නොවන බවයි. ක්‍රියාවලියේ සෑම පියවරකදීම, සිද්ධි කළමනාකරණ ක්‍රියාවලියට සම්බන්ධ සියලු දෙනා විසින් ගනු ලබන තීරණ හෝ රැස් කරන තොරතුරු හේතුවෙන් දරුවන්ට සහ ඔවුන්ගේ පවුල්වලට කිසිදු හානියක් සිදු නොවන බවට සහතික විය යුතුය.

- **දරුවාගේ යහපතට ප්‍රමුඛත්වය දෙන්න:** සිද්ධි කළමනාකරණ ක්‍රියාවලියට සම්බන්ධ සියලු දෙනාම දරුවාගේ යහපත වෙනුවෙන් කටයුතු කළ යුතුය. මෙයට දරුවාගේ ශාරීරික හා චිත්තවේගීය ආරක්ෂාව සහ යහපැවැත්ම ඇතුළත් වේ. සිද්ධි සම්බන්ධයෙන් කටයුතු කරන්නන් තීරණ ගැනීමට පෙර දරුවාගේ සහ ඔහුගේ හෝ ඇයගේ පරිසරයේ අවදානම් සහ සම්පත් ඇගයීමට ලක් කළ යුතුය. මෙය ඔවුන්ගේ දෙමව්පියන්ගේ හෝ රැකබලා ගන්නන්ගේ අවශ්‍යතාවලට, හෝ ප්‍රජාවගේ මෙන්ම ඔවුන්ගේ සිද්ධියට සම්බන්ධ විය හැකි වෙනත් අයගේ අවශ්‍යතා සහ/හෝ සංස්කෘතික වටිනාකම් වලට වඩා දරුවාගේ අවශ්‍යතාවලට ප්‍රමුඛත්වය දෙන තේරීම් කිරීම සිදු කිරීම අදහස් කෙරේ.

- **වෙනස්කම් සිදු නොකිරීම:** සිද්ධි කළමනාකරණ ක්‍රියාවලියට සම්බන්ධ තැනැත්තන් සෑම දරුවෙකුටම ඔහුගේ හෝ ඇයගේ තනි අවශ්‍යතා මත පදනම්ව සැලකිය යුතුය. දරුවන් සහ ඔවුන්ගේ පවුල් ඔවුන්ගේ ස්ත්‍රී පුරුෂ භාවය, වයස, ආගම, ආබාධිතභාවය, වාර්ගිකත්වය, ජාතිය, ලිංගික දිශානතිය හෝ ආර්ථික තත්ත්වය මත පදනම්ව වෙනස් කොට සැලකීම නොකළ යුතුය. දරුවන්ට සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ට ජාතික සංඥා භාෂාව හෝ සුවිශේෂී අවස්ථා වලදී වාචික නොවන සන්නිවේදනය ඇතුළුව ඔවුන්ගේම භාෂාවෙන් සිද්ධි සම්බන්ධයෙන් කටයුතු කරන්නා සමඟ සන්නිවේදනය කිරීමට හැකි විය යුතුය. සිද්ධි කළමනාකරණ ක්‍රියාවලියට සම්බන්ධ සියලු දෙනා විනිශ්චය, අවමන් සහගත හෝ නිෂේධාත්මක භාෂාවෙන් වැළකී සිටිය යුතු අතර ප්‍රතිපත්ති සහ භාවිතයන්හි වෙනස්කම් කිරීම් සහ අගතියට අභියෝග කිරීම කළ යුතුය.

- **සදාචාරාත්මක ප්‍රමිතීන්ට අනුගත වීම, විශේෂයෙන්ම ළමා ආරක්ෂණ මූලධර්ම:** දරුවන් සමඟ කටයුතු කරන ආයතන සහ කාර්ය මණ්ඩලය සඳහා, සදාචාරාත්මක ප්‍රමිතීන් සහ ළමා ආරක්ෂණ ක්‍රියා පටිපාටි යෙදිය යුතුය. සුරැකුම් කාර්ය මණ්ඩලය ජාතික නීති සහ ප්‍රතිපත්ති ද දැන සිටිය යුතුය.

- **දැනුවත් කැමැත්ත සහ/හෝ දැනුවත් අනුමැතිය ලබා ගැනීම:** දැනුවත් කැමැත්ත යනු නිදහස් සහ දැනුවත් තේරීමක් කරන පුද්ගලයෙකුගේ ස්වේච්ඡා ගිවිසුමයි. දැනුවත් කැමැත්ත ලබා දීම සඳහා, දරුවන් සහ ඔවුන්ගේ පවුල් ලබා ගත හැකි සේවා සහ විකල්ප, සේවා ලැබීමේ ඇති විය හැකි අවදානම් සහ ප්‍රතිලාභ, තොරතුරු රැස් කර භාවිතා කරන්නේ කෙසේද යන්න සම්පූර්ණයෙන්ම අවබෝධ කර ගත

යුතුය. රහස්‍යභාවය බිඳ වැටෙන්නේ කවදාද සහ ඇයිද යන්න දරුවන් සහ ඔවුන්ගේ පවුල්ද තේරුම් ගත යුතුය. දැනුවත් අනුමැතිය යනු සේවාවන්ට සහභාගී වීමට ඇති කැමැත්තයි. දැනුවත් කැමැත්ත ලබා දීමට, නීතියෙන් හෝ ජීව විද්‍යාත්මකව දරුවන් ඉතා කුඩා වන නමුත් සහභාගී වීමට එකඟ වීමට තරම් වයසක පසුවන විට, එය භාවිතා වේ.

- **රහස්‍යභාවයට ගරු කරන්න:** සිද්ධි කළමනාකරණ ක්‍රියාවලියට සම්බන්ධ පුද්ගලයන් දරුවන්ගේ සහ පවුල්වල පෞද්ගලිකත්වය සඳහා ඇති අයිතිය සහතික කළ යුතුය. තොරතුරු ගබඩා කිරීම, බෙදා ගැනීම සහ අන් අයට මුදා හැරීම මෙයට ඇතුළත් වේ. 'දැන ගැනීමට අවශ්‍ය' යන යෙදුම මගින් විස්තර කරන්නේ දරුවා ආරක්ෂා කිරීම සඳහා එය දැනගත යුතු පුද්ගලයින්ට පමණක් තොරතුරු, විශේෂයෙන් සංවේදී තොරතුරු සීමා කිරීමයි. රහස්‍යභාවයට ගරු කිරීම සඳහා සේවා සපයන්නන් ළමයෙකු පිළිබඳ රැස් කරන ලද තොරතුරු ආරක්ෂා කිරීම මෙන්ම, එකඟ වූ දත්ත ආරක්ෂණ ප්‍රතිපත්ති සමඟ ආරක්ෂිතව දත්ත රැස් කිරීම සහ ගබඩා කිරීම අවශ්‍ය වේ. සිද්ධි කළමණාකරණ ක්‍රියාවලියට සම්බන්ධ සියලුම දෙනා, අනෙකුත් සිද්ධි සම්බන්ධයෙන් කටයුතු කරන්නන් ඇතුළු සිද්ධියට සෘජුව සම්බන්ධ නොවන කිසිවකුට දරුවන්ගේ නම් හෝ ඔවුන් පිළිබඳ වෙනත් හඳුනාගැනීමේ තොරතුරු පැවසිය යුතු නැත. ළමයෙකු සඳහා ක්ෂණික ආරක්ෂක ගැටළු හඳුනා ගැනීම හෝ අපරාධයක් වාර්තා කිරීමට නීතියෙන් නියම කිරීම සම්බන්ධයෙන් රහස්‍යභාවයට යම් සීමාවන් තිබේ. රහස්‍යභාවයේ සීමාවන් ඇගයීම ආරම්භයේදී දරුවන්ට සහ ඔවුන්ගේ පවුල්වලට පැහැදිලි කළ යුතුය.
- **වගවීම සහතික කිරීම:** සිද්ධි කළමනාකරණ ක්‍රියාවලියට සම්බන්ධ සියලු දෙනා දරුවාට, පවුලට සහ ප්‍රජාවට වගකියනු ලැබේ. ඔවුන්ගේ ක්‍රියාවන්ට සහ එම ක්‍රියාවන්ගේ ප්‍රතිඵලවලට ඔවුන් වගකිව යුතුය.
- **දරුවන් සහ පවුල් ඔවුන්ගේ ශක්තීන් මත ගොඩනැගීමට බල ගැන්වීම:** සිද්ධි සම්බන්ධයෙන් කටයුතු කරන්නන් ශක්තීන් මත පදනම් වූ ප්‍රවේශයක් භාවිතා කළ යුතුය. දරුවන් සහ ඔවුන්ගේ පවුල් බොහෝ විට ඔරොත්තු දීමේ ලක්ෂණ වලින් සමන්විත වේ. තමන්ටම පිහිට වීමට අවශ්‍ය සම්පත් සහ කුසලතා ඔවුන් සතු වන අතර ඔවුන්ගේම ගැටලුවලට විසඳුම් සෙවීමට දායක වේ. සිද්ධි කළමනාකරණ ක්‍රියාවලියේ සියලුම අංශවල ක්‍රියාකාරී භූමිකාවක් ඉටු කිරීමට සිද්ධි සම්බන්ධයෙන් කටයුතු කරන්නන් විසින් ළමුන් සහ ඔවුන්ගේ පවුල් සම්බන්ධ කර ගත යුතු අතර, අවදානම් සහ අවදානමට ලක්වීමේ හැකියාව පිළිබඳව පමණක් නොව, ළමා ආරක්ෂණ ගැටළු විසඳීම සඳහා දරුවන්ට සහ ඔවුන්ගේ පවුල්වලට ඔවුන්ගේ ශක්තීන් සහ සම්පත් ගොඩනගා ගැනීමට හැකි වේ. මෙමගින් ළමුන් සඳහා වඩාත් හොඳින් ගැලපෙන සහ තිරසාර විසඳුම් ලැබෙනු ඇත.
- **ළමා සංවර්ධනය, ළමා අයිතිවාසිකම් සහ ළමා ආරක්ෂාව පිළිබඳ මනා දැනුමක් මත සියලු ක්‍රියාවන් පාදක කරන්න:** දරුවන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල අභ්‍යන්තරයේ පවතින සහ බොහෝ විට ප්‍රකාශ නොකළ අවශ්‍යතා සපුරාලීමට උපකාර වන අවදානම්, බල ගතිකතාවයන් සහ අවදානම් සාධක සිද්ධි සම්බන්ධයෙන් කටයුතු කරන්නන් සහ රැකබලා ගන්නන් අවබෝධ කර ගත යුතුය. ළමුන්ගේ වයස, ස්ත්‍රී පුරුෂ භාවය, හැකියාව සහ පරිණාමය වීමේ හැකියාව මත පදනම්ව ළමුන් සමඟ වඩා හොඳින් සම්බන්ධ වීමට සහ ඔවුන් සමඟ සන්නිවේදනය කිරීමට ළමා සංවර්ධනය පිළිබඳ ශක්තිමත් අවබෝධයක් උපකාරී වේ.

- **දරුවන්ගේ අර්ථවත් සහභාගීත්වයට පහසුකම් සැලසීම:** දරුවන්ට ඔවුන්ගේ අදහස් ප්‍රකාශ කිරීමට සහ ඔවුන්ගේ ජීවිතයට බලපාන තීරණවලට අර්ථවත් ලෙස සහභාගී වීමට අයිතියක් ඇත. ඔවුන් අපහසුතාවයට පත් කරන ප්‍රශ්නවලට පිළිතුරු නොදීම තෝරා ගැනීම ද මෙයට ඇතුළත් වේ. සිද්ධි කළමනාකරණ ක්‍රියාවලියේ ක්‍රියාකාරී භූමිකාවක් ඉටු කිරීමට සිද්ධි සම්බන්ධයෙන් කටයුතු කරන්නන් දරුවන්ට සහ ඔවුන්ගේ පවුල්වලට සහාය විය යුතුය.

- **සංස්කෘතිකමය වශයෙන් සුදුසු ක්‍රියාවලි සහ සේවා සැපයීම:** සිද්ධි කළමනාකරණ ක්‍රියාවලියට සම්බන්ධ සියලු දෙනාම තමන් සේවය කරන විවිධ ප්‍රජාවන් තේරුම් ගත යුතු අතර පුද්ගල, පවුල් සහ ප්‍රජා වෙනස්කම් පිළිබඳව දැනුවත් විය යුතුය. දරුවාගේ යහපත සංස්කෘතික වටිනාකම් හෝ භාවිතයන් සමඟ ගැටෙන විට, ඊට සම්බන්ධ සියලු දෙනාම දරුවාගේ යහපතට ප්‍රමුඛත්වය දිය යුතු අතර ඔහු හෝ ඇයව වැඩි අවදානමකට ලක් නොවන තීරණ ගත යුතුය. ඇතැම් සන්දර්භයන් තුළ, ළමා ආරක්ෂණ ගැටළු සහ සංස්කෘතික භාවිතයන්ට මුහුණ දීම ළමුන්, පවුල්, ප්‍රජාවන් සහ සිද්ධි සම්බන්ධයෙන් කටයුතු කරන්නන්ට ගැටුම් හෝ අමතර අවදානම් වලට තුඩු දිය හැකිය. අවදානම් ප්‍රවේශමෙන් තක්සේරු කිරීම මත තීරණ ගත යුතු අතර හානියක් නොකරන්න යන මූලධර්මවලට සහ දරුවාගේ යහපතට ගරු කිරීම සිදු කළ යුතුය.

- **සම්බන්ධීකරණය සහ සහයෝගීතාව:** සිද්ධි කළමනාකරණයේ එක් ප්‍රධාන ඉලක්කයක් වන්නේ සම්බන්ධීකරණ සේවාවන් හොඳින් සැපයීමයි. සිද්ධි කළමනාකරණයට දරුවන් ආරක්ෂා කිරීමේ නියෝගයක් සහිත සියලු සංවිධාන අතර සම්බන්ධීකරණය සහ සහයෝගීතාව වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලියක් සැපයිය හැකිය.

- **වෘත්තීය සීමාවන් පවත්වා ගැනීම සහ උනන්දුව පිළිබඳ ගැටුම් ආමන්ත්‍රණය කිරීම:** සිද්ධි කළමනාකරණ ක්‍රියාවලියට සම්බන්ධ සියලු දෙනා සේවා හෝ සහාය වෙනුවෙන් අනුග්‍රහය, ගෙවීම් හෝ තෑගි ඉල්ලා සිටීම හෝ භාර ගැනීම සිදු නොකළ යුතුය.

මීට අමතරව, **ළමා හිතකාමී** වීම සහ **ළමා කේන්ද්‍රීය** වීම ආරක්ෂා කිරීමට පියවර තුළ ඇති ප්‍රධාන ප්‍රවේශ දෙකකි.


- **ළමා හිතකාමී** වීම යනු, දරුවන්ට සුදුසු සහ දරුවන්ට ප්‍රවේශ විය හැකි ආකාරවලින් දරුවන්ට සහයෝගය ලබා දීමයි. නිදසුනක් වශයෙන්, විවිධ වයස්වල, හැකියාවන් සහ අවබෝධතා මට්ටම්වල දරුවන්ට පහසුවෙන් තේරුම් ගත හැකි තොරතුරු සන්නිවේදනය කිරීම සහ සැපයීමයි.
- **ළමා කේන්ද්‍රීය** වීම යනු දරුවාගේ අවශ්‍යතා සහ ඔවුන්ගේ හොඳම අවශ්‍යතා මත කේන්ද්‍රගත වන ආකාරයට තීරණ ගැනීම, සංවිධානය කිරීම සහ උපකාර සේවා සැපයීමයි.
- විශේෂයෙන්ම, ළමා කේන්ද්‍රීය ප්‍රවේශයක් අදහස් කරන්නේ:
  - දරුවා සමඟ **සම්බන්ධතා සහ බැඳීම් වර්ධනය කර ගැනීමට** කාලය ගත කිරීම, **දරුවාට සවන් දීම** සහ **තනි පුද්ගලයෙකු** සහ **අද්විතීය අයිතිවාසිකම්-දරන්නෙකු** ලෙස දරුවාට **ප්‍රතිචාර** දැක්වීම.
  - සිද්ධි කළමනාකරණය දරුවාට ඔහුගේ හෝ ඇයගේ සිද්ධියේ **ක්‍රියාකාරී සහභාගිවන්නෙකු** වීමට හැකි බව සහතික කිරීම, **දරුවාගේ අදහස්වලට ඇහුම්කන් දීම** සහ **ඔවුන්ගේ** සංවර්ධන **වයස සහ අවබෝධය අනුව ඔවුන්ට බලපාන තීරණවලට ළමුන් සම්බන්ධ කර ගැනීම.**

### 4.6.4. ළමා ආරක්ෂණ සිද්ධි කළමනාකරණ ක්‍රියාවලිය - හැඳින්වීමක්

CPCM ක්‍රියාවලිය ආරම්භයේ සිට අවසානය දක්වා අදියර හයක් ඇතුළත් වේ - එය පහත වගුවේ දක්වා ඇත. සිද්ධි කළමනාකරණ ක්‍රියාවලිය ආරම්භ කිරීමට පෙර, පරිවාස නිලධාරියෙකු පත්කරනු ලබන අතර, CPCM ක්‍රියාවලිය ආරම්භ වන විට ඔහු/ඇය සිද්ධි සම්බන්ධයෙන් කටයුතු කරන්නාගේ වගකීම භාර ගනී. ශ්‍රී ලංකාව තුළ, අධිකරණය විසින් තීරණය කරනු ලබන පරිදි රැකවරණය සහ ආරක්ෂාව අවශ්‍ය බොහෝ දරුවන් වෛද්‍ය නිලධාරීන් විසින්, රෝහල් පාදක ළමා ආරක්ෂණ සිද්ධි කළමනාකරණ ක්‍රියාවලිය ආරම්භ වන රෝහල් වෙත යොමු කරනු ලැබේ. මෙම ක්‍රියාවලියේදී පරිවාස නිලධාරියාට සිද්ධි සම්බන්ධයෙන් කටයුතු කරන්නාගේ භූමිකාව පවරනු ලැබේ.

සිද්ධි සම්බන්ධයෙන් කටයුතු කරන්නා වෛද්‍ය නිලධාරීන් සමඟ එක්ව හඳුනා ගැනීම සහ පරීක්ෂා කිරීම සමඟින් ක්‍රියාවලිය ආරම්භ කරයි, පසුව තක්සේරු කිරීම සහ සිද්ධි සැලසුම් කිරීම සිදු කරයි. සාමාන්‍යයෙන් මෙම ක්‍රියාවලිය හරහා, ආයතනික රැකවරණ වෙත යොමු කරනු ලබන දරුවන් ඔවුන් රැකවරණ ස්ථානයට

පැමිණි විට, ඒ සම්බන්ධයෙන් සිද්ධි සැලැස්මක් සකස් කර ඇත. එබැවින්, භාරකරුවන්ගේ කාර්යභාරය **ක්‍රියාත්මක කිරීමේ** අදියරේ සිට ආරම්භ වන නමුත්, පහත විස්තර කර ඇති පරිදි, දරුවාගේ තත්වයන් අනුව නැවත සැලසුම් කිරීම අවශ්‍ය නම් එය සිදු කළ හැක.




ඉහත පෙන්වා ඇති පියවර **අන්තර් සම්බන්ධිත** වන අතර යම් අවස්ථාවක දී ක්‍රියාවලියේ පෙර අවධියකට නැවත පැමිණීමට හේතු විය හැක. සිද්ධියක් වසා දැමීමට පෙර තක්සේරු කිරීම, සිද්ධි සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ සිද්ධි සමාලෝචනය නැවත නැවතත් කිහිප වතාවක් කළ හැක. සිද්ධි සම්බන්ධයෙන් කටයුතු කරනන් දරුවෙකුගේ සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ගේ තත්වය නිරන්තරයෙන් අධීක්ෂණය කළ යුතු අතර ඔවුන්ගේ වැඩ සංවිධානය කිරීම සඳහා නම්‍යශීලී මෙවලම් ලෙස සිද්ධි කළමනාකරණ පියවර භාවිතා කළ යුතුය.

## පළමු පියවර: හඳුනා ගැනීම සහ මූලික පරීක්ෂාව

ළමයින් විවිධ මූලාශ්‍ර හරහා හඳුනාගත හැකිය:

- දරුවා, ඔහුගේ හෝ ඇයගේ භාරකරුවන් හෝ වෙනත් පවුලේ සාමාජිකයන්
- ප්‍රජා සාමාජිකයින් සහ ළමා ආරක්ෂණ කමිටු සහ කණ්ඩායම්
- ළමා සමාජ සහ තරුණ කණ්ඩායම්
- ගුරුවරුන්, පාසල් සේවකයන්
- සෞඛ්‍ය සේවා වෘත්තිකයන්
- පොලිසිය, ආගමන නිලධාරීන්
- ළමා අයිතිවාසිකම් ප්‍රවර්ධන නිලධාරීන්, පරිවාස නිලධාරීන්, ළමා ආරක්ෂක නිලධාරීන්, PHMs, ECCD නිලධාරීන් වැනි සමාජ සේවකයන්
- වෙනත් ආයතන සහ/හෝ සිවිල් සමාජ සංවිධාන
- වෙනත් අංශවල සේවය කරන කාර්ය මණ්ඩල සාමාජිකයින්.

## දෙවන පියවර :තක්සේරුව

තක්සේරුව සඳහා පහත සඳහන් කරුණු සලකා බැලිය යුතුය:

→ ක්ෂණික ශාරීරික ආරක්ෂාව, සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ ගැටළු.

→ දරුවාගේ ශාරීරික, සමාජීය සහ චිත්තවේගීය අවශ්‍යතා. සේවාවලට වඩා අවශ්‍යතා කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් වේ. නිදසුනක් වශයෙන් දරුවාට පාසල් යාමට වඩා අධ්‍යාපනය අවශ්‍ය බව පැවසීම, බොහෝ විට දරුවාගේ අධ්‍යාපන අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීමට බොහෝ ක්‍රම ඇති අතර පාසල යනු එක් විකල්පයක් පමණි.

→ විවිධ ආරක්ෂණ ගැටළු වල පුරෝගාමීන් සලකා බැලීම ද වැදගත් වේ. නිදසුනක් වශයෙන්, දරුවෙකු ළමා ශ්‍රමයේ නියැලීමේ අවදානමක හෝ නියැලෙන්නේ නම්, විවිධ මැදිහත්වීම් හරහා ආමන්ත්‍රණය කළ යුතු පුරෝගාමීන් කිහිප දෙනෙකු සිටින බව පෙනෙන්නට තිබේ. මෙයට අධ්‍යාපනයට ප්‍රවේශ වීමට සහාය වීම, රැකබලා ගන්නන් සමඟ සමාජ සම්මතයන් ක්‍රියා කිරීම සහ පවුලේ ආදායම අහිමි වීම සඳහා උපකාර වශයෙන් කෙටි කාලීන ආවරණයක් සැපයීම සඳහා මුදල් සහ වවුචර් ආධාර (CVA) සැපයීම (දිගු කාලීන ජීවනෝපාය/සමාජ ආරක්ෂණ අවස්ථා ගවේෂණය කරන අතරතුර) ඇතුළත් විය හැකිය.

→ ළමා, පවුල් සහ ප්‍රජා මට්ටමින් අවදානම් සහ ආරක්ෂිත සාධක. එවැනි සාධකවලට දරුවාගේ වයස, ස්ත්‍රී පුරුෂ භාවය සහ ධාරිතාව, පවුලේ අධ්‍යාපනය, ආර්ථික තත්ත්වය, මනෝ සමාජීය යහපැවැත්ම සහ (මානසික) සෞඛ්‍යය, සහ/හෝ ප්‍රජාව තුළ ඇති අවදානම් හෝ ආරක්ෂාව වැනි කරුණු ඇතුළත් විය හැකිය.

## තෙවන පියවර: සිද්ධි සැලසුම් කිරීම

සිද්ධි සැලසුම් කිරීම සඳහා, දරුවා සහ ඔහුගේ හෝ ඇයගේ පවුල සම්බන්ධ වන අතර එය තක්සේරු කිරීමේදී හඳුනාගත් අවශ්‍යතා, විභව අවදානම් සහ ශක්තීන් මත පදනම්ව **වඩාත් සුදුසු ප්‍රතිචාරය** තීරණය කිරීමේ ක්‍රියාවලියකි. හඳුනාගත් එක් එක් අවශ්‍යතා සපුරාලන්නේ කෙසේද, එම විශේෂිත අවශ්‍යතා සපුරාලීමට යන්නේ

කවුරුන්ද සහ එම ක්‍රියාවන් සිදුවන්නේ කවදාද යන්න පිළිබඳ තොරතුරු සැලැස්මට ඇතුළත් විය යුතුය. කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගු කාලීන **ඉලක්ක** හඳුනා ගැනීමට දරුවාට සහ පවුලට උපකාර කිරීමට සිද්ධි සම්බන්ධයෙන් කටයුතු කරන්නාට හැකිය. විශේෂයෙන් සමහර සේවා සහ ආධාරක නොමැති නම්, හඳුනාගෙන ඇති සියලුම ගැටලු වහාම විසඳා ගැනීමට හැකිවීම පිළිබඳව දරුවාගේ සහ පවුලේ අයගේ අපේක්ෂාවන් ඉහළ නැංවීම වැදගත් නොවේ.

දරුවාගේ **කැමැත්ත සහ අදහස් අනිවාර්යයෙන්ම** සැලකිල්ලට ගත යුතුය. මින් අදහස් කරන්නේ දරුවාට අවශ්‍ය දේ සරලව කිරීම නොවේ, මන්ද දරුවා නොසලකන හෝ තේරුම් නොගත් අවදානම් තිබිය හැකි නමුත්, සිද්ධි සම්බන්ධයෙන් කටයුතු කරන්නෙකු නිශ්චිත සැලැස්මක් මත තීරණය කළේ කෙසේද සහ ඇයි දැයි තේරුම් ගැනීමට දරුවාට උපකාර කළ යුතුය - විශේෂයෙන්ම මෙය දරුවට අවශ්‍ය දෙයින් වෙනස් වේ. .

**සිද්ධි සම්මන්ත්‍රණ**

රැකවරණය සහ ආරක්ෂාව අවශ්‍ය ළමුන්ගේ බොහෝ අවස්ථාවන් සඳහා, "ළමා අපයෝජන සහ නොසලකා හැරීම් කළමනාකරණය සඳහා වූ ජාතික මාර්ගෝපදේශ" (SL College of Paediatricians, 2014) ට අනුකූලව රෝහල් විසින් සිද්ධි සම්මන්ත්‍රණයක් කැඳවනු ලැබේ. මෙය ද්විත්ව ප්‍රවේශයක් ඔස්සේ සිදු වේ.

1. සායනික සිද්ධි සම්මන්ත්‍රණය: දරුවා රෝහලට ඉදිරිපත් කර පැය 24ක් ඇතුළත විවිධ විශේෂඥයින් විසින් දරුවා කිහිප වතාවක් සම්මුඛ පරීක්ෂණයට ලක් නොකරන බව සහතික කිරීම සඳහා, දරුවා පිළිබඳව විවිධ විශේෂඥයින් දැනුවත් කිරීම සහ වැඩිදුර සායනික කළමනාකරණය සැලසුම් කිරීම.
2. ආයතනික (බහු ආංශික) සිද්ධි සම්මන්ත්‍රණය: දරුවාගේ රැකවරණය, ආරක්ෂාව, අධ්‍යාපනය, මනෝ සමාජීය යහපැවැත්ම සහ නැවත සමාජගත කිරීම සඳහා සත්කාර සැලසුම් සකස් කිරීම සඳහා සායනික සිද්ධි සම්මන්ත්‍රණයේ දී යෝජනා කරන ලද දිනක පවත්වනු ලැබේ.

ආයතනික සිද්ධි සම්මන්ත්‍රණයේ අරමුණ වන්නේ බහු-විනය/අන්තර් ආයතන සේවා සම්බන්ධීකරණය කිරීම සහ දරුවාගේ යහපත සඳහා විධිමත් තීරණ ගැනීමයි. දරුවාගේ ජීවිතයට සම්බන්ධ අය සහ අදාළ සේවකයන් (සිද්ධි සම්බන්ධයෙන් කටයුතු කරන්නන්, ගුරුවරයා, සමාජ සේවකයා, පළාත් පාලන නිලධාරියා, ආදීන්) සමඟ දරුවා හොඳින් හඳුනන අයගෙන් මණ්ඩලය සමන්විත විය යුතුය.

→ ක්‍රියාවලිය පුරාම ළමා කේන්ද්‍රීය ප්‍රවේශයක් තබා ගැනීම වැදගත් වේ.

→ දරුවා සහ ඔහුගේ හෝ ඇයගේ පවුලේ සාමාජිකයන් ඇතැම් අවස්ථාවන් වල සම්මන්ත්‍රණවලට සහභාගී වන්නේ, පවුලේ සහභාගිත්වය ලබා ගැනීම කෙතරම් යෝග්‍යද යන්න මතය. ඕනෑම සහභාගීත්වයක් සඳහා ප්‍රවේශමෙන් සැලසුම් කිරීම සහ පහසු කිරීම අවශ්‍ය වේ. ගනු ලබන තීරණ වඩාත් ඵලදායි කිරීම සඳහා සෑම විටම දරුවාගේ සහ පවුලේ අයගේ අදහස් සහ යෙදවුම් සෙවිය යුතුය.

→ සිද්ධි සම්මන්ත්‍රණ විධිමත් ලෙස වාර්තාකරණ ආකෘතියක් සහ/හෝ වාර්තා භාවිතයෙන් ලේඛනගත කළ යුතුය.

→ ආබාධ සහිත ළමුන්ගේ අවශ්‍යතාවලට ප්‍රතිචාර දැක්වීම සම්බන්ධයෙන් සිද්ධි සම්බන්ධයෙන් කටයුතු කරන්නන් සහ අධීක්ෂකවරුන් හට මග පෙන්වීම සඳහා, ආබාධ සහිත දරුවන් සමඟ වැඩ කිරීමේ විශේෂඥ දැනුම සහිත සිද්ධි සම්බන්ධයෙන් කටයුතු කරන්නන් සහ අනෙකුත් වෘත්තිකයන් ඇතුළත් විය යුතුය.


## සිව්වන පියවර : ක්‍රියාත්මක කිරීම

සිද්ධි සැලැස්ම සකස් කිරීමෙන් පසුව, ක්‍රියාත්මක කිරීම ආරම්භ කළ හැකිය. සැලැස්මෙහි විස්තර කර ඇති ක්‍රියාවන් සිදු කිරීම සඳහා දරුවා සහ ඔහුගේ හෝ ඇයගේ පවුලේ අය සමඟ කටයුතු කිරීම මෙයට ඇතුළත් වේ. සිද්ධි සම්බන්ධයෙන් කටයුතු කරන්නා බොහෝ විට මනෝ සමාජීය සහය, සිද්ධි සැලැස්මට අනුව දරුවාගේ ආරක්ෂක අවශ්‍යතා සපුරාලීමේදී සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කිරීමට අපේක්ෂා කරන පවුලේ සාමාජිකයන් සමඟ නිතිපතා සම්බන්ධ වීම සහ සාකච්ඡා කිරීම වැනි **සෘජු සේවාවන්** සපයනු ඇත.

සිද්ධි සම්බන්ධයෙන් කටයුතු කරන්නාගේ අත්‍යවශ්‍ය කාර්යභාරය වන්නේ දරුවාට සහ දරුවාගේ පවුලට හිමි සේවාවන් සඳහා ප්‍රවේශය ලබා ගැනීමට උපකාර කිරීමයි. මෙයට මූලික සේවා සහ/හෝ වැඩි විශේෂිත සේවා සඳහා **යොමු කිරීම්** මෙන්ම අවශ්‍ය විට ප්‍රජා ආධාරක මූලාශ්‍ර සමඟ සම්බන්ධ කිරීම් ඇතුළත් විය යුතුය.

**යොමු කිරීමේ මාර්ග** හැකි තරම් නිශ්චිත විය යුතු අතර නිතර යාවත්කාලීන කළ යුතුය. සිද්ධි සම්බන්ධයෙන් කටයුතු කරන්නන්, සේවා සහ ආධාරක සිතියම්ගත කිරීම නඩත්තු කිරීම සහ යාවත්කාලීන කිරීම හෝ අන්තර් නියෝජිතායතන යොමු කිරීමේ මාර්ග අතර සම්බන්ධීකරණය සඳහා සහාය වීම සිදු කළ යුතුය.

**යොමු කිරීම් වර්ග**




**දරුවාට සෘජු සේවා සැපයීමේදී රැකබලා ගන්නාගේ කාර්යභාරය**

ළමා සුරැකුම් මධ්‍යස්ථාන වල රැකබලා ගන්නන් සමඟ සසඳන විට, පරිවාස නිලධාරීන්ට ආයතනගත ළමුන් සමඟ අන්තර්ක්‍රියා කිරීම සඳහා සීමිත කාලයක් පවතී. දරුවන් තම රැකබලා ගන්නන් සමඟ ළමා සුරැකුම් මධ්‍යස්ථානයේ වැඩි කාලයක් ගත කරන අතර, ඔවුන් දරුවන්ගේ පළමු සම්බන්ධතා ස්ථානය බවට පත්වේ. එබැවින්, විශේෂයෙන්ම විශේෂිත නොවන මනෝ සමාජීය සහය සහ යොමු කිරීම් සඳහා වන යෝජනා හරහා

ඔවුන්ගේ රැකවරණයේ සිටින දරුවන් සඳහා අත්‍යවශ්‍ය සහ මූලික සහය ලබා දීමට රැකබලා ගන්නන් සූදානම් විය යුතුය.

## පස්වන පියවර : සිද්ධි සමාලෝචනය

සිද්ධි සමාලෝචනය මගින් **ක්‍රමානුකූලව සහ විධිමත් ලෙස පිළිඹිබු** කිරීමට ඉඩ සලසයි, එමගින් සිද්ධි සම්බන්ධයෙන් කටයුතු කරන්නාට, දරුවාට, දරුවාට සහ ඔවුන්ගේ භාරකරුවන්ට සිද්ධි සැලැස්මේ අරමුණු සපුරා තිබේද යන්න පරීක්ෂා කිරීමට හැකි වේ. මෙය සැලැස්ම තවදුරටත් අදාළද යන්න සහ සැලැස්මේ යම් වෙනස්කම් සිදු කළ යුතුද යන්න පරීක්ෂා කිරීමට කාලයයි. දරුවාට සහ ඔහුගේ හෝ ඇයගේ පවුලේ අයට තමන්ට හැඟෙන ආකාරය සහ ඔවුන් ලබා ඇති ප්‍රගතිය සම්බන්ධයෙන් සෑහීමකට පත්වන්නේ නම් එය පිළිඹිබු කිරීමට කාලය තිබිය යුතුය.

සිද්ධි සමාලෝචනය විවිධ ආකාර තුනකින් සිදු විය හැක:

- **සිද්ධි සමාලෝචන රැස්වීම** (දරුවා සහ ඔහුගේ හෝ ඇයගේ භාරකරුවන් සමඟ): සිද්ධි සැලැස්ම සමාලෝචනය කිරීම සඳහා සිද්ධිය සම්බන්ධයෙන් කටයුතු කරන්නා, දරුවා සහ ඔහුගේ හෝ ඇයගේ භාරකරුවන් අතර රැස්වීම. මෙහිදී පිරිස එකඟ වූ සහ සුදුසු නම්, පවුලේ අනෙකුත් සාමාජිකයන් හෝ අනෙකුත් ක්‍රියාකාරීන් පැමිණ සිටිය හැක. මෙම රැස්වීම සිද්ධි සැලසුම් රැස්වීමට සමාන වේ.
- **සිද්ධි සම්මන්ත්‍රණ** (බහු ආයතන/සේවා අතර): වඩාත් සංකීර්ණ අවස්ථා හෝ බරපතල ගැටළු සඳහා විවිධ ආයතන සහ සේවා අතර වඩාත් විධිමත් සිද්ධි සැලසුම් කිරීම හෝ සමාලෝචන රැස්වීම්.

### ප්‍රධාන සලකා බැලීම්

→ දරුවාට සහ ඔහුගේ හෝ ඇයගේ පවුලේ අයට තමන්ට හැඟෙන ආකාරය සහ ඔවුන් ලබා ඇති ප්‍රගතිය සම්බන්ධයෙන් සෑහීමකට පත්වන්නේ නම් එය පිළිඹිබු කිරීමට කාලය තිබිය යුතුය.

→ සිද්ධි සැලැස්මේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අඛණ්ඩව සහාය දැක්වීමට හැකි පුද්ගලයින් සමාලෝචනවලට ඇතුළත් කළ යුතුය.

## හයවන පියවර : සිද්ධිය අවසන් කිරීම

දරුවා සහ පවුලේ සාමාජිකයින් සිද්ධි සැලැස්මේ ඉලක්ක සපුරා ඇති විට, දරුවා හානිවලින් ආරක්ෂා වන අතර ඔහුගේ හෝ ඇයගේ යහපැවැත්මට සහාය වන අවස්ථාවන් වලදී සිද්ධි බොහෝ විට වසා දමනු ලැබේ.

සිද්ධියක් වසා දැමිය හැකි වෙනත් හේතු වනුයේ:

→ දරුවෙකු නිල වශයෙන් වෙනත් ස්ථානයකට මාරු කර ඇති විට, විශේෂයෙන් ඔවුන් වෙනත් ස්ථානයක ක්‍රියාත්මක වන්නේ නම්.

→ දරුවාට සහ ඔහුගේ හෝ ඇයගේ භාරකරුවන්ට තවදුරටත් සහය අවශ්‍ය නොවන විට සහ ඔවුන්ගේ කැමැත්තට එරෙහිව යාමට කිසිදු හේතුවක් නොමැති විට, මෙය දරුවාට ආරක්ෂිත නම්. දරුවා තම පවුල සමඟ සාර්ථකව නැවත සමාජගත කිරීම මෙයට ඇතුළත් වේ.

→ දරුවෙකුට වයස අවුරුදු 18ක් වූ පසු සමහර අවස්ථා අවසන් වේ. මෙම අවස්ථාවේදී, ඔවුන්ට වයස අවුරුදු 18 සම්පූර්ණ වූ පසු තරුණ වැඩිහිටියෙකු ලෙස ඔවුන්ට අවශ්‍ය සුදුසු සේවාවන් ලබා ගැනීමට දරුවෙකුට වයස අවුරුදු 16 හෝ 17 වන විට, ඔවුන්ට සංක්‍රාන්ති සහාය ලබා දිය යුතු අතර මෙය

සිද්ධි සැලැස්මේ කොටසක් විය යුතුය. නේවාසික රැකවරණයෙන් වයස්ගත වූ දරුවන් සඳහා විකල්ප සුරැකුම් වැඩසටහන් වලදී මෙය විශේෂයෙන් අදාළ වේ.

## 4.6.5.ලේඛනගත කිරීම සහ වාර්තා තබා ගැනීම[8]

**ලේඛනගත කිරීම** යනු දරුවා සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් සෘජුව සපයන තොරතුරු මෙන්ම වක්‍රව එකතු කරන ලද ඕනෑම තොරතුරක් ඇතුළුව තනි තනි දරුවන්ට සහ ඔවුන්ගේ පවුල්වලට විශේෂිත වූ තොරතුරු රැස් කිරීම සහ ගබඩා කිරීමේ ක්‍රියාවලියයි. නිසි ලියකියවිලි මගින් ඵලදායි සහ වගවීම සහිත සිද්ධි කළමනාකරණයට පහසුකම් සැලසෙන අතර දරුවාගේ, ඔහුගේ හෝ ඇයගේ භාරකරුවන්ගේ සහ කාර්ය මණ්ඩලයේ ආරක්ෂාව සම්බන්ධයෙන් පවතින අවදානම අවම කරයි.

**වාර්තා තබා ගැනීම**

ඔබ සිටින රටේ නීතිමය බැඳීම් හා රහස්‍ය ප්‍රතිපත්තියට අනුකූල වන ආකාරයට වාර්තා තබා ගත යුතුය. **හොඳ වාර්තා තබා ගැනීම** වෘත්තීය සහ සදාචාරාත්මක වගකීමකි. දුර්වල වාර්තා තබා ගැනීම දරුවන්ට සම්බන්ධ අවදානම් සහිත දත්ත ආරක්ෂණය උල්ලංඝනය කිරීමට හේතු විය හැක.

**රහස්‍යභාවය** යනු දත්ත ආරක්ෂණ සහ තොරතුරු හුවමාරු කිරීමේ ප්‍රොටෝකෝල හරහා සෑම තරාතිරමකම සහතික කළ යුතු සිද්ධි කළමනාකරණයේ ප්‍රධාන මූලධර්මයකි. දරුවන් ආරක්ෂා කිරීමට සහ ඔවුන්ගේ යහපත ආරක්ෂා කිරීමට රහස්‍යභාවය මූලික වේ. එය පවත්වාගෙන යනු ලබන්නේ වෙනත් පාර්ශ්වයන් සමඟ තොරතුරු බෙදා ගැනීමට කැමැත්ත සහතික කිරීමෙන් සහ දැනගත යුතු පදනමක් මත සහ දරුවාගේ යහපත සඳහා පමණක් තොරතුරු බෙදාගැනීමෙන්.

**දත්ත ආරක්ෂණය** යනු ආරක්ෂිත, සීමිත ප්‍රවේශයක් සහිත ආරක්ෂිත ආකාරයකින් තොරතුරු රැස් කිරීම, තබා ගැනීම, බෙදාගැනීම සහ ගබඩා කිරීමයි.

දැනුවත් කැමැත්ත සහ/හෝ දැනුවත් අනුමැතිය

සියලුම ක්‍රියාකාරීන් දරුවන් සහ ඔවුන්ගේ පවුල් පිළිබඳව රැස් කරන ලද තොරතුරු ආරක්ෂා කිරීමට අවශ්‍ය වන **රහස්‍යභාවයේ මූලධර්මයට** ගරු කිරීම සඳහා දැනුවත් කැමැත්ත සහ අනුමැතිය කේන්ද්‍රීය වන අතර, සීමිත අවස්ථාවන් කිහිපයකදී හැර, දරුවෙකුගේ සහ ඔවුන්ගේ භාරකරුවන්ගේ කැමැත්ත ඇතිව එයට ප්‍රවේශ විය හැකි බව සහතික කරන්න.

**දැනුවත් කැමැත්ත** යනු කැමැත්ත ලබා දීමට නීතිමය හැකියාව ඇති පුද්ගලයෙකුගේ ස්වේච්ඡා ගිවිසුමයි. "දැනුවත් කැමැත්ත" ලබා දීම සඳහා පුද්ගලයාට පිරිනමනු ලබන සේවාවන් පිළිබඳව දැන ගැනීමට, අවබෝධ කර ගැනීමට මෙන්ම නීත්‍යානුකූලව ඔවුන්ගේ කැමැත්ත ලබා දීමට හැකියාවක් සහ පරිණතභාවයක් පැවතිය යුතුය. තම දරුවාට සේවා ලබා ගැනීමට කැමැත්ත ලබා දීම සඳහා සාමාන්‍යයෙන් දෙමාපියන් හෝ භාරකරුවන් වගකිව යුතුය. සමහර සැකසීම් වලදී, වැඩිහිටි යොවුන් වියේ පසුවන්නන්ට ඔවුන්ගේ භාරකරුවන් වෙනුවට හෝ ඊට අමතරව කැමැත්ත ලබා දීමට නීත්‍යානුකූලව හැකියාව ඇත.

[8] Alliance for Child Protection in Humanitarian Action (2014) Interagency Guidelines for Case Management and Child Protection

**දැනුවත් අනුමැතිය** යනු සේවා සඳහා සහභාගී වීමට පුද්ගලයෙකුගේ ප්‍රකාශිත කැමැත්තයි. නිර්වචනය අනුව, වයස අවුරුදු 16 ට අඩු දරුවන් දැනුවත් කැමැත්ත ලබා දීමට කුඩා වන නමුත්, අවබෝධ කර ගැනීමට සහ සේවාවලට සහභාගී වීමට එකඟ වීමට තරම් වයසින් වැඩි ය. එබැවින් ඔවුන්ගේ 'දැනුවත් අනුමැතිය' අපේක්ෂා කෙරේ.

ඇතැම් අවස්ථාවන් වලදී, දැනුවත් කැමැත්ත ලබා ගත නොහැකි හෝ ප්‍රතික්ෂේප කළ හැකි අතර, තවමත් දරුවා ආරක්ෂා කිරීමට මැදිහත් වීම අවශ්‍ය විය හැකිය. නිදසුනක් වශයෙන්, 12 හැවිරිදි ගැහැණු ළමයෙකු තම පියා විසින් ලිංගික අපයෝජනයට ලක් කරන්නේ නම්, ඇය ඔහුට සහ ඇගේ පවුලේ අයට පක්ෂපාතී බවක් දැනෙන අතර කිසිදු පියවරක් ගැනීමට අකමැති විය හැකිය. සිද්ධි සම්බන්ධයෙන් කටයුතු කරන්නන්ට, සිදුවෙමින් පවතින දේ නොසලකා හැරිය හැකි බව ඉන් අදහස් නොවේ. කැමැත්ත ලබා නොදෙන විට සහ සම්බන්ධ නොවන විට, එම සිද්ධි සම්බන්ධයෙන් කටයුතු කරන්නා, දරුවෙකු ආරක්ෂා කිරීමට ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය නම්, ඊට හේතු පැහැදිලි කළ යුතු අතර දරුවාගේ සහ වරදක් නොකරන පවුලේ සාමාජිකයින්ගේ සහභාගීත්වය අඛණ්ඩව දිරිමත් කළ යුතුය.

*Child Protection Working Group (2014) Interagency Guidelines for Case Management and Child Protection*

## 4.6.6. ළමා ආරක්ෂණ සිද්ධි කළමනාකරණයේදී ආයතනික භාරකරුවන්ගේ කාර්යභාරය සහ වගකීම්

ළමා ආරක්ෂණ සිද්ධි කළමනාකරණය දිගු ක්‍රියාවලියක් විය හැකිය, විශේෂයෙන් බොහෝ දරුවන් වසර ගණනාවක් ආයතනික සුරැකුම් පහසුකම්වල ජීවත් වේ. මෙම දරුවන් බොහෝ විට වින්දිතයන්, වැරදිකරුවන් හෝ අතහැර දැමූ, අනාථ වූ හෝ අසරණ වූ දරුවන් වේ. එවැනි අහිතකර තත්ත්වයන් තුළ ළමුන් සඳහා වන සිද්ධි කළමණාකරණය සැම විටම ඔවුන්ගේ යහපැවැත්ම වැඩිදියුණු කිරීම සඳහා නිරන්තර මනෝ සමාජීය සහය සමඟ සංවේදී සුරැකුම් සහ ආරක්ෂාව සමඟ සම්බන්ධ විය යුතුය. පරිවාස නිලධාරීන් සාමාන්‍යයෙන් සුරැකුම් ආයතනවල දරුවන්ගේ රැකවරණය සහ යහපැවැත්ම නිරීක්ෂණය කිරීම සඳහා මාසික චාරිකා පවත්වයි. කෙසේ වෙතත්, ඔවුන්ට ඔවුන්ගේ අනෙකුත් රාජකාරි නිසා දරුවන් සමඟ ගුණාත්මක කාලයක් ගත කිරීමට නොහැකි වේ. දිවා රෑ නොබලා දරුවන් සමඟ සිටින නිසාත්, දරුවකු විපතට පත්වුවහොත් සම්බන්ධ වීමේ පළමු ස්ථානය වන නිසාත්, ආයතනවල සිටින භාරකරුවන්ට මෙම භූමිකාව වඩාත් ප්‍රායෝගිකව කළ හැකි ය.

එබැවින්, CPCM ක්‍රියාවලියේ භාරකරුවන්ගේ ප්‍රධාන වගකීම වන්නේ සිද්ධි සැලැස්මෙන් අපේක්ෂා කරන මනෝ සමාජීය ප්‍රතිඵල අත්කර ගැනීම සහතික කිරීම සහ සිද්ධි සම්බන්ධයෙන් කටයුතු කරන්නාට දරුවන්ගේ අවදානම් සහ යොමු කිරීමේ අවශ්‍යතා පිළිබඳ තොරතුරු සහ සහාය ලබා දීමයි.

### මනෝ සමාජීය සහය යනු කුමක්ද?

මානසික සෞඛ්‍යය යනු චිත්තවේගීය, මානසික සහ සමාජීය යහ පැවැත්මයි. එය මිනිසුන් සිතන, දැනෙන සහ ක්‍රියා කරන ආකාරය කෙරෙහි බලපායි. එය අප ආතතිය පාලනය කරන්නේ කෙසේද, අන් අය සමඟ සම්බන්ධ වන්නේ කෙසේද සහ තේරීම් කරන්නේ කෙසේද යන්න තීරණය කරයි. ළමා කාලයේ සිට වැඩිහිටි විය දක්වා ජීවිතයේ සෑම අදියරකදීම මානසික සෞඛ්‍යය සහ මනෝ සමාජීය යහපැවැත්ම වැදගත් වේ. හදිසි අවස්ථා, දුක්ඛිත සිදුවීම් සහ විපත්ති කාල පරිච්ඡේදයන් දරුවන්ට සහ ඔවුන් රැකබලා ගන්නන්ට ක්ෂණික හා දිගුකාලීන මානසික හා සමාජීය දුක් වේදනා ඇති කළ හැකිය. ළමයින් ප්‍රචණ්ඩත්වය, අහිමි වීම් සහ දුක් විඳීම අත්විඳ ඇති විට සහ ඔවුන් දුටු විට, ඔවුන් නින්දට යෑමේ අපහසුතාවය, ආහාර රුචිය වෙනස් වීම, අවධානය යොමු කිරීමේ අපහසුතාවය යනාදී මනෝ සමාජීය දුක්ඛිත ලක්ෂණ පෙන්විය හැක. පීඩාව සමනය නොකළහොත් හෝ සෘණාත්මක ක්‍රමෝපායන් හරහා කළමනාකරණය කළහොත් (මත්ද්‍රව්‍ය භාවිතය, චර්යාත්මක ගැටළු, හෝ

ස්වයං-හානිකර ගැනීම වැනි) දරුවන්ට සහ පවුල්වලට විශේෂිත සහය අවශ්‍ය වන මානසික සෞඛ්‍ය තත්වයන් වර්ධනය විය හැක.

දුෂ්කරතාවන්ට සාර්ථකව මුහුණ දීමේ දරුවන්ගේ හැකියාව (ඔවුන්ගේ "ප්‍රතිරෝධය") බලපෑම් කරනුයේ:

- ඔවුන්ගේ වයස, සංවර්ධන අවධිය සහ ආබාධිත තත්ත්වය;
- මූලික පැවැත්ම සහ ආරක්ෂක අවශ්‍යතා සඳහා ඔවුන්ගේ ප්‍රවේශය;
- ළමුන් සහ ඔවුන්ගේ පවුල්වල පෙර පවතින කායික හා මානසික සෞඛ්‍ය තත්ත්වය;
- පවුල්වලින් ඔවුන්ට ලැබෙන චිත්තවේගීය සහ සමාජීය සහයෝගය;
- ඔවුන්ගේ පවුල්වලට ලැබෙන චිත්තවේගීය සහ සමාජ සහයෝගය; සහ
- ඔවුන්ගේ සමස්ත සමාජ පරිසරය (ප්‍රජා සහයෝගය සහ ද්‍රව්‍යමය සම්පත් වැනි).

**දරුවාගේ කායික, මානසික සහ සමාජීය යහපැවැත්ම ශක්තිමත් කිරීම සඳහා සුදුසු මනෝ සමාජීය සහය සේවා සැපයීම මගින් පීඩාකාරී තත්ත්වයකට මුහුණ දෙන දරුවන් සමඟ කටයුතු කිරීමේදී සිද්ධි සම්බන්ධයෙන් කටයුතු කරන්නන් සහ රැකබලා ගන්නන් වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. භාරකරුවෙකුගේ මානසික සෞඛ්‍යය හෝ මනෝ සමාජීය පීඩාව දරුවාගේ රැකවරණය සහ යහපැවැත්මට බලපාන අවස්ථාවන් වල, භාරකරුට සහාය වීමේ මැදිහත්වීම් සඳහාද ඉලක්ක කළ යුතුය.**

සිද්ධි කළමනාකරණය පහත පරිදි සිදු කළ යුතුය:
මානසික සෞඛ්‍ය අවශ්‍යතා සඳහා සංවේදී වේ.
දරුවාගේ සහ භාරකරුගේ ආරක්ෂාව සහ මනෝ සමාජීය යහපැවැත්ම ප්‍රවර්ධනය කරයි.
පුද්ගලයෙකුගේ හැකියාවන් සහ ශක්තීන් මත ගොඩනඟයි.
පවුලේ සහ ප්‍රජා සහයෝගය ප්‍රවර්ධනය කරයි.

භාරකරුට පහත MHPSS සහායක එකතුවක් සැපයිය හැක:

1. දරුවා සහ ඔවුන්ගේ පවුලේ අය සමඟ ඇති **සෑම සම්බන්ධතාවයකදීම මූලික මනෝ සමාජීය සහාය කුසලතා යොදවන්න**, සියලු අන්තර්ක්‍රියා ගෞරවනීය බව සහතික කිරීම, විශ්වාසය ගොඩනඟා ගැනීම සහ දුෂ්කර සහ දුක්ඛිත අවස්ථාවන්ට ධනාත්මකව මුහුණ දීම සඳහා දරුවාගේ සහ පවුලේ පුද්ගල ශක්තීන් ප්‍රවර්ධනය කිරීම.
2. ආයතනය තුළ දරුවාගේ මානසික සෞඛ්‍යය සහ යහපැවැත්ම වැඩිදියුණු කිරීමට උපකාර වන **දරුවාගේ ආරක්ෂිත පරිසරය ශක්තිමත් කිරීම**.
3. දරුවාට **සෘජු අවධානය යොමු කළ විශේෂිත නොවන මනෝ සමාජීය සහය** ලබා දීම.
4. ආරක්ෂිත, ළමා හිතකාමී, ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී සහ **යෝග්‍ය MHPSS සේවාවන් වෙත යොමු කිරීම**, සිද්ධි සම්බන්ධයෙන් කටයුතු කරන්නා සමඟ එක්ව වැඩ කිරීම හරහා දරුවාට සහ ඔවුන්ගේ පවුලට සහාය ලබා ගන්න.

**භාරකරුගේ භූමිකාව <u>නොවේ</u>**
දරුවෙකුගේ රෝග විනිශ්චය කිරීම
චිකිත්සාව හෝ උපදේශනය වැනි විශේෂිත MHPSS මැදිහත්වීම් ලබා දීම

## සිද්ධි සම්බන්ධයෙන් කටයුතු කරන්නන් විසින් නාභිගත විශේෂිත නොවන MHPSS සෘජුව සැපයීම

රැකබලා ගන්නන් විසින් සෘජුවම නාභිගත විශේෂිත නොවන MHPSS මැදිහත්වීම් සැපයිය හැකිය. ඕනෑම MHPSS මැදිහත්වීමක් විවිධ වයස්වල ළමුන් සඳහා සකස් කළ යුතු අතර ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී වන ආකාරයෙන් ඉදිරිපත් කළ යුතුය.

දරුවෙකු සහ ඔවුන්ගේ පවුල සමඟ අවධානය යොමු කරන ලද විශේෂිත නොවන MHPSS මැදිහත්වීම්වලට පහත අරමුණු තිබිය හැක:

- විශ්වාසය ශක්තිමත් කිරීම සහ දරුවාගේ අවශ්‍යතා තක්සේරු කිරීම.
- දැඩි පීඩාකාරී අත්දැකීමක් තේරුම් ගැනීමට සහ ඒවාට සාර්ථකව මුහුණ දීමට.
- ආරක්ෂාව පිළිබඳ හැඟීම වැඩි කිරීමට.
- මුහුණ දීමේ කුසලතා ශක්තිමත් කිරීම සහ හැඟීම් නියාමනය කිරීම.
- ආත්ම අභිමානය ශක්තිමත් කිරීමට

රැකවරණ සපයන්නන් විසින් සපයනු ලැබිය හැකි නාභිගත විශේෂිත නොවන MHPSS මැදිහත්වීම් වර්ග තුනක් මෙහි පහත දැක්වේ. යම් අරමුණක් සාක්ෂාත් කර ගැනීම සඳහා රැකබලා ගන්නන් විවිධ මැදිහත්වීම් සහිත ක්‍රියාකාරකම්වල එකතුවක් භාවිතා කළ හැකිය. ළමයින් සමඟ මේවා ඵලදායීව සහ නිසි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා, සිද්ධි සම්බන්ධයෙන් කටයුතු කරන්නන් විසින් **දරුවාගේ වයස සහ සංවර්ධන මට්ටමට** මෙන්ම දරුවාගේ අනෙකුත් ලක්ෂණ සහ ඔවුන්ගේ තත්වය සඳහා මැදිහත්වීම් තෝරාගෙන සකස් කළ යුතුය (එනම් අනුවර්තනය වීම).

දරුවන්, රැකබලා ගන්නන් සහ/හෝ වෙනත් පවුලේ සාමාජිකයන් බව **තක්සේරුව පෙන්නුම් කරන විට විශේෂ ප්‍රවේශම්** විය යුතුය:

මානසික සෞඛ්‍ය තත්වයන් විඳදරාගැනීම, නින්ද සම්බන්ධ දරුණු ගැටළු, පාලනය කළ නොහැකි ශක්තිමත් හැඟීම්

සියදිවි නසාගැනීමේ සිතුවිලි ඇතුළුව, ස්වයං-හානිකර අවදානමක් සහිත හැසිරීම් පෙන්වීම

නිරන්තර ශාරීරික රෝග ලක්ෂණ සමඟ ජීවත් වීම සහ පැමිණිලි කිරීම

මත්පැන් හෝ මත්ද්‍රව්‍ය මත යැපීම සම්බන්ධයෙන් පැවසීම

මෙම තත්වයන් තුළ, රැකබලා ගන්නා කිසිදු හානියක් නොකිරීමට අමතර සැලකිල්ලක් දැක්විය යුතුය. සෘජු නාභිගත විශේෂිත නොවන මැදිහත්වීම්, වඩාත්ම සුදුසු සහාය නොවිය හැකිය. දරුවන් සහ ඔවුන්ගේ පවුල ආරක්ෂා කිරීම සඳහා ප්‍රථමයෙන්ම සිද්ධි සම්බන්ධයෙන් කටයුතු කරන්නාට දැනුම් දීම සහ බහු-ස්ථර යොමු කිරීම ගවේෂණය කිරීම රෙකමදාරු කරනු ලැබේ.

## 1. මනෝ අධ්‍යාපනය

මනෝ අධ්‍යාපනයට අරමුණු තුනක් ඇත:
- චිත්තවේගීය සෞඛ්‍යය සහ යහපැවැත්ම වඩා හොඳින් අවබෝධ කර ගැනීමට
- වැඩි විශ්වාසයක් සහ පාලනයක් දැනීමට (බලගැන්වීම)
- මුහුණ දීමට සහාය වීම සඳහා

මනෝ අධ්‍යාපනය සමාජ කාර්යවේදයේදී බහුලව භාවිතා වේ. එය දරුවන්ට විපත්තිවලට මුහුණ දීමට සහ කළමනාකරණය කිරීමට සහය සපයයි. මෙම මැදිහත්වීම දරුවන්ට සහ ඔවුන්ගේ පවුලේ අයට ඔවුන්ගේ මනස ක්‍රියා කරන්නේ කෙසේද, ඔවුන්ගේ හැසිරීම ඔවුන්ගේ චිත්තවේගීය සහ සංජානන අත්දැකීම් සමඟ සම්බන්ධ වී තිබෙන්නේ කෙසේද සහ මෙය සිදුවීම් සහ අත්දැකීම් වලට ප්‍රතිචාරයක් වන්නේ කෙසේද යන්න තේරුම් ගැනීමට උපකාරී වේ. බොහෝ විට, අසාමාන්‍ය තත්වයන්ට ඔවුන් දක්වන ප්‍රතික්‍රියා ඉතා සාමාන්‍ය ප්‍රතික්‍රියා බව දරුවන්ට තේරුම් ගැනීමට එය උපකාර කරයි. එමඟින් දරුවන්ට සැනසීම ලබා දීම සහ ආරක්ෂිත බවක් දැනීමට උපකාර කිරීම සිදු කෙරේ.

මනෝ අධ්‍යාපනය පවුල ශක්තිමත් කිරීමේ මැදිහත්වීමක් ද වන අතර, ඒ හරහා රැකබලා ගන්නෙකුගේ හැකියාව ශක්තිමත් කළ හැකි වන්නේ:

- තම අදහස් ප්‍රකාශ කිරීමට තම දරුවාට උපකාර කිරීම සඳහා

- ඔවුන්ගේ හැඟීම් වඩාත් හොඳින් තේරුම් ගැනීම සඳහා
- ඔවුන්ගේ හැඟීම් පාලනය කිරීම සඳහා
- වෙනස්කම් හෝ අහිතකර සිදුවීම් සමඟ සාර්ථකව කටයුතු කිරීම සඳහා

විශේෂිත නොවන MHPSS සහ විශේෂිත නාභිගත MHPSS ලබාදීම සිද්ධි සම්බන්ධයෙන් කටයුතු කරන්නෙකුගේ භූමිකාවේ කොටසක් නොවන බැවින් මූලික මට්ටමෙන් ඔබ්බට මනෝ අධ්‍යාපනය ලබා දීමට කටයුතු නොකළ යුතුය.

**රැකබලාගන්නෙකු** විසින් මැදිහත්වීම භාවිතා කළ හැකි ආකාරය පිළිබඳ උදාහරණ:

- දරුවා සහ රැකබලාගන්නාගේ විශ්වාසය දිනා ගැනීමට.
- සාමාන්‍යභාවය, ස්ථාවරත්වය සහ පුරෝකථනය කිරීමේ හැඟීම ඇති කිරීම මගින් විවිධ වයස්වල ළමුන් සහ වැඩිහිටියන් සඳහා ආරක්ෂාව පිළිබඳ පදනමක් නිර්මාණය කිරීම.
- ස්වයං-නියාමන උපාය මාර්ග සංවර්ධනය සඳහා සහාය වීම.
- ගැටළු විසඳීමේ හැකියාව ගොඩනැගීමට සහාය වීම.

## 2. ප්‍රකාශන ක්‍රියාකාරකම්

ප්‍රකාශන ක්‍රියාකාරකම් උපකාරක පසුබිමක චිත්‍ර, සංගීතය, චලනය සහ නැටුම් වැනි නිර්මාණාත්මක ප්‍රකාශන ආකාර භාවිතා කරයි - ළමයින්ට සහ රැකබලා ගන්නන්ට වචනවලට නැඟීමට අපහසු හැඟීම් සහ මතකයන් ප්‍රකාශ කිරීමට, ගවේෂණය කිරීමට සහ පරිවර්තනය කිරීමට උපකාර කිරීම මෙහිදී සිදුවේ. මෙහි අරමුණ චිත්‍ර ඇඳීම හෝ නිර්මාණාත්මක ප්‍රකාශනය නොවන අතර, එය දරුවාට, භාරකරුට සහ/හෝ පවුලේ අනෙකුත් සාමාජිකයින්ට සම්බන්ධ හැඟීම් තේරුම් ගැනීමට සහාය වීමට හැකි විශ්වාසවන්ත වැඩිහිටියෙකු සමඟ සන්නිවේදනය පහසු කිරීම සඳහා මෙවලමක් වශයෙන් භාවිතා කරයි.

රැකබලා ගන්නෙකු විසින් මැදිහත්වීම භාවිතා කළ හැකි ආකාරය පිළිබඳ උදාහරණ:

- දරුවාගේ විශ්වාසය දිනා ගැනීම සඳහා.
- විවිධ වයස්වල ළමුන් සහ වැඩිහිටියන් සඳහා ආරක්ෂාව පිළිබඳ පදනමක් නිර්මාණය කිරීම සඳහා.
- වචනවලට පෙරළීමට අපහසු හැඟීම් සහ මතකයන් බෙදා ගැනීමට, තේරුම් ගැනීමට සහ සැකසීමට දරුවන්ට උපකාර කිරීම සඳහා.
- ආතතිය මුදා හැරීමට සහ ධනාත්මක බාධා කිරීම් වෙනුවෙන් ඉඩ ලබා දීම සඳහා.

## 3. චිත්තවේගීය නියාමන ක්‍රියාකාරකම්

චිත්තවේගීය නියාමනය යනු මූලික මනෝ සමාජීය කුසලතාවයක් වන අතර එය දරුවන්ට සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් සම්බන්ධ ක්‍රියාවලියක් වන, දරුවන් සහ ඔවුන්ගේ පවුලේ අය ඔවුන් තුළ ඇති හැඟීම්, ඔවුන් ඇති විට, සහ ඔවුන් ඔවුන්ගේ හැඟීම් අත්විඳින සහ ප්‍රකාශ කරන ආකාරය කෙරෙහි බලපෑම් කරයි. තම ජීවිතයේ ආතති සහගත සිදුවීම්වලට මුහුණ දුන් දරුවන්ට සහ පවුලේ සාමාජිකයින්ට තමන්ගේම චිත්තවේගීය තත්ත්වය හඳුනාගෙන පාලනය කිරීමට ඉගෙන ගැනීම ඉතා වැදගත් වේ.

මේ තුළ පහත සඳහන් මනෝ සමාජීය ප්‍රතිලාභ ඇත:

- එය පුද්ගලයෙකු කලබල වූ විට, දුකෙන් හෝ කෝපයෙන් සිටින විට ඔහුට වඩා හොඳ හැඟීමක් ඇති කර ගැනීමට උපකාර කිරීම සඳහා පුද්ගලයාගේ හැකියාව ශක්තිමත් කරයි.

- එය පුද්ගලයෙකුට තම හැඟීම් පිළිගැනීමට සහ නම් කිරීමට සහ හැඟීම් හොඳ හෝ නරක නොවන බව තේරුම් ගැනීමට හැකියාව ලබා දෙයි.
- එය පුද්ගලයෙකුට වෙනත් පුද්ගලයින්ගේ හැඟීම් හඳුනා ගැනීමට සහ සෑම කෙනෙකුටම විවිධ ආකාරයේ හැඟීම් ඇති බව තේරුම් ගැනීමට උපකාරී වේ.
- සෑම කෙනෙකුටම ඔවුන්ගේ වයස සහ වර්ධන මට්ටම අනුව, ඔවුන්ගේ හැඟීම්වලට සෞඛ්‍ය සම්පන්න සහ ගෞරවනීය ආකාරයෙන් ප්‍රතිචාර දැක්වීමට තෝරා ගත හැකි බව වටහා ගැනීමට පුද්ගලයෙකුට හැකියාව ලබා දෙයි.

ක්‍රියාකාරකම්වලට ලිහිල් කිරීමේ සහ හුස්ම ගැනීමේ ක්‍රම, සිහිය, ආතති කළමනාකරණ ක්‍රම ආදිය ඇතුළත් විය හැකිය.

**රැකබලාගන්නෙකු විසින් මැදිහත්වීම භාවිතා කළ හැකි ආකාරය පිළිබඳ උදාහරණ:**

- විවිධ වයස්වල ළමුන් සහ වැඩිහිටියන් සඳහා ආරක්ෂාව පිළිබඳ පදනමක් නිර්මාණය කිරීම
- වෙනත් ආධාරක යොමු කිරීමට/හඳුන්වා දීමට පෙර චිත්තවේගීය ස්ථාවරත්වයේ මට්ටමක් ස්ථාපිත කිරීම.
- ස්වයං-නියාමනය කිරීමේ උපාය මාර්ග හරහා දරුවාට සිටින තත්ත්වයේ සිට සහනය දක්වා ගමන් කිරීමට උපකාර කිරීම.
- ආත්ම අභිමානය සහ ගැටළු විසඳීමේ හැකියාව ගොඩනැගීමට උපකාර කිරීම.

## ශෝකය සහ අහිමිවීම සමඟ කටයුතු කිරීම

'ශෝකය' යනු වේදනාකාරී හැඟීම් මෙන්ම, ආදරය කරන පුද්ගලයින් හෝ එම පුද්ගලයින් සමඟ සම්බන්ධයක් දැනෙන ස්ථාන අහිමි වීමෙන් ප්‍රතිචාර වශයෙන් මිනිසුන්ට දැනෙන සිතුවිලි සහ හැසිරීම් වලට ලබා දෙන නමයි. ශෝකය බොහෝ විට **මරණය** සමඟ සම්බන්ධ වුවද, ඒ හා සමාන වේදනාකාරී හැඟීම් **පවුලේ අය, මිතුරන්** මෙන්ම නිවස, හෝ පාසල පූජනීය ස්ථානයක් වැනි **හුරුපුරුදු ස්ථානවලින් වෙන්වීමත්** සමඟ ඇතිවේ.

එබැවින් බලහත්කාරයෙන් අවතැන් වීම, පවුලේ අය සහ මිතුරන්, බඩු බාහිරාදිය, ස්ථාන, චර්යාවන් සහ අනන්‍යතා, ආරක්ෂාව, අයිති සහ අර්ථය යන වෙනත් මූලාශ්‍ර අත්හැරීම වැනි සාධක අහිමි වීමේ සහ ශෝකයේ සැලකිය යුතු ප්‍රභවයන් වේ. වෙන්වීම සහ ඔවුන්ව රැකබලා ගන්නන් විසින් අත්හැර දමනු ලබන හැඟීම් **බෝවන රෝගයක** (උදා.COVID-19) ප්‍රතිඵලයක් ලෙස ද පැමිණිය හැකිය, නිදසුනක් වශයෙන්, වෙන්වීම සඳහා නිසි පැහැදිලි කිරීමක් නොමැතිව දරුවන් විකල්ප ප්‍රතිකාර සඳහා තැබීම පෙන්වාදිය හැකිය. තුවාලයක් හෝ රෝගයක් හේතුවෙන් **අත් පා හෝ ශරීර කොටස් අහිමි වීම** සම්බන්ධයෙන් කටයුතු කරන දරුවන්ට හෝ රැකබලාගන්නන්ට, දැඩි ශෝකය සහ අහිමිවීම මෙන්ම ප්‍රතික්ෂේප කිරීම වැනි හැඟීම් අත්විඳිය හැකිය. ශෝකය සමඟ **ආරක්ෂාව පිළිබඳ හැඟීමක් නැතිවීම හෝ අනාගතය පිළිබඳ බලාපොරොත්තුව සහ විශ්වාසය අහිමි වීම** සිදුවේ.

එබැවින් දරුවෙකුට හෝ රැකබලාගන්නෙකුට බාහිර හා අභ්‍යන්තර අහිමිවීම් වලින් ශෝකයක් හෝ අහිමිවීමක් අත්විඳිය හැකි අතර, ඒවායේ ප්‍රතිවිපාක අතිමහත් විය හැක (Jones, 2014). ශෝකය සහ අහිමිවීම පෙර පැවති මානසික සෞඛ්‍ය තත්ත්වයන් වඩාත් උග්‍ර කළ හැකි අතර දිගුකාලීන මානසික ආතතිය, චිත්තවේගීය හා ශාරීරික වේදනාවේ අවදානම වැඩි කරයි.

අහිමිවීම් සහ ශෝකයට දක්වන ප්‍රතික්‍රියා සහ ඒ ආශ්‍රිත සුදුසු ප්‍රතිචාර, විශේෂිත සංස්කෘතියට අනුව මෙන්ම අහිමිවීමේ ස්වභාවය අනුව වෙනස් විය හැක. නිදසුනක් වශයෙන්, ආදරය කරන කෙනෙකු අහිමි වූ පසු ඇතිවන අවිනිශ්චිතතාවය වසා දැමීමට නොහැකි විය හැකි අතර, සියදිවි නසාගැනීමෙන් පසු අත්විඳින ශෝකය විශේෂයෙන් සංකීර්ණ විය හැකි අතර වරදකාරිත්වය, ප්‍රතික්ෂේප කිරීම, කෝපය හෝ ලැජ්ජාව මෙන්ම අපකීර්තිය වැනි හැඟීම් එයට ඇතුළත් වේ. ළමා වෙළෙඳාමේ වින්දිතයින් වෙළඳාම්කරුගෙන් වෙන්වීම හේතුවෙන් කම්පනයට පත් විය හැකි අතර වෙළෙඳාම්කරු වෙත ආපසු යාමට අවශ්‍ය විය හැකිය. එබැවින් සන්දර්භීය පරිසරය, සංස්කෘතික විශ්වාසයන් සහ භාවිතයන් මෙන්ම පවතින කළමනාකරණ යාන්ත්‍රණයන් අවබෝධ කර ගැනීම ඉතා වැදගත් වේ. මේවා ආගමික, අධ්‍යාත්මික සහ සංස්කෘතික විශ්වාසයන් සහ පිළිවෙත් මත උකහා ගත හැකි අතර දරුවන්ට (විශේෂයෙන් අවතැන් වූ සහ නිවසින් බැහැරව සිටින අයට) ඔවුන්ගේ සහ ඔවුන්ගේ ආදරණීයයන්ගේ සංස්කෘතියට සහ ප්‍රජාවට අයත් වීමේ හැඟීමක් දැනීම ඉතා වැදගත් විය හැකිය.

ජීවන තත්වයන් අභියෝගාත්මක වන විට ශෝකය දිගු කලක් පැවතිය හැකිය. දරුවෙකුට අමතක වී හෝ යථා තත්ත්වයට පත් වී මාස කිහිපයකට පසු එය දැනුම් දීමකින් තොරව නැවත පැමිණිය හැකිය. එය සංවත්සරයක්, අහිමි වූ පුද්ගලයා සමඟ දරුවා කළ ප්‍රියතම ක්‍රියාකාරකමක් හෝ ඔවුන් දෙදෙනාම රස විඳි ගුවන් විදුලියේ විශේෂිත ගීතයක් වැනි සිහිකැඳවීමක් මගින් එය ප්‍රේරණය හැකිය.

### අහිමිවීම් සහ ශෝකයට මුහුණ දෙන දරුවන් සඳහා MHPSS සහාය

අහිමිවීම් අත්විඳින දරුවන් සහ පවුල් සඳහා සුදුසු ලෙස සහාය දැක්වීම සහ යොමු කිරීම සඳහා මෙන්ම ඔවුන්ගේ ප්‍රතිචාරය ශෝකය හැර වෙනත් දෙයක ප්‍රතිඵලයක් විය හැකිද යන්න හඳුනා ගැනීම සඳහා - රැකබලාගන්නන් මෙය තේරුම් ගැනීම ඉතා වැදගත් වේ:

- එක් එක් දරුවාගේ සහ පවුලේ සාමාජිකයින්ගේ විශේෂිත සහ අද්විතීය අවශ්‍යතා, අහිමිවීමේ ආකාරය, මිය ගිය හෝ 'අහිමි වූ' අවදානම් සහ ආරක්ෂිත සාධක යනාදිය.
- දරුවා සහ ඔවුන්ගේ පවුලේ සංස්කෘතිය සහ ආගම තුළ ශෝකය සහ අහිමිවීම සම්බන්ධයෙන් පවතින විශ්වාසයන් සහ පිළිවෙත්.

නාභිගත විශේෂිත නොවන MHPSS මැදිහත්වීම් (3.3.4 වගන්තිය බලන්න) ඇතුළත් විය හැකිය:

- දරුවන්ට අහිමි වූ පුද්ගලයා හෝ වෙනත් අහිමි වීමක් පිළිබඳව සහ අහිමි වීම හා ශෝකය සමඟ සම්බන්ධ හැඟීම් හඳුනාගෙන නම් කිරීමට **කතා කිරීමට අවස්ථාවන් නිර්මාණය කිරීම.**
- මානසික ආතතිය, ව්‍යාකූලත්වය සහ බලාපොරොත්තු සුන්වීම (අසාමාන්‍ය තත්වයන්ට සාමාන්‍ය ප්‍රතිචාරය) ඇතුළුව, **අහිමි වීමේ සහ ශෝකයේ අත්දැකීම් පිළිබඳ වැඩි අවබෝධයක් ලබා දීම තුළින් ආරක්ෂාව පිළිබඳ පදනමක් නිර්මාණය කිරීමට** දරුවන්ට සහාය වීම.
- **දරුවන්ගේ ශෝකය කළමනාකරණය කිරීමට උපකාර කිරීම සඳහා ස්වයං-නියාමනය සඳහා උපාය මාර්ග** සංවර්ධනය කිරීමට දරුවන්ට සහාය වීම: ප්‍රේරක හඳුනා ගැනීම සහ හුස්ම ගැනීමේ අභ්‍යාස, ගීත ගායනා කිරීම, චිත්‍ර ඇඳීම සහ වෙනත් ක්‍රියාකාරකම් හරහා හැඟීම් කළමනාකරණය කිරීම

  රැකබලා ගන්නන් විසින් සුදුසු සේවාවන් වෙත යොමු කිරීමේ අවශ්‍යතාවය සහ අවස්ථා හඳුනාගෙන සිද්ධි සම්බන්ධයෙන් කටයුතු කරන්නාට අවශ්‍ය යෝජනා ඉදිරිපත් කළ යුතුය. මෙයට ඇතුළත් විය හැකිය:

- විශේෂිත මානසික සෞඛ්‍ය සේවා අවශ්‍ය දරුවන්, රැකබලා ගන්නන් සහ/හෝ වෙනත් පවුලේ සාමාජිකයන්.

- සම වයසේ මිතුරන්ගේ සහයෝගය ශක්තිමත් කිරීම සඳහා කණ්ඩායම් ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වීම වැනි දරුවා සහ පවුල වටා ආධාරක පද්ධති ශක්තිමත් කිරීමේ අවස්ථා.

## සියදිවි නසාගැනීම් සහ ස්වයං හානි කරගැනීම්

සියදිවි නසාගැනීමේ සිතුවිලි, හැසිරීම් සහ උත්සාහයන් හුදකලාව සිදු නොවේ. සෑම විටම නොවන නමුත් බොහෝ විට, මෙම උත්සාහයන් මානසික සෞඛ්‍ය තත්ත්වය හෝ මත්ද්‍රව්‍ය අනිසි භාවිතයේ රෝග ලක්ෂණ සමඟ සම්බන්ධ වේ. නව යොවුන් වියේ දී, සියදිවි නසාගැනීමේ හැසිරීම් බොහෝ විට මත්ද්‍රව්‍ය භාවිතය සහ ආවේගශීලීත්වය සමඟ සම්බන්ධ විය හැක. දරුවකු අර්බුදකාරී තත්ත්වයක සිටින විට මැදිහත් වීමෙන් අනතුරු ඇඟවීමේ සංඥා හඳුනාගෙන සියදිවි නසාගැනීමේ අවදානම අවම කරන පළමු පුද්ගලයින් අතර රැකබලා ගන්නන් සිටිය හැකිය.

සියදිවි නසා ගැනීම සංකීර්ණ ප්‍රශ්නයක් වන අතර විවිධ සහ පාර්ශවකරුවන් අතර සම්බන්ධීකරණය සහ සහයෝගීතාව අවශ්‍ය වේ[9].

රැකබලා ගන්නන් සියදිවි නසාගැනීමේ සිතුවිලි, හැසිරීම් සහ උත්සාහයන් හෙළිදරව් කිරීමේ පෙරමුණේ සිටී. ආසන්න අවදානම් සඳහා අනතුරු ඇඟවීමේ සංඥා පිළිබඳව අනතුරු අඟවන අතර, දරුවා, පවුල, ප්‍රජාව සහ සමාජ මට්ටමින් අවදානම් සාධක හඳුනා ගැනීමට රැකබලා ගන්නන් හට, සිද්ධි සම්බන්ධයෙන් කටයුතු කරන තැනැත්තන්ට සහාය විය හැකිය. සිද්ධි සම්බන්ධයෙන් කටයුතු කරන්නා අදාළ වූ විට තම සිද්ධි සැලැස්ම තුළ ස්වයං-හානිකර සහ සියදිවි නසාගැනීම් සඳහා ආසන්න හෝ කෙටි කාලීන අවදානම් අවම කළ හැකි ආරක්ෂිත සාධක සඳහා ද තක්සේරු කළ යුතුය.

**නිර්දිෂ්ට කියවීම්:**

Alliance for Child Protection in Humanitarian Action (2014) Interagency Guidelines for Case Management and Child Protection.
https://alliancecpha.org/sites/default/files/technical/attachments/cm_guidelines_eng_.pdf
Alliance for Child Protection in Humanitarian Action (2021) Revised Interagency Child Protection Case Management Training: See training Level 1 Module 2 Foundations of child protection case management.
https://alliancecpha.org/sites/default/files/elearning/attachments/Facilitator%20Guide_English.pdf
Inter-Agency Standing Committee (2022) IASC Guidance, Addressing Suicide in Humanitarian Settings. IASC Guidance, Addressing Suicide in Humanitarian Settings

[9] Inter-Agency Standing Committee (2022) IASC Guidance, Addressing Suicide in Humanitarian Settings

# 4.7. පුද්ගල සුරැකුම් සැලැස්ම සහ නැවත සමාජගත කිරීම

**පාඨමාලා විස්තරය:**

මෙම පාඨමාලාව සැලසුම් කර තිබෙනුයේ ළමා සංවර්ධන මධ්‍යස්ථාන (CDCs) සහ අපචාරයන්ගෙන් දිවි ගලවා ගත් ළමුන් රැකබලා ගැනීම සඳහා වගකිව යුතු අනෙකුත් ආයතනවල කාර්ය මණ්ඩලයට, ළමා අපචාරයන්ගෙන් දිවි ගලවා ගත් අය සඳහා වන ප්‍රතිස්ථාපන සුරැකුම් ආකෘතියට අනුව සිද්ධි කළමනාකරණ අදියරයන් පිළිබඳව වැඩි අවබෝධයක් ලබා ගැනීමටය. තනි පුද්ගල රැකවරණය සහ නැවත සමාජගත කිරීමෙහි වත්මන් පරිචයන් තක්සේරු කිරීම සඳහා කාර්ය මණ්ඩලයට මගපෙන්වන ආකාරයෙන් පාඨමාලාව සකස් කර ඇති අතර, දරුවන් සඳහා සංවේදී, දක්ෂ සහ දැනුවත් රැකවරණයක් ලබා දීමට ඔවුන්ට ඔවුන්ට හැකියාව ඇත. මෙම පාඨමාලාව CDC හි කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ රැකවරණය යටතේ සිටින දරුවන්ගේ සුවපත් කිරීමේ සහ නැවත සමාජගත කිරීමේ ක්‍රියාවලියේදී ඔවුන් ඉටු කරන අත්‍යවශ්‍ය කාර්යභාරය පිළිබඳව දැනුවත් කිරීමට උපකාර වන ආකාරයට සැලසුම් කර ඇති අතර, එබැවින් මෙම ක්‍රියාවලියට සහාය දක්වන ක්‍රියාකාරී නියෝජිතයන් වීමට ඔවුන් බල ගන්වයි.

**ඉගෙනුම් අරමුණු**

- ළමා වෙළෙඳාමේ වින්දිතයන් (CVoT) රැකබලා ගැනීමේ සහ නැවත සමාජගත කිරීමේ ක්‍රියාවලියේ සිද්ධි කළමනාකරණය පිළිබඳ සංකල්පය සහ ඒ ආශ්‍රිත අවධීන් (යොමු කිරීම, මැදිහත් වීම සහ පසු විපරම් කිරීම) පැහැදිලි කිරීමට සහභාගිවන්නන්ට හැකි වේ.
- වර්තමාන සිද්ධි කළමනාකරණ ක්‍රමය තුළ තමන් ඉටු කරන භූමිකාවන් පිළිබඳව සාකච්ඡා කිරීමට සහභාගිවන්නන්ට හැකි වනු ඇත.
- සහභාගිවන්නන්ට ළමා වෙළෙඳාමේ විවිධ බලපෑම් පැහැදිලි කිරීමට, ළමයින් නොසලකා හැරීම පිළිබඳව පැහැදිලි කිරීමට සහ CVoT හි පවතින කම්පන සහ අපචාරයන්ට ලක්වූ ලක්ෂණ හඳුනා ගැනීමට හැකි වනු ඇත.
- සහභාගිවන්නන්ට CVoT සමඟ අන්තර්ක්‍රියා කිරීමේදී සහ රැකවරණය සැපයීම සඳහා භාවිතා කරන කුසලතා ප්‍රදර්ශනය කිරීමට හැකි වනු ඇත.
- සහභාගිවන්නන්ට ඔවුන්ගේ කුසලතා ඇගයීමට මෙන්ම ඔවුන්ගේ ශක්තීන් සහ සීමාවන් හඳුනා ගැනීමට හැකි වනු ඇත.
- ළමා වෙළෙඳාමේ වින්දිතයින් (CVoT) සඳහා පුද්ගල රැකවරණය සහ නැවත සමාජගත කිරීමේ සහය ලබා දීමේදී වත්මන් පරිචයන් ඇගයීමට සහභාගිවන්නන්ට හැකි වන අතර නැවත සමාජගත කිරීමේ ක්‍රියාවලියේ විවිධ කොටස්වලට සහභාගී නොවීමේ ප්‍රතිවිපාක පිළිබඳ අවබෝධයක් ප්‍රදර්ශනය කළ හැකිය.
- ළමා වෙළෙඳාමේ වින්දිතයින් ඇතුළත් පවුල් වල, පවුලේ සාමාජිකයන්ගේ විවිධ අභියෝග පිළිබඳව සහභාගිවන්නන්ට අවබෝධ කර ගත හැකි වනු ඇත.
- නැවත සමාජගත කිරීමේ ක්‍රියාවලියේදී මුහුණ දෙන අභියෝග අවම කිරීම සඳහා ක්‍රමෝපායන් සංකල්පගත කිරීමට සහභාගිවන්නන්ට හැකි වේ.

### 4.7.1. සිද්ධි කළමනාකරණය පිළිබඳ සංකල්පය සහ ඒ ආශ්‍රිත අදියරයන් හඳුන්වාදීම

උපකාර ලබා දීම සඳහා දරුවා යොමු කළ දිනයේ සිට දරුවා නැවත සමාජගත කරන තෙක් සිදුවන සමස්ත ක්‍රියාවලියම සිද්ධි කළමනාකරණය ඔස්සේ ආවරණය කරයි. වඩා හොඳ අවබෝධයක් ලබා ගැනීම සඳහා සම්පූර්ණ ක්‍රියාවලිය අදියර තුනකට බෙදිය හැකිය

A. යොමු කිරීමේ අදියර
B. මැදිහත්වීමේ අදියර
C. පසු විපරම් අදියර

**A. යොමු කිරීම**

උපදේශන සහ සහාය සේවා සඳහා බහු මූලාශ්‍ර හරහා යොමු කිරීම් හැසිරවීම මෙම අදියරට ඇතුළත් වේ. යොමු කිරීමේ ආකාරය අධිකරණ නියෝගයක් හරහා විය හැකිය.

**B. මැදිහත්වීමේ අදියර**

මැදිහත්වීමේ සැලැස්මක් සකස් කිරීම

- දරුවා සඳහා මැදිහත්වීම් - මෙයට උපදේශනය, චිකිත්සක සත්කාර, මාපිය රැකවරණය, අධ්‍යාපන සහාය, පවුල ශක්තිමත් කිරීම (සමාජ සහයෝගය) ඇතුළත් විය හැකිය.
- පවුල සඳහා මැදිහත්වීම් - මෙයට පවුල ශක්තිමත් කිරීම සහ නැවත සමාජගත කිරීමේ සහාය, නීතිමය සහාය, මැදිහත්වීමේ සැලැස්ම ක්‍රියාත්මක කිරීම ඇතුළත් විය හැකිය.

**C. පසු විපරම් අදියර**

මෙම අදියරේදී, සමාජ සේවකයා පවුල ශක්තිමත් කිරීමේ මැදිහත්වීම් වල නියැලීමෙන් සහ දරුවාගේ නීතිමය, අධ්‍යාපනික හෝ වෘත්තීය ක්‍රියාවලීන්ට උපකාර කරමින් පවුල සමඟ නොකඩවා සම්බන්ධ වෙමින් කටයුතු කරනු ඇත.

### 4.7.2. සිද්ධි කළමනාකරණ ක්‍රියාවලියේදී CDC කාර්ය මණ්ඩලය විසින් ඉටු කරන ලද කාර්යභාරය සම්බන්ධ සමීප විමසුමක්

- කාලෝචිත යොමු කිරීම් සහ ළමුන් සඳහා උපදේශන හෝ චිකිත්සක සහාය ලබා ගැනීම
- CDC හි පරිසරය ළමුන් සඳහා චිකිත්සීය වන ආකාරයට පවතින බව සහතික කිරීම
- කම්පන සහ නොසලකා හැරීම් හේතුවෙන් ළමුන් තුළ පවතින ලක්ෂණ හඳුනා ගැනීමට හැකි වීම
- CVoT නැවත සමාජගත කිරීම සම්බන්ධ තීරණ වලදී ක්‍රියාකාරී භූමිකාවක් භාර ගැනීම

4.7.2.1. ළමා වෙළෙඳාමේ සහ නොසලකා හැරීමේ බලපෑම්
4.7.2.2. CVoT සඳහා රැකවරණය - නිපුණතා පුහුණුව

### 4.7.3. CVoT නැවත සමාජගත කිරීම

CVoT නැවත සමාජගත කිරීම යනු මෙම තරුණ පුද්ගලයින්, නැවත යථා තත්ත්වයට පත් කිරීමට, ඔවුන්ගේ ජීවිත නැවත ගොඩනගා ගැනීමට සහ නැවත සමාජගත වීමට උපකාර කිරීම අරමුණු කරගත් සංකීර්ණ සහ

තීරණාත්මක ක්‍රියාවලියකි. බලහත්කාරයෙන් ශ්‍රමය සූරාකෑම, ලිංගික සූරාකෑම හෝ අපරාධ ක්‍රියාකාරකම්වලට සම්බන්ධ කරවීම වැනි විවිධ අරමුණු සඳහා ළමුන් සූරාකෑම ළමා වෙළෙඳාමට ඇතුළත් වේ.

- මෙම දරුවන් බොහෝ විට සැලකිය යුතු කායික, චිත්තවේගීය සහ මානසික කම්පන මෙන්ම ආර්ථික ප්‍රචණ්ඩත්වය විඳදරා ගන්නා අතර, ඔවුන්ව නැවත සමාජගත කිරීමේ ක්‍රියාවලිය බහුවිධ සහ අභියෝගාත්මක වේ.
- CVoT හි නැවත සමාජගත කිරීම නිර්වචනය කෙරෙන්නේ "වෙන් වූ දරුවෙකු, ආරක්ෂාව සහ රැකවරණය ලබා ගැනීම සඳහා මෙන්ම ජීවිතයේ සෑම ක්ෂේත්‍රයකම අයිතිය සහ අරමුණ පිළිබඳ හැඟීමක් සොයා ගැනීම සඳහා ඔහුගේ හෝ ඇයගේ ආසන්නතම හෝ විස්තෘත පවුලට සහ ප්‍රජාවට (සාමාන්‍යයෙන් සම්භවයක් ඇති) ස්ථිර වශයෙන් සම්බන්ධවීමේ ක්‍රියාවලිය වශයෙනි." - නැවත ඒකාබද්ධ කිරීම පිළිබඳ අන්තර් ආයතන සමූහය, 2013.
- CVoT නැවත සමාජගත කිරීම සඳහා රාජ්‍ය ආයතන, ප්‍රාදේශීය සහ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන, නීතිය බලාත්මක කිරීම මෙන්ම ප්‍රජාවන් ඇතුළු විවිධ පාර්ශවකරුවන් අතර සහයෝගීතාව අවශ්‍ය වේ. එය මෙම දරුවන්ගේ අයිතිවාසිකම් සහ අභිමානය යළි ස්ථාපිත කිරීම මෙන්ම සූරාකෑමෙන් නිදහස් හා තෘප්තිමත් ස්වාධීන ජීවිතයක් ගත කිරීමට ඔවුන් සවිබල ගැන්වීම අරමුණු කරගත් සාමූහික ප්‍රයත්නයකි.
- CVoT සඳහා නැවත සමාජගත කිරීම යනු සූරාකෑම සහ අපචාරයන්ගෙන් තොරව ආරක්ෂාකාරී සහ තිරසාර ආකාරයකින් නැවත සමාජගත වීමට මෙම දරුවන්ට උපකාර කිරීමේ සහ සහාය වීමේ ක්‍රියාවලියයි. ඔවුන්ගේ ශාරීරික, මනෝවිද්‍යාත්මක, සමාජීය සහ නීතිමය අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීම එයට ඇතුළත් වන අතරම ඔවුන්ගේ ජීවිත, ශරීර කෙරෙහි පාලනය නැවත ලබා ගැනීමට මෙන්ම ඔවුන්ගේ සම්පූර්ණ හැකියාවන් සාක්ෂාත් කර ගැනීමට ඔවුන්ට අවශ්‍ය බලය ලබා දේ. නැවත සමාජගත කිරීමේ ප්‍රධාන මානයන් 3 ආමන්ත්‍රණය කරන විට, මේවා සලකා බැලිය යුතුය.

### 4.7.3.1. නැවත සමාජගත කිරීම සඳහා මූලික මානයන්

නැවත සමාජගත කිරීම සඳහා මූලික මානයන් 3 ක් ඇත.

1. සමාජ ප්‍රතිසංවිධානය - වෛද්‍ය ප්‍රවේශය, අධ්‍යාපනය, වෘත්තීය පුහුණුව, නවාතැන්, යුක්තිය සඳහා ප්‍රවේශය
2. ආර්ථික ප්‍රතිසංවිධානය - ජීවනෝපාය ක්‍රියාකාරකම්, සහ පවුලේ සාමාජිකයන් සඳහා මූල්‍ය ආධාර සේවා, එවිට දරුවාට ප්‍රතිලාභ ලැබිය හැකි වන අතර, දරුවා නැවත සමාජගත කර ඇති පවුල තුළ ආරක්ෂා කිරීමට/ රැකබලා ගැනීමට හැකි වනු ඇත.
3. මනෝ සමාජීය ප්‍රතිසංවිධානය - උපදේශනය, චිකිත්සාව, සම වයසේ මිතුරන්ගේ සහාය, පවුලේ සහයෝගය, අධ්‍යාපනය (ප්‍රධාන ධාරාව/වෘත්තීය), විෂය බාහිර ක්‍රියාකාරකම්, කුසලතා ගොඩනැගීම, සහභාගීත්වය සඳහා ප්‍රවේශය ආදිය.

### 4.7.3.2. නැවත සමාජගත කිරීමේ මට්ටම්

- නැවත සමාජගත කිරීමේ මූලික ඉලක්කය වන්නේ CVoT හි අයිතිවාසිකම්, යහපැවැත්ම සහ අභිමානය යළි ස්ථාපිත කිරීමයි. එය ඔවුන්ගේ දිගුකාලීන සුවය, ප්‍රකෘතිමත් වීම සහ සාර්ථක ලෙස නැවත

සමාජගත කිරීම, හැකි සෑම අවස්ථාවකදීම, ඔවුන්ගේ පවුල්, ප්‍රජාවන් සහ පොදුවේ සමාජය තුළට අවධානය යොමු කිරීමෙන් දරුවාට ක්ෂණික රැකවරණය සහ ආරක්ෂාව සැපයීමෙන් ඔබ්බට යයි. නැවත සමාජගත කිරීමේදී විවිධ මට්ටම්වල සහාය ලැබීම අත්‍යවශ්‍ය වේ:

**පුද්ගල මට්ටම**: එක් එක් වින්දිත දරුවාගේ අද්විතීය අවශ්‍යතා සහ අත්දැකීම් ආමන්ත්‍රණය කරමින් තනි මට්ටමින් සකස් කරන ලද සහාය ඉතා වැදගත් වේ. ස්වාධීනව ජීවත්වීම සඳහා ඔවුන් සවිබල ගැන්වීම වෙනුවෙන් විශේෂිත උපදේශන, අධ්‍යාපනය සහ වෘත්තීය පුහුණුව ලබා දීම මෙයට ඇතුළත් වේ. මනෝවිද්‍යාත්මක සහ චිත්තවේගීය සුවය, කුසලතා වර්ධනය සමඟ සම්බන්ධ වීම, දරුවාට තම ජීවිතය විශ්වාසයෙන් හා ඔරොත්තු දීමේ හැකියාවෙන් නැවත ගොඩනඟා ගැනීමට අවශ්‍ය අංග වේ.

**පවුල් මට්ටම:** නැවත සමාජගත කිරීමේ ප්‍රයත්නයන් පවුල් ඒකකය දක්වා ව්‍යාප්ත වන අතර, වෙළෙඳාම් අත්දැකීම තුළ පවුලේ ගතිකත්වයේ වැදගත් භූමිකාව හඳුනා ගනී. උපකාරක වැඩසටහන් මගින් දරුවාගේ නැවත පැමිණීමට හිතකර පරිසරයක් පෝෂණය කරමින් උපදේශන සහ නිපුණතා ගොඩනැගීමේ මුල පිරීම් සඳහා පවුල් සංස්ථාව සම්බන්ධ කර ගත යුතුය. දිළිඳුකම හෝ දැනුවත්භාවය නොමැතිකම වැනි අභ්‍යන්තර පවුල් ගැටළු ආමන්ත්‍රණය කිරීම තිරසාර නැවත සමාජගත කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ. පවුලේ අය වෙළෙඳාම සඳහා සම්බන්ධ වී ඇත්නම්, එය පවුලේ සාමාජිකයන් සමඟ වැඩ කිරීම අභියෝගයක් බවට පත්වේ.

**ප්‍රජා මට්ටම:** දරුවාගේ නැවත සමාජගත වීම සඳහා ආධාරක පරිසරයක් නිර්මාණය කිරීමේදී ප්‍රජාව ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. ප්‍රධාන උපාය මාර්ග වන්නේ වෙළෙඳාමේ ප්‍රතිවිපාක පිළිබඳව දැනුවත් කිරීම, වින්දිතයන් හා සම්බන්ධ අපකීර්තිය දුරු කිරීම සහ පුනරුත්ථාපන ප්‍රයත්නයන් සඳහා ප්‍රජා සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීමයි. ප්‍රජා පාදක වැඩසටහන් ආරක්ෂිත ආවරණයක් ලෙස ක්‍රියා කරයි, දරුවා නැවත සමාජගත වන විට පිළිගැනීම සහ සහයෝගය සහතික කරයි.

**ව්‍යුහාත්මක මට්ටම:** ළමා වෙළෙඳාමේ මූලික හේතු විසඳීම සඳහා පුළුල් ව්‍යුහාත්මක වෙනස්කම් අත්‍යවශ්‍ය වේ. නීතිමය ප්‍රතිසංස්කරණ වෙනුවෙන් පෙනී සිටීම, සමාජ ආර්ථික විෂමතා විසඳීම සඳහා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ ළමා ආරක්ෂණ යාන්ත්‍රණ ශක්තිමත් කිරීමේ ප්‍රයත්නයන් ආරම්භ කිරීම මෙයට ඇතුළත් වේ. වෙළෙඳාම් වැළැක්වීම සහ අවදානමට ලක්විය හැකි දරුවන්ගේ සමස්ත යහපැවැත්ම වැඩිදියුණු කිරීම සඳහා පද්ධතිමය වෙනස්කම් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන අතර සහයෝගීතාව අත්‍යවශ්‍ය වේ.

**සහයෝගීතාවය සහ බහුවිධ ප්‍රවේශය**

සහයෝගීතාවය සහ බහුවිධ ප්‍රවේශය අත්‍යවශ්‍ය වේ. ඵලදායී සහාය සඳහා විවිධ වෘත්තිකයන් සහ නියෝජිතායතන අතර සහයෝගීතාව අවශ්‍ය වේ. ළමා ආරක්ෂණ සේවා, නීතිය බලාත්මක කිරීම, සෞඛ්‍ය සේවා සපයන්නන්, අධ්‍යාපනඥයින් සහ අනෙකුත් අදාළ පාර්ශවකරුවන් සමඟ සාකල්‍ය සහ සම්බන්ධීකරණ ප්‍රතිචාරයක් සහතික කළ යුතුය.

නැවත සමාජගත කිරීමේ ක්‍රියාවලිය

- නැවත සමාජගත වීම සඳහා මඟ පෙන්වීමට අවශ්‍ය චින්තන ක්‍රියාවලිය හඳුන්වා දෙන්න (පින්තූර නිරූපණය සැපයීම)

### 4.7.3.3. නැවත සමාජගත කිරීමේ සංරචක

*සෑම සංරචකයකදීම සපයනු ලබන සහය ළමා හිතකාමී සහ දරුවාගේ වයසට ගැළපෙන ආකාරයෙන් සිදු කළ යුතුය.

**ආරක්ෂාව:** පළමු පියවර වන්නේ වෙළෙඳාමට ලක් වූ දරුවන් හඳුනාගෙන ඔවුන් බේරා ගැනීම, ඔවුන්ගේ ක්ෂණික ආරක්ෂාව සහතික කිරීම සහ සූරාකෑමේ තත්ත්වයන්ගෙන් ඔවුන් ඉවත් කිරීමයි. ඔවුන් ආරක්ෂිත සහ ආධාරක පරිසරයක තැබිය යුතුය. දරුවාගේ හොඳම අවශ්‍යතා පිළිබඳ ඔහුගේ/ඇයගේ අධිෂ්ඨානය මත පදනම්ව, දරුවා නැවත සමාජගත කිරීම පිළිබඳ CDC මාණ්ඩලික සාමාජිකයාගේ වාර්තාව සලකා බැලීම සඳහා, ආයතනයේ ස්ථානගත කිරීමේ කමිටු රැස්වීමක් පැවැත්විය යුතුය. පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ පළාත් කොමසාරිස් (DPCCS) හෝ පරිවාස භාර නිලධාරි (POIC) විසින් සභාපතිත්වය දරන ස්ථානගත කිරීමේ කමිටුව, දරුවාගේ නැවත සමාජගත කිරීම සඳහා CDC කාර්ය මණ්ඩල සාමාජිකයාගේ නිර්දේශවලට සවන් දිය යුතුය.

ශාරීරික සහ මනෝවිද්‍යාත්මක සහාය: CVoT බොහෝ විට, ශාරීරික තුවාල, මන්දපෝෂණය, ලිංගිකව සම්ප්‍රේෂණය වන ආසාදන, මත්ද්‍රව්‍ය අනිසි භාවිතය, අනවශ්‍ය ගැබ් ගැනීම් සහ ඔවුන්ව විවිධාකාරයෙන් සූරාකෑමේ ප්‍රතිඵලයක් ලෙස විවිධ සෞඛ්‍ය ගැටලු වලින් පීඩා විඳිය හැකිය. ඔවුන්ට වෛද්‍ය ප්‍රතිකාර සහ සුදුසු සෞඛ්‍ය සේවා සඳහා ප්‍රවේශය අවශ්‍ය වේ. මීට අමතරව, ඔවුන් විඳදරාගත් චිත්තවේගීය හා මානසික කම්පනයට විසඳුම් සෙවීමට මනෝවිද්‍යාත්මක සහාය ඉතා වැදගත් වේ. ගැටළු වලට සැබවින්ම සවන් දිය හැකි සහ එම ගැටළු යථාර්ථවාදී ක්ෂණික සහ කෙටි කාලීන පියවර ලෙස නැවත සකස් කළ හැකි දක්ෂ උපදේශකයින් සමඟ සැසි; ආරක්ෂිතව හැඟීම් ප්‍රකාශ කිරීමට දරුවාට ඉඩක් ලබා දීම; උදාහරණයක් වශයෙන්, ව්‍යායාම, චිත්‍ර, නැටුම්, හෝ සංගීතයට සවන් දීම සහ සංගීතය නිර්මාණය කිරීම හරහා. ඇතැම් දරුවන්ට සෞඛ්‍ය ගැටලු ඇති විය හැකි අතර වරින් වර හෝ නිතිපතා ඖෂධ ලබා ගැනීමට සිදුවිය හැකි අතර එය සෞඛ්‍ය නිලධාරීන්ගේ නිර්දේශ මත දිගටම පවත්වාගෙන යා යුතුය. CDC කාර්ය මණ්ඩලය දරුවන්ගේ නිරන්තර වෛද්‍ය ප්‍රතිකාරවලට බාධාවක් හෝ නතර කිරීමක් සිදු නොවන බව සහතික කිරීම සඳහා අදාළ සෞඛ්‍ය සේවා සහ රැකබලා ගන්නන් අතර අවශ්‍ය සම්බන්ධතා සඳහා උපදෙස් සහ නිර්දේශ ලබා ගත යුතුය.

**අධ්‍යාපනය:** විධිමත් ආකාරයට වෘත්තීය නිපුණතා ගොඩනැගීම, විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා යෙදවීම යනාදී වශයෙන් අධ්‍යාපනයට ප්‍රවේශය ලබා දීම, ළමා වෙළඳාමේ වින්දිතයින් දීර්ඝ කාලීනව නැවත සමාජගත කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ. සියලුම CVOTs විධිමත් අධ්‍යාපනයක් ලබා නොගනී, එයින් අදහස් වන්නේ බොහෝ දෙනෙකුට, කුසලතා සංවර්ධන පුහුණුව සඳහා වැඩි අවස්ථාවන් ප්‍රමාණයක් හෝ යම් ආකාරයක ආර්ථික සවිබල ගැන්වීමේ අවස්ථාවක් අවශ්‍ය විය හැකි බවයි. NVQ වැනි සහතික සහිත වෘත්තීය පුහුණු වැඩසටහන් මගින් වැඩිහිටි දරුවන්ට රැකියා, ස්වයංපෝෂිතභාවය සහ මූල්‍ය ස්වාධීනත්වය සඳහා වූ අපේක්ෂාවන් වැඩි දියුණු කරන ජීවන සහ සමාජ කුසලතා පුහුණුව ලබා දිය හැකිය. ගුරුවරුන් සහ පන්තියේ මිතුරන් විසින් අපකීර්තියට පත් කිරීම වෙන් වූ දරුවන් අතර බහුලව දක්නට ලැබේ. ගුරුවරුන් සහ පාසල් පරිසරය බොහෝ විට ඉතා වෙනස් කොට සැලකීම් කළ හැකි අතර බොහෝ විට ගුරුවරුන්ගේ ආකල්ප, වින්දිතයෙකු අපකීර්තියට පත් කිරීමට හා ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ. ගැහැණු ළමුන් සම්බන්ධයෙන් මෙය විශේෂයෙන් වැදගත් වන්නේ ඉහත විස්තර කර ඇති ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බන්ධ අපකීර්තිය පාසල් පද්ධතිය තුළ පැහැදිලිව දක්නට ලැබෙන බැවිනි. මේ හරහා CVoT සඳහා සහය දැක්වීමට සිදුවනු ඇති අතර සේවා සපයන්නන්ට දරුවා වෙනුවෙන් පෙනී සිටීමට සිදුවනු ඇත. විශේෂයෙන්ම දිළිඳු, ආන්තික පවුලක - වෙළෙඳාමට ගොදුරු වීමේ අවදානම සහිත ඕනෑම දරුවෙකු

කෙරෙහි නිවැරදි (දිරිගැන්වීමේ/උපකාර) ආකල්ප සහතික කිරීම සඳහා සංවේදී, සැලකිලිමත්, සහයෝගීත්වය සහ සංවේදීත්වය සහිත පුද්ගලයින් වීමට ගුරුවරුන් පුහුණු කිරීම.

**මනෝ සමාජීය සහාය:** CVoT හට චිත්තවේගීය, ආර්ථිකමය, නෛතික සහ පරිපාලනමය සහය සහ මග පෙන්වීම ලබා දිය හැකි DPCCS, උපදේශකයින් සහ වෙනත් වෘත්තිකයන් ඇතුළත් ශක්තිමත් ආධාරක පද්ධතියක් අවශ්‍ය වේ. තනි පුද්ගල සහ කණ්ඩායම් උපදේශන මගින් ඔවුන්ගේ අත්දැකීම් සැකසීමට, ආත්ම අභිමානය නැවත ගොඩනගා ගැනීමට, ආත්මාරක්ෂාව, සහ මුහුණ දීමේ යාන්ත්‍රණයන් වර්ධනය කිරීමට උපකාර කළ හැක. CVoT හට අවශ්‍ය මානසික සෞඛ්‍ය සහ මනෝ සමාජීය සහය සේවා (MHPSS) ලැබීම අත්‍යවශ්‍ය වන අතර ඔහු/ඇය වඩාත් සුදුසු උපකාරක සේවා වෙත යොමු කිරීම/නැවත යොමු කිරීම අත්‍යවශ්‍ය වේ. වෙන් වූ දරුවන්ගේ, විශේෂයෙන්ම ළමා වෙළෙඳාමේ වින්දිතයින් වූ ගැහැණු ළමයින්ගේ ආත්ම අභිමානය සහ ආත්ම-වටිනාකම ශක්තිමත් කිරීමද බෙහෙවින් වැදගත් වේ. ළමයින්ට නැවතත් ස්වයං-වටිනාකම පිළිබඳ හැඟීමක් ලබා ගැනීමට උපකාර වන කණ්ඩායම් සහ තනි පුද්ගල චිකිත්සක ක්‍රියාකාරකම් සැපයිය යුතුය; දරුවන් සමඟ සැලකිලිමත් සහ අධීක්ෂණ කාර්යභාරයක් ඉටු කරන වැඩිහිටියන් ඔවුන්ගේ වචන සහ ක්‍රියාවන් එවැනි දරුවන්ට ප්‍රශංසා කිරීමට සහ ඔවුන්ගේ ආත්ම අභිමානය නැවත ඇති කිරීමට දායක වන බවට සහතික විය යුතුය. මැදිහත්වීම් තුළින් ස්වාධීනත්වය, ස්වයංපෝෂිතභාවය සහ තමාගේම විනිශ්චය විශ්වාස කිරීම ප්‍රවර්ධනය කළ යුතුය.

**පවුල සහ ප්‍රජා සහභාගීත්වය:** නැවත සමාජගත කිරීමේ ප්‍රයත්නයන් වලදී දරුවාගේ පවුල, සමීප ඥාතියෙකු හෝ භාරකරුවෙකු (හැකි සෑම විටම) සමඟ සම්බන්ධ වී ඔවුන්ගේ නැවත පැමිණීම සඳහා ආරක්ෂිත සහ සහායක පරිසරයක් නිර්මාණය කිරීම ඇතුළත් විය යුතුය. මෙය CVoTs සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් සඳහා මනෝ අධ්‍යාපනය, පවුල් උපදේශනය, රැකබලා ගන්නන් සඳහා ජීවනෝපාය සහය සැපයීම මෙන්ම ප්‍රජාව තුළ දරිද්‍රතාවය සහ අවදානම අවම කිරීමට දරන උත්සාහයන් ඇතුළත් විය හැකිය. CVoT සහ ඔහුගේ හෝ ඇයගේ පවුල වෙත ඔවුන්ගේ තත්වයන්ට මුහුණ දීම සඳහා සමාජ සහ ජීවන කුසලතා ද ලබා දිය යුතුය. අපරාධවල වින්දිතයින් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරිය පිළිබඳව පවුලේ සාමාජිකයින් දැනුවත් කළ හැකි අතර, වෙළෙඳාමේ වින්දිතයින් සහ ඔවුන්ගේ පවුල් අපරාධකරුවන්ගෙන් ආරක්ෂා කිරීම සඳහා රජයේ අධිකාරිය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ සාක්ෂි ලබා දිය හැකිය. ප්‍රජා දැනුවත් කිරීමේ ව්‍යාපාර මගින් අපකීර්තිය, අවිශ්වාසය සහ වෙනස් කොට සැලකීම්වලට එරෙහිව සටන් කිරීමටත්, ආරක්ෂා කිරීම සඳහා මෙන්ම පුනර්ජීවනය කිරීම සඳහා පවතින අවදානම් අවම කිරීමටත් හැකි වේ. රැකවරණය සහ ආරක්ෂාව අවශ්‍ය ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූ දරුවෙකු ලෙස, උසාවි නියෝගයක් හරහා දරුවා ආයතනයට ඇතුළත් කිරීමට ඉඩ ඇත. එමනිසා, CDC දරුවා සහ පවුල සමඟ ක්‍රියාවලිය ආරම්භ කිරීමට පෙර නැවත සමාජගත කිරීම සඳහා අධිකරණ අනුමැතිය ලබා ගත යුතුය. CDC විසින් දරුවාගේ නැවත සමාජගත කිරීම සඳහා හිතකර ලෙස පෙනෙන තත්වයන් අධිකරණයට ඉදිරිපත් කළ යුතු අතර, ක්‍රියාවලිය ආරම්භ කිරීම සඳහා උසාවි නියෝගයක් ඉල්ලා සිටිය යුතුය.

**නෛතික සහය:** CVoT හට ඔවුන්ගේ වෙළෙඳාම්කරුවන්ට එරෙහිව යුක්තිය පසිඳලීමට සහ ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහතික කිරීමට නීතිමය සහාය අවශ්‍ය විය හැකිය. වින්දිතයාට ඔවුන්ගේ අයිතිවාසිකම් සහ ඔවුන්ට ප්‍රවේශය ඇති ප්‍රතිපාදන මොනවාද යන්න පිළිබඳව ඉගැන්වීම, නීති ආධාර සඳහා ප්‍රවේශය ලබා දීම, නීතිමය ක්‍රියාමාර්ගවලට සහාය වීම සහ ළමා හිතකාමී යුක්තිය පසිඳලීම සඳහා පෙනී සිටීම මෙයට ඇතුළත් වේ. නීතිමය ඇහවුම් සහ නීතිමය ක්‍රියාවලියට අනුව ඉදිරි වසර කෙබඳු වනු ඇත්ද යන්න පිළිබඳව, වින්දිතන් සහ ඔවුන්ගේ පවුල් වල සාමාජිකයින් දැනුවත් කිරීම වැදගත් වේ. වින්දිතයින් වයස අවුරුදු

18 වන විට, ඔවුන් තවදුරටත් DPCCS හි රැකවරණය යටතේ නොසිටිති. කෙසේ වෙතත්, උසාවි ප්‍රමාදයන් ආදිය සමඟ, සමහර විට නඩුව අවසන් වන විට දරුවාගේ වයස 18 ට වැඩි ය. මේ අනුව, දරුවාට සහාය දක්වන කවුරුන් වුවද, නඩුව සම්බන්ධයෙන් මහාධිකරණයේ පෙනී සිටින විට භාවිතා කිරීම සඳහා එකතු කරන ලද සියලුම නීතිමය වාර්තා සහ ක්‍රියාමාර්ග ක්‍රමානුකූලව පවත්වාගෙන යාම ඉතා වැදගත් වේ. දරුවාටත් දැන් මග පෙන්වීමෙන් නඩුව ඉදිරියට ගෙන යාමට හැකි වනු ඇත. නෛතික ක්‍රියාවලිය පුරාවට, CVoT සහ පවුල MHPSS සේවාවන්ට සම්බන්ධ වී තිබීම වැදගත් වන්නේ නීතිමය ක්‍රියාපටිපාටිය කම්පන, විවිධ කාලයන් සහ වයස ආදී සාධක වල බලපෑම හේතුවෙන් ප්‍රේරණය වී, වසර ගණනාවක් පුරා දීර්ඝ වී ඇති නීති පද්ධතිය නිසාවෙනි. එවැනි අවස්ථාවකදී ඔවුන්ට සම්බන්ධ විය හැක්කේ කවුරුන් සමඟද යන්න සහ එවැනි අවස්ථාවකදී ඔවුන් සමඟ කතා කිරීමට පහසු අය කවුරුන්ද යන්න හඳුනා ගැනීම වැදගත්ය.

**දිගු කාලීන සහය සහ පසු විපරම්:** නැවත සමාජගත කිරීම යනු දිගු කාලීන සහය සහ අධීක්ෂණය අවශ්‍ය වන අඛණ්ඩ ක්‍රියාවලියකි. පුනරුත්ථාපනය වූ දරුවන්ගේ යහපැවැත්ම සහතික කිරීමට සහ ඔවුන්ට අධ්‍යාපනික සහය, නිපුණතා පුහුණුව, මනෝ සමාජීය සහය, උපදේශනය සහ අත්‍යාවශ්‍ය සේවා සඳහා ප්‍රවේශය ඇතුළු අඛණ්ඩ සහාය ලබා දීම සඳහා පසු සුරැකුම් වැඩසටහන් ක්‍රියාත්මක විය යුතුය.

එක් එක් දරුවාගේ අනන්‍ය අවශ්‍යතා, ස්ත්‍රී පුරුෂ භාවය, වයස, හැකියාවන් මට්ටම සහ දුර්වලතා සහ කැමැත්ත සැලකිල්ලට ගනිමින් නැවත සමාජගත කිරීමේ ක්‍රියාවලිය දරුවා සහ දිවි ගලවා ගත් අය කේන්ද්‍රගත විය යුතු බව සැලකිල්ලට ගැනීම වැදගත්ය. රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන සංවිධාන (ජාත්‍යන්තර සහ දේශීය යන දෙඅංශයෙන්ම), සහ අනෙකුත් පාර්ශවකරුවන් අතර සහයෝගීතාවය ඵලදායී, විස්තීර්ණ, අභිරුචිකරණය කළ සහ තිරසාර ප්‍රතිසංවිධාන ප්‍රයත්නයන් සඳහා ඉතා වැදගත් වේ. මෙහිදී දරුවා සහ සහායකයා අතර හොඳ සංවාදයක් තිබිය යුතුය. උපකාරකයා දරුවාගේ අවශ්‍යතා, රුචිකත්වයන් සහ දක්ෂතා මොනවාද යන්න පිළිබඳ අවබෝධයක් මැනිය යුතුය. මෙම අවබෝධය දරුවා සුදුසු දිශාවකට යොමු කිරීමට සහාය වනු ඇත.

** දරුවාගේ යහපත වෙනුවෙන් නැවත සමාජගත කිරීම නොහැකි නම්, දරුවන්ගේ රැකවරණය, ආරක්ෂාව, සංවර්ධනය සහ යහපැවැත්ම සඳහා සහාය වීම සඳහා සිද්ධි කළමනාකරණය පිළිබඳ පවතින ජාතික/පළාත් මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුය.

### 4.7.3.4. CVOT නැවත සමාජගත කිරීමේ අභියෝග හඳුනා ගැනීම

වෙළෙඳාමේ වින්දිතයින්ට සහය වන සේවා සපයන්නන් සංකීර්ණ අභියෝගයන්ට, විශේෂයෙන්ම පවුලේ ගතිකත්වය සම්බන්ධයෙන් අභියෝගයන්ට මුහුණ දෙති. ඇතැම් වින්දිතයින් බොහෝ පවුල තුළ පවතින විට මූල්‍යමය බාධාවන් හේතුවෙන පවුලේ සාමාජිකයන් විසින්ම, ගණිකා වෘත්තිය හෝ ශ්‍රමය සූරාකෑමේ තත්වයන්ට බලහත්කාරයෙන් හෝ දිරිමත් කරනු ලැබේ. මෙම පවුල් සබඳතාවල සංකීර්ණතා හඳුනා ගැනීම යලි සමාජගත කිරීමේ ප්‍රයත්නයන් සලකා බැලීමේදී, විශේෂයෙන්ම පවුල, වෙළෙඳාමේ කාර්යභාරයක් ඉටු කර ඇති අවස්ථා වලදී ඉතා වැදගත් වේ.

වින්දිතයින්ට පැවතිය හැකි සීමිත ආධාරක පද්ධති හෝ සම්බන්ධතා සැලකිල්ලට ගනිමින් සේවා සපයන්නන් මෙම සබඳතාවල සංකීර්ණතා අධ්‍යයනය කළ යුතුය. තමන්ට හානියක් සිදු වුවද, ඇතැම් වින්දිතයින් තම පවුල් සමඟ පවතින සබඳතා බිඳ නොදැමීමට තීරණය කළ හැකි අතර, ඔවුන්ගේ මෙම තේරීම සලකා බැලිය යුතු අතර, සම්බන්ධ වූ පුද්ගලයින්ගේ ස්වාධීනත්වයට ගරු කිරීම සිදු කෙරේ.

ඇතැම් අවස්ථාවලදී, ව්‍යුහාත්මක තත්ත්වයන් සහ සමස්ත පවුලේ තත්ත්වය වැඩිදියුණු කිරීමට ඇති ආශාව නිසා දරුවකු රැකියාව සඳහා පිටත් කර හැරීම සඳහා පවුල විසින් පැහැදිලිවම තාර්කික තීරණ ගත හැකිය. ඵලදායී උපකාර ලබාදීම සඳහා මෙම තත්වයන් අවබෝධ කර ගැනීම ඉතා වැදගත් වේ. කෙසේ වෙතත්, දරුවාගේ ආරක්ෂාවට ප්‍රමුඛත්වය ලබා දෙමින්, ඔවුන් නැවත නිවසට ගෙන ඒම ක්ෂණිකව කළ නොහැකි වනු ඇත. ඒ වෙනුවට, නීතිමය අභියෝග ආමන්ත්‍රණය කරන අතරම වඩාත් සහායක, සෞඛ්‍ය සම්පන්න සම්බන්ධතාවයක් ඇති කර ගැනීමට දරුවා සහ පවුල සමඟ කටයුතු කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

සමාජ සුබසාධන විකල්පයන් සීමිත වන අවස්ථාවන් වලදී, පවුල සමඟ සබඳතා බිඳ දැමීම සැලකිය යුතු ප්‍රතිවිපාක ඇති කරයි උදා: දරුවාට වයස අවුරුදු 18 සම්පූර්ණ වූ විට සහ පරිවාස දෙපාර්තමේන්තුවේ රැකවරණය යටතේ නොසිටින අවස්ථාවන්. අසම්පූර්ණ පවුල් සහයෝගය තුළින්, තවමත් ආරක්ෂිත ආවරණයක් සැපයිය හැකි හැකි බව හඳුනා ගනිමින්, සේවා සපයන්නන් පවුල් සම්බන්ධතා විසන්ධි කිරීමේ විභව අවදානම් සහ ප්‍රතිලාභ හොඳින් අධ්‍යනය කර විමසා බැලිය යුතුය. තැනැත්තන් වෙළෙඳාමේ වින්දිතයින් මුහුණ දෙන අභියෝගවල බහුවිධ ස්වභාවය අවබෝධ කර ගනිමින් ඒ අනුව සහාය ලබා දීම සඳහා උපකාරක වැඩසටහන් පරිපූර්ණ ප්‍රවේශයක් අනුගමනය කළ යුතුය.

එබැවින්, ඔවුන්ගේ නියෝජිතායතනයට ගරු කිරීම, පවුල් ගතිකත්වයේ සංකීර්ණතා අවබෝධ කර ගැනීම සහ නැවත සමාජගත කිරීමේ ක්‍රියාවලියේ පුළුල් ව්‍යුහාත්මක සහ සමාජ සන්දර්භය සලකා බැලීම සඳහා, වින්දිතයන් කේන්ද්‍ර කරගත් සූක්ෂ්ම ප්‍රවේශයක් අත්‍යවශ්‍ය වේ.

### 4.7.3.5. අභියෝග අවම කිරීම සඳහා මාර්ග සංවර්ධනය කිරීම

## 4.8. ස්වයං රැකවරණය සහ රැකවරණ සපයන්නාගේ ආතති කළමනාකරණය

**පාඨමාලා විස්තරය:**

ළමා වෙළෙඳාමේ වින්දිතයෙකුට (CVoT) සහය ලබා දීම ඉතා සුවිශේෂී සහ ප්‍රතිලාභදායක අත්දැකීමකි. කෙසේ වෙතත්, සුරැකුම් ආයතනවල කාර්ය මණ්ඩලය අඩු වීම මෙන්ම සහ දරුවන් රැකබලා ගන්නන් අතර අනුපාතය සාපේක්ෂව ඉහළ මට්ටමක පැවතීම ඇතුළු විවිධ හේතු නිසා ශ්‍රී ලාංකීය සන්දර්භය තුළ එය අතිමහත් අභියෝගාත්මක කාර්යයකි. ළමා වෙළෙඳාමේ වින්දිතයින්ට සහයෝගය දැක්වීම සඳහා ඔවුන්ගේ දැඩි අභිප්‍රේරණය සහ කැපවීම තිබියදීත්, ඔවුන් දවස පුරා, සෑම දිනකම, ඉටු කරන බොහෝ කාර්යයන් සහ වගකීම් මෙන්ම, ඔවුන්ගේ පෞද්ගලික සහ වෘත්තීය ජීවිතය අතර පවතින අඳුරු සීමාවන් හේතුවෙන් රැකබලා ගන්නන් ආතතියට, වෙහෙසට හා කායික සහ මානසික වශයෙන් දැඩි පීඩාවට පත්වීමට වැඩි අවදානමක් ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, අපචාරයන්ගේ වින්දිතයින් සහ ළමා වෙළෙඳාමේ වින්දිතයින්ගේ නිශ්චිත රැකවරණ අවශ්‍යතා සහ ඉල්ලීම් රැකබලා ගන්නන්ගේ යහපැවැත්මට බලපෑ හැකිය.

එමනිසා, රැකබලා ගන්නන් නිතර මුහුණ දෙන ආතති සහ ආතති ප්‍රතිචාර හඳුනා ගැනීම සහ රැකබලා ගන්නන්ගේ ආතතීන්ට මුහුණ දීම සඳහා උපාය මාර්ග සකස් කිරීම සහ ඔවුන්ගේ යහපැවැත්ම වැඩිදියුණු කිරීම සඳහා ඔවුන්ගේ දෛනික ජීවිතයට ස්වයං රැකවරණ පිළිවෙත් ඇතුළත් කිරීම ඉතා වැදගත් වේ.

**ඉගෙනුම් අරමුණු**

**පාඨමාලාවේ මූලික අරමුණ:**

මෙම මොඩියුලයේ ප්‍රධාන අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ ළමා සුරැකුම් කාර්ය මණ්ඩලය අතර මානසික සෞඛ්‍යය සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම සඳහා ආතති කළමනාකරණ කුසලතා වර්ධනය කිරීම සහ අනුවර්තනය වීමේ උපාය මාර්ග වැඩිදියුණු කිරීමයි. එබැවින්, මෙම මොඩියුලය අවසානයේ, කාර්ය මණ්ඩල සාමාජිකයින්ට ආතතිය කළමනාකරණය කිරීමට සහ තමන් වෙනුවෙන්ම පුද්ගලාරෝපිත ස්වයං රැකවරණ චර්යාවක් වර්ධනය කර ගැනීමට දැනුම සහ කුසලතා වර්ධනය කරන අතර, ඔවුන්ගේ රැකවරණයෙහි සිටින ළමුන් සඳහා ආරක්ෂිත සහ ඵලදායී සේවාවන් සැපයීමට ඔවුන්ට හැකියාව ලැබේ.

**මෙම මොඩියුලය සම්පූර්ණ කිරීමෙන් පසු, සහභාගිවන්නන්ට හැකි විය යුත්තේ:**

1) ආතතිකාරක වර්ග සහ තමන් සහ අන් අය තුළ ඇති වන ආතති ප්‍රතිචාර හඳුනා ගැනීම.
2) කායිකව සහ මානසිකව දැඩි වෙහෙසට පත්වීම සහ එහි ලක්ෂණ හඳුනා ගැනීම.
3) යහපැවැත්ම සහ ජීවන තත්ත්වය පිළිබඳ අවබෝධයක් පෙන්නුම් කිරීම.
4) ඔවුන්ගේ පෞද්ගලික සහ රැකියා ජීවිතය අතර සෞඛ්‍ය සම්පන්න සීමාවන් වර්ධනය කිරීම.
5) සම වයසේ මිතුරන් සමඟ සෞඛ්‍ය සම්පන්න සීමාවන් ස්ථාපිත කිරීම.
6) ජීවිතයේ ගුණාත්මකභාවය සහ පුද්ගලික යහපැවැත්ම වැඩිදියුණු කිරීම සඳහා පුද්ගලාරෝපිත ස්වයං රැකවරණ චර්යාවන් වර්ධනය කිරීම.
7) ආතති කළමනාකරණ ක්‍රම පුරුදු කිරීම.

## 4.8.1. ස්වයං රැකවරණය පිළිබඳ හැඳින්වීම සහ ස්වයං රැකවරණයේ වැදගත්කම

ළමා වෙළෙඳාම මගින් මානව හිමිකම් බරපතල ලෙස උල්ලංඝනය වන අතර, ළමා වෙළෙඳාමේ වින්දිතයින්ට දිගුකාලීන හානියක් සිදු වේ. මෙහිදී, තදබල වැඩ සහ වේදනාකාරී අත්දැකීම් සුව කිරීමේ ක්‍රියාවලියට අත්‍යවශ්‍ය වන රැකබලා ගන්නන් තුළ මානසික වෙහෙසට හා කායික සහ මානසික වශයෙන් දැඩි පීඩාවට පත්වීමට හේතු විය හැක. ස්වයං රැකවරණය සුඛෝපභෝගී දෙයක් නොව ළමා වෙළෙඳාමෙන් දිවි ගලවා ගත් පුද්ගලයින් රැකබලා ගැනීමේ අභියෝගාත්මක කර්තව්‍යයට කැප වූවන්ගේ අවශ්‍යතාවයකි.

ස්වයං රැකවරණය යනු ඔබේ මානසික, චිත්තවේගීය සහ ශාරීරික සෞඛ්‍යය ගැන සැලකිලිමත් වීම සඳහා ඔබ හිතාමතා කරන ඕනෑම ක්‍රියාකාරකමක් වේ.

ස්වයං රැකවරණය යනු "සෞඛ්‍ය සම්පන්න ක්‍රමවලින් තමාටම නැවත පිරවීමේ සහ නැවත නැවත එය යාවත්කාලීන කිරීමේ හැකියාව" (Gentry, 2002, p. 48), ඇතුළුව, "ශාරීරික සහ චිත්තවේගීය යහපැවැත්ම පවත්වා ගෙන යන සහ ප්‍රවර්ධනය කරන හැසිරීම් වල නියැළීමයි" (Myers et al. 2012, p. 56).

රැකබලා ගන්නන් සඳහා ස්වයං රැකවරණයේ වැදගත්කම වන්නේ චිත්තවේගීය ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම, කායික සහ මානසික වශයෙන් දැඩි පීඩාවට පත්වීම වැළැක්වීම, මානසික යහපැවැත්ම පවත්වා ගැනීම, දයානුකම්පාව සහ කාර්යක්ෂමතාව වැඩි කිරීම, සෞඛ්‍ය සම්පන්න සීමාවන් ස්ථාපිත කිරීම සහ පවත්වාගෙන යාම, වෙළෙඳාමෙන් දිවි ගලවා ගත් අය සඳහා ධනාත්මක භූමිකාවන් ආදර්ශමත් කිරීම සහ ආධාරක ප්‍රජාවන් ගොඩනැගීමයි.

### 4.8.1.1. ස්වයං රැකවරණය රැකියාවට සම්බන්ධ වන ආකාරය හඳුනා ගැනීම

ළමා වෙළෙඳාමෙන් දිවි ගලවා ගත් දරුවන්ගේ පූර්ණ පුනරුත්ථාපනය සඳහා සහ කම්පනයට එරෙහිව සටන් කිරීමේ උත්සාහයේ සාර්ථකත්වය සඳහා රැකබලා ගන්නන්ගේ ස්වයං රැකවරණයට ප්‍රමුඛත්වය දීම ඉතා වැදගත් වේ, මන්දයත්, එය රැකබලා ගන්නාගේ පෞද්ගලික සෞඛ්‍යය වැඩි දියුණු කරනවා පමණක් නොව, වෙළඳාමේ වින්දිත දරුවා නැවත යථා තත්ත්වයට පත් කිරීමේ ක්‍රියාවලියට ද උපකාරී වේ. තවදුරටත් රැකබලා ගන්නන්ගේ දිගුකාලීන කැපවීම සහ වැඩ තිරසාරත්වය, කාර්යයේ ඵලදායීතාවය සහ කම්පන සහ කම්පන සමඟ කටයුතු කිරීමේ හැකියාව වැඩිදියුණු කරනු ඇත.

### 4.8.1.2. ආතතිය අවබෝධ කර ගැනීම සහ එය ළමා වෙළෙඳාමේ වින්දිතයින් රැකබලාගන්නන් සමඟ සම්බන්ධ වන ආකාරය

ළමා වෙළෙඳාමේ වින්දිතයින්ට උපකාර කිරීමේ දැඩි වගකීම් සමුදාය රැකබලා ගන්නන් විශාල ආතතියකට සහ මානසික වෙහෙසකට නිරාවරණය කරයි.

#### 4.8.1.2.1. ආතතිය නිර්වචනය කිරීම සහ විවිධ ආතති ප්‍රතිචාර හඳුනා ගැනීම

හානිකර යැයි සැලකෙන ඕනෑම බාහිර උත්තේජකයකට ශරීරයේ අභ්‍යන්තර ප්‍රතික්‍රියාව (Lasarus & Folkman,1984).

විවිධ ආතති ප්‍රතිචාර වන්නේ ශාරීරික, චිත්තවේගීය, චර්යාත්මක, සංජානන සහ අන්තර් පුද්ගල යනාදිය වේ.

#### 4.8.1.2.2. ආතතියට හේතු හඳුනා ගැනීම

රැකබලා ගන්නන් කම්පන සහගත අත්දැකීම් (ද්විතියික කම්පන ආතතීන්) ගැන නිතර සාක්ෂි දැරීම හෝ ඇසීම සිදු කරන අතර, චිත්තවේගීය බර, සීමිත සම්පත්, අධික වැඩ බර, සදාචාරාත්මක උභතෝකෝටික, ස්වයං රැකවරණය නොමැතිකම සහ රැකබලා ගන්නන්ට අන් අයගෙන් ලැබෙන සීමිත සහයෝගය, වැනි සාධක හේතුවෙන් එය ඉහළ මට්ටමේ පීඩාවක් ඇති කළ හැකිය.

#### 4.8.1.2.3. ආතති වර්ග

ධනාත්මක ආතතිය - උද්වේගකර හෝ අභියෝගාත්මක අවස්ථාවන්ගෙන් පැන නගින ධනාත්මක ආතතිය, අභිප්‍රේරිත සහ ජවසම්පන්න තත්වයකට මග පාදයි.

සෘණාත්මක ආතතිය - අප්‍රසන්න හෝ හානිකර තත්වයන් නිසා ඇතිවන සෘණාත්මක ආතතිය, අනාරක්ෂිතබව හෝ නොසන්සුන්තාව පිළිබඳ හැඟීමක් ඇති කරයි.

### 4.8.2. දැඩි කායික හෝ මානසික විඩාව සහ එහි ලක්ෂණ නිර්වචනය කිරීම

දැඩි කායික හෝ මානසික විඩාව යනු සාර්ථකව කළමනාකරණය කර නොමැති සේවා ස්ථානයේ දිගුකාලීන ආතතියේ ප්‍රතිපලයක් වශයෙන් ඇතිවන සින්ඩ්‍රෝමය වේ. එය මාන තුනකින් සංලක්ෂිත වේ:

- ශක්තිය ක්ෂය වීම හෝ වෙහෙස දැනීම.
- තමන්ගේ රැකියාවෙන් මානසික දුරස්ථභාවය වැඩි වීම, හෝ තම රැකියාවට අදාළ නිෂේධාත්මක හැඟීම් හෝ නුරුස්සන හැඟීම්; සහ
- වෘත්තීය කාර්යක්ෂමතාව අඩු කිරීම (ICD, 11).

"Burnout" යන පදය රැකියාවක සන්දර්භය තුළ සිදුවන සංසිද්ධි සඳහා වෙන් කර ඇති අතර ජීවිතයේ වෙනත් ක්ෂේත්‍රවල සිදුවීම් විස්තර කිරීමට භාවිතා නොකළ යුතුය. කෙසේ වෙතත්, ළමා වෙළඳාමේ වින්දිතයින් සහ අනෙකුත් අපචාරයන්ට ලක්වූ වින්දිතයින් සමඟ කටයුතු කරන විට, සේවා දායකයන් ද්විතියික කම්පනය, පුද්ගලික ආරක්ෂක තර්ජන සහ සේවාදායකයින්ගේ දුර්වලතා සමඟ කටයුතු කිරීමට සිදුවීම වැනි සේවාලාභීන් සම්බන්ධ ගැටළු හේතුවෙන් කායික හෝ මානසික විඩාවක් අත්විඳිය හැකිය.

#### 4.8.2.1. කායික හෝ මානසික විඩාව සමඟ කටයුතු කරන්නේ කෙසේද සහ සුව කරන්නේ කෙසේද යන්න හඳුනා ගැනීම

ළමා වෙළෙඳාමේ වින්දිතයින් සමඟ කටයුතු කරන රැකබලා ගන්නන් කායික සහ මානසික දැඩි පීඩාවන් කළමනාකරණය කිරීම සඳහා ප්‍රධාන වශයෙන් අංශ තුනක් සලකා බැලිය යුතුය.

i. කාර්ය භාරය කළමනාකරණය කිරීම - කණ්ඩායම් ප්‍රවේශය භාවිතා කරන්න, භූමිකාවේ වෙනසක් සඳහා රැකියා සංචලනයට ඉඩ දෙන්න, නොවැදගත් ලිපි ලේඛන අඩු කරන්න, ඔබේ වැඩ බර සීමාව සකසන්න සහ ගරු කරන්න

ii. සහායක සංවිධාන වාතාවරණයක් ගොඩනඟන්න - සම වයසේ මිතුරන් සමඟ සබඳතා දිරිමත් කරන්න, උපකාර ඉල්ලා සිටීම සහ ලැබීම සාමාන්‍යකරණය කරන්න, සහ ශ්‍රම

බලකායට සහ දරුවන්ට වඩා හොඳ සහයෝගයක් ලබා දීම සඳහා කම්පන දැනුවත් ප්‍රවේශය භාවිතා කරන්න.

iii. ස්වයං රැකවරණය යොදන්න - "ස්වයං රැකවරණය සඳහා A-B-C."

A – Awareness (දැනුවත් කිරීම)

B – Balance (සමබරතාවය)

C – Connection (සම්බන්ධතාවය)

## 4.8.3. "යහපැවැත්ම" නිර්වචනය කිරීම

යහපැවැත්ම යනු පුද්ගලයන් සහ සමාජයන් අත්විඳින ධනාත්මක තත්ත්වයකි. එය දෛනික ජීවිතය සඳහා සම්පතක් වන අතර සමාජ, ආර්ථික සහ පාරිසරික තත්ත්වයන් අනුව තීරණය වේ. යහපැවැත්ම යනු ජීවිතයේ ගුණාත්මක භාවය සහ මිනිසුන්ගේ සහ සමාජවල අර්ථය සහ අරමුණ පිළිබඳ හැඟීමකින් ලෝකයට දායක වීමට ඇති හැකියාවයි (WHO, 2021).

### 4.8.3.1. යහපැවැත්මේ වටිනා කොටස් හඳුන්වා දීම

- යහපැවැත්ම ජීව විද්‍යාත්මක (භෞතික), ද්‍රව්‍යමය, සමාජීය, අධ්‍යාත්මික, සංස්කෘතික, මානසික (චින්තනය සහ ඉගෙනීම), චිත්තවේගීය වැනි බොහෝ පැතිකඩයන් වලින් සමන්විත වේ. යහපැවැත්ම පවත්වා ගෙන යන තනි සාධක හඳුනා ගැනීම.
- යහපැවැත්ම වැඩිදියුණු කළ හැකි තනි සාධක හඳුනා ගැනීම.
- යහපැවැත්ම සාක්ෂාත් කර ගැනීම ක්‍රියාවලියක් බව හඳුනා ගන්න, එබැවින් රැකබලා ගන්නාට එක් අංශයක් සාක්ෂාත් කර නොගත හැකි නමුත් ඔහු වෙනත් ක්ෂේත්‍ර ඉහළ මට්ටමකින් අත්පත් කරගෙන තිබිය හැකිය.

### 4.8.3.2. නුසුදුසු චින්තන රටා හඳුනා ගැනීම සහ වෙනස් කිරීම.

කෙනෙකුගේ මානසික යහපැවැත්ම මානසික හෝ කායික විඩාවට හෝ ගැටළු සහගත තත්ත්වයකට පත් කිරීමට හේතු වන ඕනෑම හානිකර හෝ අහිතකර චින්තන රටාවක් රැකබලා ගන්නන් හඳුනාගත යුතුය. මෙම ක්‍රමය භාවිතා කිරීමෙන්, රැකබලා ගන්නන් හට මෙම සිතුවිලි වලට අභියෝග කරන්නේ කෙසේදැයි ඉගෙන ගත හැකි අතර ඔවුන්ගේ හැඟීම් සහ ආතතිය කළමනාකරණය කිරීමට උපකාරී වන වඩාත් නිර්මාණාත්මක චින්තන රටා වර්ධනය කර ගත හැකිය.

### 4.8.3.3. සිතුවිලි-හැසිරීම-හැඟීම් චක්‍රය තේරුම් ගැනීම

රැකබලා ගන්නෙකුගේ නිෂේධාත්මක සිතුවිලි, චිත්තවේගයන් සහ හැසිරීම් එකිනෙකට සම්බන්ධ වන ආකාරය පෙන්වන සංකල්පයක් සිතුවිලි-හැසිරීම-චිත්තවේගීය චක්‍රය ලෙස හැඳින්වේ. මෙම චක්‍රයට කායික සහ මානසික විඩාවක් පවතින සන්දර්භය තුළ නොහෙට්ටුව සහ ආතතිය දිගු කිරීමේ හැකියාව ඇත. චක්‍රය සාමාන්‍යයෙන් ක්‍රියාත්මක වන්නේ මෙසේය:

I. චින්තනය - සෘණාත්මක සහ විකෘති සිතුවිලි බොහෝ විට සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරයි. මෙම සිතුවිලිවලට යටපත් වීම, ස්වයං සැකය, පරිපූර්ණත්වය හෝ ඉල්ලීම් සපුරාලීමට නොහැකි වීමේ හැඟීම ඇතුළත් විය හැකිය.
උදා: "මම සෑම දෙයක්ම හොඳින් කළ යුතුයි" හෝ "මට විවේකයක් ගැනීමට මට හැකියාවක් නැත" වැනි සිතුවිලි කායික හෝ මානසික විඩාවට ලක් වීමට දායක විය හැක.

II. හැඟීම් - සෘණාත්මක සිතුවිලි නිෂේධාත්මක හැඟීම් අවුස්සයි. කායිකව සහ මානසිකව විඩාවට පත්වීමේ චක්‍රය තුළ, ඔබට කලකිරීම, කාංසාව, දුක, හෝ වරදකාරි හැඟීම වැනි හැඟීම් අත්විඳිය හැකිය.
මෙම චිත්තවේගයන් ආතතිය තවදුරටත් තීව්‍ර කළ හැකි අතර චිත්තවේගීය වෙහෙස පිළිබඳ හැඟීමක් ඇති කරයි.

III. හැසිරීම් - හැඟීම් සහ සිතුවිලි හැසිරීම් වලට බලපායි. දැවී යාමේ සන්දර්භය තුළ, මෙයට වැඩිපුර වැඩ කිරීම, ස්වයං රැකවරණය නොසලකා හැරීම හෝ සමාජ ක්‍රියාකාරකම් වලින් ඉවත් වීම ඇතුළත් විය හැකිය.

මානසික ආතතිය සමනය කර ගැනීමට උපකාර වන ක්‍රියාකාරකම් නොසලකා හැරීම හෝ වැඩ කිරීමේ ප්‍රවණතාවයන් තුළ පුද්ගලයා නිරත විය හැකි බැවින්, කායික හෝ මානසික විඩාව නිසා ඇතිවන හැසිරීම් මගින් ආතතිය වැඩි වීමේ චක්‍රයක් නිර්මාණය කළ හැක.

## 4.8.4. ඔරොත්තු දීමේ හැකියාව අවබෝධ කර ගැනීම සහ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා උපාය මාර්ග සංවර්ධනය කිරීම

### 4.8.4.1. රැකුම් කාර්ය මණ්ඩලය සඳහා ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීමට සහාය විය හැකි සාධක හඳුනා ගැනීම

a. සමාජ සම්බන්ධතා සහ සහයෝගය සොයන්න.
b. අගයන් පැහැදිලි කර වැදගත් දේ කරන්න.
c. එක් අවස්ථාවක එක් පියවරක් තැබීමෙන් අර්බුදයක් සමඟ කටයුතු කරන්න.
d. වෙනස පිළිගන්න.
e. වෙනස් කිරීමට පියවර ගන්න.
f. ස්වයං සොයාගැනීම් සඳහා අවස්ථා සොයන්න.
g. ඔබ පිළිබඳව අනුකම්පාවෙන් සිතන්න.
h. යෙදුම: සොබාදහම සමඟ කාලය ගත කිරීම, සිහිය තබා ගැනීමේ පුරුදු, තිර කාලය අඩු කිරීම, අධ්‍යාත්මික භාවිතයන්හි යෙදීම සහ ඔබගේ මනස අවුල් කරන ඒවාට වඩා ඔබව බලගන්වන සමාජ සම්බන්ධතා තෝරා ගැනීම වැනි අනුවර්තන පුරුදු පුහුණු කිරීමෙන් ඔබ ගැන සැලකිලිමත් වන්න.

## 4.8.5. ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා අවස්ථා හඳුනා ගැනීමට සහ පුද්ගලාරෝපිත ස්වයං රැකවරණ දින චර්යාවක් වර්ධනය කිරීම සඳහා රැකබලා ගන්නන්ගේ සතිපතා චර්යාවන් පරීක්ෂා කිරීම.

### 4.8.5.1. රැකබලා ගන්නන් අනුවර්තී ස්වයං රැකවරණ පුරුදු ඇතුළුව ඔවුන්ගේම පුද්ගලාරෝපිත දෛනික සහ සතිපතා චර්යාවන් වර්ධනය කර ගැනීම අවශ්‍ය වේ.

**4.8.5.2. ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා එම ස්වයං රැකවරණ චර්යාවන් පුහුණු කිරීම**

a. පාලන චක්‍රය

b. ලිහිල් කිරීමේ ක්‍රියාකාරකම්

c. සිහිකල්පනාව ක්‍රියාකාරකම්: සිහියෙන් යුතුව ආශ්වාස ප්‍රශ්වාස කිරීම, ආහාර ගැනීම සහ වෙනත් ක්‍රියාකාරකම්

### 4.8.6. පරාවර්තක පුහුණු අභ්‍යාස - ගිබ්ස්ගේ පරාවර්තක චක්‍රය

ගිබ්ස්ගේ පරාවර්තක චක්‍රයේ සියලුම පියවර 05 හඳුනා ගැනීම සහ රැකබලා ගන්නන් ගේ ජීවිතවලට ඒවා ඇතුළත් කිරීම.

**නිර්දිෂ්ට කියවීම:**


Child Welfare Information Gateway. (n.d.). Child Welfare Can Address Burnout. https://ncwwi.org/files/--Documents/Child_Welfare_CAN_Address_Burnout.pdf. https://www.childwelfare.gov/topics/workforce/preventing-burnout/

Early Childhood National Centres. (n.d.). Promoting Informed Childcare Choices: A Training Guide for Childcare Subsidy Staff. https://childcareta.acf.hhs.gov/sites/default/files/new-occ/resource/files/training_guide_ccsubsidystaff_09_0.pdf

Taephant, N. (2010). The IOM Training manual on psychosocial assistance for trafficked persons. International Org. for Migration, Regional Office, Bangkok, Thailand. https://thailand.iom.int/resources/iom-training-manual-psychosocial-assistance-trafficked-persons

## 05. දේශන කාලසටහන

| පාඨමාලා අන්තර්ගතය | කාල සීමාව (පැය) | දිනය සහ වේලාව (තාවකාලික) | බෙදා හැරීමේ ආකාරය |
|---|---|---|---|
| **1. ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රධාන මූලධර්ම** | 6 | | **දෙමුහුන්** |
| 1.1 ළමයා සහ ළමා අයිතිවාසිකම් නිර්වචනය කිරීම<br>1.2 ළමා අයිතිවාසිකම් අධ්‍යයනය කිරීමේ අරමුණ<br>1.3 ළමා අයිතිවාසිකම් පිළිබඳ මූලික මූලධර්ම<br>1.4 අවදානමට ලක්විය හැකි දරුවෙකු බවට පත්වීමට හේතු හඳුනා ගැනීම | 2 | පළමු කණ්ඩායම 2024 ජුනි 18 පෙ:ව: 10.00 - ප:ව: 12.00<br>දෙවන කණ්ඩායම 2024 ජුනි 19 පෙ:ව: 10.00 - ප:ව: 12.00<br>තෙවන කණ්ඩායම 2024 ජුනි 20 පෙ:ව: 10.00 - ප:ව: 12.00<br>සිව්වන කණ්ඩායම 2024 මැයි 18 පෙ:ව: 10.00 - ප:ව: 12.00 | මාර්ගගත |
| 1.5 අවදානමට ලක්විය හැකි ළමුන් සඳහා මැදිහත් වීමේ ක්‍රමවේදය<br>1.6 දරුවන්ගේ සේවා සපයන්නන්ගේ සහ රාජකාරි ඉගෙන ගන්නන්ගේ වගකීම<br>1.7 දරුවන්ගේ වගකීම | 2 | පළමු කණ්ඩායම 2024 ජුනි 24 පෙ:ව: 10.00 - ප:ව: 12.00<br>දෙවන කණ්ඩායම 2024 ජුනි 25 පෙ:ව: 10.00 - ප:ව: 12.00<br>තෙවන කණ්ඩායම 2024 ජුනි 26 පෙ:ව: 10.00 - ප:ව: 12.00<br>සිව්වන කණ්ඩායම 2024 ජුනි 24 පෙ:ව: 10.00 - ප:ව: 12.00 | මාර්ගගත |
| 1.8 ආයතනවල සිටින ළමුන්ගේ ප්‍රභේද හඳුනා ගැනීම<br>1.9 ළමා සුරැකුම් ආයතන වෙනුවෙන් සේවා සැපයීම සඳහා බහු-විනය යාන්ත්‍රණයක් ස්ථාපිත කරන්නේ කෙසේද?<br>1.10 ළමා සුරැකුම් ආයතනවල ළමුන්ගේ සහභාගීත්වයේ අයිතිවාසිකම් සහතික කරන්නේ කෙසේද? | 2 | පළමු කණ්ඩායම 2024 ජුලි 06 පෙ:ව: 10.00 - ප:ව: 12.00<br>දෙවන කණ්ඩායම 2024 ජුලි 06 පෙ:ව: 10.00 - ප:ව: 12.00<br>තෙවන කණ්ඩායම 2024 ජුලි 06 ප:ව: 1.00 - ප:ව: 3.00<br>සිව්වන කණ්ඩායම 2024 ජුලි 06 ප:ව: 1.00 - ප:ව: 3.00 | මාර්ගගත |
| **2. නීතිමය රාමුව** | 6 | **දෙමුහුන්** | |
| 2.1 තැනැත්තන් වෙළෙඳාම (TIP) සම්බන්ධ අපරාධ සහ ළමා වෙළෙඳාම පිළිබඳ මූලික අවබෝධය<br>2.2 ළමා වෙළෙඳාමට අදාළ වන ජාත්‍යන්තර, කලාපීය සහ ජාතික නීති | 2 | පළමු කණ්ඩායම 2024 ජුලි 08 පෙ:ව: 10.00 - ප:ව: 12.00<br>දෙවන කණ්ඩායම 2024 ජුලි 09 පෙ:ව: 10.00 - ප:ව: 12.00<br>තෙවන කණ්ඩායම 2024 ජුලි 10 පෙ:ව: 10.00 - ප:ව: 12.00<br>සිව්වන කණ්ඩායම 2024 ජුලි 08 පෙ:ව: 10.00 - ප:ව: 12.00 | මාර්ගගත |
| 2.3 ළමා අයිතිවාසිකම් සහ ළමා වෙළෙඳාම පිළිබඳ නෛතික සහ ප්‍රතිපත්ති රාමුව තුළ අදාළ ළමා ආරක්ෂණ | 2 | පළමු කණ්ඩායම 2024 ජුලි 15 | මාර්ගගත |

| | | | |
|---|---|---|---|
| සේවා සපයන්නන්ගේ යුතුකම් සහ වගකීම් අවබෝධ කර ගැනීම<br>2.4 ගෝලීය සහ ජාතික වශයෙන්, ළමා වෙළෙඳාම සම්බන්ධ ගැටලුවේ ස්වභාවය හඳුනා ගැනීම | | පෙ.ව: 10.00 - ප.ව: 12.00<br><br>දෙවන කණ්ඩායම<br>2024 ජුලි 16<br>පෙ.ව: 10.00 - ප.ව: 12.00<br><br>තෙවන කණ්ඩායම<br>2024 ජුලි 17<br>පෙ.ව: 10.00 - ප.ව: 12.00<br><br>සිව්වන කණ්ඩායම<br>2024 ජුලි 15<br>පෙ.ව: 10.00 - ප.ව: 12.00 | |
| 2.5 ළමා වෙළෙඳාමේ නව ප්‍රවණතා සහ ළමා වෙළෙඳාම සඳහා තල්ලු කිරීමේ සහ ඇදගැනීමේ සාධක<br>2.6 ළමා වෙළෙඳාම් අපරාධයේ අංග<br>2.7 ළමා ආරක්ෂණය සහ ළමා වෙළඳාමේ වින්දිතයින්ගේ සහාය සඳහා පුළුල් මූලධර්ම සහ ප්‍රවේශයන් | 2 | පළමු කණ්ඩායම<br>2024 ජුලි 27<br>පෙ.ව: 10.00 - ප.ව: 12.00<br><br>දෙවන කණ්ඩායම<br>2024 ජුනි 27<br>පෙ.ව: 10.00 - ප.ව: 12.00<br><br>තෙවන කණ්ඩායම<br>2024 ජුනි 27<br>ප.ව: 1.00 - ප.ව: 3.00<br><br>සිව්වන කණ්ඩායම<br>2024 ජුනි 27<br>ප.ව: 1.00 - ප.ව: 3.00 | දේශන ශාලාව තුළ |
| **3. ළමා වෙළඳාමේ වින්දිතයින් සහ වෙනත් අපචාරවලට ගොදුරු වූ ළමා වින්දිතයන් හඳුනා ගැනීම** | 8 | **දෙමුහුන්** | |
| 3.1 ශ්‍රී ලංකාවේ ළමා වෙළෙඳාම සහ අනෙකුත් ළමා අපචාර අතර සම්බන්ධය<br>3.2 ළමා වෙළෙඳාමේ වින්දිතයින් හඳුනාගැනීමේ වැදගත්කම | 2.5 | පළමු කණ්ඩායම<br>2024 ජුලි 29<br>පෙ.ව: 10.00 - ප.ව: 12.30<br><br>දෙවන කණ්ඩායම<br>2024 ජුලි 30<br>පෙ.ව: 10.00 - ප.ව: 12.30<br><br>තෙවන කණ්ඩායම<br>2024 ජුලි 31<br>පෙ.ව: 10.00 - ප.ව: 12.30<br><br>සිව්වන කණ්ඩායම<br>2024 ජුලි 29<br>පෙ.ව: 10.00 - ප.ව: 12.30 | මාර්ගගත |
| 3.3 වින්දිතයින් හඳුනාගැනීමේ ක්‍රියාවලිය<br>3.4 ළමා වෙළෙඳාමේ විභව වින්දිතයන් හඳුනා ගැනීමට උපකාර වන පරීක්ෂණ දර්ශක සහ මූලික පරීක්ෂණ මෙවලම් | 2.5 | පළමු කණ්ඩායම<br>2024 අගෝස්තු 05<br>පෙ.ව: 10.00 - ප.ව: 12.30<br><br>දෙවන කණ්ඩායම<br>2024 අගෝස්තු 06<br>පෙ.ව: 10.00 - ප.ව: 12.30<br><br>තෙවන කණ්ඩායම<br>2024 අගෝස්තු 07<br>පෙ.ව: 10.00 - ප.ව: 12.30<br><br>සිව්වන කණ්ඩායම<br>2024 අගෝස්තු 05<br>පෙ.ව: 10.00 - ප.ව: 12.30 | මාර්ගගත |
| 3.5 ළමා වෙළෙඳාමේ වින්දිතයන් සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීමේදී සැලකිලිමත් විය යුතු මූලික මූලධර්ම<br>3.6 ළමා - සංවේදී සන්නිවේදනය | 3 | පළමු කණ්ඩායම<br>2024 අගෝස්තු 17<br>පෙ.ව: 10.00 - ප.ව: 1.00<br><br>දෙවන කණ්ඩායම<br>2024 අගෝස්තු 17<br>පෙ.ව: 10.00 - ප.ව: 1.00<br><br>තෙවන කණ්ඩායම<br>2024 අගෝස්තු 17<br>ප.ව: 12.30 - ප.ව: 3.30<br><br>සිව්වන කණ්ඩායම<br>2024 අගෝස්තු 17<br>ප.ව: 12.30 - ප.ව: 3.30 | දේශන ශාලාව තුළ |

| | | | |
|---|---|---|---|
| **4. ළමා වෙළෙඳාමේ වින්දිතයින් සහ වෙනත් ආකාරයේ අපචාරවලට ගොදුරු වූ ළමා වින්දිතයන් සම්බන්ධ රැකවරණ අවශ්‍යතා** | 8 | **දෙමුහුන්** | |
| 4.1 ජාවාරම් සහ වෙනත් අපයෝජනයන්ට ගොදුරු වූ දරුවන්ගේ රැකවරණ අවශ්‍යතා සපුරාලීමේ වැදගත්කම පිළිබඳ හැඳින්වීම<br>4.2 සත්කාර අවශ්‍යතා සඳහා අත්‍යවශ්‍ය කුසලතා හඳුනා ගැනීම සහ පුහුණු කිරීම | 4 | පළමු කණ්ඩායම<br>2024 අගෝස්තු 19<br>පෙ:ව: 9.00 - ප:ව: 1.00<br>දෙවන කණ්ඩායම<br>2024 අගෝස්තු 20<br>පෙ:ව: 9.00 - ප:ව: 1.00<br>තෙවන කණ්ඩායම<br>2024 අගෝස්තු 21<br>ප:ව: 12.00 - ප:ව: 4.00<br>සිව්වන කණ්ඩායම<br>2024 අගෝස්තු 19<br>ප:ව: 12.00 - ප:ව: 4.00 | මාර්ගගත |
| 4.3 ළමා වෙළෙඳාමේ වින්දිතයින් තුළ පවතින මානසික සෞඛ්‍ය ගැටලු පිළිබඳ සංඥා සහ දර්ශක හඳුනා ගැනීම සහ ඔවුන් අපකීර්තියට පත් කිරීම හෝ ලේබල් කිරීම තුරන් කිරීමේ වැදගත්කම<br>4.4. ළමා වින්දිතයින් විශේෂඥයකු වෙත යොමු කිරීමේ ක්‍රියා පටිපාටි සහ මාර්ගෝපදේශ - ආරක්ෂිත යොමු කිරීම | 4 | පළමු කණ්ඩායම<br>2024 අගෝස්තු 26<br>පෙ:ව: 9.00 - ප:ව: 1.00<br>දෙවන කණ්ඩායම<br>2024 අගෝස්තු 27<br>පෙ:ව: 9.00 - ප:ව: 1.00<br>තෙවන කණ්ඩායම<br>2024 අගෝස්තු 28<br>පෙ:ව: 9.00 - ප:ව: 1.00<br>සිව්වන කණ්ඩායම<br>2024 අගෝස්තු 26<br>පෙ:ව: 9.00 - ප:ව: 1.00 | මාර්ගගත |
| **5. ළමා වෙළෙඳාමේ වින්දිතයින්ගේ අභියෝගාත්මක හැසිරීම් සහ අවදානම් කළමනාකරණය කිරීම** | 8 | **දෙමුහුන්** | |
| 5.1 අභියෝගාත්මක හැසිරීම් පිළිබඳ හැඟීමක් ඇති කිරීම<br>5.2 අභියෝගාත්මක හැසිරීම් වල ක්‍රියාකාරී අරමුණ<br>5.3 මූලික තක්සේරු කුසලතා | 4 | පළමු කණ්ඩායම<br>2024 සැප්තැම්බර් 02<br>පෙ:ව: 9.00 - ප:ව: 1.00<br>දෙවන කණ්ඩායම<br>2024 සැප්තැම්බර් 03<br>පෙ:ව: 9.00 - ප:ව: 1.00<br>තෙවන කණ්ඩායම<br>2024 සැප්තැම්බර් 04<br>ප:ව: 12.00 - ප:ව: 4.00<br>සිව්වන කණ්ඩායම<br>2024 සැප්තැම්බර් 02<br>ප:ව: 12.00 - ප:ව: 4.00 | මාර්ගගත |
| 5.4 වර්ධනය අඩු කිරීම<br>5.5 අමතර හෝ විශේෂඥ සහාය සඳහා යොමු කිරීම අවශ්‍ය වන විපතට පත් දරුවන් හඳුනා ගන්න<br>5.6 අවදානම් අවම කිරීමට සහ හානි අවම කිරීම ප්‍රවර්ධනය කිරීමට උපාය මාර්ග හඳුන්වා දීම | 4 | පළමු කණ්ඩායම<br>2024 සැප්තැම්බර් 13<br>පෙ:ව: 10.00 - ප:ව: 12.00<br>දෙවන කණ්ඩායම<br>2024 සැප්තැම්බර් 13<br>පෙ:ව: 10.00 - ප:ව: 12.00<br>තෙවන කණ්ඩායම<br>2024 සැප්තැම්බර් 13<br>ප:ව: 1.00 - ප:ව: 4.00<br>සිව්වන කණ්ඩායම<br>2024 සැප්තැම්බර් 13<br>ප:ව: 1.00 - ප:ව: 4.00 | දේශන ශාලාව තුළ |
| **6. ළමා ආරක්ෂණ සිද්ධි කළමනාකරණය සහ වාර්තා තබා ගැනීම සඳහා සහාය වීම** | 8 | **දෙමුහුන්** | |
| 6.1 ළමා ආරක්ෂණ සිද්ධි කළමනාකරණය යනු කුමක්ද?<br>6.2 ළමා ආරක්ෂණ සිද්ධි කළමනාකරණය යනු කුමක්ද? | 2.5 | පළමු කණ්ඩායම<br>2024 සැප්තැම්බර් 16<br>පෙ:ව: 10.00 - ප:ව: 12.30<br>දෙවන කණ්ඩායම<br>2024 සැප්තැම්බර් 17<br>පෙ:ව: 10.00 - ප:ව: 12.30 | මාර්ගගත |

| | | | |
|---|---|---|---|
| | | තෙවන කණ්ඩායම<br>2024 සැප්තැම්බර් 18<br>ප:ව: 12.30 - ප:ව: 4.00 | |
| | | සිව්වන කණ්ඩායම<br>2024 සැප්තැම්බර් 16<br>ප:ව: 12.30 - ප:ව: 4.00 | |
| 6.3 සිද්ධි කළමනාකරණය සඳහා මාර්ගෝපදේශ මූලධර්ම<br>6.4 ළමා ආරක්ෂණ සිද්ධි කළමනාකරණ ක්‍රියාවලිය - හැඳින්වීමක් | 2.5 | පළමු කණ්ඩායම<br>2024 සැප්තැම්බර් 23<br>පෙ:ව: 10.00 - ප:ව: 12.30 | මාර්ගගත |
| | | දෙවන කණ්ඩායම<br>2024 සැප්තැම්බර් 24<br>පෙ:ව: 10.00 - ප:ව: 12.30 | |
| | | තෙවන කණ්ඩායම<br>2024 සැප්තැම්බර් 25<br>පෙ:ව: 10.00 - ප:ව: 12.30 | |
| | | සිව්වන කණ්ඩායම<br>2024 සැප්තැම්බර් 23<br>පෙ:ව: 10.00 - ප:ව: 12.30 | |
| 6.5 ලේඛනගත කිරීම සහ වාර්තා තබා ගැනීම<br>6.6 ළමා ආරක්ෂණ සිද්ධි කළමනාකරණයේදී ආයතනික සුරැකුම් කාර්ය මණ්ඩලයේ කාර්යභාරය සහ වගකීම් | 3 | පළමු කණ්ඩායම<br>2024 සැප්තැම්බර් 30<br>පෙ:ව: 10.00 - ප:ව: 1.00 | දේශන ශාලාව තුළ |
| | | දෙවන කණ්ඩායම<br>2024 ඔක්තෝබර් 02<br>පෙ:ව: 10.00 - ප:ව: 1.00 | |
| | | තෙවන කණ්ඩායම<br>2024 ඔක්තෝබර් 03<br>ප:ව: 12.30 - ප:ව: 3.30 | |
| | | සිව්වන කණ්ඩායම<br>2024 සැප්තැම්බර් 30<br>ප:ව: 12.30 - ප:ව: 3.30 | |
| **7. පුද්ගල රැකවරණ සැලැස්ම සහ නැවත සමාජගත කිරීම** | 8 | **දෙමුහුන්** | |
| 7.2 සිද්ධි කළමනාකරණ ක්‍රියාවලියේදී CDC කාර්ය මණ්ඩලය විසින් ඉටු කරන ලද කාර්යභාරය පිළිබඳව සමීපම විමසා බැලීම | 3 | පළමු කණ්ඩායම<br>2024 ඔක්තෝබර් 12<br>පෙ:ව: 10.00 - ප:ව: 1.00 | දේශන ශාලාව තුළ |
| | | දෙවන කණ්ඩායම<br>2024 ඔක්තෝබර් 12<br>පෙ:ව: 10.00 - ප:ව: 1.00 | |
| | | තෙවන කණ්ඩායම<br>2024 ඔක්තෝබර් 13<br>ප:ව: 12.30 - ප:ව: 3.30 | |
| | | සිව්වන කණ්ඩායම<br>2024 ඔක්තෝබර් 12<br>ප:ව: 12.30 - ප:ව: 3.30 | |
| 7.1 සිද්ධි කළමනාකරණය පිළිබඳ සංකල්පය සහ ඒ ආශ්‍රිත අවධීන් හැඳින්වීම | 2.5 | පළමු කණ්ඩායම<br>2024 ඔක්තෝබර් 14<br>පෙ:ව: 10.00 - ප:ව: 12.30 | මාර්ගගත |
| | | දෙවන කණ්ඩායම<br>2024 ඔක්තෝබර් 15<br>පෙ:ව: 10.00 - ප:ව: 12.30 | |
| | | තෙවන කණ්ඩායම<br>2024 ඔක්තෝබර් 16<br>පෙ:ව: 10.00 - ප:ව: 12.30 | |
| | | සිව්වන කණ්ඩායම<br>2024 ඔක්තෝබර් 15<br>පෙ:ව: 10.00 - ප:ව: 12.30 | |
| 7.3 CVoT නැවත සමාජගත කිරීම | 2.5 | පළමු කණ්ඩායම<br>2024 ඔක්තෝබර් 21<br>පෙ:ව: 10.00 - ප:ව: 12.30 | මාර්ගගත |

| | | | |
|---|---|---|---|
| | | දෙවන කණ්ඩායම<br>2024 ඔක්තෝබර් 22<br>පෙ:ව: 10.00 - ප:ව: 12.30<br>තෙවන කණ්ඩායම<br>2024 ඔක්තෝබර් 23<br>පෙ:ව: 10.00 - ප:ව: 12.30<br>සිව්වන කණ්ඩායම<br>2024 ඔක්තෝබර් 21<br>පෙ:ව: 10.00 - ප:ව: 12.30 | |
| **8. ස්වයං රැකවරණය සහ රැකවරණ සපයන්නාගේ ආතති කළමනාකරණය** | 8 | **දෙමුහුන්** | |
| 8.1 ස්වයං රැකවරණය පිළිබඳ හැඳින්වීම සහ ස්වයං රැකවරණයේ වැදගත්කම<br>8.2 කායිකව හෝ මානසිකව විඩාවට පත් වීම සහ එහි ලක්ෂණ නිර්වචනය කිරීම | 3 | පළමු කණ්ඩායම<br>2024 නොවැම්බර් 02<br>පෙ:ව: 10.00 - ප:ව: 1.00<br>දෙවන කණ්ඩායම<br>2024 නොවැම්බර් 02<br>පෙ:ව: 10.00 - ප:ව: 1.00<br>තෙවන කණ්ඩායම<br>2024 නොවැම්බර් 02<br>ප:ව: 1.00 - ප:ව: 4.00<br>සිව්වන කණ්ඩායම<br>2024 නොවැම්බර් 02<br>ප:ව: 1.00 - ප:ව: 4.00 | දේශන ශාලාව තුළ |
| 8.3 යහපැවැත්ම නිර්වචනය කිරීම<br>8.4 ඔරොත්තු දීමේ හැකියාව අවබෝධ කර ගැනීම සහ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා උපාය මාර්ග සංවර්ධනය කිරීම<br>8.5 ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා අවස්ථා හඳුනා ගැනීමට සහ පුද්ගලාරෝපිත ස්වයං රැකවරණ දින චර්යාවක් වර්ධනය කිරීම සඳහා රැකබලා ගන්නන්ගේ සතිපතා චර්යාවන් පරීක්ෂා කිරීම | 3 | පළමු කණ්ඩායම<br>2024 නොවැම්බර් 04<br>පෙ:ව: 10.00 - ප:ව: 1.00<br>දෙවන කණ්ඩායම<br>2024 නොවැම්බර් 05<br>පෙ:ව: 10.00 - ප:ව: 1.00<br>තෙවන කණ්ඩායම<br>2024 නොවැම්බර් 06<br>පෙ:ව: 10.00 - ප:ව: 1.00<br>සිව්වන කණ්ඩායම<br>2024 නොවැම්බර් 04<br>පෙ:ව: 10.00 - ප:ව: 1.00 | මාර්ගගත |
| 8.6 පරාවර්තක පුහුණු අභ්‍යාස - ගිබ්ස්ගේ පරාවර්තක චක්‍රය | 2 | පළමු කණ්ඩායම<br>2024 නොවැම්බර් 11<br>පෙ:ව: 10.00 - ප:ව: 12.00<br>දෙවන කණ්ඩායම<br>2024 නොවැම්බර් 12<br>පෙ:ව: 10.00 - ප:ව: 12.00<br>තෙවන කණ්ඩායම<br>2024 නොවැම්බර් 13<br>පෙ:ව: 10.00 - ප:ව: 12.00<br>සිව්වන කණ්ඩායම<br>2024 නොවැම්බර් 11<br>පෙ:ව: 10.00 - ප:ව: 12.00 | මාර්ගගත |
| | | | |
| **එකතුව (දේශන පැය 60)** | මාර්ගගත : පැය 36<br>දේශන ශාලාව තුළ : පැය 24 | මාර්ගගත : 60%; දේශන ශාලාව තුළ : 40% | |

## 6. පාඨමාලා මාර්ගෝපදේශ

### I කොටස - ඇතුලත්වීමේ සුදුසුකම් සහ පාඨමාලා විස්තර

1. ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව (SLQF) අනුව ඔහු/ඇය පහත සඳහන් සුදුසුකම් සපුරා තිබේ නම් මිස, (මානව හිමිකම් පදනම් කරගත් CVoT සිද්ධි කළමනාකරණය සහ රැකවරණය සඳහා ප්‍රවේශය) පාඨමාලාවට ඇතුළත් වීම සඳහා කිසිදු අපේක්ෂකයෙකු සලකා බලනු නොලැබේ.
    a) අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ (සාමාන්‍ය පෙළ) හෝ ඊට සමාන සුදුසුකමක්, හෝ
    b) NVQF 3 වන මට්ටම සම්පූර්ණ කර තිබීම
    සහ
    c) CSHR හි අධ්‍යයන කමිටුව විසින් පිළිගත් සහ නීති පීඨයේ පීඨ මණ්ඩලය විසින් අනුමත කරන ලද වෙනත් අදාළ සුදුසුකම් සහ/හෝ අත්දැකීම්
    සහ
    d) පාඨමාලාව පවත්වනු ලබන භාෂාව පිළිබඳ හොඳ වැඩ දැනුමක්

2. **පාඨමාලා ව්‍යුහය සහ අන්තර්ගතය**
    a) **ව්‍යුහය:** මෙම පාඨමාලාව **ශ්‍රී ලංකා සුදුසුකම් රාමු මට්ටම 2** (SLQF 2) හි සම්මාන වටිනාකම් පද්ධතිය මත පදනම්ව නිර්මාණය කර ඇති අතර එමගින් අපේක්ෂකයෙකුට **මාස හයක (06)** කාල සීමාවක් තුළ **අධ්‍යයන සම්භාර 15ක්** උපයා ගැනීමට ඉඩ සලසයි.
    b) **පාඨමාලා අන්තර්ගතය:** මෙම පාඨමාලාව ළමා වෙළෙඳාමේ වින්දිතයින් කළමනාකරණය සහ රැකවරණය (CVoT) පිළිබඳ හැඳින්වීමකි. එය අදාළ ක්ෂේත්‍රවල මූලික කරුණු කෙරෙහි අවධානය යොමු කරයි, විශේෂයෙන් ළමා අයිතිවාසිකම්, නීතිමය රාමුව, ළමා අපයෝජන, ළමා ආරක්ෂණය, රැකවරණ සැලැස්ම, ආතතිය කළමනාකරණය, CVoT අවබෝධ කර ගැනීම, CVoT හි සත්කාර අවශ්‍යතා, නඩු කළමනාකරණය සහ වාර්තා තබා ගැනීම යනාදී කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කරයි.

3. **පාඨමාලා කාලසීමාව**

    මාස හයයි (06)

4. **ඉගැන්වීම් මාධ්‍ය සහ ඇගයීම් ක්‍රමවේදය**

    මෙම පාඨමාලාව **සිංහල** සහ **දෙමළ** භාෂාවලින් පැවැත්වේ. පාඨමාලාව පවත්වන භාෂාවෙන් දේශන සහ අදාළ කියවීම්, ලිවීමට සහ තේරුම් ගැනීමට අපේක්ෂකයින්ට හැකියාව තිබිය යුතුය.

5. **සම්පත්දායකයින්**

    සම්පත්දායක සංචිතය නීති පීඨයේ කථිකාචාර්යවරුන්, ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් වන විද්වතුන් සහ වෘත්තිකයන්ගෙන් සමන්විත වේ.

6. **ඉගැන්වීමේ සහ ඉගෙනීමේ ක්‍රමය**

සහභාගිවන්නන් කේන්ද්‍ර කරගත් ඉගැන්වීම් සහ ඉගෙනුම් ක්‍රම අනුගමනය කරනු ඇත. කේන්ද්‍රය විසින් පවත්වනු ලබන දේශන/සාකච්ඡා සහ වෙනත් ආකාරයේ පහසු උපදෙස් සඳහා සිසුන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය අපේක්ෂා කෙරේ. පාඨමාලාවෙන් 60% ක් මාර්ගගතව බෙදාහරින අතර 40% ක් කොළඹ විශ්වවිද්‍යාලයේ දේශනශාලා තුළ පැවැත්වේ. පාඨමාලාව අවසන් කිරීමට අවශ්‍ය ඇගයීම් වෙනුවෙන් සුදුසුකම් ලැබීම සඳහා පැමිණීම 80% ක ප්‍රතිශතයක් පැවතීම අනිවාර්ය වේ. පාඨමාලාව හදාරන සිසුන්, CSHR සම්පත් මධ්‍යස්ථානය (CSHR පුස්තකාලය) වෙත නොමිලේ ප්‍රවේශ වීමට සහ CSHR සම්පත් මධ්‍යස්ථානය විසින් කළමනාකරණය කරනු ලබන විවෘත ප්‍රවේශ ඊ-සම්පත්වල ඇති තොරතුරු පරිහරණය කිරීම සඳහා සුදුසුකම් ලබයි.

## II කොටස
## ඇගයීම් පටිපාටිය සහ ගෞරව, කුසලතා, නිර්දේශ සහ අසමත් සාමාර්ථ ලබාදීමේ නිර්ණායක

7. CSHR විසින් (මානව හිමිකම් පදනම් කරගත් CVoT සිද්ධි කළමනාකරණය සහ රැකවරණය සඳහා ප්‍රවේශය) ප්‍රදානය කිරීමට අදාළ අධ්‍යයන වර්ෂයේ මධ්‍ය සහ අවසාන ඇගයීම් පැවැත්වීම සහ තක්සේරු කිරීම සඳහා පරීක්ෂකයෙකු / පරීක්ෂක මණ්ඩලයක් පත් කෙරේ.

8. ඇගයීම් ක්‍රමවේදය

පාඨමාලාවේ උපරිම ලකුණු ප්‍රමාණය ලකුණු 100 ක් තිබිය යුතුය. ඇගයීම සංරචක දෙකකින් සමන්විත වේ. පාඨමාලාව සඳහා අපේක්ෂකයෙකුගේ කාර්ය සාධනය ඇගයීම, තනි පුද්ගල ඉදිරිපත් කිරීමක් සහ ස්වාධීන පැවරුමක් සඳහා ලකුණු වෙන් කිරීම මගින් සිදු කෙරේ. සහභාගිවන්නන් දේශන පැමිණීමෙන් 80% ක් සමග එක් එක් සංරචක සඳහා 50% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

9. CSHR විසින් පත් කරන ලද උපදේශකයෙකු විසින් තනි ඉදිරිපත් කිරීම් සහ ස්වාධීන පැවරුම යන ද්විත්වයම ඇගයීමට ලක් කෙරේ.

10.

10.1 අපේක්ෂකයෙකු පළමු මාස තුන අවසානයේ තනි පුද්ගල ඉදිරිපත් කිරීමක් සිදු කළ යුතු අතර දේශන සහ වෙනත් ආකාරයේ උපදෙස් සම්පූර්ණ කිරීමෙන් පසු පාඨමාලාව අවසානයේ ස්වාධීන පැවරුම ඉදිරිපත් කළ යුතුය.

10.2 පාඨමාලා ගාස්තුව පරිත්‍යාගශීලීන්ගේ අරමුදල් සහිත වැඩසටහනක් වන බැවින්, එක උත්සාහයකින් පාඨමාලාව සම්පූර්ණ කිරීම අත්‍යවශ්‍ය වේ. කෙසේ වෙතත්, පාඨමාලා අවසානයේ ඇගයීම් සංරචක වලට සහභාගී වීමට අපොහොසත් වන ඕනෑම අපේක්ෂකයෙකුට, CSHR විසින් විකල්ප අවස්ථාවක් ලබා දෙනු ඇත. මේ සඳහා CSHR අධ්‍යයන කමිටුවේ ලිඛිත අනුමැතිය ලබා ගැනීමට යටත්ව, වෛද්‍ය හේතු මත පදනම් වූ හෝ එම කමිටුව සහ පීඨ මණ්ඩලය විසින් පිළිගත හැකි යැයි සොයා ගන්නා වෙනත් හේතු ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ. පාඨමාලාව අධ්‍යයන වර්ෂය තුළ සම්පූර්ණ කළ යුතුය.

10.3 පුද්ගලයෙකු අධ්‍යයන වාරය ආරම්භයේ සිටම ඔහු/ඇය (මානව හිමිකම් පදනම් කරගත් CVoT සිද්ධි කළමනාකරණය සහ රැකවරණය සඳහා ප්‍රවේශය) අපේක්ෂකයෙකු ලෙස නිසි ලෙස ලියාපදිංචි වී නොමැති නම් ඇගයීම් සංරචක ඉදිරිපත් කිරීමට අවසර ලබා නොදේ.

10.4 1986 අංක 1 දරන විභාග ක්‍රියාපටිපාටියේ දැක්වෙන, වැරදි සහ දඬුවම් මෙන්ම විභාග රෙගුලාසි

වල අඩංගු විභාග සහ ඇගයුම්වලට අදාළ සියලුම නීතිරීති සහ එහි පසුකාලීන සංශෝධන සියල්ල (මානව හිමිකම් පදනම් කරගත් CVoT සිද්ධි කළමනාකරණය සහ රැකවරණය සඳහා ප්‍රවේශය) පාඨමාලාව සඳහා අදාළ වේ.

10.5 ඇගයීම් සම්බන්ධ ඕනෑම කරුණක් CSHR විසින් තීරණය කරනු ලැබේ.

11. අපේක්ෂකයෙකු සම්පූර්ණ ලකුණු ප්‍රමාණයෙන් අවම වශයෙන් 50% ක් ලබා ගන්නේ නම්, ඔහු/ඇය (මානව හිමිකම් පදනම් කරගත් CVoT සිද්ධි කළමනාකරණය සහ රැකවරණය සඳහා ප්‍රවේශය) ප්‍රදානය කිරීමට පවත්වන ලබන ඇගයිමේ දී සාර්ථක වූ බව සලකනු ලැබේ.

12. (මානව හිමිකම් පදනම් කරගත් CVoT සිද්ධි කළමනාකරණය සහ රැකවරණය සඳහා ප්‍රවේශය) ප්‍රදානය කිරීමේදී ලියාපදිංචි කිරීමේ පළමු කාලය තුළ ලබාදෙන ඇගයීම් සඳහා කිසියම් අපේක්ෂකයෙකු, මුළු ලකුණුවලින් 75% ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ලබාගෙන ඇත්නම් ඇය/ඔහු සඳහා විශිෂ්ට සාමාර්ථයක් පිරිනැමිය හැකිය.

13. (මානව හිමිකම් පදනම් කරගත් CVoT සිද්ධි කළමනාකරණය සහ රැකවරණය සඳහා ප්‍රවේශය) ප්‍රදානය කිරීමේදී ලියාපදිංචි කිරීමේ පළමු කාලය තුළ ලබාදෙන ඇගයීම් සඳහා කිසියම් අපේක්ෂකයෙකු, මුළු ලකුණුවලින් 65% - 74% ලබාගෙන ඇත්නම් ඇය/ඔහු සඳහා කුසලතා සාමාර්ථයක් පිරිනැමිය හැකිය.

14. (මානව හිමිකම් පදනම් කරගත් CVoT සිද්ධි කළමනාකරණය සහ රැකවරණය සඳහා ප්‍රවේශය) ප්‍රදානය කිරීමේදී ලියාපදිංචි කිරීමේ පළමු කාලය තුළ ලබාදෙන ඇගයීම් සඳහා කිසියම් අපේක්ෂකයෙකු, මුළු ලකුණුවලින් 50% - 64% ලබාගෙන ඇත්නම් ඇය/ඔහු සඳහා සාමාන්‍ය සාමාර්ථයක් පිරිනැමිය හැකිය.

15. 12 වගන්තියේ සපයා ඇති කොන්දේසි සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයෙකු ඇගයීම අසමත් වූවා සේ සලකනු ලැබේ.

16. ඇගයීමේදී අසාර්ථක වූ අපේක්ෂකයෙකු ඊළඟ අපේක්ෂක කණ්ඩායම සමඟ ඇගයීම් සංරචක/ය ඉදිරිපත් කළ යුතුය.

17. සමත් වූ අපේක්ෂකයින් (මානව හිමිකම් පදනම් කරගත් CVoT සිද්ධි කළමනාකරණය සහ රැකවරණය සඳහා ප්‍රවේශය) සහ අසම්පූර්ණ ප්‍රතිඵල ඇති අපේක්ෂකයින් (මානව හිමිකම් පදනම් කරගත් CVoT සිද්ධි කළමනාකරණය සහ රැකවරණය සඳහා ප්‍රවේශය) CSHR විසින් නිවේදනය කරනු ලැබේ.

## III කොටස - විවිධ

18. පාඨමාලාව සඳහා ගාස්තු (මානව හිමිකම් පදනම් කරගත් CVoT සිද්ධි කළමනාකරණය සහ රැකවරණය සඳහා ප්‍රවේශය) 2024. මෙම පාඨමාලාව වසරක් සඳහා අරමුදල් සපයන වැඩසටහනක් යටතේ පවත්වනු ලබන බැවින් පාඨමාලා ගාස්තුවක් ගෙවීම අවශ්‍ය නොවේ.

19. **අයදුම් කිරීමේ ක්‍රියාවලිය**

DPCCS විසින් එහි අදාළ කාර්ය මණ්ඩලයෙන් අයදුම්පත් කැඳවනු ලබන අතර, සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර සමඟ තෝරාගත් අයදුම්කරුවන්ගේ ලැයිස්තුවක් CSHR හි අධ්‍යක්ෂ වෙත ලබා දෙනු ඇත.

## 7. ඇගයීම් කාලසටහන

| ඇගයීම | දිනයන්* |
|---|---|
| **1. ස්වාධීන පැවරුම** | **2024 අගෝස්තු 15** |
| සූදානම් වීම සඳහා කාලය | 2024 අගෝස්තු 15 - 2024 සැප්තැම්බර් 04 |
| භාරදීම සඳහා වන අවසාන දිනය | 2024 සැප්තැම්බර් 05 |
| **2. ස්වාධීන ඉදිරිපත් කිරීම** | **2024 ඔක්තෝබර් 10** |
| සූදානම් වීම සඳහා කාලය | 2024 ඔක්තෝබර් 10 - 2024 ඔක්තෝබර් 25 |
| ඉදිරිපත් කිරීම | 2024 ඔක්තෝබර් 26 (පළමු කාණ්ඩයම) |
| | 2024 ඔක්තෝබර් 27 (දෙවන කණ්ඩායම) |

*** මෙම දිනයන් තාවකාලික වන අතර, නොවැළැක්විය හැකි හේතුන් මත ඕනෑම අවස්ථාවකදී මෙම දිනයන් වෙනස් වීමට යටත් වන බව කරුණාවෙන් සලකන්න.**

## 8. ස්වාධීන පැවරුම

මෙම ලේඛනය ඔබගේ ස්වාධීන පැවරුම සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ආරක්ෂා කිරීමේදී ඔබට මග පෙන්වනු ඇත. කාලසීමාවන් සහ ඉදිරිපත් කිරීමේ ක්‍රියා පටිපාටි වැනි තොරතුරු එහි අඩංගු වේ.

### ස්වාධීන පැවරුම සඳහා මාර්ගෝපදේශ

1. මුල් පිටුවෙහි පහත තොරතුරු ඇතුළත් විය යුතුය (ඇමුණුම 01 බලන්න)

   - මුලකුරු සහිත නම (සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවෙන්)
   - ලියාපදිංචි අංකය

2. පැවරුමේ වචන සීමාව 1500 වන අතර, පාද සටහන් සහ ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය එයට ඇතුළත් නොවේ.

3. මෙම ලේඛනය සඳහා භාවිතා කරන අකුරු වර්ගය, ප්‍රමාණය සහ රේඛා පරතරය පහත පරිදි විය යුතුය:

   අකුරු ප්‍රමාණය - 12

   රේඛා පරතරය - 1.5

   අකුරු වර්ගය - ඉස්කෝල පොත (සිංහල)

   භාමිණි/කලහම් (දෙමළ)

5. පැවරුම ඉදිරිපත් කිරීමේ අවසාන දිනය:

6. රචනා සොරකම යනු බරපතල ශාස්ත්‍රීය විෂමාචාරයකි. සොරකම් කිරීමේ සිද්ධීන් හමු වුවහොත් ඊට එරෙහිව අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ.

7. ඔබගේ පැවරුම ඉහත සඳහන් මාතෘකා මත පදනම් විය යුතුය.

8. ඔබගේ ඉදිරිපත් කිරීමෙහි දෘඩ පිටපතක් පහත ලිපිනයට ඉදිරිපත් කරන්න

අධ්‍යක්ෂක,<br>
මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය<br>
නීති පීඨය<br>
කොළඹ විශ්වවිද්‍යාලය<br>
අංක 94,<br>
කුමාරතුංග මුනිදාස මාවත,<br>
කොළඹ 03.

# 9. ස්වාධීන ඉදිරිපත් කිරීම

මෙම ලේඛනය ඔබගේ ස්වාධීන ඉදිරිපත් කිරීම සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ආරක්ෂා කිරීමේදී ඔබට මග පෙන්වනු ඇත. කාලසීමාවන් සහ ඉදිරිපත් කිරීමේ ක්‍රියා පටිපාටි වැනි තොරතුරු එහි අඩංගු වේ.

## ස්වාධීන ඉදිරිපත් කිරීම සඳහා මාර්ගෝපදේශ

දිනය :

වේලාව :

1.ස්වාධීන ඉදිරිපත් කිරීම කොළඹ විශ්වවිද්‍යාලය තුළ පැවැත්වේ.

2.ඔබගේ පැවරුම ඉහත සඳහන් මාතෘකා මත පදනම් විය යුතුය.

3.ඉදිරිපත් කිරීම සඳහා කාලය - විනාඩි 15

4.ඔබ කැමති ඕනෑම මාධ්‍යයක් යොදා ගනිමින් මෙම ඉදිරිපත් කිරීම සිදුකල හැක.

උදා: 1. Power point

2. බ්‍රිස්ටල් බෝඩ් හෝ Flip Chart යොදා ගැනීම

3. අත්පත්‍රිකා/දැන්වීම්

4. පින්තූර රාමු

(Power point යොදාගන්නේ නම්)

අකුරු වර්ගය - ඉස්කෝල පොත

අකුරු ප්‍රමාණය - 28

රේඛා පරතරය - 1.5

Slides 10 ට වඩා වැඩි නොවිය යුතුය.

5.කරුණාකර ඔබේ ඉදිරිපත් කිරීමේදී ලියාපදිංචි අංකය සහ මුලකුරු සමඟ ඔබේ නම පැහැදිලිව සඳහන් කරන්න.

6.සිසුන් ඉදිරිපත් කිරීම PowerPoint ආකෘතියෙන් සිදු කරන්නේ නම් ඊට පෙර තම ඉදිරිපත් කිරීම PDF ආකෘතියෙන් සම්බන්ධීකාරක dhayalini@cshr.cmb.ac.lk වෙත විද්‍යුත් තැපෑලෙන් එවිය යුතුය.

7.පෙළ හෝ ලේඛනවල ඡේද (උපග්‍රන්ථ) ඉදිරිපත් කිරීමේදී යොමු ලෙස භාවිතා කරනනේ නම් , එහි මූලාශ්‍රය දැක්විය යුතුය.

8.රචනා සොරකම යනු බරපතල ශාස්ත්‍රීය විෂමාචාරයකි. සොරකම් කිරීමේ සිද්ධීන් හමු වුවහොත් ඊට එරෙහිව අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ.

9.ඔබ කුමන මාධ්‍යයක් යොදා ගනිමින් ඉදිරිපත් කිරීම සිදු කරන්නේ ද යන්න පිළිබඳ දින 07 කට පෙර සම්බන්ධීකාරකව දැනුවත් කළ යුතුය. ඉදිරිපත් කිරීම සඳහා නියමිත දිනයට දින දෙකකට පෙර ඔබගේ Power Point pdf. අපවෙත එවන්න.

## 10. ප්‍රවර්ධන මාර්ගෝපදේශ

මෙම පාඨමාලාවේ මාර්ගගත හා ස්ථානීය දේශන යන දෙයාකාරයටම පවතී. පාඨමාලාවෙන් අඩකට වඩා මාර්ගගත වනු ඇත. මාර්ගගත දේශන සතියේ දිනවල උදෑසන මසකට තෙවරක් පැවැත්වෙන අතර සති අන්තයේ මසකට වරක් කොළඹ දී ස්ථානීය දේශන පැවැත්වේ. සහභාගී වන්නන් මාස හයක කාලය තුල මසකට එක්වර බැගින් කොළඹ විශ්වවිද්‍යාලය වෙත පැමිණිය යුතුය. කොළඹ විශ්වවිද්‍යාලයේ දේශන පවත්වන විට විශ්වවිද්‍යාලය විසින් ඔබට ප්‍රවාහන වියදම් හා දිවා ආහාරය සපයන අතර දේශන මාර්ගගතව පවත්වන විට අන්තර්ජාල වියදම් සපයනු ලැබේ. මෙම ලොජිස්ටික් මාර්ගෝපදේශය ඔබට ප්‍රවාහනය, දිවා ආහාරය හා අන්තර්ජාල වියදම් සඳහා හිමිකම් පෑමට උපකාරී වනු ඇත.

### 01. ප්‍රවාහන වියදම් ඉල්ලුම් කරන්නේ කෙසේද?

අ). සුදුසුකම් නිර්ණායක

- ළමා වෙළෙඳාම පිළිබඳ පාඨමාලාව සඳහා නිල වශයෙන් ලියාපදිංචි වී සිටින රාජ්‍ය ආයතනවලට අයත් පුද්ගලයන් ප්‍රවාහන වියදම් සඳහා සුදුසුකම් ලබයි.
- ප්‍රවාහන වියදම සඳහා සුදුසුකම් ලැබීමට නම් සහභාගී වන්නන් කොළඹ නම් කරන ලද ප්‍රදේශවල සිට පාඨමාලාවට සහභාගි විය යුතුය.

ආ ). ආපසු ගෙවීම් අනුපාතය

- සහභාගී වන්නන් ආපසු ගමන් කරන දුර මත පදනම්ව ආපසු ගෙවීමේ අනුපාත තීරණය කරනු ලැබේ.
- අදාල ගණනය කිරීමත් සමග CSHR විසින් කිලෝමීටරයකට කලින් තීරණය කල අනුපතයක් ස්ථාපිත කෙරෙයි.
- CSHR විසින් ගණනය කල දුර සහ අනුමත අනුපාත මත පදනම්ව එක් එක් සහභාගී වන්නන්ට ප්‍රතිපූරණ මුදල වෙන් කරනු ඇත. දේශන සඳහා සහභාගී විය යුතුය.

ඇ).ගෙවීම් ක්‍රියාවලිය

- CSHR විසින් ස්ථානීය සැසියේ පැමිණීමේ ලේකනය සමාලෝචනය කරනු ඇත.
- විශ්වවිද්‍යාලය විසින් මස හයක් සඳහා වන මුළු ප්‍රවාහන ගාස්තුව කිලෝමීටරයකට කලින් තීරණය කල ගාස්තුව සහ යම් පළාතක ස්ථානීය දේශනයට සහභාගී වන්නන් සංඛ්‍යාව මත පදනම්ව තීරණය කරනු ලබයි.
- CSHR අනුමත කරන පරිදි සහභාගීවන්නන්ට ගෙවීම් සිදු කරනු ඇත.

ඇ).කාලරේඛාව

- තීරණය කරන ලද ගෙවීම කොළඹ දී පැවැත්වෙන ස්ථානීය සැසි වාරයට දින පහළවකට පසු ලියාපදිංචි තැපෑලෙන් චෙක්පතක් ලෙස බෙදා හරිනු ලැබේ.

ඉ).සම්බධතා තොරතුරු

- ප්‍රතිපූරණය කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් ඕනෑම විමසීමක් හෝ සහයක් සඳහා සහභාගිවන්නන්ට CSHR සහ DPCCS වෙත සම්බන්ධ විය හැකිය.

## 02. සහභාගී වන්නන් සඳහා දිවා ආහාරය

- විශ්වවිද්‍යාලයේ පැවැත්වෙන දේශනයට සහභාගි වන අයට දිවා ආහාර ගාස්තු අය කර ගත හැකිය.
- භෞතික දේශන සඳහා සහභාගී වීමේදී එක් එක් සහභාගි වන්නෙකුට රු 500 ක් ලබා දෙනු ලැබේ.
- CSHR විසින් පැමිණීමේ පත්‍රිකාව සමාලෝචනය කර එම මුදල සහභාගී වන්නන්ට ලබා දෙනු ඇත.

## 03. අන්තර්ජාල පිරිවැයට හිමිකම් කියන්නේ කෙසේද?

- zoom ඔස්සේ මාර්ගගත දේශන සඳහා සහභාගීවන්නන්ට අන්තර්ජාල පිරිවැය සඳහා ඉල්ලීම් කල හැකිය.
- මාර්ගගත දේශනයකට සහභාගී වීම සඳහා එක් එක් සහභාගිවන්නෙකු සඳහා රුපියල් 450.00 දක්වා ලබා දෙනු ලැබේ.
- එම මුදල CSHR විසින් පැමිණීමේ ලේකනය සමාලෝචනය කර ගෙවනු ලැබේ.

# 11. පරිපාලන මාර්ගෝපදේශ

## 1. හැඳින්වීම

ළමා වෙළඳාමේ වින්දිතයින් පිළිබඳ සිද්ධි කළමනාකරණය සහ රැකවරණය සඳහා වූ ප්‍රවේශය පිළිබඳව වන මානව හිමිකම් පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව සඳහා, මෙම මාර්ගෝපදේශය සම්පාදනය කර ඇත්තේ, ඵලදායී පරිපාලනයට සහාය වීම සඳහා ය. එය (**මානව හිමිකම් පදනම් කරගත් CVoT සිද්ධි කළමනාකරණය සහ රැකවරණය සඳහා ප්‍රවේශය**) මාර්ගෝපදේශවල අවශ්‍යතා පැහැදිලි කරයි. මෙහි සඳහන් කර නොමැති ඕනෑම කරුණක් සඳහා, කරුණාකර (**මානව හිමිකම් පදනම් කරගත් CVoT සිද්ධි කළමනාකරණය සහ රැකවරණය සඳහා ප්‍රවේශය**) වැඩසටහනේ පරිපාලන සම්බන්ධීකාරක/අධ්‍යයන සම්බන්ධීකාරක අමතන්න.

## 2. පැමිණීම

a. වැඩසටහන සාර්ථකව නිම කිරීම සඳහා 80% පැමිණීමක් අවශ්‍ය වේ. (එයින් අදහස් වන්නේ ඔබට නොපැමිණ සිටිය හැකි උපරිම ප්‍රමාණය වන්නේ මුළු ප්‍රමාණයෙන් 20% කි).
b. ඔබ අවසර ලත් 20% සීමාව තුළ සිටියද, ඔබට දේශනවලට සහභාගී වීමට නොහැකි නම් අධ්‍යයන සම්බන්ධීකාරක වෙත දැනුම් දිය යුතුය.
c. නොපැමිණීම සඳහා ඔබේ නිදහසට කරුණ ''වලංගු නිදහසට කරුණක්'' (වෛද්‍ය හේතූන්, රැකියා හෝ සම්මන්ත්‍රණ සඳහා පමණක් විදේශගත වීම) ගණයට වැටේ නම් පමණක් එය අවශ්‍ය 80% ට සාපේක්ෂව ගණන් නොගනී.
d. අවසාන ඉදිරිපත් කිරීමට සති 2 කට පෙර ඔබේ පැමිණීම අවශ්‍ය 80% ට වඩා අඩු නම්, ඔබට ඉදිරිපත් කිරීම සිදු කිරීමට අවසර නොලැබේ.
   - වලංගු නිදහසට කරුණක් (සාක්ෂි සහිතව) CSHR අධ්‍යයන කමිටුව වෙත ඉදිරිපත් කළ යුතුය, සහ
   - අධ්‍යයන කමිටුව විසින් 80% ට වඩා අඩු පැමිණීමේ ප්‍රතිශත පරීක්ෂා කරනු ලබයි.

## 3. පැවරුම් :

a. අධ්‍යයන සම්බන්ධීකාරක විසින් නියම කරන ලද පැවරුම් කාලය/කාලසීමාව තුළ ස්වාධීන පැවරුම සම්පූර්ණ කර CSHR වෙත ඉදිරිපත් කළ යුතුය.
b. සිසුන් තම පැවරුමේ මෘදු පිටපත (ඊතැපැල් ලිපිනය) වෙත යොමු කළ යුතු අතර, එම අවස්ථාවේදීම දෘඪ පිටපතද භාරදිය යුතුය.
c. කිසියම් හේතුවක් නිසා මෙම කාල සීමාව තුළ පැවරුම සම්පූර්ණ කළ නොහැකි නම් හෝ නියමිත කාලසීමාවට ඉදිරිපත් කළ නොහැකි නම්, පැවරුම් කාල සීමාවට අවම වශයෙන් දින 05 කට **පෙර** අධ්‍යයන සම්බන්ධීකාරක වෙත දැනුම් දිය යුතුය. (හෝ තත්වයන් මත පදනම්ව, ඉදිරිපත් කිරීමට පෙර සාධාරණ කාල සීමාවක් තුළ)
d. වලංගු නිදහසට කරුණක් නොමැතිව නියමිත දිනට පැවරුමක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම, ඉක්ම ගිය උත්සාහයක් වශයෙන් සලකනු ලැබේ.

e. අසාර්ථක පැවරුමක් (දැනුම්දීමකින් තොරව ඉදිරිපත් නොකිරීමේ හේතූන් මත හෝ වෙනත් ආකාරයකින් අසාර්ථක වූ) ඊළඟ අධ්‍යයන වර්ෂයේදී, නැවත ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියකට පසුව නැවත නැවත ඉදිරිපත් කළ හැකිය (පහත සටහන බලන්න)

**4. ස්වාධීන ඉදිරිපත් කිරීම :**

a. අධ්‍යයන සම්බන්ධීකාරක විසින් නියම කරන ලද දින (ය) මත ස්වාධීන ඉදිරිපත් කිරීම පවත්වනු ලැබේ

b. බරපතල හදිසි කාරණයක් නම් මිස, ශිෂ්‍යයෙකුට/ශිෂ්‍යයන්ට කල්දැමීම සඳහා ඉල්ලුම් කළ හැකි පදනම මත, ඉදිරිපත් කිරීමේ දිනයන් සංශෝධනය නොකෙරේ.

c. කිසියම් හේතුවක් නිසා ශිෂ්‍යයෙකුට නියමිත දිනට ඉදිරිපත් කිරීම කළ නොහැකි නම්, ඉදිරිපත් කිරීමට අවම වශයෙන් දින 10 කට පෙර අධ්‍යයන සම්බන්ධීකාරකවරයා දැනුවත් කළ යුතුය. (හෝ තත්වයන් මත පදනම්ව, ඉදිරිපත් කිරීමට පෙර සාධාරණ කාල සීමාවක් තුළ)

d. වලංගු නිදහසට කරුණක් නොමැතිව නියමිත දිනට ඔබගේ ඉදිරිපත් කිරීම සිදු කිරීමට, අපොහොසත් වීම, ඉක්ම ගිය උත්සාහයක් වශයෙන් සලකනු ලැබේ.

e. ශිෂ්‍යයෙකු ඉදිරිපත් කිරීම සිදු කිරීමට අපොහොසත් වුවහොත් (දැනුම්දීමක් ඇතිව හෝ නොපැමිණීමේ හේතු මත) එම අධ්‍යයන වර්ෂයේදීම ඉදිරිපත් කිරීම කිරීමට අවස්ථාවක් ලබා දිය හැකිය.

## 12. විශේෂ දිනයන්

| තොරතුරු | දිනයන්* |
|---|---|
| සමාරම්භක උත්සවය | 2024 මැයි 18 |
| දිශානතිය | 2024 මැයි 20 |
| දේශන | 2024 මැයි 20 |
| ස්වාධීන ඉදිරිපත් කිරීම | 2024 අගෝස්තු 31 /සැප්තැම්බර් 01 |
| ස්වාධීන පැවරුම | 2024 ඔක්තෝබර් 31 |

*** මෙම දිනයන් තාවකාලික වන අතර, නොවැළැක්විය හැකි හේතූන් මත ඕනෑම අවස්ථාවකදී මෙම දිනයන් වෙනස් වීමට යටත් වන බව කරුණාවෙන් සලකන්න.**

## 13. විශේෂ තොරතුරු

| | | |
|---|---|---|
| 01 | තැපැල් ලිපිනය | මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය<br>නීති පීඨය<br>කොළඹ විශ්වවිද්‍යාලය<br>අංක 94,<br>කුමාරතුංග මුනිදාස මාවත,<br>කොළඹ 03.<br>ශ්‍රී ලංකාව |
| 02 | සම්බන්ධ කරගැනීම සඳහා | +94-112-500879/503017<br>info@cshr.cmb.ac.lk |
| 03 | අධ්‍යක්ෂක | මහාචාර්ය (විශ්‍රාමික) වසන්තා සෙනවිරත්න<br>director@cshr.cmb.ac.lk |
| 04 | නියෝජ්‍ය අධ්‍යක්ෂක | එම්.ඒ.එම්. හකීම් මහතා<br>deputydirector@cshr.cmb.ac.lk |
| 05 | ශාස්ත්‍රීය සම්බන්ධීකාරක | දනුෂිකා අබේරත්න මිය<br>danushika@law.cmb.ac.lk |
| 06 | වැඩසටහන් සම්බන්ධීකාරක | එස් ශ්‍රී දයාලිනී<br>dhayalini@cshr.cmb.ac.lk |

## සම්පත් දායකයින්ගේ නාම ලේඛනය

### සිංහල මාධ්‍යය

මහාචාර්ය (විනේතෘ) රෝස් විජේසේකර
පුද්ගල හා තුලනාත්මක නීති දෙපාර්තමේන්තුව
නීති පීඨය
කොළඹ විශ්වවිද්‍යාලය

ආචාර්ය මධුර සංඛ ගුණවර්ධන
සායනික මනෝවිද්‍යාඥ
අධ්‍යක්ෂ
සිත්නිවන මානසික සෞඛ්‍ය පුනරුත්ථාපන සහ
උපදේශන මධ්‍යස්ථානය

බියන්කා අබේගුණවර්ධන
ළමා සංවර්ධනය/ළමා ආරක්ෂණය/
ඇතුළත් සංවර්ධන සහ අධ්‍යාපනය පිළිබඳ විශේෂඥ

රුෂානි චන්ද්‍රසේන
ශ්‍රී ලංකාවේ ළමා සුරැකීමේ මානුෂීය ක්‍රියාමාර්ග
පිළිබඳ ළමා ආරක්ෂණ විශේෂඥ
සේව් ද චිල්ඩ්‍රන් ශ්‍රී ලංකා

රොෂාන් ධම්මපාල
සායනික මනෝවිද්‍යාඥ

උදානි ගම්මන්පිල
කථිකාචාර්ය
පුද්ගලික හා සංසන්දනාත්මක නීති දෙපාර්තමේන්තුව
නීති පීඨය
කොළඹ විශ්වවිද්‍යාලය

නිලූෂා ගුණතිලක
සායනික මනෝවිද්‍යාඥ

බී.කේ.එස්.කරුණාරත්න
කථිකාචාර්ය/පුහුණු නිලධාරී
ජාතික සමාජ සංවර්ධන ආයතනය

නීතිඥ අනුරාධි නවරත්නම්
නීතිඥ
සම-නිර්මාතෘ / CEO-LIFE

සුබෝධ එම් මලවර ආරච්චි
ස්වාධීන උපදේශක සහ සුදුසුකම්ලත් පුහුණුකරු

නව්නෙත් මෙන්ඩිස්
උපදේශන සායනික මනෝවිද්‍යාඥ

මිලානි සල්පිටිකෝරළ
නීතිඥ
ළමා ආරක්ෂක බලකායේ නිර්මාතෘ

කුසලා වෙත්තසිංහ
මානසික සෞඛ්‍යය සහ මනෝ සමාජීය වෘත්තික

රන්ජන් වෙත්තසිංහ
කලාපීය උපදේශක-ළමා අයිතිවාසිකම් පාලනය
සේව් ද චිල්ඩ්‍රන් ශ්‍රී ලංකා

නිලූකා වික්‍රමසිංහ
ළමා මනෝවිද්‍යාඥ/කළමනාකරු - MHPP
ආසියා පදනම
බුද්ධිනි විතාන
ජ්‍යෙෂ්ඨ තාක්ෂණික උපදේශක - ළමා ආරක්ෂණය
සහ ළමා අයිතිවාසිකම් පිළිබඳ ව්‍යාපාරය
සේව් ද චිල්ඩ්‍රන්, ශ්‍රී ලංකා